ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

# කඩුවෙල

## මහ නගර සභා සංවර්ධන සැලැස්ම



2023 - 2033

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# කඩුවෙල මහ නගර සභා
# සංවර්ධන සැලැස්ම
## 2023 -2033

**නාගරික සංවර්ධන අධිකාරිය**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය**

**කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033**

@ නාගරික සංවර්ධන අධිකාරිය  -  ශ්‍රී ලංකාව  - 2023

සියලුම හිමිකම් ඇවිරිණි.
මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකල යුතුය.

ප්‍රකාශනය
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව-2023
6, 7 හා 9 වන මහල් “සෙත්සිරිපාය” බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය - www.uda.gov.lk
ඊමේල් - info@uda.gov.lk
දුරකථන - + 94112873637

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 – 2033

කඩුවෙල මහ නගර සභා බලප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම I ,II සහ III ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. මෙහි පළමු කොටස මගින් සංවර්ධන සැලසුම හැදින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ. දු. අ. ත විශ්ලේෂණය සහ සැලස්ම අන්තර්ගත කර ඇත. දෙවන කොටස මගින් කඩුවෙල මහනගර සභා බලප්‍රදේශය සඳහා 2023 - 2033 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ නියමතා සහ කලාපීකරණ නියමතා අන්තර්ගත කර ඇත. තුන්වන කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 - 2033, නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්හි හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මග පෙන්වීම පෙරදැරි කරගෙන සිදුකර ඇත.

**අධීක්ෂණ කටයුතු**
**නිමේෂ් හේරත්** ,*සභාපති-නා.සං.අධි.*, **වරලත් නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ. රණවීර**, *අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි.,* **වරලත් වාස්තු විද්‍යාඥ** හා **වරලත් නගර නිර්මාණ ශිල්පී මහින්ද විතානාරච්චි**, *අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අධි,* **වරලත් නගර නිර්මාණ ශිල්පී එම්. පී.රණතුංග**,*නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප (I) - නා.සං.අධි.,* **වරලත් නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න** *වැ.බ. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප II - නා.සං.අධි.,* **වරලත් නගර නිර්මාණ ශිල්පී රූපා රංජනී**, *අධ්‍යක්ෂ (උපායමාර්ගික සැලසුම්) නා.සං.අධි.*

**සහය කණ්ඩායම්**
**කඩුවෙල මහනගර සභා සැලසුම් කණ්ඩායම**- ( බුද්දික ජයවිලාල්-නගරාධිපති, දිල්රුක්ෂි ගමගේ-නාගරික කොමසාරිස්,කේ. පී. ශාන්ත විජේසිරි-නාගරික ඉංජිනේරු, මංජු ශ්‍රී දිසානායක-නාගරික ඉංජිනේරු, ටී.කේ.කේ.එන්.පී. බණ්ඩාර- මාණ්ඩලික වැඩ අධිකාරි, ඒ. එම්. ආරියරත්න- වැඩ අධිකාරි, නිරෝෂා තල්ලියද්ද- තාක්ෂණ නිලධාරී, ඒ.ඒ. ඕ.එස්. ගුණසේකර- තාක්ෂණ නිලධාරී, එච්. කේ. තාරක ගුණරත්න- තාක්ෂණ නිලධාරී)

**පරිසර හා භූ දර්ශන අංශය - නා.සං.අ.** (වරලත් පරිසරවේදී පද්මා විජේසිංහ -නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිසර) , නිලුශා කාරියවසම් -සහකාර අධ්‍යක්ෂ (පරිසර), වරලත් වාස්තු විද්‍යාඥ කෝසලා තෙන්නකෝන් - සහකාර අධ්‍යක්ෂ භූ දර්ශන උපදේශන, යූ. ජී. කමනි තුලතුංග-සැලසුම් නිලධාරී, එස්. එම්. ගයාන් සමරකෝන්- පරිසර නිලධාරී, වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පි පසන් ප්‍රනාන්දු - භූ දර්ශන වාස්තු විද්‍යාඥ)

**උපායමාර්ගික සැලසුම් අංශය - නා.සං.අ**. (වරලත් නගර නිර්මාණ ශිල්පී මනීෂා කුමාරසිංහ- නගර නිර්මාණ ශිල්පී -අධීක්ෂණය ,නියාමනය සහ ගැසට් කිරීම)

**භූ ගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ** (භූ ගෝලීය තොරතුරු හා දත්ත සැපයීම, කලාපීකරණ සිතියෙමෙහි තාක්ෂණික නිර්වද්‍යතාවය පරීක්ෂා කිරීම, කලාපීකරණ සිතියම නිර්මාණය සහ තාක්ෂණික සහය සැපයීම)

**ඉංග්‍රීසි භාෂා පරිවර්ථනය**- වරලත් නගර නිර්මාණ ශිල්පී ඩබ්. කේ. කේ. චතුරංග
**දමිළ භාෂා පරිවර්ථනය-** වරලත් නගර නිර්මාණ ශිල්පී වයි. ආර්තී
**පිට කවරය-** වරලත් නගර නිර්මාණ ශිල්පී ප්‍රවීන් කාවින්ද

**සැලසුම් කණ්ඩායම**

**වරලත් නගර නිර්මාණ ශිල්පී තුෂානි ද අල්විස්**, **අධ්‍යක්ෂ (කොළඹ මහ නාගරික ප්‍රදේශ)**, නාගරික සංවර්ධන අධිකාරිය, (විද්‍යාවේදී දේපල කළමණාකරණ සහ තක්සේරු විද්‍යා(විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නාගරික සැලසුම්කරණය මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය

**වරලත් නගර නිර්මාණ ශිල්පී තමරා ජයගොඩ**- **නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)**, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, (විද්‍යාවේදී දේපල කළමණාකරණ සහ තක්සේරු විද්‍යා(විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නගර හා ග්‍රාම නිර්මාණ මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය

**වරලත් නගර නිර්මාණ ශිල්පී එම්. ඒ. පී. මුණසිංහ**- **සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)**, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය , (වර්තමාන- කළුතර දිස්ත්‍රික් කාර්යාලය), නාගරික සංවර්ධන අධිකාරිය, (විද්‍යාවේදී දේපල කළමණාකරණ සහ තක්සේරු විද්‍යා(විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, විද්‍යාපති නගර හා ග්‍රාම නිර්මාණ මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය

**වරලත් නගර නිර්මාණ ශිල්පී නදීපා පල්ලියගුරු**-**සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)**, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, (විද්‍යාවේදී දේපල කළමණාකරණ සහ තක්සේරු විද්‍යා(විශේෂ) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, නගර හා ග්‍රාම නිර්මාණ මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ව්‍යාපෘති කළමණාකරණය මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, නාගරික සැලසුම්කරණය හා කළමණාකරණය- නෙදර්ලන්තය ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය

**වරලත් නගර නිර්මාණ ශිල්පී සත්‍යා මීපාගල**- **නගර නිර්මාණ ශිල්පී**, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,විද්‍යාවේදී (ගෞරව) නගර හා ග්‍රාම නිර්මාණ මොරටුව විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව, විද්‍යාපති දේපල කළමණාකරණ සහ තක්සේරු විද්‍යා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව ( අධ්‍යයන) ආයතනික සාමාජික - ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය

**වරලත් නගර නිර්මාණ ශිල්පී ඩබ්. හර්ෂණී සිල්වා-නගර නිර්මාණ ශිල්පී,** කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,විද්‍යාවේදී (ගෞරව) නගර හා ග්‍රාම නිර්මාණ මොරටුව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා ඉංජිනේරු කාර්මික ශිල්පීන්ගේ සංගමය (අවසන් විභාගය සමත්), ආයතනික සාමාජික- ශ්‍රී ලංකා නගර නිර්මාණ ශිල්පී ආයතනය, ආශ්‍රිත සාමාජික- පරිසර වෘත්තිකයන්ගේ ආයතනය

**එන්. ඩී. මධුක ප්‍රභාත් වීරසේන- බලාත්මක පුහුණු නිලධාරි**, ශාස්ත්‍රවේදී (ගෞරව) භූගෝල විද්‍යාව කැළණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව,

# ප්‍රණාමය

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 -2033 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහා නාගරික අංශයේ මූලික අධීක්ෂණය යටතේ සිදුවිය. කඩුවෙල ප්‍රදේශයෙහි අනාගත දැක්ම වන " **ශ්‍රී ලංකා ස්වෛරීත්ව කිරුළේ බලවත්ම කේන්ද්‍රස්ථානය** " යන දස අවුරුදු දැක්ම කරා යොමු කිරීමට අවශ්‍ය කරන අපේක්ෂිත නගර පරිවර්තනය පුබුදුවාලීමට අවශ්‍ය නිවැරදි ප්‍රවේශයට අවතීර්ණ වීම මෙම සැලැස්මේ අරමුණයි. කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 – 2033 වර්තමාන ශ්‍රී ලාංකීය රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව නිර්මාණය කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පනත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 – 2033 සඳහා අනුමැතිය ලබා දීම සිදු කරන ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා හට අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමු.

තවද මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබා දුන් නාගරික සංවර්ධන, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්තුමන් හා අමාත්‍යාංශයේ අනිකුත් නිලධාරී මඩුල්ල වෙත අපගේ ස්තුතිය පුදකොට සිටිමු.

කඩුවෙල මහ නගර සභාවෙහි නගරාධිපතිතුමා, උප නගරාධිපතිතුමා, නාගරික කොමසාරිස්තුමිය, නාගරික මන්ත්‍රීවරුන් හා තාක්ෂණික නිලධාරීන් ඇතුලු සෙසු සියලුම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම්තුමිය හා එම කාර්යාලයේ සියලුම නිලධාරීන්ටත් මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු.

විශේෂයෙන්ම මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ධෛර්ය හා මගපෙන්වීම ලබා දුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති, නිමේෂ් හේරත් මහතාට, අධ්‍යක්ෂ ජනරාල් එන්.පී.කේ .රණවීර මහතාට සහ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මහින්ද විතානාරච්චි මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප I එම්. පී.රණතුංග මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) කලාප II ලලිත් විජයරත්න මහතාට, නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ ඩී. එම් කිරිවත්තුඩුව මහත්මියට හා උපායමාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ , රූපා රංජනී මහත්මියට හා පරිසර හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ සී.කේ .ට් .කළුපහන මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමු. තවද, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂ නගර නිර්මාණ ශිල්පී ජේ.පී එස් සෝමසේකර මෙනවියට හා එම අංශයේ සියලුම නිලධාරීන්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුද කරමු.

එමෙන්ම, අතුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිතව විශේෂ රෙගුලාසි සකස් කිරීම සඳහා සහය වූ ශ්‍රී ලංකා ආරක්ෂක මූලස්ථාන පරිශ්‍රයේ හා ආරක්ෂක අමාත්‍යාංශයේ නිලධාරීන්ට, සහ කළුගල් කැණීම් ප්‍රදේශ ආශ්‍රිතව විශේෂ රෙගුලාසි සකස් කිරීම සඳහා සහය වූ භූ විද්‍යා හා පතල් කැණීම් කාර්‍යාංශයේ නිලධාරීන්ට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු

අවසාන වශයෙන් මෙම සැලැස්ම පිළියෙල කිරීම සඳහා නන් අයුරින් සහයෝගය ලබාදුන් කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශයේ වරලත් නගර නිර්මාණ ශිල්පී නිලූෂා සිල්වා මෙනෙවියට ද, වරලත් නගර නිර්මාණ ශිල්පී අයෝමි ක්‍රාවගේ මහත්මියට ද කළමණාකාර සහකාර අයි. එම්. සී. නිලන්ත කරුණාරත්න මහතා ද , කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශයේ සෙසු සියලුම නිලධාරී මහත්ම මහත්මීන් ද, මෙම සැලැස්ම සාර්ථකව නිමා කර ගැනීම සඳහා සහයෝගය දැක්වූ උපායමාර්ගික සැලසුම් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පරිසර හා භූ දර්ශන අංශය, නීති අංශය ඇතුලු අනෙකුත් සියලුම අංශයන්හි නිලධාරී මහත්ම මහත්මීන්ට අපගේ විශේෂ ස්තුතිය පුදකර සිටිමු.

# ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



කඩුවෙල නගර සංවර්ධනය යථාර්ථයක් කරා.........

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වසර 2048 දී පූර්ණ සංවර්ධිත ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම උදෙසා වන සියලු අරමුණු සහ ඉලක්ක කාර්යක්ෂමව හා සඵලදායී ලෙස ඉටුකර ගැනීම පිණිස නිවැරදි දිශානතියක් කරා රාජ්‍යය යොමු කිරීම යටතේ නව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යය.

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හඳුනාගත් නගර 26 ක් සඳහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සඳහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී . කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සඳහා සැලසුම්කර ඇත.

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ කඩුවෙල, බත්තරමුල්ල නගරයන්ගෙන් සේවා ලබාගැනීම සඳහා පැමිණෙන මගී ජනතාවට සහ එහි නේවාසික ජනතාව සඳහා වන අතර ප්‍රදේශය තවදුරටත් ආයතනික නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගැනිමට මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලසුම (2023-2033) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

**ප්‍රසන්න රණතුංග**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය**

# ගරු සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී නාගරික සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීමේ මූලික පරමාර්ථය වී ඇත්තේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය හා නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමයි.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ (II අ කොටස) 8 (1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යයවරයා විසින් ප්‍රකාශයට පත්කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලැසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව ප්‍රදේශයේ භෞතික , ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් ක්‍රමෝපායන් උපයෝගී කර ගනිමින් කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු හඳුනා ගැනීම තුළින් ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම හා ඒ හරහා උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇති අතර තවදුරටත් සංවර්ධන සැලසුම තුළින් සංවර්ධන කලාප හා කලාපීකරණ නියමතා නියාමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යයතා ඉටු කරනු වස් මෙම සැලැස්ම බලාත්මක කිරීම තුළින් එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන්ගෙන් සහ මහජනතාවගෙන් ඉල්ලා සිටිමි. කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම නියමිත කාලය තුළ සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙම කර්තව්‍යය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

**නිමේෂ් හේරත්**
**සභාපති**
**නාගරික සංවර්ධන අධිකාරිය**

# නාගරික කොමසාරිස්තුමියගේ පෙරවදන



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමේ ප්‍රධානතම ආයතනය වන අතර නාගරික පරිසරය ගුණාත්මක කළමනාකරණය කිරීම හා එහි ජීවත්වන ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීම සිදු කරනු ලබයි.

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය වර්ෂ 1979 ඔක්තෝම්බර් මස 01 වන දින අංක 56/6 අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමත් සමග සංවර්ධන ක්‍රියාදාමය තුළ කැපී පෙනෙන කාර්යය භාරයක් ඉටු කරමින් පොදු මහජන සුබ සිද්ධිය උදෙසා තම වගකීම නොපිරිහෙලා ඉටු කරමින් සිටියි. මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2008-2020 කාල සීමාව සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය ඉකුත්වීම හේතුවෙන් නව සංවර්ධන සැලැස්මක් ඉදිරි කාලසීමාව සඳහා සකස් කිරීමේ අවශ්‍යතාවය මතු විය.

වර්තමානය වන විට රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුකූලව  කඩුවෙල නාගරික බල ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරයේ සිය අනන්‍යතාවය ගොඩ නගා ගනිමින් සිටියි. ප්‍රදේශයේ පවතින සමාජීය, ආර්ථික, පාරිසරික, භෞතික, දේශපාලනික, සංස්කෘතික, ව්‍යුහයන් අතර තුලිත සංවර්ධනයක් පවත්වාගෙන යමින්, ප්‍රදේශයේ පවතින ගැටලු හඳුනා ගනිමින්, එහි ප්‍රමුඛතාවය මත නිරීක්ෂණ, විශ්ලේෂණ හා නිගමන තුළින් තාර්කික විසඳුම් ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගෙන, සැලසුම් සහගතව උපායමාර්ගික ව්‍යාපෘති හඳුනාගනිමින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන, බත්තරමුල්ල ප්‍රමුඛ කොටගත් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කිරීම මෙන්ම සමස්ත ප්‍රදේශයේ ආර්ථික තත්වය සවිබල ගැන්වීමට අවශ්‍ය විධිමත් නාගරීකරණ මගපෙන්වීම, කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033 තුළින් සාක්ෂාත් කරගත හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, ප්‍රදේශයේ සංවර්ධනය විධිමත් කිරීමේ අරමුණින්, මහජනතාවගේ සුබ සිද්ධිය උදෙසා 2023-2033 කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරන ලද කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම තුළින් හඳුනාගත් දැක්ම සාක්ෂාත් කර ගැනීමට අපගේ නොමද සහයෝගය ලබා දෙන අතර එය සාක්ෂාත් කර ගැනීමට හැකිවේවායි ප්‍රාර්ථනා කරමි.

**දිල්රුක්ෂි ගමගේ**
**නාගරික කොමසාරිස්**
**කඩුවෙල මහ නගර සභාව**

# පූර්විකාව

වර්තමානයේදී කඩුවෙල, බත්තරමුල්ල නගර හා ඒ හා තදාසන්න නගර වල ඇතිවන සංවර්ධනය හේතුවෙන් පැන නගින අභියෝගයන්ට මුහුණ දීම සඳහා මෙන්ම රට අවශ්‍ය පහසුකම් සපයමින් සංවර්ධනය නිවැරදි දිශානතියකට යොමු කරනු වස් විධිමත් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව මතුවී ඇත. ඒ අනුව, වර්තමානයේ කඩුවෙල, බත්තරමුල්ල නගර තුල පවතින ආර්ථික , සමාජීය හා පාරිසරික තත්වය සැලකිල්ලට ගෙන "**ශ්‍රී ලංකා ස්වෛරීත්ව කිරුලේ බලවත්ම කේන්ද්‍රස්ථානය**" ලෙස සංවර්ධනය කිරීමේ දැක්ම පෙරදැරි කර ගනිමින් මෙම සැලැස්ම සකස් කොට ඇත.

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී 2011-2022 වර්ෂ වලට අදාල ද්විතියික දත්ත එකතු කිරීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් එක්රැස් කරන ලද දත්ත පදනම් කරගනිමින් සිදුකරන ලද විශ්ලේෂණ මගින් නිගමන වලට එළඹීම සිදුකරන ලදී. ඒ අනුව කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023 – 2033 කාල සීමාව සඳහා වලංගුවන නව සංවර්ධන සැලැස්මක් ලෙස සකස් කර ඇති අතර එය සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේ විවිධ අවස්ථා වලදී ලබා ගත් තීරණ හා ප්‍රයෝගික ක්‍රියාවලි හරහා අවබෝධ කරගත් කරුණු යන දෙකෙහිම ප්‍රතිඵලයක් වේ.

ඒ අනුව 2023 -2033 කාල සීමාව සඳහා සකස් කරන කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම කොටස් තුනකින් සමන්විත වේ. එහි පළමුවන කොටස සංවර්ධන සැලැසේමේ පසුබිම, මූලික අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය, සංවර්ධන සැලසුම් රාමුව, ශද්‍රඅත (SWOT) විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වන අතර දෙවන කොටස 2023 -2033 කාල සීමාව සඳහා සැලසුම් සීමාවට අදාල සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා වලින් සමන්විත වේ. තුන්වන කොටස කලාපීකරණ මායිම් වලට අදාල ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

## කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 (ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 ජනවාරි 31 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II
බත්තරමුල්ල.

ප්‍රසන්න රණතුංග (පා.ම)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
2 වන මහල, "සෙත්සිරිපාය"
බත්තරමුල්ල

2024 මැයි මස 16 වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2386/06 - 2024 මැයි මස 28 වැනි අඟහරුවාදා - 2024.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2024 ජනවාරි මස 31 වැනි දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 16 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

1A - PG 6738 — 19 (2024/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම 2024 මැයි මස 16 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග** (පා. ම.),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2024 මැයි මස 21 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
12 වන මහල,
"සෙත්සිරිපාය" අදියර - II,
බත්තරමුල්ල.

## කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8(අ) වගන්තියේ බලතල ප්‍රකාරව කඩුවෙල මහා නගර සභාව සඳහා වූ සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 මැයි මස 16 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**නිමේෂ් හේරත්,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2024 මැයි මස 21 වැනි දින,

EOG 05 - 0169

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# පටුන

ප්‍රණාමය iv
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන v
සභාපතිතුමාගේ පෙරවදන - නාගරික සංවර්ධන අධිකාරිය vi
නාගරික කොමසාරිස්තුමියගේ පෙරවදන vii
පූර්විකාව viii
ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය ix
ගැසට් නිවේදනය x
පටුන xi

**පළමු කොටස** 1
**පළමු පරිච්ඡේදය - සංවර්ධන සැලැස්මේ පසුබිම** 3
1.1 හැඳින්වීම 4
1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් 4
1.2.1. මූලික පාර්ශව ආයතනය 5
1.2.2. උපදේශන ආයනතන 5
1.2.3. අනෙකුත් පාර්ශව ආයතන 5
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය 6
1.4 සැලසුම් ක්‍රියාවලිය 6
1.4.1. පසුබිම අධ්‍යයනය 8
1.4.2. විෂය පථය 8
1.4.3. ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනීම 8
1.4.4. දැක්ම හා අරමුණු 8
1.4.5. විස්තරාත්මක විශ්ලේෂණය 8
1.4.6. සැලසුම් සහ උපායමාර්ග 9
1.4.7. සැලසුම් නියමතා/ රෙගුලාසි 9
1.4.8. අදහස් ලබා ගැනීම 9
1.4.9. දළ සැලසුම් වාර්තාව භාර දීම. 9
1.4.10. අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම 10

**දෙවන පරිච්ඡේදය** 11
2.1 අධ්‍යයන ප්‍රදේශය 12
2.2. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම 12
2.2.1. හැඳින්වීම 12
2.2.2. ක්‍රියාකාරී සීමාව 14
2.2.3. භූගෝලීය සීමාව 15
2.2.4. පරිපාලන සීමාව 15
2.2.5. සැලසුම් සිමාව 16
2.3. සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය 19
2.3.1. ඓතිහාසික පසුබිම හා විකාශනය 19
2.3.1.1. ජනප්‍රවාද හා බැදුණු නාම විකාශනය 19
2.3.1.2 ඉතිහාසය හා ඓතිහාසික වැදගත්කම 19
2.3.1.3 නගර සීමාවන්හි ක්‍රමික විකාශනය හා කඩුවෙල පරිපාලනමය තත්වය 21

2.3.1.4 කඩුවෙල නගරයේ සැලසුම් ඉතිහාසය 21

2.3.1.4.1 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම - 1982 21

2.3.1.4.2 මහ කොළඹ නාගරීක පුරවර ව්‍යුහ සැලැස්ම (CMRSP) - 1998 23

2.3.1.4.3 කොළඹ නගර සංවර්ධන සැලැස්ම - 1999 24

2.3.1.4.4 බස්නාහිර පළාත් මහනගර පුරවර සැලැස්ම - 2004 25

2.3.1.4.5 කඩුවෙල සංවර්ධන සැලැස්ම-2008-2020 26

2.3.1.4.6 මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම 26

2.3.1.4.7 බස්නාහිර පළාත් මහනගර සංවර්ධන සැලැස්ම - 2016 27

2.3.1.4.8 අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030 27

2.3.1.4.9 ජාතික ප්‍රතිපත්ති 28

2.3.2. කඩුවෙල නගරයේ වර්තමාන තත්වය 29

2.3.2.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි භෞතික පසුබිම 29

2.3.2.1.1 භූමි පරිහරණ රටාව 29

2.3.2.1.2 ජාතික හා කලාපීය සබදතා 31

2.3.2.1.3 මහා මාර්ග පද්ධතිය 33

2.3.2.1.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි යටිතල පහසුකම් 35

2.3.2.1.3.1 ජල පහසුකම 35

2.3.2.1.3.2 විදුලි පහසුකම 35

2.3.2.1.3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය 36

2.3.2.1.3.4 මල හා අපජල කළමනාකරණය 36

2.3.2.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සමාජයීය පසුබිම 36

2.3.2.2.1 ජනගහනය 36

2.3.2.2.2 නිවාස 39

2.3.2.2.3 සෞඛ්‍යය 42

2.3.2.2.4 අධ්‍යාපනය 42

2.3.2.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම 46

2.3.2.3.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කුඹුරු හා අනෙකුත් කෘෂිකාර්මික කටයුතු 47

2.3.2.3.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කර්මාන්ත 49

2.3.2.3.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වල ව්‍යාප්තිය 49

2.3.2.4 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික පසුබිම 50

2.3.2.4.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික සංවේදී ප්‍රදේශ 50

2.3.2.4.1.1 ශ්‍රී ජයවර්ධනපුර කුරුළු අභය භූමිය 50

2.3.2.4.1.2 තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය 50

2.3.2.4.1.3 දැඩිගමුව කන්ද පරිසර ආරක්ෂණ බල ප්‍රදේශය හා කොරතොට පන්සල් කන්ද 50

2.3.2.4.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ස්වභාවික ආපදා 52

2.3.2.4.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පොදු එළිමහන් ,විවේක හා විනෝද කටයුතු 54

2.3.2.4.4 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ස්ථාන 58

**තෙවන පරිච්ඡේදය** 61

3.2 හඳුනාගත් ගැටළු 62

3.2.1 කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ පරිපාලන නගරයක ගති ලක්ෂණ ඉස්මතු නොවීම තුළ ප්‍රදේශය පිළිබඳව පවතින අඩු සංවේදීතාව 62

3.2.2 අධික ලෙස වර්ධනය වන රථ වාහන තදබදය ප්‍රදේශය තුළ පවතින පොදු ප්‍රවාහන දුෂ්කරතාවය 64

3.2.3 වර්තමාන නේවාසික, වාණිජ හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් පරිසර සංවේදී ප්‍රදේශයන්ට ව්‍යාප්ත වීම හා ඒ හේතුවෙන් මතු වී ඇති ගංවතුර අවධානම 68

3.2.4. සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් හරිත කලාපයෙහි සිදුවන හායනය මත ඇති වී ඇති හරිතාගාර ආවරණය 74

3.2.5 මලාපවාහන හා අපජලය බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම 75

3.2.6. ප්‍රදේශය තුළ ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් නේවාසික ප්‍රදේශයන්ට සිදුවන බලපෑම 76

3.3 හඳුනාගත් විභවතා 80

3.3.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ආර්ථික අංශයේ විභවයන් ගවේෂණය 81

3.3.2 ඉදිරි සංවර්ධන ව්‍යාපෘති වලින් උපරිම ධනාත්මක බලපෑම් අත්කර ගැනීම 83

3.3.2.1 සැහැල්ලු දුම්රිය සංක්‍රමණ (Light Rail Transit) හා කුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගය (Elevated Express way) 83

3.3.3: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ජෛව විවිධත්වය 85

**හතරවන පරිච්ඡේදය** 87

4.1 දැක්ම 88

4.2 දැක්මෙහි ප්‍රකාශනය 88

4.3 ඉලක්ක 88

4.4 අභිමතාර්ථ 90

**පස්වන පරිච්ඡේදය** 93

5.1 සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය 94

**හයවන පරිච්ඡේදය** 99

6.1 සංකල්පීය සැලැස්ම 100

6.2 කඩුවෙල නගර සංවර්ධන සැලසුමෙහි සංයුතිය 101
6.2.1 නාගරික ආකෘති නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම 101
6.2.2 ආර්ථික ශක්යතාව සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම 102
6.2.3 භෞතික යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගය 102
6.2.4.තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගය 103
6.2.5.ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 103
6.3 නාගරික ආකෘති නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම 103
6.3.1 හැඳින්වීම 103
6.3.2 අරමුණ 104
6.3.3 කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම 2023-2033 ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය 104
6.3.4 විෂය පථය 104
6.3.4.1 කඩුවෙල මහනගර සභා ප්‍රදේශය සඳහා සනත්ව රටාවන්ගෙන් සමන්විත යෝජිත භූමි පරිහරණ සැලැස්ම 104
6.3.4.2 අපේක්ෂිත ජනගහන පුරෝකථනය 106
6.3.4.3 පාර්ලිමේන්තු කලාප හා විශේෂ ආරක්ෂක කලාපයන්ගෙන් සමන්විත විශේෂිත පාලන කලාපයන් 109
6.3.4.3.2 අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිතව යෝජිත විශේෂ ආරක්ෂක කලාප 110
6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම 113
6.4.1 හැදින්වීම 113
6.4.2. අරමුණ 113
6.4.3. කඩුවෙල මහ නගර ප්‍රදේශ සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය 113
6.4.4. විෂය පථය 114
6.4.4.1 විශේෂ ආර්ථික දිස්ත්‍රික්ක සංවර්ධනය 114
6.4.4.1.1 උපාය මාර්ගික ව්‍යාපෘති 01: විධායක සහ රාජ්‍යතාන්ත්‍රික පරිවර්තන ප්‍රදේශය 114
6.4.4.1.2 උපාය මාර්ගික ව්‍යාපෘති 02: බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාපය 115
6.4.4.1.3 උපාය මාර්ගික ව්‍යාපෘති 03: කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාපය 117
6.4.4.1.4 උපාය මාර්ගික ව්‍යාපෘති 04: මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය 119
6.4.4.1.5. උපාය මාර්ගික ව්‍යාපෘති 05: අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය 120
6.4.4.1.6. උපාය මාර්ගික ව්‍යාපෘති 06: අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යානය-කොරතොට 122
6.4.4.1.7. උපාය මාර්ගික ව්‍යාපෘති 07: කාර්මික උද්‍යාන සංවර්ධනය - ඔරුවල 123
6.4.4.1.8. උපාය මාර්ගික ව්‍යාපෘති 08: ජලාභිමුඛ නගර සංවර්ධනය- කඩුවෙල 124
6.4.4.1.9. උපායමාර්ගික ව්‍යාපෘති 09: මාලබේ නගර සංවර්ධනය 126
6.4.4.1.10. උපායමාර්ගික ව්‍යාපෘති 10: අතුරුගිරිය නගර සංවර්ධනය 128
6.5 භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 130
6.5.1 හැදින්වීම 130
6.5.2 අරමුණ 130
6.5.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය 131
6.5.4 විෂය පථය 131
6.5.5.1 මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම 131

6.5.5.1.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: නව මාර්ග සංවර්ධනය සඳහා වන යෝජනා 131
6.5.5.1.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: නාගරික ක්‍රියාකාරී මාර්ග පුළුල් කිරීම සඳහා වන යෝජනා 134
6.5.5.1.4 උපායමාර්ගික ව්‍යාපෘති 04: සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය 138
6.5.5.1.5 උපායමාර්ගික ව්‍යාපෘති 05:කොස්වත්ත, කඩුවෙල හා අතුරුගිරිය නගර සඳහා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන හඳුන්වාදීම 138
6.5.5.2 ඝන අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්ම 139
6.5.5.2. 1 ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම 140
6.5.5.2. 2 ජනනය වන කසල විධිමත් ලෙස වෙන් කිරීම 140
6.5.5.2. 3 ජනනය වන කසල සදහා මිලක් ලබා දීම. 140
6.5.5.2. 4 නිවස තුළ ජනනය වන කසල නිවස තුළම බැහැර කිරීම 141
6.5.5.3.4 ජල සැපයුම් හා විදුලි සැපයුම් කළමනාකරණය 142
6.5.5.3.5 සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම 142
6.5.5.3.5.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: තලංගම රෝහල පරිශ්‍රය වැඩිදියුණු කිරීම 143
6.5.5.3.5.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානය - අතුරුගිරිය 144
6.5.5.3.5.3 උපායමාර්ගික ව්‍යාපෘති 03: වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය - බත්තරමුල්ල 145
6.5.5.3.5.4 උපායමාර්ගික ව්‍යාපෘති 04: සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශය - කඩුවෙල 145
6.5.5.3.5.5 උපායමාර්ගික ව්‍යාපෘති 05: කොරතොට ශ්‍රී සෝමානන්ද විද්‍යාලයට පහසුකම් සැපයීම 146
6.6. තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගය 147
6.6.1 හැඳින්වීම 147
6.6.2 අරමුණ 147
6.6.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය 147
6.6.4 විෂය පථය 148
6.6.4. හරිත ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම 148
6.6.4.1 තෙත්බිම් ජාල වර්ගීකරණය 149
6.6.4.2 තෙත්බිම් උද්‍යාන සංවර්ධනය 149
6.6.4.2.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය 150
6.6.4.2.2. උපායමාර්ගික ව්‍යාපෘති 02: ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යානය 151
6.6.4.2.3. උපායමාර්ගික ව්‍යාපෘති 03: කඩුවෙල තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානය 152
6.6.4.2.4. උපායමාර්ගික ව්‍යාපෘති 04: කොස්වත්ත ජල උද්‍යානය 153
6.6.4.2.5. උපායමාර්ගික ව්‍යාපෘති 05: කඩුවෙල නගර මල් උද්‍යානය 154
6.6.4.2.6. උපායමාර්ගික ව්‍යාපෘති 06: දැඩිගමුව නාගරික වන උද්‍යානය 155
6.6.4.2.7. උපායමාර්ගික ව්‍යාපෘති 07: කැලණි ගඟ රක්ෂිතය භූ දර්ශනය 156
6.6.5 නිල ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම හා ආපදා කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම 157
6.6.5.1 ජල ප්‍රදේශ අධීක්ෂණය සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම 158
6.6.5.2 කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර බාධක බැමි ඉදිකිරීමට සුදුසු ස්ථාන සඳහා නියමිත සැලසුම් සකස් කිරීමට යෝජනා කිරීම 159

6.6.5.3 හෙට්ටිගේ ඔය ජල පෝෂක ප්‍රදේශය සහ කඩුවෙල නගරය ආශ්‍රිතව ඇතිවන ජල ගැලීම් තත්ත්වය පාලනයට වැසි ජල පොම්පාගාර ස්ථාපිත කිරීමට යෝජනා කිරීම. 159
6.6.5.4 පවතින වේලි හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම නිසි ක්‍රම වේදයකට අනුව සිදු කිරීම. 160
6.6.5.5. ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම 160
6.6.6. පොදු විවෘත අවකාශය කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම 161
6.6.6.1 පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබද අවකාශීය සැලැස්ම (PORS) සඳහා උපායමාර්ග 162
6.6.7 උරුම සංරක්ෂණ හා කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම 165
6.6.7.1 අපේගම පරිශ්‍රය ප්‍රතිනිර්මාණය කිරීම 166
6.7 ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 167
6.7.1 හැදින්වීම 167
6.7.2 අරමුණ 167
6.7.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය 167
6.7.4 විෂය පථය 168
6.7.5 නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන කලාප හඳුනාගැනීම. (නේවාසික කලාප ප්‍රවර්ධන සැලැස්ම) 168
6.7.6. නේවාසික කලාපය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් සැපයීම සඳහා කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම 170
6.7.6.1. උපායමාර්ගික ව්‍යාපෘති 01: අරංගල මංසන්ධි සංවර්ධනය 171
6.7.6.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: කොරතොට මංසන්ධි සංවර්ධනය 171
6.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 173
6.8.1 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම හා ව්‍යාපෘති සදහා වන ආයතනික වගකීම 173

**දෙවන කොටස** 177

**හත්වන පරිච්ඡේදය** 17/
7.1 සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා හැදින්වීම 179
7.2 කලාපීකරණ සැලැස්ම (2023-2033) 180
7.3 සංවර්ධන කලාප සහ කලාප සංගුණකය 181
7.4 සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා 183

**අටවන පරිච්ඡේදය** 192
8.1. කලාපීකරණ රෙගුලාසි 193
8.1.1. විශේෂ නේවාසික කලාපය 193
8.1.2 නේවාසික කලාපය 196
8.1.3 ආයතනික කලාපය 198
8.1.4 මිශ්‍ර සංවර්ධන කලාප I- වාණිජ ප්‍රමුඛ කරගත් මිශ්‍ර සංවර්ධන කලාපය 202
8.1.5 මිශ්‍ර සංවර්ධන කලාපය II- අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය 203
8.1.6 මිශ්‍ර සංවර්ධන කලාපය III- අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය 204
8.1.7. මිශ්‍ර සංවර්ධන කලාපය IV- කැළණි ගඟාභිමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය 205
8.1.8 වාණිජ කලාපය 207

8.1.9: දැනුම නගර සංවර්ධන කලාපය 209
8.1.10: සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 25 දක්වා ප්‍රදේශය 212
8.1.11: සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 25 වඩා උසින් වූ ප්‍රදේශය 213
8.1.12 සංරක්ෂණ කලාපය (දැඩිගමුව කඳු ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 30 දක්වා වූ ප්‍රදේශය 215
8.1.13: සංරක්ෂණ කලාපය (දැඩිගමුව කඳු ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 30 වඩා වැඩි උසින් වූ ප්‍රදේශ 216
8.1.14: අධි සංවේදී තෙත්බිම් සංරක්ෂණ කලාපය 218
8.1.15: මධ්‍ය සංවේදී තෙත්බිම් සංරක්ෂණ කලාපය 220
8.1.16: අඩු සංවේදී සංරක්ෂණ කලාපය 224

**උපලේඛණ** 228
උපලේඛණය I - "අ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් ගෙබිම් අනුපාතයන් 229
උපලේඛණය II - "ආ" ආකෘතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති අවසරලත් මහල් ප්‍රමාණයන් 233
උපලේඛණය III - "ඉ" ආකෘතිය: නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021/07/08 දින අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති විවෘත අවකාශයන් 234
උපලේඛණය V- "උ " ආකෘතිය: අනුමත භාවිතයන්ට අදාළ අවම බිම් ප්‍රමාණයන් 235
උපලේඛන V: තෙත් බිම් ආශ්‍රිත රෙගුලාසීන්ට අදාල ආයතන ලැයිස්තුව 240

**නමවන පරිච්ඡේදය** 242
9.1 මාර්ග හා ගොඩනැගිලි සීමා 243
අ. පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 24 බැගින් ගොඩනැගිලි සීමාව තැබිය යුතු මාර්ග 243
ආ. පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 15 බැගින් ගොඩනැගිලි සීමාව තැබිය යුතු මාර්ග 243
ඇ. පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 12 බැගින් ගොඩනැගිලි සීමාව තැබිය යුතු මාර්ග 243
ඈ. පාරේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර් 9 බැගින් ගොඩනැගිලි සීමාව තැබිය යුතු මාර්ග 243
9.2 පළාත් පාලන ආයතනය මගින් ප්‍රකාශයට පත් කරන ලද මාර්ග සඳහා වන ගොඩනැගිලි සීමා 244
9.3 පළාත් පාලන ආයතනය මගින් නඩත්තු කරනු ලබන මාර්ග හා රට අයත් ගොඩනැගිලි සීමා 311

**තෙවන කොටස** 314
සිතියම් ලේඛනය 316
රූපසටහන් ලේඛනය 317
වගු ලේඛනය 319
ඇමුණුම් ලේඛනය හා ඇමුණුම් 321

# පළමු කොටස

# පළමු පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මේ පසුබිම

# පළමු පරිච්ඡේදය

## සංවර්ධන සැලැස්මේ පසුබිම

### 1.1 හැඳින්වීම

නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශයන්හි ආර්ථික, භෞතික, සමාජයීය හා පාරිසරික යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, එම අංශ ප්‍රවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ වු සැලැස්මක් සකස් කිරීම සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ලෙස හැඳින්විය හැකිය.

වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 (1) සහ (2) වගන්තියේ බලතල ප්‍රකාරව යම් ප්‍රදේශයක්, නාගරික සංවර්ධන බලප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කරනු ලැබිය හැකි අතර, එසේ ප්‍රකාශයට පත්කරනු ලැබූ ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ බලතල 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8 II (අ) වගන්තිය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත.

වර්ෂ 1979 ඔක්තෝම්බර් 01 වන දින අංක 56/6 දරණ ගැසට් පත්‍රය මඟින් කොළඹ දිස්ත්‍රික්කය තුළ හේවාගම් කෝරළේ - බටහිර පල්ලේ පත්තුවට අදාළව කඩුවෙල ගම් සභා ප්‍රදේශයද, අතුරුගිරිය ගම් සභා ප්‍රදේශයද නාගරික සංවර්ධන අධිකාරී බලප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

කඩුවෙල නගරය වර්තමානයේ දී මහ නගර සභාවක තත්වය උසුලනු ලබන අතර, වර්ෂ 1988 දක්වා අතුරුගිරිය, කඩුවෙල යන ගම් සභා දෙක යටතේ සහ බත්තරමුල්ල සුළු නගර සභාව යටතේ පරිපාලනය විය. 1988 වසරේ දී අතුරුගිරිය, කඩුවෙල සහ බත්තරමුල්ල යන පරිපාලන ඒකක ඒකාබද්ධ කරමින් කඩුවෙල ප්‍රාදේශීය සභාව පිහිටුවන ලදී. අනතුරුව, එම ප්‍රදේශය වර්ෂ 2011 අගෝස්තු මස 01 දින  සිට කඩුවෙල මහනගර සභා  බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

කොළඹ නගරයෙහි පරිපාලන කටයුතු බත්තරමුල්ල ප්‍රදේශයෙහි සංකේන්ද්‍රණය වීමේ ප්‍රවණතාවය අනුව 1985 අංක 335/5  දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සකස් කරන ලද ශ්‍රී ජයවර්ධනපුර පරිපාලන අගනගර ප්‍රදේශ සැලැස්ම තුලට බත්තරමුල්ල ප්‍රදේශයද ඇතුලත් විය.

අනතුරුව 2019 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, මහරගම නගර සභා බල ප්‍රදේශය හා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය එක් සැලසුම් ප්‍රදේශය ලෙස සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2019- 2030 වර්ෂයන්ට බලපැවැත්වෙන පරිදි අග නගර සංවර්ධන සැලැස්ම පිළියෙල කරන ලදි.

මේ වනවිට 2008 – 2020 කාලසිමාව සඳහා සකස් කරන ලද කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය ඉකුත් වීම හේතුවෙන් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාව මතු විය.

''අගනගර සංවර්ධන සැලැස්ම 2019 - 2030'' මගින් කඩුවෙල මහ නගර සභාව, කෝට්ටේ මහ නගර සභාව, මහරගම නගර සභාව හා කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් යුතු පුළුල් භූමි පරාසයක් තුල විහිදි, පාලන ප්‍රදේශ හතරක් ඒකාබද්ධ කරමින් සැකසූ සැලැස්මක් වන අතර,  එම සංවර්ධන සැලැස්මට ප්‍රතිශෝධනයක් ලබා දෙමින් ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික සංරචක, තිරසාර සංවර්ධනයකට යොමු කිරීම පෙරදැරි කරගනිමින් කඩුවෙල පළාත් පාලන බල ප්‍රදේශය සඳහා 2023– 2033 කාල සීමාව සඳහා නව සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා  ඇතුලත් මෙම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

### 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

සංවර්ධන සැලැස්මක් සකස් කිරීමෙහිලා පාර්ශවකරුවන්ගේ අදහස් ලබාගැනීම ඉමහත් වගකීමක් වන අතර, එය සංවර්ධන සැලැස්මක යාවත්කාලින පැවැත්ම උදෙසා බෙහෙවින් උපකාරී වේ.

කඩුවෙල සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වල නියුතු සියලු පාර්ශවකරුවන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීම මූලික වශයෙන්ම 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස 18 වන දින පවත්වන ලද පාර්ශවකරුවන්ගේ හමුවේ දී සිදුකරන ලදී. එහිදී සැලසුම් ප්‍රදේශයේ පාරිසරික, ආර්ථික, සමාජීය, පරිපාලන, භෞතික හා යටිතල පහසුකම් ආදී අංශ නියෝජනය වන පරිදි ලබාගත් අදහස් හා යෝජනා මෙම සැලැස්ම පිළියෙළ කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී. ඒ සඳහා සම්බන්ධ වූ පාර්ශවකරුවන් පහත පරිදි වේ.

### 1.2.1. මූලික පාර්ශව ආයතනය

- කඩුවෙල මහනගර සභාව

### 1.2.2. උපදේශන ආයතන

- කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ලංකා විදුලිබල මණ්ඩලය
- ජාතික අපදා කළමනාකරණ මධ්‍යස්ථානය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
- ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය
- මාර්ග සංවර්ධන අධිකාරිය
- පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
- ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
- භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- කලාප අධ්‍යාපන කාර්යාලය
- ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය \

### 1.2.3. අනෙකුත් පාර්ශව ආයතන

- ශ්‍රී ලංකා පොලීසිය
- ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය
- සිවිල් සමාජ සංවිධාන
- පරිසර සංවිධාන
- වෙළඳ සංගම්

තවද ප්‍රවාහනය, ජලය, විදුලිය ආදී යටිතල පහසුකම්, ඉඩම්, ප්‍රජා පහසුකම්, හා පාරිසරික පද්ධතියට අදාළ සියලුම පාර්ශව ආයතන සම්බන්ධ කරගනිමින් වෙන් වෙන් වශයෙන් පවත්වන ලද සාකච්ඡා මාලාවක් හරහා පාර්ශවකරුවන්ගේ අදහස් ,යෝජනා හා ඒකාබද්ධ සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය දත්ත හා තොරතුරු එක් රැස් කර ගන්නා ලදී.

### 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

කොළඹ වාණිජ නගරයට කි.මී 17.5ක් නුදුරින් පිහිටි කඩුවෙල මහ නගර සභාව හෙක්ටයාර 8770ක් පුරා විහිදු ප්‍රදේශයක් වේ. උතුරින් කැළණි ගඟ ද , නැගෙනහිරින් නාකඩමුල්ල ඇළ හා දිගන දෙනිය පිට ඇළටද, දකුණින් පුවක්ගහදෙනිය යාය, මැදි ඇළ සහ බණ්ඩාරදෙනියෙන්ද, බටහිරින් ජපන් මිත්‍රත්ව මාර්ගය, දියවන්නා ඔය හා දියවන්නා වගුරින්ද මායිම් වූ කඩුවෙල මහනගර සභාව කොළඹ දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් 13.4%කට උරුමකම් කියයි.

කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම මගින් තෙත්බිම් හා අනෙකුත් සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කරමින් දැනට පවතින උපයෝගිතාව හා ඉදිරියේදී ක්‍රියාත්මක වන අපරව්‍යුහ පහසුකම් වල උපයෝගිතාව ප්‍රශස්ථ මට්ටමින් ලබාගත හැකි වන ලෙස සැලසුම් ප්‍රදේශයේ විවිධ ස්ථානවල ජනගහන ව්‍යාප්තිය හා තෙත්බිම් ප්‍රමාණ ඝනත්වයන් නිර්ණය කිරීම සඳහා උපායමාර්ගික මැදිහත්වීමක් සපයේ.

අපේක්ෂිත භෞතික සංවර්ධනය අත්පත් කරගැනීම සඳහා "අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030" ව්‍යුහාත්මක සැලැස්ම පදනම් කරගෙන සිදුවෙන මෙම සංවර්ධන සැලැස්ම දිගුකාලීන වුවක් වන නමුත්, ප්‍රධාන උපක්‍රමයන් වසර 10ක් තුලදී ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ. ගෝලීය වශයෙන් ශ්‍රී ලංකාව තුල ඇතිවිය හැකි සමාජ, ආර්ථික සහ තාක්ෂණමය ප්‍රගමනයත්, කොළඹ වාණිජ නගරයේ සිදුවන නාගරීකරණයටත් සමගාමීව කඩුවෙල නගරය නාගරීකරණය වීමත් සමඟ ඇතිවිය හැකි ගැටලු නිරාකරණය කිරීම යන කලින් කලට විවිධ කරුණු පෙරමුණ කරගනිමින් අවශ්‍යතා සැපිරෙන පරිදි ඉදිරි වෙනස් වීම් වලට වැඩි නම්‍යතාවයක් සහිතව මෙම සංවර්ධන සැලැස්ම සම්පාදනය කරන ලදී.

කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම ඉදිරි දැක්ම කෙරෙහි වැඩි නම්‍යතාවයක් දක්වමින් සංවර්ධනයේ දිශානතිය, බලාත්මක යාන්ත්‍රණය , සංවර්ධන කලාප හා රෙගුලාසි, සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි, සංවර්ධන නිෂ්කාශන ක්‍රියාවලිය යන නීතිමය පැතිකඩ සකස් වී ඇත. එමෙන්ම මතුවිය හැකි තත්වයන්ට අනුව සංවර්ධන සැලැස්මේ දැක්ම හා පරමාර්ථ අන්තර්ගතයට දායකත්වයක් සැපයිය හැකි පරිදි උපායාත්මක යෝජනා ක්‍රියාත්මක කිරීමට පෙර ඒවායේ ආර්ථික හා තාක්ෂණමය ශක්‍යතාව සම්බන්ධ සවිස්තරාත්මක විධිමත් අගය කිරීමේ ක්‍රමවේදයන්ට යටත් විය යුතුය.

කෙසේ වුවද කඩුවෙල සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පවතින නීතිමය ප්‍රතිපාදන, ආයතනික රාමුව සහ පරිපාලන පහසුකම් මත පදනම්ව ඇති බව සඳහන් කල යුතුය.

### 1.4. සැලසුම් ක්‍රියාවලිය

කඩුවෙල සංවර්ධන සැලැස්ම, 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනතේ දක්වා ඇති සැලසුම් කිරීමේ කාර්යය පටිපාටියට අනුව, රට අනුගත වෙමින් උපායාත්මක සැලසුම්කරණ ප්‍රවේශය මත සකස් කර ඇත. සැලසුම් ක්‍රියාවලිය, නිර්මාණ ක්‍රියාවලිය හා විවිධ අවස්ථාවන් වලදී ගෙන හැර දැක්වීමේ මුලධර්ම අනුව 2019-2030 අගනගර සැලැස්ම සකස් කොට ඇති අතර, මෙම 2023 -2033 කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම, අගනගර සැලැස්මේ ඇති ක්‍රමවේදයන්ද උකහා ගනිමින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම උදෙසා සැලසුම්කරණයට පහසු හා නම්‍යශීලී ක්‍රමවේදයක් ඔස්සේ යමින් සම්ප්‍රදායික සැලසුම් ක්‍රියාවලියෙන් බැහැර වූ නව ක්‍රමවේදයක් අනුගමනය කර පිළියෙළ කිරීම සිදු කර ඇත.

ඝනත්වය මත පදනම් වූ කලාපීය සැලැස්ම සහ සංවර්ධන නියමතා සකස් කිරීමෙන් අනතුරුව පොදු මහජනතාව, පාර්ශවකරුවන් සහ කඩුවෙල මහ නගර සභාවෙහි දින 60ක කාල සීමාවක් අදහස් දැක්වීම් අනුව සංශෝධන කර අවසන් කල සැලසුම් කෙටුම්පත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව මගින් අනුමැතිය ලබා ගන්නා ලදී.

***රූප සටහන 1.1: සැලසුම් ක්‍රියාවලිය***



### 1.4.1 පසුබිම් අධ්‍යයනය

සැලසුම් ක්‍රියාවලියේ ආරම්භය වන මෙම අවස්ථාවේදී ප්‍රාථමික හා ද්විතීක දත්ත රැස්කිරීම මගින් සැලසුම් ප්‍රදේශය අවබෝධ කරගැනීම සිදුවේ. විවිධ පාර්ශවකරුවන් සමග සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා, කාර්යාල දත්ත, අන්තර්ජාලය, ගූගල් සිතියම්, ලේඛන පරිශීලනය මගින් දත්ත රැස්කිරීම සිදු කරන ලදී. මෙහිදී මූලික අධ්‍යයනයන් හා දත්ත විශ්ලේෂණය සිදු කරනු ලැබූ අතර එහිදී භූගෝලීය වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන්ද කඩුවෙල ප්‍රදේශයේ ඇති වැදගත්කම, කලාපීය සබදතා හඳුනා ගැනීම, ආර්ථික, සමාජයීය, පාරිසරික හා භෞතික අංශ ආවරණය වන පරිදි ප්‍රාථමික අධ්‍යනයන් සිදුකර මෙම ප්‍රදේශය පිළිබද මනා අවබෝධයක් ලබා ගැනීම සිදු කර ඇත.

### 1.4.2 විෂය පථය

අතීත, වර්තමාන හා අනාගත සංවර්ධන හමුවේ ප්‍රතිපත්ති, රෙගුලාසි හා නව ව්‍යාපෘති විශ්ලේෂණයෙහි ප්‍රතිපලයක් ලෙස නව සැලැස්ම සම්පාදනය කිරීමේ අවකාශය මෙමගින් පැහැදිලි කෙරේ. මෙහිදී පසුබිම් අධ්‍යයනය මගින් ලබාගත් ප්‍රාථමික හා ද්විතීක දත්ත, දත්ත විශ්ලේෂණයට යොමුකර සංවර්ධන සැලැස්ම යොමුවිය යුතු දිශාව හඳුනා ගැනීම මෙමගින් සිදුකරයි. ඒ අනුව, සමස්ථ සංවර්ධන සැලැස්මෙහි ඉදිරි කාලීන දිශානතිය මෙමගින් විස්තර කරනු ඇත.

### 1.4.3 ගැටළු හා විභවතාවයන් හඳුනා ගැනීම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුල පසුබිම් අධ්‍යයනය කිරීම හරහා ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය සම්බන්ධව ලබා ගන්නා අවබෝධය තුලින් සංවර්ධන සැලැස්මක් සැකසීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සිදු කරන ලදි. විවිධ අංශයන්හි නියුතු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් විවිධ වැඩමුළු, සාකච්ඡා හරහා ලබා ගන්නා ලද අදහස් හා යෝජනා සමඟ දත්ත විශ්ලේෂණය කිරීම තුළින්, හඳුනාගත් ගැටළු අතර ගැටළුවේ සන්දර්භය, එහි විශාලත්වය, සාපේක්ෂ බලපෑම යන කරුණු අධ්‍යයනයෙන් ප්‍රමුඛතා කරගත් ගැටළු හා විභවතා හඳුනා ගැනීම සිදු කර ඇත.

ඒ අනුව කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මෙහි පාර්ශවකරුවන්ගේ හමුව, 2022 ඔක්තෝම්බර් මස 18 වන දින පවත්වන ලද අතර ඒ තුළින් ප්‍රදේශයෙහි ගැටළු හා විභවතා සවිස්තරාත්මකව හඳුනා ගැනීම සිදු කරන ලදී. ඒ සදහා නාගරික සංවර්ධන අධිකාරියේ උපාය මාර්ගික සැලසුම් අංශයේ සහය ලබා ගන්නා ලද අතර එම අංශය මගින් සිදු කරන ලද NVIVO දත්ත විශ්ලේෂණ ක්‍රමය මගින් ද හදුනාගත් ගැටළු හා විභවතා තහවුරු කර ගැනීම සිදු කරන ලදී.

### 1.4.4 දැක්ම හා අරමුණු

ශ්‍රී ලංකාවේ අගනගරයෙහි පිහිටි ප්‍රධාන නගරයක් ලෙස හදුනාගන්නා ලද කඩුවෙල ප්‍රදේශයේ ගැටළු, විභවතා හා සංවර්ධන ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් සැලැස්මේ සංවර්ධන දැක්ම ගොඩ නැගීම සිදුකරන අතරම එම දැක්ම මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය අරමුණු හා පරමාර්ථ ගොඩනැංවීම මෙමගින් විස්තර කරනු ඇත.

කඩුවෙල නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033 "**ශ්‍රී ලංකා ස්වෛරීත්ව කිරුළේ බලවත්ම කේන්ද්‍රස්ථානය** " යන දස අවුරුදු දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රදේශයෙහි පවතින ගැටළු හා විභවතාවයන් ප්‍රමුඛ කරගත් අරමුණු හතරකින් යුක්තව මෙම සැලැස්ම සකස් කර ඇත.

### 1.4.5 විස්තරාත්මක විශ්ලේෂණය

මෙහිදී අරමුණු නිර්මාණය කිරීම පෙරදැරි කරගනිමින් දත්ත විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබයි. විශේෂයෙන්ම ප්‍රදේශයෙහි ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික රටාවන් දත්තයන් බවට පරිවර්තනය කරගනිමින් භූගෝලීය දත්ත පද්ධති (GIS) මෘදුකාංගය හරහා විශ්ලේෂණය කර ඇත.

ප්‍රදේශයෙහි සංවේදී කලාපයන්, සංවර්ධන විභවතාවයන්, සංවර්ධන දිශාවන් හදුනා ගැනීම බහු විශ්ලේෂණය තුළින් සිදු කර ඇත. එමෙන්ම, සංවේදීතා විශ්ලේෂණය, ජීව අවකාශ විශ්ලේෂණය, කලාපීය සම්බන්ධතාවයන්, ශ.දු.අ.ත. විශ්ලේෂණය, අවකාශීය සැලසුම් ජාල විශ්ලේෂණය යන විශ්ලේෂණ හරහා මෙම දත්ත විශ්ලේෂණය කර ඇත.

### 1.4.6 සැලසුම් සහ උපායමාර්ග

සැලැස්ම ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනුයේ පරමාර්ථ වෙනුවෙන් නිර්මාණය කරන ලද උපායමාර්ග මගිනි. මෙහිදී උපාය මාර්ග, භූමි පරිහරණ රටාව ට අනුව සැලසුම් කිරීම, ඊට අදාල වූ අපරවුහ පහසුකම් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා තිරසාර පරිසර සංවර්ධනය, නගර නිර්මාණය යන උපායමාර්ගයන් ගෙන් ද නියාමනය හා ප්‍රවර්ධන අනුකූල උපදෙස් මාලාවකින් ද සුවිශේෂී ව්‍යාපෘති වලින්ද සමන්විතය.

ඒ අනුව එකී යෝජිත සැලසුම් හා උපායමාර්ග සදහා අවසන් අදහස් හා යෝජනා ලබා ගැනීම විවිධ අංශයන් නියෝජනය වන පරිදි පාර්ශව ආයතන සෘජුවම සම්බන්ධ කර ගනිමින් 2022 වර්ෂයේ ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාසයන් හිදී සිදු කරන ලදී.

### 1.4.7 සැලසුම් නියමතා/ රෙගුලාසි

සැලසුම් ප්‍රදේශය නියාමනය කිරීම හා දිශානුගත කිරීම සඳහා කලාපීකරණ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි විෂය පථ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලක් යොමු කරන ලදි. එහිදී ඉඩම් සංවර්ධනය සම්බන්ධ නීති රීති, පාරිසරික සංවේදී ප්‍රදේශ සංවර්ධනය කිරීමට අවශ්‍ය නීති රීති මෙන්ම සංවර්ධන සැලැස්ම සාර්ථක කරගැනීමේදී උද්ගත විය හැකි ගැටලුකාරී තත්ත්ව මග හරවා ගැනීම සදහාද රෙගුලාසි සකස් වේ.

### 1.4.8 අදහස් ලබා ගැනීම

විවිධ වැඩසටහන් පැවැත්වීම මගින් සංවර්ධන සැලැස්ම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ අදහස්, යෝජනා, විරෝධතා හා සංශෝධන ලබා ගැනීමට කටයුතු කරනු ලැබූ අතර එහිදී 2023 වර්ෂයේ ජුනි මස 14 වන දින කඩුවෙල මහනගර සභාව වෙත යෝජිත සැලැස්ම හා සැලසුම් නියමතා ඉදිරිපත් කරන ලද අතර එම මස 19 වන දින කඩුවෙල සම්බන්ධීකරණ කමිටුව වෙත ද ඉදිරිපත් කරන ලදී. ඒ අනුව එදින සිට මහජන දැනුවත් කිරීම උදෙසා සැලැස්ම දින 60 ක කාල සීමාවක් කඩුවෙල මහ නගර සභාව තුළ තබන ලදී.

අනතුරුව නාගරික සංවර්ධන අධිකාරියේ වෘත්තීයවේදීන් වෙත 2023 වර්ෂයේ ජුලි මස 19 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් උප කමිටුව හරහා සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම සිදු කරන ලද අතර එමගින් අධිකාරියේ නිලධාරීන්ගේ අවසන් අදහස් හා යෝජනා ලබා ගැනීමත් සිදු කරන ලදී.

### 1.4.9 දළ සැලසුම් වාර්තාව භාර දීම.

කඩුවෙල මහ නගර සභාවේ අදහස් හා යෝජනාවන් , නාගරික සංවර්ධන අධිකාරියේ වෘත්තීයවේදීන්ගෙන් ලබා ගත් අදහස් හා යෝජනාවන්, පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනාවන් ඇතුළත්ව පිළියෙල කරන ලද කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033 නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම 2023 වර්ෂයේ ඔක්තෝම්බර් මස 31 වන දින සිදු කරන ලදී.

අනතුරුව ප්‍රධාන සැලසුම් කමිටුවේ අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගෙන මෙම කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදුකොට ඇත.

### 1.4.10 අනුමැතිය හා ප්‍රකාශයට පත්කිරීම

මෙය ප්‍රධාන ක්‍රියාවලි කිහිපයක් යටතේ සිදු කර ඇත. ඒ අනුව,

- ✓ ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම
- ✓ සැලැස්ම ත්‍රෙයි භාෂා වලට පරිවර්තනය කිරීම
- ✓ කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- ✓ විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
- ✓ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම
- ✓ පුවත්පත් මඟින් මහජනතාව දැනුවත් කිරීම

# දෙවන පරිච්ඡේදය

# මූලික අධ්‍යයනය

# දෙවන පරිච්ඡේදය

# මූලික අධ්‍යයනය

**2.1 අධ්‍යයන ප්‍රදේශය**

කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා බල ප්‍රදේශය, මහරගම නගර සභා බල ප්‍රදේශය සහ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රදේශීය සභා බල ප්‍රදේශය යන පළාත් පාලන බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වූ ශ්‍රී ජයවර්ධනපුර අගනගර සංවර්ධන සැලැස්මේ සැලැස්මෙහි සැලසුම් බල ප්‍රදේශය, මෙම සැලස්මෙහි අධ්‍යයන ප්‍රදේශය වේ. එය බස්නාහිර පළාත තුළ කොළඹ දිස්ත්‍රික්කයෙහි වර්ග කිලෝමීටර් 165.14 ක පමණ භූමි ප්‍රමාණයක පැතිරී ඇත.

කැළණි ගංගා මිටියාවතේ සාරවත් භූමියක් හිමි එම ප්‍රදේශයට උතුරින්, කැළණි ගඟින්ද බටහිරින්, කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයෙන්ද, දකුණු දෙසින්, බොරලැස්ගමුව නගර සභා බල ප්‍රදේශය ද නැගෙනහිරින්, හෝමාගම හා සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් ද මායිම් වේ.

මෙරට අගනගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මෙම ප්‍රදේශය තුළ පිහිටීම, මෙම ප්‍රදේශයෙහි වැදගත්කම වඩාත් තීව්‍ර කරනු ලබයි. එසේම මෙම ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 138 කින් යුක්ත වන අතර, එයින් 57 ක් කඩුවෙල මහනගර බල ප්‍රදේශය තුළ ද 20 ක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා ප්‍රදේශය තුළද 31 ක් මහරගම නගර සභා බල ප්‍රදේශය තුළද 20 ක් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළද පිහිටා ඇත.

සිතියම් අංක 2.1 න් කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි අධ්‍යයන ප්‍රදේශය පැහැදිලි කෙරේ.

**සිතියම් අංක 2.1: කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි අධ්‍යයන ප්‍රදේශය**




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

### 2.2. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

#### 2.2.1. හැඳින්වීම

කඩුවෙල සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී කඩුවෙල නගරයේ ස්ථානීය පිහිටීම හා භෞතික මායිම් පිළිබදව මූලිකවම අධ්‍යයනය කරන ලද අතර, අනතුරුව එහි ක්‍රියාකාරී සීමාව, භූගෝලීය සීමාව සහ පරිපාලන සීමාව පිළිබඳව අවධානය යොමු කරන ලදී.

#### 2.2.2. ක්‍රියාකාරී සීමාව

සංවර්ධන සැලැස්මෙහි ක්‍රියාකාරී සීමාව අධ්‍යයනය කිරීමේදී එය අධ්‍යයන ප්‍රදේශයෙන් ඔබ්බට විහිදී යාමක් හදුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ අගනගරය වන ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, සංවර්ධන සැලැස්මෙහි අධ්‍යයන ප්‍රදේශය තුළ පිහිටා තිබෙන අතර ශ්‍රී ලංකාවේ පරිපාලන නගරය වන බත්තරමුල්ල, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි තිබීම හේතුවෙන් මෙම ,ප්‍රදේශයෙහි නේවාසික ජනගහනයට අමතරව සංසරණ ජනගහනය ද සාපේක්ෂව ඉහල මට්ටමක පවතී. නොයෙකුත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ඉලක්ක කරගනිමින් ඒවායෙහි සේවාවන් ලබා ගැනීම සඳහා රටෙහි සෑම ප්‍රදේශයකම ජනතාව මෙම ප්‍රදේශයට ඒකරාශී වීමක් දක්නට ලැබේ. කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ එම ජන සංසරණය අධ්‍යයන ප්‍රදේශය තුළ පවතින අනෙකුත් පළාත් පාලන බල ප්‍රදේශයන්ට සාපේක්ෂව ඉහළ අගයක් උසුලනු ලබයි.

බත්තරමුල්ල, කඩුවෙල, මාලබේ, සහ අතුරුගිරිය කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන වන අතර මහරගම, කොට්ටාව, රාජගිරිය, නුගේගොඩ, අංගොඩ, බියගම ආදී නගර සමග කඩුවෙල ප්‍රදේශය ඍජු සමාජ, ආර්ථික සම්බන්ධතාවයක් පවත්වා ගෙන යනු ලබයි.

කඩුවෙල නගරය අන්තර් පළාත් හා සම්බන්ධ ප්‍රධාන බස්නැවතුම්පල කේන්ද්‍ර කරගනිමින් සහ ප්‍රදේශයේ වාණිජ මධ්‍යස්ථාන ඉලක්ක කරගනිමින්, පරණ අවිස්සාවේල්ල මාර්ගය ඔස්සේ ව්‍යාප්තව ඇත. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ විශ්ව විද්‍යාල රැසක් පිහිටා ඇති මාලබේ නගරයට ද එහි අධ්‍යාපනය ලබාගැනිම සඳහා දිනපතා විශාල පිරිසක් ආකර්ශණය වේ.

සමස්ත අධ්‍යයන ප්‍රදේශයෙහිම සවිමත් මහා මාර්ග පද්දතියක් පවතින අතරම විශේෂයෙන්ම කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය මහා මාර්ග මෙන්ම අධිවේගී මාර්ග ඔස්සේ ශක්තිමත් මාර්ග සම්බන්ධතාවයකින් පර්යන්ත නගර සමග මනා අන්තර් සම්බන්ධතාවයක් පවත්වා ගනියි.

ඉහතින් සදහන් කල ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාව තාක්ෂණික විශ්ලේෂණයන් ඔස්සේ තවදුරටත් තහවුරු කරගන්නා ලදී. මේ අනුව ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය (Development Pressure) පිළිබඳව සළකා ලබන විට එය ප්‍රධාන නගර කේන්ද්‍ර කරගනිමින් සහ ප්‍රධාන මාර්ග ඔස්සේ පර්යන්ත ප්‍රදේශ කරා ඇදී යන බව හඳුනාගත හැකිය. ඇමුණුම අංක 01 න් ප්‍රදේශයේ සංවර්ධන තීව්‍රතාවය පැහැදිලි කෙරේ.

එමෙන්ම ඉඩම් වටිනාකම විශ්ලේෂණය (Land Value Analysis), නේවාසික ඉඩම් වටිනාකම සහ වාණිජ ඉඩම් වටිනාකම යන අංශ දෙක යටතේ සිදුකරන ලදී. සමස්ත අධ්‍යයන ප්‍රදේශයෙහිම නාගරික ප්‍රදේශ ආශ්‍රිතව ඉහළ ඉඩම් වටිනාකමක් දක්නට ලැබෙන අතරම බත්තරමුල්ල, පැලවත්ත, කොස්වත්ත, මාලබේ, අතුරුගිරිය යන නගර කේන්ද්‍ර කරගනිමින් සහ ප්‍රධාන මාර්ග ඔස්සේ ද ඉහළ ඉඩම් වටිනාකමක් හඳුනාගත හැකිය. ඇමුණුම් අංක 02 න් ප්‍රදේශයේ ඉඩම් වටිනාකම විශ්ලේෂණය පැහැදිලි කෙරේ.

ජන සංකේන්ද්‍රණ ලක්ෂණ විශ්ලේෂණයේ දී අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව අධි ජන ඝනත්වයක් බත්තරමුල්ල, පැලවත්ත, සහ මාලබේ ප්‍රදේශයන් හි හඳුනාගත හැකි වුවත්, 2020 වර්ෂයේ ජන විද්‍යාත්මක දත්ත අනුව එය මධ්‍ය වාණිජ කේන්ද්‍රයෙන් ඔබ්බට විහිදී යන බවක් හඳුනාගත හැකිය.
එබැවින්, හඳුනාගත් දත්ත සහ විශ්ලේෂණ මඟින් තහවුරු කරගත් දත්ත පදනම් කර ගනිමින් ක්‍රියාකාරී සීමාව (Functional Boundary) නිර්ණය කිරීමේදී, සමස්ත කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයම සැලකිල්ලට ගන්නා ලදී.

#### 2.2.3. භූගෝලීය සීමාව

වර්ග කි.මී. 87.7 ක් වැනි විශාල භූමි භාගයක පැතිරී ඇති කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා කඩුවෙල ඡන්ද කොට්ඨාශය එකම භෞතික සීමාවකින් සමන්විත වේ.
උතුරින් කැළණි ගඟට ද, නැගෙනහිරින් නාකඩමුල්ල ඇළ හා දීගලදෙණිය පිට ඇළටද, දකුණින් පුවක්ගහදෙණිය යාය මැද ඇළ, බණ්ඩාරදෙණිය පිට ඇළ, ඕවිටිවෙල මැද ඇළ, පිට අමුණු යාය, පිට ඇළ හා අන්කුටුයායට ද, බටහිරින් ජපන් මිත්‍රත්ව මාර්ගයට, දියවන්නා ඔය හා දියවන්නා වගුරට ද, භෞතික වශයෙන් මායිම් වේ.
කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සමස්ත භූ විෂමතාවය පිළිබද සලකා බැලීමේදී ප්‍රදේශයේ උතුරු මායිමේ දී අඩු උන්නතාංශයක් සහ දකුණු මායිමේ දී ඉහළ උන්නතාංශයක් හඳුනාගත හැකිය. සාමාන්‍ය උන්නතාංශය මුහුදු මට්ටමේ සිට මීටර් 5 ක් පමණ වන අතර, එම උන්නතාංශය ප්‍රදේශයේ වගුරු බිම්, කුඹුරු ප්‍රදේශයන් හි දක්නට ලැබේ. උපරිම උන්නතාංශය මීටර් 115 ක් පමණ වන අතර, එම උන්නතාංශය කොරතොට නවගමුව ප්‍රදේශය ආශ්‍රිතව වාර්තා වේ.

තවද කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි බොහොමයක් ප්‍රදේශ ජනාකීර්ණ වුවද, කොරතොට දැඩිගමුව ප්‍රදේශය හි රක්ෂිත ප්‍රදේශ හඳුනාගත හැකි අතරම සමස්ත ප්‍රදේශය පුරා විහිදුණු කුඹුරු හා වගුරු බිම් ප්‍රදේශයන් දක්නට ලැබේ.

මෙකී භූගෝලීය ලක්ෂණ සහ විශ්ලේෂණ වලින් තහවුරු කරගත් දත්ත පදනම් කරගනිමින් සමස්ත කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයම භූගෝලීය සීමාව ලෙස සැලකිල්ලට ගන්නා ලදී.

#### 2.2.4. පරිපාලන සීමාව

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා කඩුවෙල ඡන්ද කොට්ඨාශය යන එකම භෞතික සීමාවකින් සමන්විත, ග්‍රාම නිළධාරී කොට්ඨාශ 57කින් යුතු කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය, කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි පරිපාලන සීමාව ලෙස හඳුනාගන්නා ලදී.

### 2.2.5. සැලසුම් සීමාව

සැලසුම් ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාව, භූගෝලීය සීමාව හා පරිපාලන සීමාව එකම ප්‍රදේශයක් මත පදනම් කර ගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය සැලසුම් සීමාව ලෙස යොදා ගන්නා ලදි.

තවද, කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි අධ්‍යයන ප්‍රදේශය ලෙස හඳුනාගන්නා ලද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා බල ප්‍රදේශය, මහරගම නගර සභා බල ප්‍රදේශය සඳහා වෙන් වෙන් වශයෙන් සංවර්ධන සැලසුම් සකස් කර 2022 වර්ෂයේ දී ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබීමත් සහ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලසුමක් මේ වන විට සකස් කරගෙන තිබීම හේතුවෙන් මෙකී සංවර්ධන සැලැස්මෙහි සැලසුම් සීමාව ලෙස කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය හඳුනාගන්නා ලදී.

කැළණි ගංගා මිටියාවතේ සාරවත් භූමියක් හිමි කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයට උතුරින් ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම ප්‍රාදේශීය සභාවට සහ දොම්පේ ප්‍රාදේශීය සභාවට ද, දකුණින් කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම නගර සභාවට ද, නැගෙනහිරින් හෝමාගම ප්‍රාදේශීය සභාවට ද, බස්නාහිරින් කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවට ද හා කෝට්ටේ මහ නගර සභාවට ද මායිම්ව පිහිටා ඇත.

කොළඹ වාණිජ නගරයට ආසන්නව පිහිටා ඇති කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය තුල බත්තරමුල්ල පරිපාලන නගරය හා කඩුවෙල, මාලබේ සහ අතුරුගිරිය යන ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන පිහිටා ඇත.

ඒ අනුව, සැලසුම් සීමාව වන කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, ග්‍රාම නිලධාරී වසම් 57 කින් සමන්විතව ඇත. මෙම ප්‍රදේශයට බොරැල්ල සිට පැමිණෙන විට පාර්ලිමේන්තු මාර්ගය ඔස්සේ බත්තරමුල්ල හරහා 177 බස් මාර්ගය මගින් ද, පරණ අවිස්සාවේල්ල පාර ඔස්සේ වැලිවිට ග්‍රාම නිලධාරී කොට්ඨාසය හරහා 143 බස් මාර්ගය මගින් ද, දකුණු දිශාවෙන් කොට්ටාව - තලවතුගොඩ හරහා 174 බස් මාර්ගය මගින් ද, ගොඩගම සිට පැමිණෙන විට අතුරුගිරිය හරහා 190 බස් මාර්ගය මගින් ද, කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙන් ද, උතුරින් කැළණි ගඟ හරහා කඩුවෙල පාලම ඔස්සේ හෝ ඔරු මගින් රණාල, නවගමුව හරහා ප්‍රවේශ වීමට හැකියාව ඇත.

සිතියම් අංක 2.2 න් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ස්ථානීය පිහිටීම සහ සිතියම් අංක 2.3 න් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සැලසුම් සීමාව පැහැදිලි කෙරේ.

**සිතියම් අංක 2.2: කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයෙහි ස්ථානීය පිහිටීම**



සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

**සිතියම් අංක 2.3: කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයෙහි සැලසුම් සීමාව**



සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

## 2.3. සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය විශ්ලේෂණය කිරීමේදී, එහි වර්තමාන තත්වය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ යටතේ හදුනා ගනු ලැබූ අතර, ඓතිහාසික විකාශනය හා පූර්ව සැලසුම් ප්‍රයත්න මගින් කඩුවෙල නගරය ජාතික, කලාපයීය හා ප්‍රදේශීය වශයෙන් ස්ථාන ගත කිරීම යන කරුණු පිලිබදව මෙම පරිච්ඡේදය මගින් විස්තර කෙරේ.

### 2.3.1. ඓතිහාසික පසුබිම හා විකාශනය

#### 2.3.1.1. ජනප්‍රවාද හා බැදුණු නාම විකාශනය

අතීත ජනප්‍රවාද වලට අනුව කඩුවෙල මුලින්ම හඳුන්වා ඇත්තේ “කඩුදෙවොල” හෙවත් පත්තිනි දේවියන්ගේ වාසස්ථානය ලෙසිනි. තවදුරටත් ඉතිහාස කථාපුවත් වල විස්තර වන ආකාරයට පත්තිනි දේවියන්ගේ දේවාලයේ දිය කැපීමේ චාරිත්‍රය සඳහා භාවිතා කරන ලද රන් කඩුව මුලාශ්‍ර කරගනිමින් "පුරාණ රන්කඩු පත්තිනි මහා දේවාලය" පිහිටීම හේතුවෙන් මෙම ප්‍රදේශය කඩුවෙල ලෙස ජනප්‍රවාදයේ විකාශනය වූ බවයි.

තවද, අතීත ජනප්‍රවාද වලට අනුව හෝකන්දර ප්‍රදේශයෙන් ගෙන එන ලද යපස් ආයුධ බවට පත් කර කොරතොට රජමහා විහාරයේ සිට කැලණි ගඟ දක්වා උමං මාර්ගයක් ඉදිකරන ආකාරයට හමුදාව සංවිධානය කර තිබුණු බවත්, මෙම මෙහෙයුමේදී හැඩිදැඩි මිනිසුන් හමුවූ ප්‍රදේශය තකගමුව බවත් ජනප්‍රවාදයේ පැවසේ. තවද යුද්ධයට ලැදි මිනිසුන් සිටි ප්‍රදේශය රණාල නමින්ද, රණ කෙළිය පුහුණු වූ ප්‍රදේශය කෙලිතොට නමින්ද පසුකල එය කොරතොට ලෙසන්ද, යාපස් හෝ හකෙන් ගෙන ආ ප්‍රදේශය හෝකන්දර නමින්ද ජනප්‍රවාදයේ සදහන් වේ.

#### 2.3.1.2 ඉතිහාසය හා ඓතිහාසික වැදගත්කම

කඩුවෙල ප්‍රදේශයේ ජනාවාස ආරම්භය පිළිබඳව නිවැරදි කාල පරිච්ඡේදයන් ඉදිරිපත් කිරීමට අපහසු වුවද පුරාවිද්‍යා සාක්ෂි වලට අනුව, කොරතොට රජ මහා විහාරය, නවගමුව පත්තිනි දේවාලය, කඩුවෙල රන්කඩු පත්තිනි දේවාලය වැනි ඓතිහාසික වැදගත්කමකින් යුතු ස්ථාන පිලිබදව ජනප්‍රවාදයේ තොරතුරු වාර්තා වේ. මහනුවර යුගයේ ලිඛිත සාක්ෂි අනුව මෙය කෙසෙල්බටුවාව නමින් හඳුන්වා ඇත. සීතාවක රාජසිංහ රජතුමා (1581-1597) පෘතුගීසීන් සමග කළ සටනේදී කොරතොට මෙන්ම මුල්ලේරියාව, කඩුවෙල, අතුරුගිරිය හා හෝකන්දර යුධමය අතින් වැදගත් ස්ථානයන් ලෙස දක්වා ඇත. මෙම විහාරස්ථානයට යාබදව පිහිටි කඳුගැටය බැලුම්ගල නමින් ප්‍රසිද්ධයක් උසුලන අතර රාජසිංහ රජුගේ භේවායන් කොළඹ සිට පැමිණෙන පෘතුගීසි සේනා ගැන ඔත්තු බැලුවේ මෙම කඳු ගැටයේ සිට බවට සාක්ෂි ජනප්‍රවාදයේ තොරතුරු ඇත. එසේම කොරතොට විහාරයේ ලෙන් ලිපිය අනුව එය ක්‍රි.පූ. 2 වන සියවසට අයිති බව සෙනරත් පරණවිතාන මහතා විසින් සඳහන් කර ඇත.

පත්තිනි දෙවියන්ගේ කේන්ද්‍රස්ථානය නවගමුවයි. ජනප්‍රවාදයට අනුව අනුරාධපුර රාජධානිය සමයේ පළමු වන ගජබා රජුගේ පියාණන් වන වංකනාසිංහතිස්ස රජුගේ කාලයේ සොළී රටින් පැමිණි ආක්‍රමණිකයින් විසින් ලාංකිකයන් 1200 ක් පමණ පිරිසක් එම රටට රැගෙන ගොස් ඇත. එයට හිලවු ලෙස පළමු වන ගජබා රජු විසින් එරටින් 2400 ක පමණ පිරිසක්ද සමඟ ඔවුන් වටිනා වස්තුවක් ලෙස සැලකූ පත්තිනි දෙවියන්ගේ රන් සළඹ හා පත්තිනි කතාව ඇතුළත් දෙමළ පොතක්ද රැගෙන පැමිණි බවට තොරතුරු

වාර්තා වේ. එසේ රුවල් නැවකින් ලංකාවට පැමිණෙන අවස්ථාවේදී, ඔවුන් දරුණු කුණාටුවකට හසුව කැලණි ගඟ ඔස්සේ පැමිණ නවගමුවට ගොඩබසින ලද බව සඳහන් වේ. පසුදා පත්තිනි දෙවියන්ගේ රන් සළඹ අනුරාධපුරයට රැගෙන යාමේ බලාපොරොත්තුවෙන් කැලණි ගඟ අසබඩ නා ගස් සමූහයක් පිහිටි ස්ථානයේ පූජාසනයක් කරවා එහි රන් සළඹ තැන්පත් කළ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ . පසුදා රන් සළඹ රැගෙන යාමට සැරසෙන අවස්ථාවේ දී විශාල නාගයන් සත් දෙනෙකු සළඹ වට කරගෙන සිටිනු දුටු රජතුමා ඇතුළු පිරිස එම ස්ථානයේ දේවාලයක් කරවිය යුතු බව සිතා, පසුව එම ස්ථානයේ නවගමුව පත්තිනි දේවාලය කරවූ බව ජනප්‍රවාදයේ වැඩිදුරටත් සඳහන් වේ.

මෙම සාධක අනුව ක්‍රි.පූ 2 වන සියවසට පෙර සිට කඩුවෙල ප්‍රදේශය ජනාවාසව පැවති බව කිව හැකිය. 1521-1593 කාලයේදී කෝට්ටේ රාජධානිය පාලනය කළ මායාදුන්නේ රජු හා පළමුවන රාජසිංහ රජු සමයේ දී මෙම ප්‍රදේශය ජනාකීර්ණ වන්නට පටන්ගත් බව සැලකේ. ඓතිහාසික සාක්ෂි අනුව සුප්‍රකට මුල්ලේරියා සටන ඇති වූ මුල්ලේරියා මිටියාවතද මෙහිදී ඓතිහාසික වැදගත්කමක් දක්වයි**.**

ඉතිහාස වාර්තා වලට අනුව පසුකාලීනව මෙම ප්‍රදේශය බ්‍රිතාන්‍ය ආධිපත්‍යයට නතු වූ අතර ඉංග්‍රීසි පාලන සමයේදී කඩුවෙල නගරය නාගරික, කලාපීය හා ජාතික වශයෙන් වැදගත් ස්ථානයක් අත්කර ගන්නට සමත් වී ඇත.

රූපය 2.1 : නවගමුව පත්තිනි දේවාලය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

රූපය 2.2 : නවගමුව රන්කඩු පත්තිනි දේවාලය




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

රූපය 2.3 : කොරතොට රජ මහා විහාරය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

### 2.3.1.3 නගර සීමාවන්හි ක්‍රමික විකාශනය හා කඩුවෙල පරිපාලනමය තත්වය

කඩුවෙල ප්‍රදේශයේ පරිපාලනමය ඉතිහාසය පිලිබද සලකා බැලීමේ දී, කඩුවෙලඅතුරුගිරිය , ගම් සභා වශයෙනුත් බත්තරමුල්ල සුළු නගර සභාව යටතේ ද වසර දක්වා 1988පරිපාලනය වී ඇත .1988 වසරේ දී අතුරුගිරිය කඩුවෙල සහ ,බත්තරමුල්ල යන පරිපාලන ඒකක ඒකාබද්ධ කරමින් කඩුවෙල ප්‍රාදේශීය සභාව පිහිටුවන ලද අතර අනතුරුව201 එම ප්‍රදේශය වර්ෂ ,0 පෙබරවාරි මස 02 දින අංක 11/1639දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මඟින් කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතරදින 01 අගෝස්තු මස 2011 සිට කඩුවෙල මහනගර සභාවෙහි ධුර කාලය ආරම්භක දිනය ලෙස 2011 වන දිනැති 30 ජුලි මසඅංක 30/1716 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

එසේම, වර්ෂ 1979 ඔක්තෝම්බර් මස 01 වන දින අංක 56/6 දරණ ගැසට් පත්‍රය මඟින් කොළඹ දිස්ත්‍රික්කය තුළ හේවාගම් කෝරළේ බටහිර පල්ලේ පත්තුවට අදාළව - කඩුවෙල ගම් සභා ප්‍රදේශයද, අතුරුගිරිය ගම් සභා ප්‍රදේශයද නාගරික සංවර්ධන අධිකාරී බලප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

### 2.3.1.4 කඩුවෙල නගරයේ සැලසුම් ඉතිහාසය

#### 2.3.1.4.1 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම - 1982

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම, අගනගර ලක්ෂණය අවධාරණය කල ප්‍රථම හා එකම සැලසුම් ප්‍රයත්නය විය. මෙම සංවර්ධන සැලස්ම මගින්, සැලසුම්ගත නොවුන නාගරික වර්ධනය නිසා මතු වූ පරිසර දූෂණය, තදබදය සහ සංවර්ධන සඳහා ඉඩම් ලබා ගැනීම වැනි ගැටළු සදහා විසදුම් යෝජනා සකස් කිරීම සිදුවිය.

මෙම සැලැස්මේ මූලික අරමුණ වූයේ එවකට පැවති කෝට්ටේ මහ නගර සභාව (UC), කොළොන්නාව නගර සභාව (UC) , කොටිකාවත්ත , මුල්ලේරියාව, බත්තරමුල්ල හා මහරගම නගර සභා (TC) කඩුවෙල, අතුරුගිරිය, කෝට්ටේ - ගල්කිස්ස, මාම්පේ - කැස්බෑව යන ගම් සභා (VC) , ප්‍රදේශයන්ගෙන් ආවරණය වන හෙක්ටයාර 4374 කින් යුත් ප්‍රදේශයන් ඇතුලත් ප්‍රදේශය ලෙස අගනුවර ලෙස ස්ථාපිත කිරීමයි.

වඩාත් සුදුසු පරිපාලන නගර සංවර්ධනයක් සඳහා **ශ්‍රී** ජයවර්ධනපුර අගනගර සංවර්ධන සැලැස්ම විස්තරාත්මක නිර්මාණ රටා, භූ දර්ශනකරණය, අපරවෘහ පහසුකම් සැපයීම, පරිපාලන හා ආර්ථික විෂයපථ කැටි කර ගත්තකි. සැලැස්මේ නිරූපිත සවිස්තරාත්මක භූදර්ශන අලංකරණය දේශීය උද්‍යාන ඔස්සේ ඉදිකරන ලද ජල මාර්ග හා හරිත තීරයන්, ජලාශ්‍ර ප්‍රවර්ධනය හා උත්සව ප්‍රවේශය (Ceremonial Access) භූ දර්ශන අලංකරණ ඇතුලත් අපූර්ව සංයුතීන්ගෙන් යුක්තව එම අංශ වලට විශේෂ අවධානයක් යොමු කරමින් සකස් කර ඇත. නගරය, පරිපාලන අගනගරය ලෙස සංවර්ධනය කිරීමේ නිර්මාණ සංයුතියේදී, ඇතුලත නගර ප්‍රදේශය මනා ලෙස සම්බන්ධිත ප්‍රවාහන පද්ධතියක් සමග ජල මාර්ග සහිත හරිත තීරයන්ගෙන් සමන්විත වූ ප්‍රදේශයක් ලෙස විශේෂ උපදේශන සැලැස්මක් සහිතව සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. තවද වැසි ජල ප්‍රවාහන, කාණු ජල ප්‍රවාහන, නගර කේන්ද්‍ර සංවර්ධනය, නගර ආශ්‍රිත සංවර්ධනය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර ඇත.

කෙසේ නමුත්, මේ අතරතුරදී පාර්ලිමේන්තු සංකීර්ණය, සෙත්සිරිපාය හා ඉසුරුපාය වැනි පරිපාලන සංකීර්ණ ස්ථාපිත කිරීම වැනි සැලකිය යුතු පරමාර්ථ ඉටුකර ගැනීම භාරධූර තත්වයක් ලෙස අගය කල හැක. ශ්‍රී ජයවර්ධනපුර අගනගර සංවර්ධන සැලැස්මේ විශේෂත්වය වනුයේ කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම සැකසීමේදී  උපදේශාත්මක සැලැස්මක් ලෙස එය වර්තාමානයට ද ප්‍රයෝජනයට ගත හැකි වීමයි.

ශ්‍රී ජයවර්ධනපුර අගනගර සංවර්ධන සැලැස්මේ සලකා බැලූ පළාත් පාලන ආයතන අතරින් කඩුවෙල නගර සභා සීමාව අද වන විට නාගරීකරණයේ උපරිම තලය වෙත පැමිණෙමින් පවතියි.

රූපය 2.4 : ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ  අගනගර සැලස්ම 1982




මූලාශ්‍රය: **ශ්‍රී** ජයවර්ධනපුර කෝට්ටේ  අගනගර සැලස්ම 1982

### 2.3.1.4.2 මහ කොළඹ නාගරික පුරවර ව්‍යුහ සැලැස්ම (CMRSP) - 1998

මහ කොළඹ නාගරික පුරවර ව්‍යුහ සැලැස්ම, සම්මත “ව්‍යුහ සැලැස්ම” අභිබවා කොළඹ විසල් කෝට්ටේ (හර ප්‍රදේශය) සඳහා සවිස්තර සැලැස්මක් සහිතව සකස් කරන ලද සැලැස්මකි.

එය කොළඹ නගරය ආශ්‍රිත කරගෙන සිදුවන සංවර්ධනය තේමා කර ගෙන, තිරසර සංවර්ධනයක් සඳහා විශේෂ අවධානය යොමු කරමින්, අවම හා උපරිම ඝනත්වයක් සහ ක්‍රියාකාරී ව්‍යෘහ මාලාවක් ඇතුලත් කරගෙන සකස් කර ඇත. මෙහිදී කලාපීකරණ සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි කෙරේ විශේෂ අවධානයක් යොමු කර ඇත. මෙම සැලැස්ම මගින් නාගරික ධුරාවලියක් හඳුන්වා දී ඇති අතර එහි සදහන් වන පරිදි කොළඹ මහා නගර සභා ප්‍රදේශය ජාතික මධ්‍යස්ථානක ලෙසත්, කඩුවෙල, බත්තරමුල්ල යන ප්‍රදේශ ව්‍යුහ සැලැස්මේ "හර" ප්‍රදේශ ලෙසත්, අතුරුගිරිය ප්‍රදේශය "සංවර්ධනය මධ්‍යස්ථානයක්" ලෙසද හදුනාගෙන ඇත. මෙම ව්‍යුහ සැලැස්ම පරිපාලන ආයතන ප්‍රසාරණය, වඩාත් කාර්යක්ෂම ප්‍රවාහන හා සන්නිවේදන සම්බන්ධතාවයන් ස්ථාපිත කිරීම, අගනගර පුරවරය (Capital Territory) පාරිසරික, සමාජීය හා භෞතික වශයෙන් කළමනාකරණය හා ප්‍රමාණවත් ආරක්ෂාව සහතික කරනුවස් උපායාත්මක ස්ථාන වල ආරක්ෂක කේන්ද්‍රයන්ද යෝජනා කර ඇති සැලැස්මකි.

රූපය 2.5 : මහ කොළඹ නාගරික පුරවර ව්‍යුහ සැලැස්ම (CMRSP) - 1998




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 1982

### 2.3.1.4.3 කොළඹ නගර සංවර්ධන සැලැස්ම - 1999

පෙර කී සංවර්ධන සැලසුම් තුලින් කොළඹ නගරයේ භෞතික සංවර්ධනය වෙත ප්‍රධාන අවධානය යොමු විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ නගරයට ගැටළු රාශියකට මුහුණ දීමට විය. ඉන් සමහරක් ප්‍රමාණවත් නොවන අපරවයුහ පහසුකම්, දූෂණය, වාහන තදබදය, නුසුදුසු නාගරික ප්‍රසාරණය සහ නගරයේ සංවර්ධනයට සුදුසු ඉඩම් නිසි ලෙස ව්‍යාප්තව නොතිබීමයි.

මෙම සැලසුම් ගැටළු හේතුවෙන්, සියලු සමකාලීන ගැටළු හා අනාගතයේදී මතුවිය හැකි නාගරික ගැටළු වලට පිළියම් යෙදෙන විස්තීර්ණ සැලැස්මක අවශ්‍යතාවය පැන නැගිනි. එලෙස නිර්මාණය වූ කොළඹ නගර සංවර්ධන සැලැස්ම කඩුවෙල, කොටිකාවත්ත, බත්තරමුල්ල, මාලබේ වැනි ප්‍රදේශ ද අන්තර්ගත කරගනිමින් ආර්ථික, පාරිසරික හා අනෙකුත් ගැටළුවලට විශේෂ අවධානය යොමු කර එම ගැටළුවලට ප්‍රතිචාර දක්වනු පිණිස හා ධරණීය ආර්ථිකයක් හා සතුටුදායක සෞන්දර්යය පරිසරයක් සහිත 21 වන ශත වර්ෂයේ ජන ජීවිතයේ ගුණාත්මක භාවය වඩාත් දියුණු කරනු වස් සකස් කරන ලද්දකි.

රූපය 2.6 : කොළඹ නගර සංවර්ධන සැලැස්ම - 1999




මූලාශ්‍රය: හර ප්‍රදේශ සැලැස්ම, නාගරික සංවර්ධන අධිකාරිය

### 2.3.1.4.4 බස්නාහිර පළාත් මහනගර පුරවර සැලැස්ම - 2004

2004 වර්ෂයේදී පිළියෙල කරන ලද බස්නාහිර පළාත් මහ නගර පුරවර සැලැස්ම නගරයට පමණක් සීමා නොවූ සමස්ත බස්නාහිර පළාතටම පිළියෙල කරන ලද සැලැස්මකි. මෙම සැලැස්ම මගින් කඩුවෙල හා බත්තරමුල්ල ප්‍රදේශ ඇතුලත් කොළඹ හර ප්‍රදේශය කලාප 12කට බෙදා වෙන් කිරීමට යෝජනා කරන ලද අතර එමගින් නගර කේන්ද්‍ර, පරිසර කලාප හා නේවාසික සංවර්ධනයට ඉඩම් හඳුනා ගන්නා ලදි. මෙම සැලැස්ම මගින් සංවර්ධනය විමධ්‍යගත කිරීමේ සංකල්පය අනුගමනය කල අතර කොළඹ හර ප්‍රදේශය ලෙස තවදුරටත් පවත්වා ගනිමින් සංවර්ධනය උතුරු, නැගෙනහිර හා දකුණු දිශාවන්ට යොමු කිරීමට යෝජනා කරන ලදි. දෙවනුව විවිධ කලාප වෙන් කරමින් හරිත ජාලයක් සහිතව නගරය උද්‍යානයක් අයුරින් "හරිත ඇඟිලි සංකල්පය" පදනම් කරගනිමින් සංවර්ධනය කිරීමට යෝජනා විය.

තවදුරටත් ජනතාවට ඔවුන්ගේ රැකියා ආශ්‍රිත ප්‍රදේශයන්හි විසීමට හැකිවන ලෙස "රැකියා ස්ථානය - ජීවිතය - සැලසුම් " යන (A Live - Work - Plan) සංකල්පය මත ජන ජීවිතයේ ගුණාත්මක භාවය ප්‍රවර්ධනය කිරීමටද යෝජනා කරන ලදි.

රූපය 2.6 : බස්නාහිර පළාත් මහනගර පුරවර සැලැස්ම - 2004




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

### 2.3.1.4.5 කඩුවෙල සංවර්ධන සැලැස්ම-2008-2020

නාගරික ලක්ෂණයන් වර්ධනය වෙමින් පැවති, එවක ප්‍රදේශීය සභාවක් වූ කඩුවෙල ප්‍රදේශය සඳහා 2020-2008 කාල වකවානුව සඳහා කඩුවෙල සංවර්ධන සැලැස්ම පිළියෙළ කරන ලදී .නේවාසික සංවර්ධනය මුල් කරගනිමින් සකස් කර ලද මෙම සැලැස්මෙහි බත්තරමුල්ල , පැලවත්ත නගර ආශ්‍රිතව පරිපාලන නගරයක් ලෙස සංවර්ධනය කිරීමටත්, බත්තරමුල්ල, කොස්වත්ත, මාලබේ, කඩුවෙල, අතුරුගිරිය නගර ආශ්‍රිතව වාණිජ සංවර්ධනය පදනම් කරගනිමින් සංවර්ධනය කිරීමට ද මාලබේ සිට වැලිවිට දක්වා ප්‍රදේශය තොරතුරු තාක්ෂණ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට ද, පාර්ලිමේන්තුව අවට සැතපුම් 1 ක් දක්වා ප්‍රදේශය විශේෂ නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට ද මෙම සැලැස්ම තුළින් අවකාශය සලසා ඇත .එමගින් ප්‍රදේශයේ ගොඩනැගිලි හා සංවර්ධන කටයුතු බලාත්මක කරනු ලබයි.

රූපය 2.7 : කඩුවෙල සංවර්ධන සැලැස්ම-2008-2020




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

### 2.3.1.4.6 මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම

වර්ෂ දරණ ගැසට් පත්‍රය මඟින් 18/1418 වන දිනැති අංක 09 නොවැම්බර් මස 2005මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කර ඇත .නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මෙම සැලැස්ම ප්‍රධාන වශයෙන් මාලබේ හා කොටිකාවත්ත ප්‍රදේශයෙන් කොටසක් තොරතුරු තාක්ෂණය සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා දේශීය හා ජාතික ආර්ථික සංවර්ධන කෙෂ්ත්‍රයේ සංවර්ධනය යොමු කිරීමට අපේක්ෂා කර ඇත. තවද මාලබේ ප්‍රදේශයේ සහ ඒ ආශ්‍රිත

කුඹුරුවල ස්වභාවික පරිසරය ආරක්ෂා කර ගැනීම සඳහා පරිසරයට අගනා දායකත්වයක් ලබා දීමට කටයුතු කර ඇත. මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සදහා වූ සංවර්ධන සැලැස්මෙහි එකී ප්‍රදේශය සදහා වන කලාපීයකරණ නියමතා, ගොඩනැගිලි නියමතා, මාර්ග සහ ඇළ මාර්ග සදහා රක්ෂිතයන්, යෝජිත ක්‍රියාකාරී ව්‍යාපෘති වලින් සමන්විත වේ.

තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සදහා වූ යෝජිත කලාපීකරණ සැලැස්ම 2030-ඇමුණුම අංක 04යටතේ ඉදි රිපත් කෙරේ.

**2.3.1.4.7 බස්නාහිර පළාත් මහනගර සංවර්ධන සැලැස්ම - 2016**

බස්නාහිර පළාතේ අවකාශීය විපර්යාසයක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් සහ ශ්‍රී ලංකාව ඉහළ අදායම් සහිත සංවර්ධිත රටක් බවට පත්කිරීමේ අපේක්ෂාවෙන් යුතුව බස්නාහිර පළාත් මහනගර සංවර්ධන සැලැස්ම 2016 වසරේදී නිර්මාණය විය. ඒ අනුව බස්නාහිර පළාතේ නාගරික සංකේන්ද්‍රණයේ අවකාශීය විපර්යාසය ලඟා කර ගත හැක්කේ අවිධිමත් නාගරීකරණයේ ඇතිවූ ගැටළු සඳහා පිළියම් යොදමින් ජාතික ආර්ථිකයේ ව්‍යුහ විපර්යාසය මගිනි.

එම සැලැස්මෙහි ජාතික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අරමුණු හා උපාය මාර්ග නිර්මාණයට මගපෙන්වූ සැලසුම් දර්ශනය "ආර්ථික වර්ධනය හා සෞභාග්‍යය" "සමාජ සමානත්වය, ප්‍රවේශය හා ආරක්ෂාව" "පාරිසරික" තිරසර-භාවය" සහ "පුද්ගලික සංතුෂ්ඨිය" යන මූලික කුළුණු 4 මත පදනම් විය.

මෙම සැලැස්ම විශේෂ ව්‍යාපෘති දහයක් මගින් නියම කරගත් අරමුණු සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වේ. එම ව්‍යාපෘති අතරින් තාක්ෂණ නගර ව්‍යාපෘතිය හරහා කඩුවෙල පාලන බලප්‍රදේශයට විශේෂ බලපෑමක් සිදු කරනු ලබන අතරම කඩුවෙල නගරයේ ලක්ෂණ උසස් කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් යොමු කර හැක.

මෙම සැලැස්මෙහි ඇතුලත් මාලබේ උප සැලසුම් ප්‍රදේශය හා විද්‍යා හා තාක්ෂණ නගර සැලැස්ම . ඇමුණුම අංක 05 යටතේ ඉදිරිපත් කෙරේ.

**2.3.1.4.8 අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030**

වර්ෂ 2019 ජුනි මස 28 වන දිනැති අංක 2129/94 දරණ ගැසට් පත්‍රය මඟින්, අගනගර සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කර ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මෙම සැලැස්මෙහි සැලසුම් බල ප්‍රදේශය ලෙස කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය, ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා ප්‍රදේශය, මහරගම නගර සභා ප්‍රදේශය හා කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා ප්‍රදේශය යන පලාත් පාළන ප්‍රදේශ ඇතුලත් වේ.

ව්‍යුහාත්මක සැලැස්මක් ලෙස සකස් කරන ලද අගනගර සංවර්ධන සැලැස්මෙහි කඩුවෙල, කොස්වත්ත උත්සව ප්‍රවේශ මාර්ගයේ (Ceremonial Access Road) පිහිටි නගර ලෙස ද බත්තරමුල්ල, පැලවත්ත, කොස්වත්ත හා තලවතුගොඩ ප්‍රදේශ පරිපාලන කලාපයක් ලෙස ද, කඩුවෙල හා අතුරුගිරිය ප්‍රදේශ නේවාසික කලාපයක් ලෙස ද, මාලබේ තොරතුරු තාක්ෂණ නගරයක් ලෙස ද, රණාල, කොරතොට හා නවගමුව ප්‍රදේශ කාර්මික කලාපයක් ලෙස ද සංවර්ධන කිරීමට සැලසුම් කරන ලදී.

අගනගර සංවර්ධන සැලැස්මෙහි සංකල්පිත සැලැස්ම හා කලාපීකරණ සැලැස්ම ඇමුණුම අංක 06 හා 07 යටතේ ඉදිරිපත් කෙරේ.

**2.3.1.4.9 ජාතික ප්‍රතිපත්ති**

ජාතික භෞතික සැලැස්ම 2050 ට අනුකූලව, කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය සංකේන්ද්‍රිත නාගරික සංවර්ධන ප්‍රදේශය (Concentrated Urban Development Area) ට අයත් ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි අතරම කොළඹ හා ගම්පහ ප්‍රධාන සේවා මධ්‍යස්ථානයන්ට මැදිව පිහිටා ඇති ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

රූපය 2.8: ජාතික භෞතික සැලැස්ම 2050




මූලාශ්‍රය: ජාතික භෞතික සැලැසුම් දෙපාර්තමේන්තුව

### 2.3.2. කඩුවෙල නගරයේ වර්තමාන තත්වය

ප්‍රදේශීය, කලාපීය, ජාතික හා අන්තර් ජාතික වශයෙන් කඩුවෙල ප්‍රදේශයේ සංවර්ධනය දිශානුගත කිරීම සඳහා පළමුව ප්‍රදේශයේ වත්මන් ප්‍රවණතා හඳුනා ගැනීම සිදුකල අතර අනතුරුව සමකාලීන සමාජ, ආර්ථික, භෞතික හා පාරිසරික අංශයන්හි සංවර්ධනය පිළිබඳව අධ්‍යනය කිරීම අත්‍යවශ්‍ය අංගයකි.

කඩුවෙල ප්‍රදේශයේ වර්තමාන සැලසුම් සන්දර්භය හඳුනා ගැනීම සඳහා භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ පහත පරිදි විග්‍රහ කර ඇත.

#### 2.3.2.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි භෞතික පසුබිම

ප්‍රදේශයෙහි භූමි පරිහරණ රටාව, ජාතික හා කලාපීය සම්බන්ධතාවය, මහා මාර්ග පද්ධතිය, යටිතල පහසුකම් යනාදී කරුණු විශ්ලේෂණය තුලින් කඩුවෙල ප්‍රදේශයේ භෞතික පසුබිම හඳුනා ගන්නා ලදි.

##### 2.3.2.1.1 භූමි පරිහරණ රටාව

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයේ 2020 වර්ෂයේ භූමි පරිහරණ රටාවට අනුව මුළු භූමි ප්‍රමාණයෙන් 50% ක භූමි ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර 19% ක භූමි ප්‍රමාණයක් වී වගාව, පොල් වගාව ආදී කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා වී ඇති බව පෙනී යයි. තවද කර්මාන්ත භාවිතය සඳහා මුළු භූමියෙන් 4%ක ට ආසන්න ප්‍රමාණයක් ද වෙන්ව ඇති බව පැහැදිලි වේ.

වගු අංක 2.1 මගින් කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයේ භූමි පරිහරණ ව්‍යාප්තියෙහි සංක්ෂිප්ත විග්‍රහය පහත පරිදි වේ.

වගුව 2.1 : භූමි පරිහරණය-, කඩුවෙල මහ නගර සභාව 2020

| භාවිතය | භූමි ප්‍රමාණය (හෙක්. ) | % |
|---|---|---|
| නේවාසික | 4349 | 49.53 |
| වාණිජ | 404 | 4.60 |
| කෘෂිකාර්මික | 1708 | 19.45 |
| ආයතන | 215 | 2.45 |
| මහාමාර්ග | 468 | 5.33 |
| ජල ප්‍රදේශයන් | 250 | 2.85 |
| පොදු ප්‍රදේශ (ක්‍රීඩා පිටි, විවෘත ප්‍රදේශ) | 98 | 1.12 |
| වගුරු බිම් හා රක්ෂිත | 461 | 5.25 |
| කදු ප්‍රදේශ | 13 | 0.15 |
| මුඩු බිම් | 400 | 4.56 |
| කර්මාන්ත | 313 | 3.56 |
| සුසාන භූමි | 9 | 0.10 |
| ඇළ රක්ෂිත | 80 | 0.91 |
| උපයෝගීතා සේවා | 12 | 0.14 |
| **එකතුව** | **8780** | **100** |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

සිතියම් අංක 2.4 න් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි භූමි පරිහරණ ව්‍යාප්තිය සවිස්තරාත්මකව පැහැදිලි කෙරේ.

සිතියම් අංක 2.4: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි භූමි පරිහරණ ව්‍යාප්තිය



සැකසුම:භූගෝලීය තොරතුරු පද්ධති අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

#### 2.3.2.1.2 ජාතික හා කලාපීය සබදතා

කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය කොළඹ සිට කි.මී 11ක් දුරින්ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ සිට කි.මී 6ක දුරින්ද පිහිටා ඇත. මෙම ප්‍රදේශය පරණ අවිස්සාවේල්ල මාර්ගය ඔස්සේ සහ අතුරුගිරිය හරහා ගොඩගම සිට පැමිණෙන මාර්ගය ඔස්සේ අවිස්සාවේල්ල නගරයටද, නව නුවර මාර්ගය ඔස්සේ ගම්පහ දිස්ත්‍රිකයට ද පිටත වටරවුම් මාර්ගය ඔස්සේ දක්ෂිණ අධිවේගී මාර්ගයට සහ ගම්පහ දිස්ත්‍රිකයට ද කලාපීය වශයෙන් ඍජුවම සම්බන්ධතාවයක් දක්වයි. එසේම මෙම සැලසුම් ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම, කොට්ටාව, හෝමාගම, කැස්බෑව, රාජගිරිය, කොලොන්නාව, ආදී නගර වලටද ඍජුවම අන්තර් සබදතා සම්බන්ධතාවයක් පවත්වනු ලබයි.

කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශය ජාතික හා කලාපීය වශයෙන් විශාල වැදගත්කමක් ඇති සෙත්සිරිපාය අදියර I ,අදියර II , සුහුරුපාය, ඉසුරුපාය, සම්පත්පාය, රන්මගපාය, මගනැගුම මහ මැදුර, ලක්දිය මැදුර, මිහිකත මැදුර, මධ්‍යම පරිසර අධිකාරිය, බස්නාහිර පළාත් සභා අමාත්‍යාංශය ආදී මෙරට රාජ්‍ය , අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන පාර්ලිමේන්තු පරිශ්‍රයද කඩුවෙල මහ නගර සීමාවට ඉතා ආසන්නයේ පිහිටා තිබීම සුවිශේෂිතාවයක් ලෙස හදුනාගත හැකිය. එසේම ආගමික සංස්කෘතිමය වශයෙන් වැදගත්කමක් උසුලන නවගමුව පත්තිනි දේවාලය, කොරතොට රජ මහා විහාරය ඇතුළු පුජාභූමි මෙම කඩුවෙල මහ නගර සීමාව තුලට ඇතුලත් වීම ජාතික හා කලාපීය වශයෙන් විශාල වැදගත්කමක් ඇති වීමට තවත් එක් හේතුවකි.

ප්‍රදේශයේ ජාතික සම්බන්ධතාවය වගු අංක 2.2 මගින් ද, කලාපීය සම්බන්ධතාවය වගු අංක 2.3 මගින් පහත පරිදි දක්වා ඇත.

වගුව 2.2 : ප්‍රදේශයේ ජාතික සම්බන්ධතාවය - කඩුවෙල මහ නගර සභාව 2020

| ප්‍රදේශයේ ජාතික සම්බන්ධතාවය | දුර (කිලෝමීටර්) |
|---|---|
| කඩුවෙල සිට කොළඹ දක්වා | 11 |
| කඩුවෙල සිට ගාල්ල දක්වා | 114.2 |
| කඩුවෙල සිට මහනුවර දක්වා | 110.4 |
| කඩුවෙල සිට රත්නපුර දක්වා | 69.8 |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

වගුව 2.3 : ප්‍රදේශයේ කලාපීය සම්බන්ධතාවය - කඩුවෙල මහ නගර සභාව 2020

| ප්‍රදේශයේ කලාපීය සම්බන්ධතාවය | දුර (කිලෝමීටර්) |
|---|---|
| කඩුවෙල සිට හෝමාගම දක්වා | 14 |
| කඩුවෙල සිට අවිස්සාවේල්ල දක්වා | 31.8 |
| කඩුවෙල සිට කඩවත දක්වා | 23.6 |
| කඩුවෙල සිට කොට්ටාව දක්වා | 13.1 |
| කඩුවෙල සිට කොලොන්නාව දක්වා | 11.9 |
| කඩුවෙල සිට රාජගිරිය දක්වා | 12.3 |

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය

සිතියම් අංක 2.5 මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කලාපීය සම්බන්ධතාවය සවිස්තරාත්මකව පැහැදිලි කෙරේ.

සිතියම් අංක 2.5: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කලාපීය සම්බන්ධතාවය




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

**2.3.2.1.3 මහා මාර්ග පද්ධතිය**

ප්‍රදේශයේ භූමි පරිහරණ සැකැස්ම සලකා බැලීමේදී, මහාමාර්ග පද්ධතිය සඳහා මුළු භූමි ප්‍රමාණයෙන් 5.33% ක් වෙන්ව ඇති අතර නව නුවර මාර්ගය, පරණ අවිස්සාවේල්ල මාර්ගය, අතුරුගිරිය හරහා ගොඩගම සිට පැමිණෙන මාර්ගය, කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය ආදී ප්‍රධාන මාර්ග රැසකින් සහ සෙසු මාර්ග වලින් සමන්විත වේ.

සැලසුම් ප්‍රදේශය තුල කිලෝමීටර් 86 ට ආසන්න ප්‍රාමාණයක් පළමු ශ්‍රේණියේ (A) මාර්ගයන් ද, කිලෝමීටර් 192 ට ආසන්න ප්‍රමාණයක් දෙවන ශ්‍රේණියේ (B) මාර්ගයන් ද, පිහිටා ඇත. සෙසු සියලුම මාර්ග “සී” හා “ඩී” ශ්‍රේණියේ වලටද අයත් වන අතර මෙම මාර්ග වලින් 80% ක් පමණ අඩි 10-15 අතර අවම පළලකින් යුක්ත වේ. මහාමාර්ග වල නඩත්තු කටයුතු මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය හා කඩුවෙල මහ නගර සභාව මගින් සිදු කරනු ලබයි.

කොළඹ පිටත වටරවුම් අධිවේගී මාර්ගය හා සම්බන්ධ කඩුවෙල, කොතලාවල, අතුරුගිරිය යන අධිවේගී මාර්ගයෙහි හුවමාරු මධ්‍යස්ථාන තුනක් කඩුවෙල මහ නගර සභා සීමාවෙහි පිහිටා ඇත.

කඩුවෙල මහ නගර සභා සීමාවෙන් ආරම්භ වන බස් සේවාවන් පිලිබද තොරතුරු වගු අංක 2.4 මගින් පහත පරිදි දක්වා ඇත.

වගුව 2.4 : කඩුවෙල මහ නගර සභා සීමාවෙන් ආරම්භ වන බස් සේවාවන්

| **බස් ගමන් මාර්ගය** | **මාර්ග අංකය** | **බස් ප්‍රමාණය** | **දුර ( කි. මී.)** |
|---|---|---|---|
| අතුරුගිරිය - කොළඹ | 170 | 41 | 20.6 |
| අතුරුගිරිය - කොළඹ | 138/4 | 20 | 29.8 |
| අතුරුගිරිය-තුනඅදහේන හරහා මාලබේ | 344 | 9 | |
| කඩුවෙල - කොළඹ | 143 | 25 | 15.2 |
| කඩුවෙල - ගම්පහ | 228/1 | 21 | 23.2 |
| කඩුවෙල - කිරිබත්ගොඩ | 380 | 24 | 15.9 |
| මාලබේ - මහරගම | 993 | 16 | 7 |
| කඩුවෙල - හෝමාගම | 697 | 39 | 15.8 |
| කඩුවෙල - හෝමාගම | 698 | 18 | 19.8 |
| මාලබේ - කොට්ටාව | 336 | 17 | 8.5 |
| කඩුවෙල - කොල්ලුපිටිය | 177 | ප්‍රමාණවත් තොරතුරු නොමැත | 20 |
| කඩුවෙල - ගාල්ල (අධිවේගී මාර්ගය හරහා) | EX-001-023 | | 120 |
| කඩුවෙල - මාතර (අධිවේගී මාර්ගය හරහා) | EX-001-002 | | 140 |
| කඩුවෙල - කළුතර (අධිවේගී මාර්ගය හරහා( | - | 2 | 46 |

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ- 2020 කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

සිතියම් අංක 2.6 මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි මහා මාර්ග පද්ධතිය සවිස්තරාත්මකව පැහැදිලි කෙරේ.

සිතියම් අංක 2.6: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි මහා මාර්ග පද්ධතිය



සැකසුම:භූගෝලීය තොරතුරු පද්ධති අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

### 2.3.2.1.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි යටිතල පහසුකම්

#### 2.3.2.1.3.1 ජල පහසුකම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පානීය ජල පහසුකම පිළිබද සලකා බැලීමේදී ප්‍රදේශයේ 90% ආසන්න නිවාස සංඛ්‍යාවක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සපයන නල ජලය භාවිතයට ගන්නා බව හදුනාගත හැකි අතර 8% ආසන්න නිවාස සංඛ්‍යාවක් පුද්ගලික ආරක්ෂිත ළිං භාවිතයට ගන්නා බව හඳුනාගත හැකිය. එසේම ප්‍රදේශය තුල, ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවයෙන් 95% ඉක්මවන සේවා පහසුකම් සැපයීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජල සම්පාදන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත.

ප්‍රදේශයේ නිවාස සංඛ්‍යාව අනුකූලව පානීය ජල පහසුකම වගු අංක 2.5 මගින් පහත පරිදි විග්‍රහ කර ඇත

වගුව .25: පානීය ජල පහසුකම- කඩුවෙල මහ නගර සභාව 2020

| පානීය ජල පහසුකම | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| නල ජලය භාවිතයටගන්නා නිවාස | 63,553 | 90.29 |
| ප්‍රජා ජලව්‍යාපෘති භාවිතයට ගන්නා නිවාස | 1,015 | 1.44 |
| නළ ළිං භාවිතයටගන්නා නිවාස | 3 | 0 |
| ළිං ආරක්ෂිත (පුද්ගලික) | 5,367 | 7.62 |
| ළිං අනාරක්ෂිත (පුද්ගලික) | 2 | 0 |
| පොදු ළිං භාවිතයටගන්නා | 443 | 0.63 |
| ජල යෝජනා ක්‍රම | 1 | 0 |
| පානීය ජල පහසුකම් නොමැති නිවාස | 5 | 0.01 |
| **එකතුව** | **70,389** | **100** |

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ- 2020 කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

#### 2.3.2.1.3.2 විදුලි පහසුකම

සැලසුම් ප්‍රදේශයෙහි විදුලි අවශ්‍යතාවය ලංකා විදුලි බල මණ්ඩලය මගින් සපයනු ලබයි . කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පවතින නිවාස සංඛ්‍යාවෙන් 99% ක් ජාතික විදුලි බල පද්ධතිය හරහා විදුලිබල පහසුකම ලබා ගෙන ඇති අතර ,ඉන් නිවාස 0.38% සූර්‍ය පැනල මගින් සූර්‍ය බලය හරහා ද විදුලිබල පහසුකම ලබා ගෙන ඇත .ප්‍රදේශයේ විදුලි බල සැපයුම නොමැති නිවාස සංඛ්‍යාව 0.10% කි.

ප්‍රදේශයේ නිවාස සංඛ්‍යාව අනුකූලව විදුලි පහසුකම වගු අංක .2 වගුව.මගින් පහත පරිදි විග්‍රහ කර ඇත 2.66: විදුලි පහසුකම - කඩුවෙල මහ නගර සභාව 2020

| විදුලි පහසුකම | නිවාස සංඛ්‍යාව | % |
|---|---|---|
| විදුලි පහසුකම් සහිත නිවාස | 70,316 | 99.52 |
| විදුලිපහසුකම් රහිත නිවාස | 73 | 0.10 |
| සූර්යපැනල සහිත නිවාස | 268 | 0.38 |

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ- 2020 කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

**2.3.2.1.3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය ටොන් 75 ක් පමණ වන වේ මෙම .දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය ජෛව හායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය හා ජෛව හායනයට ලක් නොවන ඝන අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කල හැකි අතර එය පිලිවෙළින් ටොන් 25-30ත් අතර වේ.

මෙම ඝන අපද්‍රව්‍ය එක්ලැස් කිරීම වර්ගීකරණයක් යටතේ කඩුවෙල මහ නගර සභාවෙහි බත්තරමුල්ල ,කඩුවෙල දිස්ත්‍රික් කාර්‍යාලය , දිස්ත්‍රික් කාර්‍යාලය හා අතුරුගිරිය දිස්ත්‍රික් කාර්‍යාලය මගින් දිනපතා සිදු කරනු ලබයි. එසේ රැස් කරනු ලබන අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු කඩුවෙල කසල අංගනය මගින් සිදුකරනු ලබන අතර එහි ධාරිතාවය අනුව දෛනිකව ජෛව හායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය ටොන් 10-15 අතර ප්‍රමාණයක් මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සිදුකරනු ලබයි .ජෛව හායනයට ලක්වන ඉතිරි ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය මුතුරාජවෙල කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබයි .සැලසුම් ප්‍රදේශයෙහි ප්ලාස්ටික් හා වීදුරු අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා 100% පුද්ගලික අංශය සහය ලබා ගන්නා අතර පොලිතීන් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කෙලවරපිටිය (Western Power Project) මගින් කළමනාකරණය කිරීම සිදුකරනු ලබයි. එමෙන්ම කඩුවෙල කසල අංගනය මගින් මසකට දියර පොහොර ලීටර් 800-1000 අතර ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම සිදු කරනු ලබයි.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම සිදුකරනු ලබන ස්ථාන දැක්වෙන ඇමුණුම අංක 08 යටතේ ඉදිරිපත් කෙරේ.

**2.3.2.1.3.4 මල හා අපජල කළමනාකරණය**

සැලසුම් ප්‍රදේශයෙහි මල හා අපජල කළමනාකරණය කඩුවෙල මහ නගර සභාව හා පෞද්ගලික අංශය යටතේ සිදු කරනු ලබයි. සාමාන්‍යයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශය මගින් එක් රැස් කරනු ලබන මල හා අපජලය බැහැර කිරීම සඳහා ජයවඩනගම නිවාස යෝජනා ක්‍රමයේ මලාපවහන පද්ධතියෙහි පොම්පාගාරය හා කොළඹ අපජලය කළමනාකරණ මධ්‍යස්ථානය භාවිතා කරනු ලබයි. සාමාන්‍යයෙන්, දිනකට ට්‍රක් රථ 36ක් පමණ ප්‍රදේශයේ විවිධ ආයතනවලින් පොම්පාගාරය වෙත යොමු කරනු ලබන අතර එය පොම්පාගාරයෙහි සැලසුම් පරිමාව අභිබවා යැමට හේතු වී ඇත. නාගරික ඝනත්වයට සාපේක්ෂව මල හා අපජල කළමනාකරණය කිරීම සඳහා ව්‍යාපෘතියක් යෝජනා වී තිබුණ ද ප්‍රදේශීය විරෝධතා හමුවේ එය ක්‍රියාත්මක නොවීම දැකගත හැකිය.

**2.3.2.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සමාජයීය පසුබිම**

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයේ සමාජයීය පසුබිම අධ්‍යයනය කිරීම සඳහා ජනගහනය, නිවාස, සෞඛ්‍යය හා අධ්‍යාපන සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලබයි.

**2.3.2.2.1 ජනගහනය**

2001 හා 2012 ජන සංගණන වාර්තා අනුව කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ නේවාසික ජනගහනය පිලිවෙලින් 209,251 ක් හා 252,041 ක් වන අතර, ස්වාභාවික ජනගහන වර්ධන වේගය 0.01ක් වේ. තවදුරටත් සම්පත් පැතිකඩෙහි දත්ත පදනම්

කරගනිමින් 2020 වර්ෂයේ ජනගහනය 281,182 වශයෙන් හදුනා ගත හැකි අතර 2032 වර්ෂයට පුරෝකථන අනුව ජනගහනය දළ වශයෙන් 345,949 ක් පමණ වනු ඇතැයි ගණනය කල හැක.

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ ජනගහනය කොළඹ දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනයෙන් 11% කට ආසන්න ප්‍රමාණයක් වේ. 2012 ජන සංගණන වාර්තා අනුව කොළඹ දිස්ත්‍රික් ජනගහනයෙන්, කඩුවෙල ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය දෙවන වැඩිම ජනගහනයක් සිටින පළාත් පාලන ආයතනය වන අතර එය රූපය අංක 2.8 යටතේ ඉදිරිපත් කෙරේ.

රූපය 2.9: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනගහනය




| | කොළඹ | කඩුවෙල | කැස්බෑව | තිඹිරිගස්යාය | හෝමාගම | මහරගම | කොලොන්නාව | මොරටුව | සීතාවක | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ | රත්මලාන | දෙහිවල | පාදුක්ක |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2012 | 323,257 | 252,041 | 245,232 | 238,057 | 237,905 | 196,423 | 191,687 | 168,280 | 113,807 | 107,925 | 95,506 | 88,962 | 65,267 |
| 2001 | 380,946 | 209,251 | 209,619 | 266,154 | 186,050 | 185,193 | 161,247 | 177,563 | 94,001 | 116,366 | 108,716 | 101,830 | 54,338 |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012

රූපය 2.10: 2020 වර්ෂයේ වයස් ව්‍යුහය අනුව ජනගහනය




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2012 වර්ෂයේ සිට 2020 වර්ෂය වන විට ජයවඩනගම, ආසිරි උයන, වික්‍රමසිංහපුර, උඩුමුල්ල, බටපොත, මුත්තෙට්ටුගොඩ, වල්පොල, යන ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි වැඩිම ජන ඝනත්වයක් දක්නට ලැබේ.

සිතියම් අංක 2.7: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ජන ඝනත්වය 2020




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

2020 ජන සංගණන වාර්තාව අනුව 49% ක් පුරුෂ හා 51% ක් ස්ත්‍රී වන අතර වයස් කාණ්ඩ අනුව ජනගහනය අවුරුදු 15 ට අඩු 17% ක් ද 15 – 59 අතර 71% ක්ද, 60 ට වැඩි 12% ක් ද වේ. ඒ අනුව කඩුවෙල ප්‍රදේශයේ ශ්‍රම බලකාය එනම් අවුරුදු 15 – 59 අතර ජනගහනය සාපේක්ෂව 71% ක් වැනි ඉහල අගයක් ගැනීම අනාගත සංවර්ධනය උදෙසා විභවතාවයක් වනු ඇත.

ජන වර්ගය අනුව ජනගහනය සලකා බැලීමේදී, වැඩිම පිරිසක් සිංහල වන අතර, ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව සුළු පිරිසකි. එමෙන්ම ආගමික වශයෙන් සලකා බැලීමේදී, බහුතරයක් බෞද්ධයන් වන නමුත් සැලකිය යුතු කතෝලික ජනගහනයද මෙම ප්‍රදේශයේ වාසය කරනු ලබයි.

එසේම ජනගහන වර්ධනයත් සමග ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදී කලාපවලට ජනාවාස ව්‍යාප්ත වීම වර්තමානය වන විට හදුනාගත හැකි අතර එම තත්වය සැලසුමක අවශ්‍යතාවය 3.2.3 යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කෙරේ.

**2.3.2.2.2 නිවාස**

2020 සම්පත් පැතිකඩ වාර්තාවට අනුව, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නිවාස ව්‍යාප්තිය පිළිබද සලකා බැලීමේදී ස්ථිර හා අර්ධ ස්ථිර නිවාස වැඩි වශයෙන් දක්නට ලැබෙන අතර මෙම ප්‍රදේශයෙහි අනවසර ඉදිකිරීම් කලපලුවාව, කොටුවේගොඩ හා කඩුවෙල-ඒ ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව දක්නට ලැබේ. වගු අංක 2.7 මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි තත්වය අනුව නිවාස වර්ගීකරණය පහත පරිදි විග්‍රහ කෙරේ.

වගුව .27: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි තත්වය අනුව නිවාස වර්ගීකරණය 2020

| නිවාස වර්ගීකරණය | නිවාස ප්‍රමාණය | % |
|---|---|---|
| ස්ථිර | 68,577 | 97.42 |
| අර්ධ ස්ථිර | 1,578 | 2.24 |
| පැල්පත් | 40 | 0.06 |
| තාවකාලික | 194 | 0.28 |
| **එකතුව** | **70389** | **100** |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020- කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ඒ අනුව, බහුලවම පැල්පත් නිවාස මාලබේ බටහිර හා කොරතොට ග්‍රාම නිලධාරී වසම් ආශ්‍රිතව දක්නට ලැබේ. එසේම ප්‍රදේශයෙහි මහල් නිවාස වර්ගීකරණයට අනුව 75% තනිමහල් නිවාස වන අතර 20% ක් දෙමහල් නිවාස ද, 4% පමණ තෙමහල් නිවස ද වේ. මෙම තෙමහල් නිවාස වලින් බහුතරයක් කුමරගේවත්ත ග්‍රාම නිලධාරී වසම තුළ ද, අරංගල ග්‍රාම නිලධාරී වසම තුළ ද පිහිටා ඇත.

සම්පත් පැතිකඩෙහි දත්ත වලට අනුකූලව ප්‍රදේශයෙහි අනවසරයෙන් ඉදිකරන ලද නිවාස 154 ක් පමණ පවතින අතර, ඉන් අනවසරයෙන් ඉදිකරන ලද නිවාස 75 කට වැඩි ප්‍රමාණයක් කලපලුවාව, කොටුවේගොඩ, කඩුවෙල ඒ ආශ්‍රිතව දැකගත හැකිය.

එමෙන්ම ප්‍රදේශය තුළ පෞද්ගලික ගොඩනැගිලි සංවර්ධනකරුවන් විසින් ක්‍රමවත්ව ගොඩනගන ලද එක් එක් ආර්ථික මට්ටම් වලට අනුකූලව සකස්කරන ලද නේවාසික ප්‍රදේශ දක්නට ලැබේ. බොහොමයක් මෙම ප්‍රදේශ අතුරුගිරිය මාලබේ ආශ්‍රිතව පිහිටා ඇති අතර මිලේනියම් සිටි නේවාසික කලාපය, අරියානා නේවාසික කලාපය ඊට කදිම නිදසුනකි.

2012 ජන සංගණන වාර්තා අනුව කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නිවාස ඝනත්වය අධ්‍යනය කිරීමේදී කොරතොට, නවගමුව, දැඩිගමුව, තුනඅදහේන ආදී ප්‍රදේශ ආශ්‍රිතව අඩු ඝනත්වයක් පෙන්නුම් කිරීමට එක් සාධකයක් ලෙස එම ප්‍රදේශ ආශ්‍රිතව සිදුවන කලුගල් කැණීම හේතු වී ඇති අතර ප්‍රදේශයෙහි 2020 වර්ෂයට අදාළ නිවාස ඝනත්වය වැඩිදුරටත් සිතියම් අංක 2.8 යටතේ ඉදිරිපත් කෙරේ.

සිතියම් අංක 2.8: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නිවාස ඝනත්වය 2020




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

#### 2.3.2.2.3 සෞඛ්‍ය

කඩුවෙල ප්‍රදේශයෙහි සෞඛ්‍ය පහසුකම් මධ්‍යම රජය, පළාත් සභාව, පළාත් පාලන ආයතන, ආයුර්වේද සහ පෞද්ගලික අංශයේ රෝහල් හා කාර්යමණ්ඩල මඟින් සපයනු ලැබේ. මෙම ප්‍රදේශයෙහි සෞඛ්‍ය සේවාව ව්‍යාප්ත කිරීම සඳහා කොට්ඨාස මහජන සෞඛ්‍ය පරීක්ෂක හා පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස අටකට වෙන් කර ඇත. වර්තමානයේ දී මෙම කොට්ඨාසයේ සෞඛ්‍ය පහසුකම සැපයීම නවගමුව, තලංගම, අතුරුගිරිය යන රජයේ රෝහල් තුනක් යටතේ ද, මධ්‍යම බෙහෙත් ශාලා තුනක්, හා වෛද්‍ය සායන දහඅටක් යටතේ ද සිදුකෙරේ. එමෙන්ම ප්‍රදේශයෙහි අර්ධ රාජ්‍යය රෝහලක් ලෙස මාලබේ නෙවිල් ප්‍රනාන්දු රෝහල පිහිටා තිබීම ද සඳහන් කල හැකි අතර ජාතික රෝහල, නැගෙනහිර කොළඹ ශික්ෂණ රෝහල, දකුණු කොළඹ ශික්ෂණ රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල, කාසල් රෝහල හා ජයවර්ධනපුර රෝහල යන ජාතික තලයේ රෝහල් රැසක් සැලසුම් ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටා තිබීම ද ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනය උදෙසා විභවතාවයක් වනු ඇත.

හේමාස් පෞද්ගලික රෝහල, නවලෝක පෞද්ගලික රෝහල් ශාඛාව, සැන්ටා ඩෝරා රෝහල, සතුරා ඩෙන්ටල් හොස්පිටල් යන පෞද්ගලික රෝහල් මෙම ප්‍රදේශයෙහි පිහිටා ඇති අතරම ප්‍රමුඛ පෙළ පෞද්ගලික රෝහල් රැසක් ද සැලසුම් ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටා තිබීම ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනය උදෙසා පිටුවහලක් වනු ඇත. සිතියම් අංක 2.9 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සෞඛ්‍ය පහසුකම්වල ව්‍යාප්තිය ඉදිරිපත් කෙරේ.

#### 2.3.2.2.4 අධ්‍යාපනය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදේශය පුරා විහිදුණු ඉහල අධ්‍යාපන සේවාවක් පවතින බව දක්නට හැකි වේ. 2020 වර්ෂය වන විට මෙම කොට්ඨාසය තුළ ක්‍රියාත්මක ලියාපදිංචි පෙර පාසල් ගණන 160 ක් වන අතර, රජයේ පාසල් 32 ක් පිහිටා ඇත. එම රජයේ පාසල් වලින් 8ක් ජාතික පාසල් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර ප්‍රදේශය තුළ පවතින ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් ගණන 8ක් වේ. එම ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් කඩුවෙල, බත්තරමුල්ල, තලාහේන, මාලබේ ආදී ප්‍රදේශ වල විහිදී පවතියි.

කෙසේ වෙතත්, මේ වන විට රජයේ පාසල් අධ්‍යාපනය සම්බන්ධව පහත දක්වා ඇති පරිදි ගැටළු තත්ත්වයන් අධීක්ෂණය කළ හැකිය.

- කොළඹ නගරයට ආසන්නව පිහිටීම හේතුවෙන් ශිෂ්‍යත්ව විභාගයෙන් හා සාමාන්‍ය පෙළ විභාගයෙන් උසස් ලෙස සමත්වන සියළුම සිසුන් කොළඹ පාසල් වලට අස් වී යාම.
- ශිෂ්‍යත්වය පදනම් කර ගනිමින් හා පළමු ශ්‍රේණිය සඳහා පාසල් කිහිපයකට පමණක් පවතින තියුණු තරඟය මත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇතැම් පාසල් වලට ඇතුල් වන සිසුන් සංඛ්‍යාව අඩු වීම.

ජාතික තලයේ පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විශ්ව විද්‍යාලය ඇතුළු සුප්‍රසිද්ධ පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන පිහිටා තිබීම ද ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනය උදෙසා විභවතාවයක් වනු ඇත.

සිතියම් අංක 2.10 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ප්‍රාථමික, ද්විතීක හා තෘතියික මට්ටමේ පාසල් හා ජාතික මට්ටමේ පාසල් ඇතුළු අධ්‍යාපන පහසුකම්වල ව්‍යාප්තිය ඉදිරිපත් කරන අතර පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ව්‍යාප්තිය සිතියම් අංක 2.11 යටතේ ඉදිරිපත් කෙරේ.

සිතියම් අංක 2.9: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සෞඛ්‍ය පහසුකම්වල ව්‍යාප්තිය 2020




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

සිතියම් අංක 2.10: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි අධ්‍යාපන පහසුකම්වල ව්‍යාප්තිය 2020




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

සිතියම් අංක 2.11: පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි ව්‍යාප්තිය 2022




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

### 2.3.2.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථික පසුබිම ගත් කල ප්‍රධාන වශයෙන් රාජ්‍ය ,අර්ධ රාජ්‍ය, පෞද්ගලික, කෘෂිකාර්මික, කාර්මික, සේවා අංශ මෙන්ම ස්වයං රැකියා, කුලී වැඩ, විදේශ රැකියා ආදී ලෙස රැකියාවන්හි නිරත වන පිරිස හඳුනා ගත හැකි වේ. රැකියා අංශයේ වර්ගීකරණය තුළින්, ජනතාවගේ ආර්ථික තත්වය පිළිබඳ තොරතුරු සපයන අතර, 2020 වර්ෂයෙහි සම්පත් පැතිකඩ පරිදි විවිධ අංශයන්හි රැකියාවෙහි නියුතු ප්‍රමාණය වගු අංක 2.8ට අනුව පහත පරිදි වේ .

වගු අංක 2.8: සේවා නියුක්තිය, කඩුවෙල මහ නගර සභාව 2020

| අංශය | ස්ත්‍රී | පුරුෂ | එකතුව | ප්‍රතිශතය(%) |
|---|---|---|---|---|
| රාජ්‍ය අංශය | 8879 | 8744 | 17623 | 10.07 |
| අර්ධ රාජ්‍ය අංශය | 4846 | 6048 | 10894 | 6.22 |
| පෞද්ගලික අංශය | 23358 | 33262 | 56620 | 32.34 |
| කෘෂිකාර්මික අංශය | 1581 | 2639 | 4220 | 2.41 |
| කාර්මික අංශය | 1123 | 5791 | 6914 | 3.95 |
| සේවා අංශය | 4633 | 8253 | 12886 | 7.36 |
| ස්වයං රැකියා | 6365 | 6232 | 12597 | 7.20 |
| කුලී වැඩ | 3443 | 9055 | 12498 | 7.14 |
| විදේශ රැකියා | 1558 | 1905 | 3463 | 1.98 |
| අර්ධ කාලීන රැකියා | 3271 | 4487 | 7758 | 4.43 |
| ස්ථිර රැකියාවක් නොමැති | 8264 | 9005 | 17269 | 9.86 |
| රැකියාවක් නොමැති | 7810 | 4525 | 12335 | 7.05 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

මේ අනුව වැඩි ප්‍රමාණයක් පෞද්ගලික අංශයෙහි රැකියාවෙහි නියුතු වන බව හඳුනා ගත හැකිය .රූපය 2.11 මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ස්ත්‍රී පුරුෂ භාවය අනුව සේවා නියුක්තිය නිරූපණය කෙරේ.

රූපය 2.11: සේවා නියුක්තිය, කඩුවෙල මහ නගර සභාව 2020




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි අධ්‍යාපන මට්ටම අනුව සේවා නියුක්තිය හා සේවා වියුක්තිය වගු අංක 2.9ට අනුව පහත පරිදි වේ.

වගු අංක 2.9: අධ්‍යාපන මට්ටම අනුව සේවා නියුක්තිය 2020

| අංශය | සේවා නියුක්තිය | | | | සේවා වියුක්තිය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | එකතුව | (%) | ස්ත්‍රී | පුරුෂ | එකතුව | (%) |
| 8 ශ්‍රේණිය සමත් | 13400 | 15868 | 29268 | 21.94 | 3929 | 2382 | 6311 | 29.57 |
| අ. පො.ස. සා. පෙළ සමත් | 22962 | 23573 | 46535 | 34.88 | 5024 | 3037 | 8061 | 37.77 |
| අ. පො.ස. උ. පෙළ සමත් | 20689 | 20214 | 40903 | 30.66 | 3155 | 2154 | 5309 | 24.88 |
| ඩිප්ලෝමාධාරී | 3206 | 3309 | 6515 | 4.88 | 376 | 345 | 741 | 3.47 |
| උපාධි සමත් | 5460 | 4748 | 10208 | 7.65 | 461 | 459 | 920 | 4.31 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි 2020 වර්ෂයේ සංඛ්‍යාලේඛන පරිදි මාසික අදායම් මට්ටම් අනුව පවුල් සංඛ්‍යාව රූපය 2.12 ට අනුව පහත පරිදි හඳුනා ගත හැකිය .ඒ අනුව බහුතරයක් රු 25000.ට ඉහල මාසික අදායමක් ලබන පිරිසක් වේ .එය ප්‍රදේශයෙහි ආර්ථික මට්ටම ඉහල මට්ටමක පවතින බවට සාධක පෙන්වයි.

රූපය 2.12: මාසික අදායම් මට්ටම් අනුව පවුල් සංඛ්‍යාව, කඩුවෙල මහ නගර සභාව 2020




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

### 2.3.2.3.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කුඹුරු හා අනෙකුත් කෘෂිකාර්මික කටයුතු

සැලසුම් ප්‍රදේශයෙහි වී වගා කරන භූමි ප්‍රමාණය හෙක්ටයාර් පමණ 1688.747වන අතර පොල්, රබර්, එළවළු හා පළතුරු වගාව ද සාර්ථකව සිදු කරනු ලබයි. කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පවතින මුළු භූමි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 321.096 ක් රබර් වගා ඉඩම් පවතින අතර පොල් වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර් 108.46 කි.

සිතියම් අංක 2.12 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කුඹුරු හා අනෙකුත් වගා ඉඩම්හි ව්‍යාප්තිය ඉදිරිපත් කෙරේ.

සිතියම් අංක 2.12: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කුඹුරු හා වගා ඉඩම්හි ව්‍යාප්තිය



සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

සැලසුම් ප්‍රදේශයෙහි තුළ සත්ව පාලනය ද සාර්ථකව සිදු කරනු ලබයි. ඒ අනුව කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල වාර්ෂික කිරීමි කිරි ,යෝගට් , නිෂ්පාදනය පිළිවෙලින් ලීටර් ,70,450ලීටර් ,19,000හා ලීටර් 10,800 පමණ වේ .තවද වාර්ෂික බිත්තර 40, 200 ක් පමණ නිෂ්පාදනය වේ.

**2.3.2.3.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කර්මාන්ත**

වානේ, යකඩ, ඇලුමිනියම්, සත්ව ආහාර නිෂ්පාදනය, පොලිතින් හා ප්ලාස්ටික් ආශ්‍රිත නිෂ්පාදන,කොන්ක්‍රීට් හා කලුගල් ආශ්‍රිත නිෂ්පාදන, ඇගලුම් කර්මාන්තය ආදී ප්‍රදේශය පුරා විහිදුණු කර්මාන්ත රැසක් කඩුවෙල, කොරතොට, නවගමුව, රණාල ආශ්‍රිතව පවතින අතර සම්ප්‍රධායික කර්මාන්ත වන වෙස්මුහුණු කර්මාන්තය නවගමුව දකුණ හා රණාල ආදී ප්‍රදේශ වල දැකගත හැකිය. මාලබේ ආශ්‍රිතව වාත්තු කර්මාන්තය ව්‍යාප්තව පවතින අතර මැටි කර්මාන්තය රණාල ආශ්‍රිතව ව්‍යාප්ත වීමක් දැකගත හැකිය. රෙදිපිළි ආශ්‍රිත කර්මාන්ත කහන්තොට මාර්ගය ආශ්‍රිතව බහුලව දක්නට ලැබෙන අතර සුප්‍රසිද්ධ ආහාර නිෂ්පාදන කර්මාන්ත රැසක් රණාල හබරකඩ මාර්ගය ආශ්‍රිතව ව්‍යාප්ත වීමක් දැකගත හැකිය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කලුගල් කැණීම් ආශ්‍රිත කර්මාන්ත සදහා සුවිශේෂි වන අතර භූ විද්‍යා හා පතල් කැණීම් කාඩාංශයෙහි නිර්දේශයට යටත්ව විදිමත් ලෙස සක්‍රීය කලුගල් කැණීම් කර්මාන්ත 45ක් යටතේ කලුගල් කැණීම් කටයුතු සිදු කරගෙන යනු ලබයි. එම සක්‍රිය කලුගල් කැණීම් කර්මාන්ත තුළින් මාසිකව කියුබ් 44, 954 ක නිෂ්පාදනයක් සිදු කරගෙනෙ යනු ලබන අතර එය කොළඹ දිස්ත්‍රික්කය තුල සිදු කරනු ලබන සමස්ත නිෂ්පාදනයෙන් 22.5% ලෙස වාර්තා වේ.

ඇමුණුම අංක 09 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි කලුගල් කැණීම් කර්මාන්ත විස්තරාත්මව ඉදිරිපත් කෙරේ.

**2.3.2.3.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වල ව්‍යාප්තිය**

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථිකයට විශාල දායකත්වයක් සැපයීමට බත්තරමුල්ල හා ඒ ආශ්‍රිත ප්‍රදේශය තුළ ස්ථාපිතව පවතින රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන හේතු වී ඇති බව හදුනාගත හැකිය. මෙසේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන මෙම ප්‍රදේශය තුළ ස්ථාපිත වීම හේතුවෙන්, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි වාණිජ්‍ය කටයුතු පුළුල් පරාසයක් තුළ ව්‍යාප්ත වීමක් දැකගත හැකිය. එය ප්‍රදේශයෙහි ආර්ථිකය සවිමත් කිරීමට පිටුවහලක් සපයනු ලබයි.

රූපය 2.12: සෙත්සිරිපාය අදියර I හා II



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

රූපය 2.13: පොල්දූව



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

ඇමුණුම අංක 10 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි ව්‍යාප්තිය ඉදිරිපත් කෙරේ.

### 2.3.2.4 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික පසුබිම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික පසුබිම පිළිබද සලකා බැලීමේදී, එය පාරිසරික සංවේදී ප්‍රදේශ, ප්‍රදේශයෙහි පවතින ස්භාවික ආපදා මෙන්ම ප්‍රදේශය තුල පවතින පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු මෙන්ම පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන පිළිබඳ සලකා බැලේ.

#### 2.3.2.4.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික සංවේදී ප්‍රදේශ

සමස්ත භූමි ප්‍රමාණයෙන් 20 % ක භූමි ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ ගණයට අයත් වන අතර, ඉන් 58 % කුඹුරු හා2 2 %වගුරු බිම් ද වේ .ශ්‍රී ජයවර්ධනපුර කුරුළු අභය භූමිය ,කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයට මායිම්ව පිහිටා තිබීමත් සහ තවත් වැදගත් පාරිසරික සංවේදී ප්‍රදේශ වනතලංගම වැව , පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය හා කොරතොට පන්සල් කන්ද පිහිටා තිබීමත් හදුනාගත හැකිය .

##### 2.3.2.4.1.1 ශ්‍රී ජයවර්ධනපුර කුරුළු අභය භූමිය

රැම්සාර්“ වන සමුළුවේදී කොළඹ පිහිටි තෙත්බිම් 13 වන දින ඩුබායි හි පැවති රැම්සාර් සම්මුතියේ 25 ඔක්තෝම්බර් මස 2018 (Ramsar City) ”නගරයක්ලෙස ප්‍රකාශයට පත්කරන ලද අතර එසේ සදහන් කරන ලද තෙත්බිම් අතරින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කුරුළු අභය භූමිය පිහිටි තෙත්බිම් පද්ධතියෙන් කොටසක් කඩුවෙල මහා නගරසභා බල ප්‍රදේශයට අයත් වීම ද සුවිශේෂිතාවයකි.

##### 2.3.2.4.1.2 තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය

කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති තලංගම වැව සහ පරිවාරයේ ජලාශ්‍රිත පරිසර පද්ධතිය, වර්තමානයේ තලංගම උතුර, මුත්තේගොඩ, තලංගම දකුණ, බටපොත සහ කුමාරගේ වත්ත යන ග්‍රාම නිලධාරී වසම්වලට අයත් වේ.

තලංගම වැව ආශ්‍රිත ප්‍රදේශයම වන අතර එහි පක්ෂි විශේෂ සංඛ්‍යාව“ තෙත්බිම් පරිසර පද්ධතියක්”207ක් පමණ හමුවී ඇත ඉන් . ලංකාවට ආවේණික විශේෂ ගණන 23කි. සංක්‍රමණික විශේෂ ගණන 95කි. පක්ෂීන්ට අමතරව, ක්ෂීරපායී සත්ත්ව විශේෂ 24ක් ද, මිරිදිය මත්ස්‍ය විශේෂ 35ක් ද, සමනල විශේෂ 64ක් ද, බත්කූරු විශේෂ 37ක් ද, උරග විශේෂ 23ක් ද මෙම ප්‍රදේශයෙන් වාසය කරනු ලබයි.

පාරිසරික වැදගත්කමකින් යුක්ත මෙම තලංගම තෙත් බිම් පරිසර පද්ධතිය 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතට අනුව 2007/03/05 දින පාරිසරික ආරක්ෂණ ප්‍රදේශයක් බවට මධ්‍යම පරිසර අධිකාරිය මගින් අංක 1487/10 ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. වැව ආශ්‍රිත ප්‍රදේශය හෙක්. 118 පමණ වේ.

ඇමුණුම අංක 11 යටතේ තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය ඉදිරිපත් කෙරේ.

##### 2.3.2.4.1.3 දැඩිගමුව කන්ද පරිසර ආරක්ෂණ බල ප්‍රදේශය හා කොරතොට පන්සල් කන්ද

කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති විශේෂිත වූ පාරිසරික සහ භූ දර්ශන අගයකින් යුත් කදු පන්ති අතුරෙන් අවම පාරිසරික හානියක් සිදුවී ඇති කදු ප්‍රදේශය ලෙස දැඩිගමුව කන්ද හැදින්විය හැකිය. දැඩිගමුව කන්දේ පවතින ජෛව

විවිධත්වයත් ,මෙහි පවතින ස්වභාවික ජල උල්පත් නිසා ජල පෝෂිත ප්‍රදේශයක් ලෙසත්,මෙම කන්දේ බටහිර පාමුලට වන්නට ගලායන හෙට්ටිගේ ඔය නිසාත්දැඩිගමුව කන්ද හා ඒ ආශ්‍රිත ප්‍රදේශය විශේෂ පාරිසරික වටිනාකම ,ක් ඇති ප්‍රදේශයක් ලෙස සැලකිය හැකිය .තවද ඓතිහාසික වටිනාකමකින් යුක්ත ලෙන් විහාරදැඩිගමුව කන්ද ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු , ස්ථාන වේ .

දැඩිගමුව කන්ද පරිසර ආරක්ෂණ බල ප්‍රදේශය හා කොරතොට පන්සල් කන්ද නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ දරන ගැසට් පත්‍රය 28/1627 දින අංක 13 නොවැම්බර් මස 2009 .ලෙස ඇතුලත් කර සංරක්ෂණය කර ඇත "කඩුවෙල උස්බිම් සංරක්ෂිත කලාපය" මගින් කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම යටතේ එම ගැසට් පත්‍රය ඇමුණුම අංක 12 මගින් ඉදිරිපත් කර ඇත.

රූපය 2.14: තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරින්

සිතියම් අංක 2.13 යටතේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික සංවේදී ප්‍රදේශ ඉදිරිපත් කෙරේ.

සිතියම් අංක 2.13: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පාරිසරික සංවේදී ප්‍රදේශ




සැකසුම:පරිසර හා භූ දර්ශන අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

### 2.3.2.4.2 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ස්වභාවික ආපදා

ශ්‍රී ලංකාව, දේශගුණික අව බලපෑම් (Climate effect) වලට භාජනය වන රටවල් අතුරින් එකකි. මෙම දේශගුණික විපර්යාසයන් නිසා රටේ මුහුදුබඩ ප්‍රදේශකදුකර ප්‍රදේශ සහ විය,ගංගා ආශ්‍රිත ප්‍රදේශ,ළි කලාපයේ විශාල ප්‍රදේශයක දෛනික කටයුතු සඳහා බාධා පැමිණෙන අතර එය රටේ ආර්ථික තත්ත්වයට විශාල වශයෙන් බලපායි.

කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ ප්‍රධාන වශයෙන් සිදුවන ආපදාව ලෙස අධික වර්ෂාව හේතුවෙන් කැළණි ගඟ පිටාර ගැලීම නිසා ඇතිවන ගංවතුර අවධානම සඳහන් කල හැකිය.

ජල ගැලීම් යනු විශේෂවුන් ඉතා වැදගත් වූත් පාරිසරික අවශ්‍යතාවයකි. ගංගා පිටාර ගැලීමට බහුලව බලපාන සාධකය අධික වර්ෂාව වන නමුත්, ජල ගැලීම් ඇතිවීමට තවත් බොහෝ හේතු පවතී. විශේෂයෙන්ම මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ගැලීම් ඇති වීමේ වැඩිවීමක් පසුගිය වසරවලදී දක්නට ලැබුණු බව ගංවතුරට මුහුණ දුන් කැළණි ගඟ අවට බොහෝ ප්‍රදේශවල ජනතාව පවසති.

එනම් වගුරු බිම් ගොඩ කිරීම,ඉහළ ජලාධාර ප්‍රදේශවල වනාන්තර එළි කිරීම,, වනාන්තර එළි කිරීම නිසා පසට ජලය උරාගැනීමේ හැකියාව අඩු වන අතර මතුපිට පස වැලි ජලය සමඟ ගංගා දක්වා ගලා යැම සිදු වේ. රොන්මඩ නිසා ජලාශ ගොඩ වීමත්, අනතුරුව ජලාශවල අපේක්ෂිත ධාරිතාව බිඳ වැටීම නිසා නිරන්තරව පහත් ප්‍රදේශවලට අධික පීඩනයක් යටතේ ඇති ජලය ක්ෂණික ව

නිදහස් කිරීමට සිදු වීමත් නිසාද ගංවතුර ඇති වේ .කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ජල ගැලීම් නිසා ආපදාවන්ට ලක් වූ නිවාස හා දැඩි සුළං නිසා ආපදාවන්ට ලක් වූ නිවාස පිළිබද තොරතුරු වගු අංක.2.9 මගින් ඉදිරිපත් කෙරේ.

වගු අංක 2.9: ජල ගැලීම් හා දැඩි සුළං නිසා ආපදාවන්ට ලක් වූ නිවාස පිළිබද තොරතුරු

| | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|
| ජල ගැලීම් නිසා ආපදාවන්ට ලක් වූ නිවාස | 388 | 686 | 291 | 53 |
| දැඩි සුළං නිසා ආපදාවන්ට ලක් වූ නිවාස | 15 | 15 | 116 | 183 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ , 2020 - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

රූපය 2.13: කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ ජල ගැලීම් වලට ලක්වූ ප්‍රදේශ




මූලාශ්‍රය -කඩුවෙල ප්‍රදේශීය ලේකම් කාර්‍යාලය -2023.

### 2.3.2.4.3 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පොදු එළිමහන් ,විවේක හා විනෝද කටයුතු

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ යෝජිත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු සංවර්ධනය කිරීම මෙම සැලැස්ම මගින් සිදු කෙරේ.

මෙය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සඳහා යෝජනා කරනු ලැබූ උද්‍යාන ස්ථාපනය කිරීමේ අනුපිළිවෙලක් වන අතර, ඇවිද යා හැකි දුර ප්‍රමාණය මූලික පදනම වේ. නාගරික සංවර්ධන අධිකාරියේ ගණනය කිරීම්වලට අනුව ජනගහනය පුද්ගලයන් 1000ට හෙක්ටයාර් 1 අවම වශයෙන් පොදු එළිමහන් විවේක කටයුතු සඳහා විවෘත භූමි ලෙස සංවර්ධන සැලැස්ම සැකසීමේ දී වෙන්කළ යුතුය.

විවේක සහ විනෝද පහසුකම් සෘජු හා වක්‍ර ලෙස ආකාර දෙකකි. සෘජු විවේක සහ විනෝද පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී විය හැකි ක්‍රීඩා කිරීම සඳහා වෙන් කරන ලද විශේෂ පහසුකම් සහ ඉඩ ප්‍රමාණයක් හෝ උපකරණ අවශ්‍ය වන පාපන්දු,

අත්පන්දු, ටෙනිස් වැනි ක්‍රීඩා ආදිය අයත් වේ. වක්‍ර විවේක සහ විනෝද පහසුකම් යටතේ ඇවිදීම, ඡායාරූපකරණය, සොබාදම් නැරඹීම, කුරුල්ලන් නැරඹීම වැනි විශේෂ පහසුකම් අවශ්‍ය නොවන ක්‍රියාකාරකම් අයත් වේ.

කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ 2020 වසර වන විට ජනගහනය 281,308ක් ලෙසත්, වසර 2033වන විට එම ජනගහනය 454,614 ක් දක්වා වර්ධනය වන බව ද පුරෝකථනය කර ඇත. ඒ අනුව, 2033 වර්ෂය වන විට පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර 454 ක් වෙන්කළ යුතුව ඇත. නමුත් පවතින සීමිත බිම් ප්‍රමාණය හේතුවෙන් ජනගහනය 1000ට හෙක්ටයාර 0.5ක් ලෙස සලකා 2033 දී වැඩිවන ජනගනය සඳහා අවශ්‍ය පොදු එළිමහන් විවෘත භූමි ලෙස හෙක්ටයාර 227 ක් අවම වශයෙන් ඒ සඳහා වෙන් කිරීම කළ යුතුව ඇත.

වසර 2033 වන විට මෙම මහ නගරසභා බල ප්‍රදේශයේ පවතින ඉහත සඳහන් වර්ගීකරණයට අයත් ක්‍රීඩාපිටි හා උද්‍යාන පිළිබඳ විස්තර සිතියම් අංක 2.13, වගු අංක 2.10 සහ වගු අංක 2.12 යටතේ දක්වා ඇත.

වගු අංක 2.10: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන

| අනු අංක | ක්‍රීඩාපිටි හා උද්‍යාන වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| 1 | පවතින ඉතා කුඩා උද්‍යාන<br>Existing Pocket Parks (EPP) | 1.35 |
| 2 | පවතින කුඩා උද්‍යාන<br>Existing Mini Parks (EMP) | 5.05 |
| 3 | පවතින අසල උද්‍යාන<br>Existing Local Parks (ELP) | 2.35 |
| 4 | පවතින ප්‍රජා උද්‍යාන<br>Existing Community Parks (ECP) | 8.39 |
| 5 | පවතින නගර උද්‍යාන<br>Existing Town Parks (ETP) | 7.32 |
| 6 | පවතින රේඛීය උද්‍යාන<br>Existing Linear Park (ELiP) | 5.37 |
| | **එකතුව** | **29.83** |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2020), පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි

වක්‍ර විවේක සහ විනෝද පහසුකම් යටතේ සලකා බලනු ලබන සිනමා ශාලා, පුස්තකාල, ගෘහස්ත ක්‍රීඩාංගන ආදිය ද මේ සඳහා යොදාගත හැකි වේ. මහ නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රජා ශාලා 27ක්, සිනමා ශාලා 5ක්, පුස්තකාල 15ක් පමණ ස්ථාපනය වී ඇති අතර, මෙම විවේක සහ විනෝද පහසුකම සපුරා ගැනීම සඳහා මෙම ස්ථානවල පහසුකම් වැඩි දියුණු කළ යුතු වේ.

මීට අමතරව මෙම නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇති පොදු නොවන නමුත් ඇතුලත්වීමේ ගාස්තුවක් ගෙවා මෙම විවේක හා විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන වගු අංක 2.11 යටතේ දක්වා ඇත.

වගු අංක 2.11 විවේක සහ විනෝද පහසුකම් සපුරාගත හැකි අනෙකුත් ස්ථාන

| අනු අංකය | විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | ග්‍රාම නිලධාරී කොට්ඨාසය |
|---|---|---|---|---|
| 1 | EWP | දියසරු තෙත්බිම් උද්‍යානය | 7.48 | පහළවෙල |
| 2 | EORS1 | අපේ ගම පරිශ්‍රය | 4.02 | පහළවෙල |

සිතියම් අංක 2.13: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පොදු ක්‍රීඩා පිටි හා උද්‍යාන



සැකසුම: පරිසර හා භූ දර්ශන අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

වගු අංක 2.12 පවත්නා උද්‍යාන වර්ගීකරණය

| අනු අංකය | උද්‍යාන සහ ක්‍රීඩාපිටි වර්ගය | වර්තමාන භාවිතය | ප්‍රමාණය (හෙක්ටයාර්) | ග්‍රාම නිලධාරී කොට්ඨාසය |
|---|---|---|---|---|
| | පවතින ඉතා කුඩා උද්‍යාන (EPP) | | | |
| 1 | EPP1 | මාලබේ එළිමහන් ශරීර සුවතා මධ්‍යස්ථානය | 0.05 | මාලබේ බටහිර |
| 2 | EPP2 | වෙල්ලන්ගිරිය ක්‍රීඩාපිටිය | 0.06 | වැල්ලන්ගිරිය |
| 3 | EPP3 | ක්‍රීඩාපිටිය | 0.07 | රණාල |
| 4 | EPP4 | ඔසු උද්‍යානය | 0.08 | බත්තරමුල්ල දකුණ |
| 5 | EPP5 | ඉසුරුපුර ක්‍රීඩාංගනය | 0.08 | මාලබේ උතුර |
| 6 | EPP6 | ළමා උද්‍යානය | 0.11 | ඔරුවල |
| 7 | EPP7 | සරත් සුමනසේකර ක්‍රීඩාංගනය | 0.14 | ආසිරි උයන |
| 8 | EPP8 | ළමා උද්‍යානය | 0.15 | ජයවඩනගම |
| 9 | EPP9 | ක්‍රීඩාපිටිය | 0.15 | ඉහළ බෝමිරිය |
| 10 | EPP10 | ක්‍රීඩාපිටිය | 0.15 | පොතුඅරාව |
| 11 | EPP11 | සුප්‍රීම් සිටි ක්‍රීඩාපිටිය | 0.15 | මාලබේ නැගෙනහිර |
| 12 | EPP12 | ජයවඩනගම ක්‍රීඩාපිටිය | 0.16 | ජයවඩනගම |
| | | එකතුව | 1.35 | |
| | පවතින කුඩා උද්‍යාන (EMP) | | | |
| 13 | EMP1 | මෙල්ෆෝර්ට් ස්ටේට් ළමා උද්‍යානය | 0.22 | කොතලාවල |
| 14 | EMP2 | රෝහණ ජයසේකරපුර ක්‍රීඩාපිටිය | 0.25 | වැලිපිල්ලෑව |
| 15 | EMP3 | රග්ගහවත්ත ක්‍රීඩාපිටිය | 0.26 | රග්ගහවත්ත |
| 16 | EMP4 | කැකුනගලවත්ත ක්‍රීඩාපිටිය | 0.29 | පොතුඅරාව |
| 17 | EMP5 | පොදු උද්‍යානය සහ ළමා උද්‍යානය | 0.29 | අරුප්පිටිය |

| | | | | |
|---|---|---|---|---|
| 18 | EMP6 | ලේක් ටෙරස් ක්‍රීඩාපිටිය | 0.3 | තුන්අඟහේන |
| 19 | EMP7 | ක්‍රීඩාපිටිය | 0.37 | මාලබේ උතුර |
| 20 | EMP8 | ශාන්තලොකුගම ක්‍රීඩාපිටිය | 0.49 | ශාන්තාලෝකගම |
| 21 | EMP9 | පුබුදු ක්‍රීඩාපිටිය | 0.51 | තලංගම උතුර A |
| 22 | EMP10 | ක්‍රීඩාපිටිය | 0.6 | වැලිවිට |
| 23 | EMP11 | ක්‍රීඩාපිටිය | 0.63 | පහළ බෝමිරිය B |
| 24 | EMP12 | අභයපුර ක්‍රීඩාපිටිය | 0.84 | තුන්අඟහේන |
| | | එකතුව | 5.05 | |
| | පවතින අසල උද්‍යාන (ELP) | | | |
| 25 | ELP1 | ජී.එච්.බුද්ධදාස ක්‍රීඩාපිටිය | 1.15 | පහළවෙල |
| 26 | ELP2 | කිංස්ලි සේනාරත්න ක්‍රීඩාපිටිය | 1.2 | වැකේවත්ත |
| | | එකතුව | 2.35 | |
| | පවතින ප්‍රජා උද්‍යාන (ECP) | | | |
| 27 | ECP1 | ජාතික සදුන් උයන | 3.78 | පහළවෙල |
| 28 | ECP2 | පාර්ලිමේන්තු ක්‍රීඩාපිටිය සහ ඇවිදින මං තීරුව | 4.61 | බත්තරමුල්ල දකුණ |
| | | එකතුව | 8.39 | |
| | පවතින නගර උද්‍යාන (ETP) | | | |
| 29 | ETP1 | දියත උයන | 7.32 | සුභූතිපුර |
| | | එකතුව | 7.32 | |
| | පවතින රේඛීය උද්‍යාන (ELiP) | | | |
| 30 | ELiP1 | අමරගොඩ ඇවිදින මංතීරුව | 0.45 | වැකේවත්ත, අරංගල, කුමාරගේවත්ත |
| 31 | ELiP2 | මාලබේ ඇවිදින මංතීරුව | 0.68 | මාලබේ බටහිර, තලාහේන උතුර |

| | | | | |
|---|---|---|---|---|
| **32** | **ELiP3** | **එම්.ඕ.ඩී. ඇවිදින මංතීරුව** | **1.16** | **ආසිරි උයන, අරුප්පිටිය** |
| **33** | **ELiP4** | **පාර්ලිමේන්තු ඇවිදින මං තීරුව** | **1.35** | **පහළවෙල** |
| **34** | **ELiP5** | **තුන්අඟහේන ඇවිදින මං තීරුව** | **1.73** | **මාලබේ නැගෙනහිර, හෝකන්දර උතුර, පෝරේ** |
| | | **එකතුව** | **5.37** | |
| | | **සමස්ත එකතුව** | **29.83** | |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2020), පරිසර හා භූ දර්ශන අංශය, නා.සං.අධි

**2.3.2.4.4 සංස්කෘතික, ආගමික, වාස්තු විද්‍යාත්මක සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන.**

කඩුවෙල ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම දෙස බැලීමේදී මුල්ලේරියා සටන මෙහෙය වීම සඳහා මෙම ප්‍රදේශයෙන් අංගම් පොර සටන්කරුවන් විශාල පිරිසක් රැගෙන යාමද ඓතිහාසික වශයෙන් විශේෂත්වයකි. කඩුවෙල මහ නගර සභා බලප්‍රදේශය තුල පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ස්ථාන කිහිපයක් හඳුනාගතහැකි අතර ඒවා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ගැසට් කරනලද පහත සඳහන් ස්ථාන වේ.

- **කොරතොට රජමහා විහාරය (ගැසට් අංකය 1264 - 2002/02/22)**

කොරතොට ග්‍රාමය තුල පිහිටා ඇති අතර මෙම විහාරස්ථානය අනුරාධපුර යුගයට අයත්වේ. කඩුවෙල හෝමාගම බස් මාර්ගයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. මෙය ලෙන් විහාරයක් වන අතර මෙහි කටාරම් කෙටූ ගල් ලෙන් 6 ක් හා (Cave) සෙල්ලිපි (Inscriptions) දක්නට ඇත. මෙම සෙල්ලිපි අවුරුදු 2000 ට වඩා පැරණි ඒවා බව හඳුනාගෙන ඇත. මෙහි විශාලම ගල්ලෙන මීටර් 25 ක දිගින් හා මීටර් 15 ක් පළලින්ද වන අතර උස මීටර් 18 ක් වේ. මෙහි විශාල හිටි බුදු පිළිම 05ක් දක්නට ඇත. බස්නාහිර පලාතේ ඇති උසම සමාධි බුදුපිළිමද මෙහි දක්නට ඇත. මෙම බුදු පිළිම මහනුවර යුගයෙන් පසු ප්‍රතිසංස්කරණය කරන ලද ඒවා වේ. මෙම විහාරස්ථානය වලගම්බා රජු විසින් සාදන ලද්දකි. සෙල්ලිපි වලට අමතරව බිතුසිතුවම්, චිත්‍ර මූර්ති, හා කැටයම්ද ලෙන සහිත උමං මාර්ගයක්ද මෙහි දකනට ඇත. වර්තමානයේ එය වැසී තිබුනද අතිතයේ කැළණිගඟ කඩු වක්කලම දක්වා විහිදී ගිය බව සඳහන්ය. කොරතොට රජමහා විහාරය දැනටද වැඳුම් පිදුම් ලබන ප්‍රසිද්ධ විහාරස්ථානයකි.

- **නවගමුව කටාරම් ලෙන**

මෙම කටාරම් කෙටූ ලෙනෙහි වහලය ලෙස ඇත්තේ ගල්තලාවයි. ලෙන් ලිපි, බිතුසිතුවම්, චිත්‍ර, මූර්ති හා කැටයම් මෙම ලෙන තුල දක්නට ඇත. මෙම ලෙන අනුරාධපුර යුගයට අයත් ලෙස සැලකේ.

- **නවගමුව රජමහා විහාරය**

පැරණි ගල් කණු, පැරණි පිළිමගෙයි නටඹුන් දැනට දක්නට ඇති අතර නවගමුව පත්තිනි දේවාලයද මෙම විහාර භූමියෙහිම පිහිටා ඇත. මෙම විහාරස්ථානය නවගමුව සුගතබිම්බාරාමය ලෙස නම්කර තිබුනද නවගමුව පත්තිනි දේවාලය යනුවෙන් ලංකාව පුරා ප්‍රචලිත

වී ඇත. නවගමුව දේවාලය වැඳපුදා ගැනීමට එන සියළුම බැතිමතුන් මෙම රජමහා විහාරයද වන්දනාමාන කරන අතර හොඳින් ආරක්ෂා වී ඇති ස්ථානයක් ලෙස හැඳින්විය හැක.

- **නවගමුව දේවාලය (ගැසට් අංක 1264- 2002/02/22)**

කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නවගමුව ග්‍රාමයේ කොළඹ - රත්නපුර මාර්ගයේ 13 වන සැතපුම් කණුව අසල කැළණි ගඟ ආශ්‍රිතව මෙම දේවාලය පිහිටා ඇත. පුරාවෘතයන්ට අනුව මෙම දේවාලය මුලින්ම පිහිටුවා ඇත්තේ ක්‍රි.ව. පළමු සියවසේදීය. කෙසේවුවද පුරාවිද්‍යාත්මක ගවේශනවලට අනුව ක්‍රි. පූ. අවධියට අයත් පෞරාණික නටඹුන්පවා මෙම ප්‍රදේශයෙන් සොයාගෙන ඇත. මෙම දේවාලය ආරම්භ කර ඇත්තේ ගජබා රජු විසිනි. එය “පත්තිනි කෝල්මුරකවි” පොතේද සඳහන්ය. නවගමුව පත්තිනි දේවාලයේ ඉතිහාසය ක්‍රි. පූ. අවධිය දක්වා දිවෙන බව කියවෙන ජනප්‍රවාද කිහිපයකි. කෝට්ටේ යුගයේදී මෙම ප්‍රදේශය හේවාගම් කෝරළය ලෙස හැඳින්වූ බව රාජවලියේ සඳහන්වේ. නවගමුව පත්තින්දේවාලය පිළිබඳව මුල්ම ලිඛිත සාධකය හමුවන්නේ කෝට්ටේ යුගයේදීය. ක්‍රි.ව. 1521-1580 කාලයේදී මායාදුන්නේ රජතුමා සීතාවක සිට කොළඹ කොටුවේ පරංගීන් හා යුධවැදීමට යන අතරතුර නවගමුව පත්තිනි දේවාලයට භාරයක් වී ගිය බවද සඳහන්වේ.එමෙන්ම 1576 දී පෘතුගීසීන් නවගමුව දේවාලය විනාශකර එය යුධකඳවුරක් ලෙස යොදාගත් බවත් එහි තිබූ ගල්කණු ආදිය යොදාගන ඒ අසල පෘතුගීසි පල්ලියක් ඉදිකළ බවත් සඳහන්වේ. මෙසේ විනාශ කළ දේවාලය නැවතවරක් මායාදුන්නේ රජු විසින් ප්‍රතිසංස්කරණය කරන ලදී.මෙම භූමියේ අවට ප්‍රදේශවල තිබී ඌරාකැට ළිං, ඕලන්ද කාසි හා බුද්ධ ප්‍රතිමා ආදිය හමුවී ඇත. නවගමුව දේවාලයට දෙන ලද රාජකීය ප්‍රධානයන් පිළිබඳ විස්තර කෝට්ටේ යුගයේ බුවනෙකබා රජතුමා විසින් පවරණලද “ගොඩගම සන්නසෙහි” සඳහන්ව ඇත. පත්තිනි දේවාලයට අමතරව විශ්ණු, කතරගම, දැඩිමිණුඩ, සමන්, ඊශ්වර සම ගණ දේවාලය යන ඒවාද මෙහි දක්නට ඇත.

1813 - 1978 කාලවකවානුව තුල දේවාලයේ සංරක්ෂණ කටයුතු සිදු කර ඇති අතර ඉන්පසු 2016 වසර වනතුරු කිසිදු සංරක්ෂණ කටයුත්තක් සිදුකර නොමැත. ආසන්න වශයෙන් වසර 100 ට පමණ පසු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ (Guideline & Principals) මුලධර්ම හා සිද්ධාන්ත වලට අනුව සංරක්ෂණ කටයුතු සිදුකර ඇත. මේ අතරට ලී කැටයම් සංරක්ෂණය කිරීම, පොලව සඳහා ගල් ඇල්ලීම, වහලය ප්‍රතිසංස්කරණය කිරීම යනාදිය සිදුකර ඇත. ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සිද්ධාන්තයන්ට අනුව විශේෂ ස්මාරක (Monuments) 08 ක් සංරක්ෂණය සඳහා හඳුනාගෙන ඇත. ඒවා නම් පිළිමගෙය (Shrine room) , සංඝාවාසය (The monks abode) , ගල්කණු (Stone pillars), මහා පත්තිනි දේවාලය, විශ්ණු දේවාලය, කතරගම දේවාලය, දැඩිමුණ්ඩ දේවාලය, වසර 100 ට වඩා පැරණි නා ගස වේ. නවගමුව දේවාලයද වර්තමානයේ බොහෝ බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍රවූ ස්ථානයකි. මෙම ස්ථානයද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් කර ඇත.

- **කොතලාවල සංඝපිට්ඨි විහාරය (ගැසට් අංකය 948 - 1996/11/01)**

කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවට අයත් කඩුවෙල කොතලාවල ග්‍රාමයේ මෙම විහාරස්ථානය පිහිටා ඇත. 19 වන සියවස මැද භාගයේ එනම් කෝට්ටේ යුගය අග භාගයේදී හෝ මහනුවර යුගයේ මුල් භාගයේ ආරම්භ වී ඇතැයි සැලකෙන මෙම විහාරස්ථානයේ මුල් යුගය පිළිබඳ තොරතුරු හෙලිවී නොමැත. මෙහි ධාතූන්වහන්සේලා තැන්පත් කිරීමට නිර්මාණය කරන ලද ආරක්ෂිත මණ්ඩපය, ඇම්බැක්කේ ලී කැටයම් හා සමාන තත්වයක පවතී. එමෙන්ම එහි ඇති සියුම් ලී කැටයම් මෙම විහාරස්ථානයේ ප්‍රෞඪ ඉතිහාසය විදහා දක්වයි.

මෙහි ඇති පැරණි බුදුපිළිම හා සිතුවම් කෝට්ටේ යුගයට අයත් බවට අනුමාන කරන අතර දැනට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ සංරක්ෂණය කර ඇත.මෙම විහාරස්ථානයේ ඓතිහාසික බව තහවුරු කරන දැනට පවතින එකම ලිඛිත සාක්ෂිය වන්නේ 1823 දී අත්තදස්සි හිමියන් විසින් බටුගෙදර ඥානාලංකාර හිමියන්ට පැවරීමට අදාල ලිපියයි. මෙම විහාරස්ථානය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් පුරාවිද්‍යා ස්ථානයක් ලෙස ගැසට් කර ඇත.

- **කොන්තගංතොට**

කොන්තගංතොට ඓතිහාසික උරුමයකි. පරංගින් කොළඹ කොටුවේ රජකරන විටද බ්‍රිතාන්‍යයන් ලංකාවට පැමිණි කාලයේද කෝට්ටේ ජනතාව දියවන්නා ඔය තරණය පිණිස පාවිච්චි කල තොටුපල කොන්තගංතොට නමින් හැදින්විණි . පසුකලෙක ඉංග්‍රීසින් ජනතාවගේ පහසුව සදහා ස්ථානයට උචිත කුඩා පාලමක් ඉදිකරන ලදී .

සැලළිහිණි සංදේශ කාව්‍ය මෙරට සංදේශ කාව්‍ය ඉතිහාසයේ වැදගත් සළකුණකි. 6 වන පැරකුම්බා රජු කෝට්ටේ රාජධානිය පාලනය කරන සමයෙහි ලියවුන මෙය කෝට්ටේ සිට කැළණිය විභීෂණ දෙවියන්ට කරනු ලබන ඉල්ලීමක් රැගෙන සැලළිහිණියෙකු විසින් යන ගමනක විස්තරය ඇතුලත් කාව්‍යකි. සැලළිහිණියා ගිය ගමන කෝට්ටේ රාජධානියෙන් ආරම්භව බත්තරමුල්ල කඩුවෙල හරහා දියවන්නා ඔය මතින් ගමන් කර ඇති බව එහි සඳහන්වේ. මෙහි සඳහන් කොන්තගන්තොට පුරාවිද්‍යා ස්ථානය බත්තරමුල්ල මංසන්ධියේ සිට පාර්ලිමේන්තු වටරවුම දෙසට ගමන්කරන විට හමුවේ. පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පුවරුවක් පවා එහි සවිකර තිබුන නමුත් දැනට මෙම ස්ථානය දක්නට නොමැත.දැනට එහි ගොඩනැගිල්ලක් ඉදකර ඇත .

- **කොරතොට බැළුම්ගල**

රණකෙළියට ප්‍රකට වූ නිසා කෙළිතොට වී පසුව එය ජනවහරෙන් කොරතොට වී ඇත. කොරතොට කඳුශිකරය අතීත රාවණ රජුගේ යුධ බලකොටුවක් ලෙසද පසුකාලීනව වලගම්බා රජුගේ යුධ පුහුණු මධ්‍යස්ථානයක් ලෙසද පසුව ටිකිරි කුමරුන්ගේ ප්‍රධාන අංගම් මධ්‍යස්ථානය ලෙසද පැවත ඇත. මේ කරුණු එහි ලියවී ඇති සෙල්ලිපි වලින්ද සඳහන්වේ. පෘතුගීසි ජාතිකයන් සමග ඇති වූ සටන් වලදී මෙම බැළුම්ගල කේන්ද්‍රස්ථානයක් ලෙස යොදාගෙන ඇත. මෙම ස්ථානය දැනට දක්නට තිබුනද ගල්වලවල් නිසා විනාශයට යමින් පවතී.

- **ඇඹුදොල කන්ද (ආඳා දොල කන්ද) (ගැසට් අංකය 1739 - 2011/12/30)**

  කටාරම් කෙටූ ස්වාභාවික ලෙන් දෙකක් පිහිටා ඇති අතර ඒවා ප්‍රාග් ඓතිහාසික යුගයට අයත්වේ. වර්තමානයේ ගල්වලවල් පවත්වාගෙන යාම හේතුවෙන් විනාශයට පත්වෙමින් පවතී. මෙම ස්ථානයද ගැසට් අංක 1739- 2011/12/30 දින ගැසට් කර ඇති ආරක්ෂිත ස්ථානයකි.

- **රන්කඩු පත්තිනි දේවාලය**

රන් කඩු පත්තිනි දේවාලය අතිතයේ හඳුන්වා ඇත්තේ "කඩු දෙවොල" යනුවෙනි. මෙම දේවාලය vi වන පැරකුම්බා සමයටත් පෙර ගජබා සමය දක්වා ඉතිහාසයට දිව යයි. රන්කඩු පත්තිනි දේවාලය පත්තිනි, මැණික් බණ්ඩාර වැනි මහා දෙවිවරුන්ගේ මෙන්ම සීතාවක රාජසිංහ, සීතාවක මායාදුන්නේ වැනි රජවරුන්ගේ පාද ස්පර්ෂය ලත් ස්ථානයකි. මෙම දේවාලය පිළිබඳ ජනප්‍රවාදයට අනුව, මෙයට අයිතිවාසිකම් කියමින් මෙහි අධිපති දෙවියන් වූ මැණික් බණ්ඩාර දෙවියන් හා බණ්ඩාර හත් කට්ටුවේ සහෝදර දෙවියන් අතර

ඇතිවූ විසම්මුතියකදී පත්තිනි දේව මෑණියන් මෙම ස්ථානයට වැඩමවා එම ආරවුල සංසිඳුවා මැණික් බණ්ඩාර දෙවියන්ට මෙම දේවාලය භාරදුන් බවට සඳහන් වේ. එසේම පෘතුගීසීන් බෞද්ධ විහාර හා දේවාල විනාශ කර වටිනා පුරාවස්තු කොල් කද්දී එම දේවාලවල කපු මහතුන් මැණික් බණ්ඩාර දෙවිඳුන්ගේ දේවාභරණ රැගෙන මෙම කඩුදෙවොල් කන්දට පැන ආ බවත් එම දේවාභරණ මෙහි සඟවා තැබූ බවත් සඳහන්වේ. vi වන පරාක්‍රමබාහු රජු විසින් මැණික් බණ්ඩාර දෙවියන් පූජා කළ රන් කඩුව මෙම දේවාල භූමියේ පොළොව යට තැන්පත් කර ඇති බවට විශ්වාස කෙරේ. මෙම දේවාලයද වර්තමානයේ බැතිමතුන්ගේ ගෞරවාදරයට පාත්‍රවූ හොඳින් ආරක්ෂා වී ඇති ස්ථානයකි.

- **හීනටිකුඹුර පුරාණ විහාරය**

ශතවර්ෂයකට වැඩිය පැරණි ඉතිහාසයකට හිමිකම් කියන හීනටිකුඹුර පුරාණ විහාරය , උතුරු තලංගම හීනටිකුඹුර ග්‍රාමයේ පිහිටා ඇත . විහාර භූමිය තල කීපයකින් සමන්විතව ඇත . ප්‍රධාන පිවිසුමෙන් ඇතුල් වූ පසු දකුණු පස මදක් උස්බිම් තීරයක සන්ථාර කුළුණ , විහාර මන්දිරය සහ බුබ්බුලාකාර චෛත්‍ය ඉදිකර තිබේ . මාධ්‍යකාලීන විහාර සම්ප්‍රදායේ ආකෘතියට නිමවා ඇති විහාර මන්දිරය වෙත පිවිසීමට පියගැට පෙළක් නිමවා ඇත . විහාරස්ථානයේ වම්පස ඇති ධර්ම ශාලාවද පැරණි ආකෘතියට ඉදිකර ඇත .බෝධිය ඉදිරියේ ඇති සමාධි පිළිමය මෑතකාලීන එකක් වන අතර සිත්ගන්නා සුළු අයුරින් නිමවා ඇත.

1900 වසරේ ඇතුල්කෝට්ටේ සිරිපැරකුම්බා පිරිවෙනෙහි වැඩසිටි මාදුලාවේ ඉන්ද්‍රජෝති හිමියන් මෙම විහාරස්ථානයේ මූලාරම්භය සිදුකර ඇත . එකල බටකොළ සෙවිළි කල මඩුවක උන්වහන්සේ වස් සමාදන් වී ඇත .

- **හෝකන්දර පුරාණ විහාරය .**

පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් මෙම විහාරස්ථානයේ ප්‍රධාන ආකර්ශනීය ස්ථාන වන්නේ රූපමන්දිරය සහ සන්ථාරයයි . මෙම සන්ථාර කුළුණේ පතුලේ බෞද්ධ හා ක්‍රිස් යානි යුගවල සදහන් වර්ෂ ඇතුළත් පුවරු දෙකක් දක්නට ඇත. රූපගෘහය අෂ්ඨාශ්‍ර හැඩැති ගොඩනැගිල්ලක් වන අතර එය කොටස් දෙකකින් යුක්ත වේ. දේවාලය හා පිටත කොටස වශයෙනි .රූප මන්දිරයේ පිටත කොටසේ කුඩා දේවාලයක්ද ඉදිකර ඇත. බුදුරදුන්ගේ ප්‍රධාන ශ්‍රාවකයන් දෙදෙනා වන සැරියුත් , මුගලන් තෙරුන්ගේ රූප දෙකක් සහිත විශාල හිඳි පිළිමයක් දේවාලය තුළ දක්නට ඇත . මෙහි ඇති ප්‍රථිමා ගෘහය සහ සන්ථාරය 2014 ජුනි 20 දින පුරාවිද්‍යා ආරක්ෂිත ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

රට පරිබාහිරව ශාන්ත ආනා දේවස්ථානය, පල්ලිය වත්ත පුරාවිද්‍යා ස්ථානය, මල්වත්තේගම සෙල්ලිපිය, සාලාව වනෝද්‍යාරාම විහාරය පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන අතර වේ. කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි පුරාවිද්‍යාත්මක ස්ථාන දැක්වෙන සිතියම ඇමුණුම අංක 13 මගින් ඉදිරිපත් කෙරේ.

# තෙවන පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

# තෙවන පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාව

## 3.1 හැඳින්වීම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය විශ්ලේෂණය කිරීමේදී, එහි වර්තමාන තත්වය භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ යටතේ හඳුනා ගන්නා ලදී. එසේ සැලසුම් ප්‍රදේශයේ වර්තමාන තත්වය කෙසේද යන්න විමසීම මගින් සැලසුමක සැබෑ අවශ්‍යතාවය සඳහා පිළිතුරු සපයා ගැනීමට අපේක්ෂා කරන ලබයි. සැලසුම යොමුවිය යුතු දිශාව සහ අනාගතයේ දී ප්‍රදේශයේ සංවර්ධනය යොමුකළ යුතු දිශානතිය හඳුනා ගැනීම සඳහා සැලසුමක සැබෑ අවශ්‍යතාවය හඳුනා ගැනීම හෝ සැලසුමක් සෑදිය යුතු හේතු හදුනා ගැනීම අවශ්‍ය වේ.

සැලසුමෙහි අවශ්‍යතාව හඳුනා ගැනීමේ දී සැලසුම් ප්‍රදේශය තුල පවත්නා විවිධ ගැටළු හඳුනා ගැනීම සදහා , මූලික වශයෙන්ම නගරය හා සම්බන්ධ වන විවිධ පාර්ශවකරුවන් විසින් හඳුනාගත් ගැටළු පිළිබදව අවධානය යොමු කරන ලදී. මේ යටතේ ප්‍රධාන පාර්ශවකරුවන් වන සේවා සපයන ආයතන සහ නගරය භාවිතා කරන්නන් හරහා නගරයේ (පුරවැසියන් සහ මගීන් ඇතුළු සාමාන්‍ය ජනතාව) දැනට පවතින ගැටළු පිළිබඳව අදහස් විමසන ලදී. මෙහිදී විවිධ පාර්ශවකරුවන් විසින් විවිධ පැතිකඩයන් හරහා පුළුල් පරාසයක් ආවරණය වන පරිදි විවිධ ගැටළු හඳුනා ගත හැකි විය.

දෙවනුව මෙලෙස , හඳුනාගත් ගැටළු පිලිබඳ සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය තුළින් ඔබ්බට ගොස් තත්ව විශ්ලේෂණ ක්‍රමෝපායන් ඔස්සේ තවදුරටත් අධ්‍යයනය කරමින් ප්‍රදේශයෙහි පවතින ගැටළු නිවැරදි ලෙස අර්ථ දැක්වීම සිදුකරන ලදී එසේ හඳුනාගත් ගැටළු හා විභවතා සවිස්තරාත්මකව අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ගැටළුවේ සන්දර්භය, ගැටළුවේ වැදගත්කම හා ගැටළුවේ විශාලත්වය යන කරුණු පදනම් කරගනිමින් හඳුනා ගත් එක් එක් ගැටළු පහත 3.2 යටතේ විග්‍රහ කරන ලදී.

තවද ,කඩුවෙල මහ නගර සභාව සඳහා නව සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීමේ දී, 2008-2020 සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ වලංගු කාලය අවසන් වීමනව , සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟීමට තවත් එක් ප්‍රධානතම හේතුවකි.

එසේම 2008-2020 සංවර්ධන සැලැස්මේ පැවති සාර්ථක උපායමාර්ග ඉදිරියට ගෙන යැමටත්, එහි පැවති දුර්වලතා මඟ හරවා ගනිමින් නව සැලසුම් ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට අදහස් කරනු ලබන අතර, ප්‍රකාශිත සංවර්ධන සැලැස්ම මගින් ආවරණය නොකරන ලද නව සංවර්ධන ප්‍රවණතා හඳුනා ගෙන එමගින් උපායශීලී ක්‍රියාමාර්ග කරා යොමු වීමටද අපේක්ෂා කරනු ලබයි.

කඩුවෙල ප්‍රදේශයේ පවතින ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමටත්, එම සම්පත් සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීමටත්, ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සුවපහසු හා ආරක්ෂාකාරී වටපිටාවක් නිර්මාණය කිරීම උදෙසාත්, නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව මූලික අදියරයෙහි දී හඳුනා ගන්නා ලදී.

### 3.2 හඳුනාගත් ගැටළු

#### 3.2.1 කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ පරිපාලන නගරයක ගති ලක්ෂණ ඉස්මතු නොවීම තුළ ප්‍රදේශය පිළිබඳව පවතින අඩු සංවේදීතාව

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය පරිපාලනමය, ආර්ථිකමය, පාරිසරික හා පුරාවිද්‍යාත්මක වශයෙන් ප්‍රදේශයටම ආවේණික වු ලක්ෂණයන්ගෙන් සමන්විත භූමි ප්‍රදේශයකි. බත්තරමුල්ල, මාලබේ, කඩුවෙල හා අතුරුගිරිය එහි ප්‍රධාන නාගරික කේන්ද්‍රයන් වේ.

1985 වර්ෂයේ දී එවකට එළඹි දේශපාලන තීරණයකට අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවර ලෙස නම් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සෙත්සිරිපාය හා ඉසුරුපාය පිළිවෙළින් බත්තරමුල්ල හා පැලවත්ත නගර ආශ්‍රිතව ස්ථාපනය විය. එකල සිට බත්තරමුල්ල ප්‍රදේශය ආශ්‍රිතව සංකේන්ද්‍රනය වූ පරිපාලන කටයුතු හේතුවෙන්, අද වන විට මෙම ප්‍රදේශය මෙරට ප්‍රමුඛතම ආයතනික නගරය බවට පත් වෙමින් පවතියි. එයට හේතු වී ඇත්තේ මෙරට ප්‍රමුඛතම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන රැසක මූලස්ථානය මෙම ප්‍රදේශය ආශ්‍රිතව සංකේන්ද්‍රනය වී පැවතීමයි.

එනමුත් 1982 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම තුළින්, එකී පරිපාලන ගොඩනැගිලි වල සංවර්ධනයට සමගාමීව, යෝජිත අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය නොවීම හේතුවෙන් එකල සිට නාගරික ජනතාවට විවධ ගැටළුකාරී තත්වයන්ට මුහුණදීමට සිදුවිය. එමෙන්ම එකල සිට සැලැස්මකට අනුව සිදුනොවු අවිධිමත් සංවර්ධනය ප්‍රදේශයෙහි රථ වාහන තදබදය වැනි නාගරික ගැටළු රැසක් ඇතිවීමට හේතු වී ඇත.

කෙසේ නමුත්, මෙරට පරිපාලන කටයුතු මෙම ප්‍රදේශයට ඒකරාශී වුවද, ආයතනික නගරයක් ලෙස කඩුවෙල නාගරික ප්‍රදේශය එකී ප්‍රදේශයට ආවේණික වු ලක්ෂණයන් සමන්විත නොවීම, ප්‍රාදේශීය අනන්‍යතාවය පිළිබඳ පවතින අඩු සංවේදීතාවට එක් ප්‍රධාන සාධකයකි. ඒ සඳහා ප්‍රදේශයෙහි පවතින ගොඩනැගිලි වල මුහුණත පෙනුම හා නාමපුවරු වල ස්වරූපය, සෘජු බලපෑමක් ඇති කරන අතර එය රූපය 3.1 මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 3.1: බත්තරමුල්ල නාගරික ප්‍රදේශයෙහි පවතින ගොඩනැගිලි හා නාමපුවරු වල ස්වරූපය





මූලාශ්‍රය :ක්ෂේත්‍ර සමීක්ෂණ, 2022

එමෙන්ම, ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුකූලව බත්තරමුල්ල ප්‍රදේශයට මෙරට ප්‍රමුඛතම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සංකේන්ද්‍රනය වුවද, එය මහජනතාවට පහසුකම් සපයන සුහදශීලී සේවා නගරයක් නොවීම ද බත්තරමුල්ල ආයතනික නගරයක් ලෙස අඩු සංවේදීතාවයක් ඇති වීමට හේතු වී ඇත. රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් නොයෙකුත් සේවා අවශ්‍යතා සපුරා ගැනීමට දෛනිකව පැමිණෙන දහස් සංඛ්‍යාත මගී ජනයාට අවශ්‍ය මූලික පහසුකම් නොමැති වීම මීට එක් ප්‍රධාන හේතුවකි. ක්ෂේත්‍ර සමීක්ෂණ වලින් හඳුනාගත් පරිදි බත්තරමුල්ල පොල්දූව මාර්ගයෙහි සතියේ දිනයන් හි දෛනිකව සියලුම වර්ගයේ රථ වාහන 100-200 ත් අතර ප්‍රමාණයක් මාර්ගය දෙපස නවතා තිබීම හඳුනා ගත හැකිය. ඊට හේතු වී ඇත්තේ ප්‍රදේශය තුළ පවතින රථ වාහන නැවතුම් මධ්‍යස්ථාන ප්‍රමාණවත් නොවීමත්, ඇතැම් රථ වාහන නැවතුම් මධ්‍යස්ථාන පිළිබඳව මහජනතාව දැනුවත් නොවීමත් ය. ඒ තුළින් ගම්‍ය වන්නේ සේවා ලබාගැනීමට පැමිණෙන මහජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් රථ වාහන නැවැත්වීමේ පහසුකම් ප්‍රදේශය තුළ නොමැති වීම හා පවතින රථ වාහන නැවතුම් මධ්‍යස්ථාන පිළිබඳව මනා මාර්ගෝපදේශනයක් ප්‍රදේශය තුළ නොමැති වීමයි.

රූපය 3.2: බත්තරමුල්ල පොල්දූව මාර්ගය දෙපස පවතින රථ වාහන



මූලාශ්‍රය :ක්ෂේත්‍ර සමීක්ෂණ, 2022

බත්තරමුල්ල නගරයෙහි දෛනිකව මහජනතාව ඒකරාශී වන සුහුරුපාය, සෙත්සිරිපාය වැනි ආයතනික ගොඩනැගිලි වලට මීටර් 500-700 අතර දුරකින් දියත උද්‍යානය පිහිටා තිබුන ද, සේවා ලබාගැනීමට පැමිණෙන මහජනතාවට තම දෛනික අවශ්‍යතා ඉටු කරගැනීමට හා සේවා අවශ්‍යතාවය ලබා දෙන තුරු විවේකීව ගත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පහසුකම් නගර මධ්‍ය තුළ නොතිබීම බත්තරමුල්ල නගරය සුහදශීලී සේවා නගරයක් නොවීමට තවත් එක් හේතුවකි. එමෙන්ම, ප්‍රදේශය තුළ පදිකයින්ට පහසුවෙන් ගමනාගමනය කිරීමට හැකි තරම් පදික මංතීරු ප්‍රමාණවත් නොවීම හා ආයතනික නගරයක් ලෙස මහජනතාවට පහසුවෙන් තම සේවය ලබාගැනීමට අවශ්‍ය සේවා ආයතනය ලෙස යොමු කිරීමට අවශ්‍ය නිසි මාර්ගෝපදේශනයක් නගරය තුළ නොතිබීම ප්‍රදේශය පිළිබදව පවතින ප්‍රාදේශීය අනන්‍යතාවය පිළිබද අඩු සංවේදීතාවට හේතු වී ඇති තවත් එක් සාධකයකි.

### 3.2.2 අධික ලෙස වර්ධනය වන රථ වාහන තදබදය ප්‍රදේශය තුළ පවතින පොදු ප්‍රවාහන දුෂ්කරතාවය

පරිච්ඡේදය 2.3. සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භය විශ්ලේෂණය යටතේ විග්‍රහ කළ පරිදි සැලසුම් ප්‍රදේශය, කොළඹ හර ප්‍රදේශයට ඇතුළත් වන අතර නව නුවර මාර්ගය, ලෝ ලෙවල් මාර්ගය (පරණ අවිස්සාවේල්ල මාර්ගය), ඇතුලත් කි .මී 27.5 ක දිගකින් යුතු, A ශ්‍රේණියේ ප්‍රධාන පිවිසුම් මාර්ග තුනකින් හා කඩුවෙල මහ නගර සභාව මගින් පාලනය වන කි .මී 2223.4 කින් යුතු, E ශ්‍රේණියේ මාර්ග ගණනාවකින්ද, මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පාලනය වන කි,මී 6.93 කින් යුතු පිටත වටරවුම් අධිවේගී මාර්ග සීමාවකින්ද සමන්විත අති විශේෂ පරිපාලන ප්‍රදේශයකි. ප්‍රදේශයෙහි මාර්ග ජාලයෙහි හා භූමි පරිහරණ රටාවෙහි පවතින මෙකී සුවිශේෂිත්වය නිසාවෙන් සැලසුම් ප්‍රදේශයේ ප්‍රවාහන තදබදය අනෙකුත් නගර හා සංසන්දනාත්මකව බලන විට සැලකිය යුතු ලෙස ඉහළ අගයක් උසුලනු ලබයි.

1982 වර්ෂයේ දී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම තුළින් යෝජිත ප්‍රවාහන සැලැස්ම ඒ ආකාරයෙන් ක්‍රියාත්මක නොවීමද වර්තමානය වන විට පවතින අධික රථ වාහන තදබදයට මූලික හේතුව වී ඇත.

එමෙන්ම, විද්‍යාත්මක විශ්ලේෂණයේ එන අවකාශීය රීති විග්‍රහයට (Space Syntax Analysis) අනුව ඉහත සඳහන් පිවිසුම් මාර්ග 1.8 සිට 2.8 වටිනාකම් පරාසයක පිහිටා ඇති අතර එය කොළඹ නගරය හා සසඳන විට මධ්‍යම වටිනාකම් පරාසයක් තුල පිහිටා ඇත. ප්‍රදේශයෙහි අනෙකුත් මාර්ග හා සංසන්දනය කර බලන විට, නව නුවර මාර්ගය ඉහළම මගී ආකර්ෂණ ඝනත්වය පවත්වා ගනිමින් ඉහළම ඒකාබද්ධතාවය සහිත පිවිසුම ලෙස හඳුනාගත හැකිය. එය ඇමුණුම් අංක 14 යටතේ දැක්වෙන රූප සටහන මගින් විග්‍රහ කරයි. එමෙන්ම ප්‍රදේශයෙහි ඉහළ ඒකාබද්ධතාවය, ඉහළ මගී ආකර්ෂණයට ඇති කිරීමට හේතු වී ඇති අතර, ඒ බව ඇමුණුම් අංක 15 යටතේ දැක්වෙන රූප සටහන මගින් විග්‍රහ කරයි. තවද, මේ හේතුවෙන් කඩුවෙල නගරය හා නව නුවර මාර්ගය විවිධ වාණිජ කටයුතු ආකර්ෂණය කරන ප්‍රදේශයක් බවට පත්ව ඇත. මෙය, මෙම මාර්ගය ඔස්සේ අධික රථ වාහන තදබදයක් ඇති කිරීමට හේතු වී ඇති එක් ප්‍රධාන සාධකයකි.

එමෙන්ම පරිපාලන කටයුතු බත්තරමුල්ල නගරයෙහි ප්‍රතිස්ථානගත කිරීම, තාක්ෂණ නගරය මාලබේ පිහිටුවීම, අධිවේගී අන්තර් හුවමාරු මධ්‍යස්ථාන වන කොතලාවල, කඩුවෙල හා අතුරුගිරිය පිහිටා තිබීම යන විශේෂ ක්‍රියාකාරකම් මීට හේතු වන්නට ඇත. ලෝ

ලෙවල් මාර්ගයේ (පරණ අවිස්සාවේල්ල  මාර්ගය) ඉහළ ඒකාබද්ධතාවයක් හා ඉහළ මගී ආකර්ෂණ ඝනත්වයක් ඇති බව පිළිගැනුන ද එම ප්‍රදේශයට පවතින ගං වතුර උවදුර නිසා වාණිජ කටයුතු වල පැතිරීම සීමා වී ඇත.

තවද, නව නුවර මාර්ගය, ලෝ ලෙවල් මාර්ගය (පරණ අවිස්සාවේල්ල මාර්ගය) සෘජුවම කොළඹ නගරය හා සම්බන්ධ වන ප්‍රධාන පිවිසුම් මාර්ග වීම හේතුවෙන් , කොළඹ නගරයට පවතින අති විශාල මගී ආකර්ෂණය මෙම මාර්ග ඔස්සේ ගමන් කිරීමක් හඳුනා ගත හැකිය. ඒ හේතුවෙන් නව නුවර මාර්ගයෙහි හා ලෝ ලෙවල් මාර්ගයෙහි පැයක් තුළ ගමන් කරන වාහන ධාරිතාවය ඉක්මවා ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වාහන ගමනාගමනය වැඩි අවස්ථා වලදී දැඩි වාහන තදබදයක් පවතී. නාගරික ප්‍රවාහන සැලැස්ම 2012 විශ්ලේෂණයට අනුව නව නුවර මාර්ගයෙහි (මාලබේ කොරිඩෝව) හා ලෝ ලෙවල් මාර්ගයෙහි (ලෝ ලෙවල් කොරිඩෝව) වාහන ගමනාගමනය වැඩි අවස්ථා වලදී, පැයක මාර්ග තදබදය, පැයක ගමනාගමන ධාරිතාවය 700 (PCU) කින් ඉක්මවා ඇති අතර එය වර්තමානය වන විට තවදුරටත් වර්ධනය වී ඇති බව වාහන ගමනාගමනය වැඩි අවස්ථා වලදී ගූගල් සිතියම් හි සජීවී රථ වාහන තදබද විශ්ලේෂණය මගින් හඳුනා ගත හැකිය. ගූගල් සිතියම් හි සජීවී රථ වාහන තදබද විශ්ලේෂණය ඇමුණුම් අංක 16 යටතේ දැක්වෙන රූප සටහන මගින් විග්‍රහ කරන අතර වගු අංක 3.1 යටතේ පිවිසුම් මාර්ගයන්හි රථ වාහන ධාරිතාවය හා රූපය අංක 3.3 යටතේ මාධ්‍ය අනුව පිවිසුම් මාර්ගයන්හි රථ වාහන ධාරිතාවය විස්තරාත්මකව නිරූපණය කෙරේ.

වගු අංක 3.1: පිවිසුම් මාර්ගයන්හි රථ වාහන ධාරිතාවය

| පිවිසුම් මාර්ග | පැයක මාර්ග තදබදය (PCU) | පැයක ගමනාගමන ධාරිතාව (PCU) | පැයක මාර්ග තදබදය හා පැයක ගමනාගමන ධාරිතාව අතර වෙනස (PCU) |
|---|---|---|---|
| මාලබේ කොරිඩෝව | 5100 | 4400 | -700 |
| ලෝ ලෙවල් කොරිඩෝව | 2900 | 2200 | -700 |
| හයි ලෙවල් කොරිඩෝව | 2000 | 2300 | +300 |

මූලාශ්‍රය : CoMTrans, නාගරික ප්‍රවාහන සැලැස්ම 2012

රූපය 3.3: මාධ්‍ය අනුව පිවිසුම් මාර්ගයන්හි රථ වාහන ධාරිතාවය




මූලාශ්‍රය : CoMTrans, නාගරික ප්‍රවාහන සැලැස්ම 2012

රූපය 3.3 යටතේ විස්තරාත්මකව නිරූපණය කරන පරිදි අනෙකුත් මාර්ගයන්ට සාපේක්ෂව නව නුවර මාර්ගයෙහි (මාලබේ කොරිඩෝව) රථ වාහන ධාරිතාවය ඉක්මවා යැමට පුද්ගලික වාහන භාවිතය හේතු වී ඇති බව ද පැහැදිලි වේ.

කොළඹ මෙට්‍රොපොලිටන් කලාපය සහ තදාසන්න ප්‍රදේශ සඳහා නාගරික ප්‍රවාහන පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය- 2014 යටතේ කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි සිදුකරන ලද ගමන් වේග සමීක්ෂණ ප්‍රතිපල මගින්, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි බත්තරමුල්ල හා අතුරුගිරිය නගර මංසන්ධි ආසන්නව සවස් කාලයේ දී ද, කොස්වත්ත නගර මංසන්ධිය ආසන්නව උදය කාලයේ දී

ද, මාලබේ නගර මංසන්ධිය ආසන්නව උදය හා සවස් කාලයේ දී ද දැඩි වාහන තදබදයක් පවතින බව හඳුනා ගත හැකිය. එය රූපය අංක 3.4 යටතේ විස්තරාත්මකව නිරූපණය කෙරේ. එමෙන්ම බත්තරමුල්ල, කඩුවෙල, මාලබේ ප්‍රදේශ ආශ්‍රිතව හා නව නුවර මාර්ගයෙහි හා 174 බස් මාර්ගයෙහි බොහොමයක් ප්‍රදේශ ආශ්‍රිතව වේගය පැයට කිලෝමීටර් 10- 20 ත් අතර අවම මට්ටමක පවතින බව හඳුනා ගත හැකිය. ඒ බව රූපය අංක 3.5 යටතේ ඉදිරිපත් කෙරේ.

රූපය 3. 4: ගමන් වේග සමීක්ෂණ ප්‍රථිපල




මූලාශ්‍රය : කොළඹ මෙට්‍රොපොලිටන් කලාපය සහ තදාසන්න ප්‍රදේශ සඳහා නාගරික ප්‍රවාහන පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය, 2014

රූපය 3.5: ගමන් වේග සමීක්ෂණ ප්‍රථිපල




මූලාශ්‍රය : CoMTrans, නාගරික ප්‍රවාහන සැලැස්ම 2012

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, මෙම ප්‍රදේශයට පමණක් නොව සමස්ත රටටම ආර්ථිකමය වශයෙන් වටිනාකමක් සහිත වාණිජ නගරයක් වන හෙයින්, මෙම ප්‍රදේශය තුල පවතින රථ වාහන තදබදය මෙම ප්‍රදේශයට මෙන්ම මෙරටෙහි ආර්ථික සංවර්ධනයට නිශේධාත්මක ලෙස බලපෑමක් ඇති කරනු ඇත. තවද ප්‍රවාහන තදබදය නිසා ශ්‍රී ලංකා ආර්ථිකයේ වාර්ෂිකව දළ ජාතික නිෂ්පාදන ප්‍රමාණයෙන් 1.8% අහිමි වී යන බව ද ඇස්තමේන්තු කර ඇත.

එපමනක් නොව කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ පවතින බොහොමයක් මහා මාර්ග පද්දති තුළ පොදු ප්‍රවාහනයේ දුෂ්කරතා පවතී. එනම්, ඇතැම් ප්‍රදේශ තුළ පොදු ප්‍රවාහන පහසුකම් නොමැතිවීම හේතුවෙන් මහජනතාවට ගැටලු රැසකට මුහුණ දීමට සිදුවී ඇත. එමෙන්ම කඩුවෙල ප්‍රදේශයෙහි ඇතැම් පොදු මාර්ග වල පවතින අබලන් ස්වභාවය ද පොදු ප්‍රවාහන ගැටලුවට තවත් එක් නිදසුනකි. එය පහත 3.6 රූපය මගින් විග්‍රහ කෙරේ. එමෙන්ම, විදිමත් පොදු ප්‍රවාහන මාධ්‍යක් නොමැතිවීම හේතුවෙන් මාලබේ චන්ද්‍රිකා කුමාරතුංග මාවතෙහි පොදු ප්‍රවාහන ගැටලු උග්‍රව පවතී.

අනාගතයේදී, යෝජිත සංවර්ධන ව්‍යාප්ති හමුවේ මෙම ප්‍රදේශය තුළ ඉහළ යන ප්‍රවාහන ඉල්ලුමට සාපේක්ෂව ඊට සුදුසු ප්‍රතිකර්ම නොයෙදුවහොත්, ඉහත තත්වය තවදුරටත් තීව්‍ර කෙරෙනු ඇත. එබැවින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රවාහන තදබදයට පිළියම් යෙදීම සම්බන්ධයෙන් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ඉතාමත් විචාරාත්මක වේ.

රූපය 3.6: පොදු මාර්ග වල පවතින අබලන් ස්වභාවය






මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ , 2022

### 3.2.3 වර්තමාන නේවාසික, වාණිජ හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් පරිසර සංවේදී ප්‍රදේශයන්ට ව්‍යාප්ත වීම හා ඒ හේතුවෙන් මතු වී ඇති ගංවතුර අවධානම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ සමස්ත භූමි ප්‍රමාණයෙන් 20% ක භූමි ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ ගණයට අයත් වන අතර, එය සංඛ්‍යාත්මකව හෙක්ටයාර් 1730.71 කට ආසන්න වේ. ඉන් 58% එනම් හෙක්ටයාර් 1005.58 ක් කුඹුරු වන අතර 22% ක් එනම් හෙක්ටයාර් 388.42ක් වගුරු බිම් වේ.

2012 ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව, කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත් වන ජනගහනයෙන් 11% ක් වූ ප්‍රමාණයක් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වේමේ වන විට ., වැඩි වන ජනගහනය සමඟ 2020 කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය මඟින් නිකුත් කරන ලද, සම්පත් පැතිකඩ වාර්තාවන් ට අනුව, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ මුළු ජනගහනය 281,282 කි. එනම්, ශ්‍රී ලංකාව තුල මුළු ජනගහනයෙන් 40% ක් තරම් වූ පිරිසක් ජීවත් වන කොළඹ දිස්ත්‍රික්කය තුළ උක්ත සඳහන් කළ 281,282 ට ආසන්න (11%) වූ ජන සංඛ්‍යාවක් තම ස්ථිර පදිංචිය සඳහා තෝරා ගත් ප්‍රදේශයකි .

එමෙන්ම, 2001-2012 කාල පරාසය තුල ජනගහන වර්ධන වේගය 0.02%ක ප්‍රතිශතයක් ගන්නා ලද අතර 2012-2020 කාල පරාසය තුල ජනගහන වර්ධන වේගය 0.01 කි. 2001 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂය වන විට ජනගහනය අධික ප්‍රදේශ වල ජනගහනය තවදුරටත් වර්ධනය වීමක් හඳුනා ගත හැකි අතරම ග්‍රාමීය ප්‍රදේශ කරා ද ජනගහන ව්‍යාප්තිය වර්ධනය වීමේ සීඝ්‍ර ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ඒ අනුව ජනගහනයේ භූමි පරිභෝජනයට අනුව, මුළු භූමියෙන් මේ වන විටත් 49.5 % ප්‍රමාණයක් එනම් හෙක්ටයාර් 4349.4 කට ආසන්න භූමි ප්‍රමාණයක් තුළ නේවාසික ව්‍යාප්තිය දැකිය හැකි වේ.

කුඹුරු ඉඩම්, වගුරු, පාරිසරික ආරක්ෂණ ප්‍රදේශ, (තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය), තෙත් බිම්, රක්ෂිත ප්‍රදේශ, වැව්, ගංවතුර ඇති වන ප්‍රදේශ යන නිර්ණායක යටතේ පාරිසරික සංවේදී කලාපයන්ගේ විහිදීම, පාරිසරික සංවේදීතා විශ්ලේෂණයේ දී හඳුනා ගන්නා ලද අතර එහි ප්‍රතිඵල වලට අනුව ද කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ සංවේදී කලාප පවතින බවට සනාථ වේ. මෙම ප්‍රදේශයට ආවේණික වූ තෙත්බිම් පරිසර පද්ධතියක් හා ඒ හා බැඳී පවතින ජල මූලාශ්‍ර පද්ධතියකින් හෙබි සංවේදී කලාපයක් පිහිටා තිබීම තුලින් ප්‍රදේශයේ සුන්දරත්වය මනාව ඔප් නැංවීමට හා, ජල රැඳවුම් නිසි ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය පරිසර පද්ධති සමතුලිතතාවය සඳහා මහඟු පිටුවහලක් ලබා දෙනු ලබයි.

කෙසේ වෙතත් පෙර සඳහන් කළ පරිදි වැඩි වන ජනගහනය මත, වර්තමානයේ සංවර්ධන ක්‍රියාවලීන් සංවේදී කලාප වෙතට ව්‍යාප්ත වීමේ වැඩි නැඹුරුතාවයක් පවතී.

වර්ෂ 2021 දී කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය මගින් සිදුකරන ලද සමීක්ෂණයට අනුකූලව, වර්තමාන සංවර්ධන ක්‍රියාවලීන් හේතුවෙන් 2014 වර්ෂයට සාපේක්ෂව පාරිසරික සංවේදී කලාප 7% කින් හායනය වී ඇති බව හඳුනා ගත හැකිය. එය සංඛ්‍යාත්මකව හෙක්ටයාර් 1838.12 සිට 1730.7 දක්වා අඩු වී ඇති බව සිතියම් අංක 3.1 මගින් නිරූපණය කෙරේ. එසේ හායනය වී ඇති පාරිසරික සංවේදී ප්‍රදේශයන් හි ප්‍රමාණය හෙක්ටයාර් 134.41කි.

සිතියම් අංක 3.1: පාරිසරික සංවේදී ප්‍රදේශයන් හි ව්‍යාප්තිය



සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

රූපය 3.6: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පාරිසරික සංවේදී ප්‍රදේශයන් හි ඡායනය



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

මෙම ප්‍රදේශයට ගං වතුර උවදුර ඇති වීමට එක් ප්‍රධාන කරුණක් ලෙස කැළණි ගංගා ද්‍රෝණිය තුල පිහිටි එහි ස්වභාවික පිහිටීම හඳුනා ගත හැකිය. එමෙන්ම, ප්‍රදේශයේ ගං වතුර අවදානම උග්‍ර තත්වයකට පත් වීමට නිසි සැලසුමක් හා පාලනයක් නොමැති කාර්මික හා නේවාසික සංවර්ධනය හේතු වී ඇත. තවද කොළඹ වාණිජ නගරයට තදාසන්නව පිහිටීම සහ එහි ඉඩම් සඳහා පවතින

අධික ඉල්ලුමට සාපේක්ෂව කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි අඩු ඉඩම් වටිනාකමක් පැවතීම යන කරුණු හේතුවෙන් මෙම ප්‍රදේශය තුළට වැඩි නේවාසික ආකර්ෂණයක් සිදුවන බව හඳුනා ගත හැකිය. මෙසේ සිදුවෙමින් පවතින සංවර්ධන ක්‍රියාවලින් හේතුවෙන් වර්තමානයේ පවතින ගොඩ ඉඩම් සීඝ්‍රයෙන් අඩුවෙමින් තෙත් බිම් පරිසර පද්ධතිය ආක්‍රමණය කිරීමට පටන්ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ස්වභාවික ජලවහන පද්ධතියට බාධා වූ අතර ගං වතුර අවධානම තවදුරටත් වර්ධනය විය. තවද අනවසර ආක්‍රමණයන් නිසා සිදුවූ තෙත් බිම් කැබලි වීම හේතුවෙන් ශාක හා සත්ව ඝනත්වය හීන විය. මේ නිසා ජීව විද්‍යාත්මක චක්‍ර, ආහාර ජාල, ජන්ම භූමි සහ තෙත් බිම් ජෛව පද්ධතියේ ප්‍රතිජනනය දැඩි ලෙස බාධා වූ අතර අවසන් ප්‍රථිඵලයක් ලෙස තෙත් බිම් පරිසර පද්ධතියේ ඵලදායීතාවය සැලකිය යුතු ලෙස අඩුවීමක් සිදු විය.

සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් භූමියේ ජලය උරා නොගන්නා අනුපාතය ඉහළ ගිය අතර ඉන් වැසි ජලය මතුපිට ගලා යාමද ඉහළ යන ලදී. මෙයට පිළියමක් ලෙස වැසි වතුර රඳවා ගැනීම පිණිස ප්‍රධාන තෙත් බිම් ප්‍රදේශ ජල එකතුවක් බවට පරිවර්තනය කරන ලදී. තෙත්බිම් අඩුවීමෙන් ජලය එකතු වී ඇති ජලාශ්‍රිත ප්‍රදේශ වල ජල මට්ටම ඉහළ යාමෙන් ගංවතුර තර්ජනයක් මතුවිය හැකි බවට ශ්‍රී ලංකා පහත් සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් අනාවැකි පළ කර ඇත. ශ්‍රී ලංකා පහත් බිම් සංවර්ධනය කිරීමේ සංස්ථා වාර්තාවට අනුව වර්තමාන සංවර්ධන ප්‍රවණතා අනුව සියලු තෙත් බිම් නැතිවී ගියහොත් එය දළ ජාතික නිෂ්පාදිතයෙන් අසන්න වශයෙන් 1.3%කට බලපෑමක් ඇතිකරලිය හැකි බව දක්වා ඇත. සංවර්ධනය ශක්තිමත් වීමට මෙන්ම ස්වභාවික ආපදා තුලනයට පදනම් සම්පතක් බැවින් තෙත්බිම් සංරක්ෂණය කිරීම වැදගත් වේ.

කෙසේ වෙතත්, සංවර්ධන කටයුතු හා පරිසර පද්ධති අතර සිදුවන නොගැලපීම හේතුවෙන් කඩුවෙල, නවගමුව, රණාල, බෝමිරිය ආදී පහත නම් සඳහන් ග්‍රාම නිලධාරී ප්‍රදේශ රැසක ජනතාව ගංවතුර අවධානමට මුහුණ දෙන බව අනාවරණය විය.

වගු අංක 3.2: වාර්ෂිකව ගං වතුර ආපදාවට ලක්වන පවුල් සංඛ්‍යාව, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය

| | ග්‍රාම නිලධාරී වසම | ආපදාවට ලක්වන පවුල් සංඛ්‍යාව | ගං වතුර ආපදාවට ලක්වන පවුල් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|
| | | | දැඩි අවදානම් පවුල් සංඛ්‍යාව | මධ්‍යඅවදානම් පවුල් සංඛ්‍යාව | අඩුඅවදානම් පවුල් සංඛ්‍යාව |
| 1 | රණාල | 22 | 0 | 22 | 0 |
| 2 | නවගමුව | 840 | 0 | 40 | 0 |
| 3 | නවගමුව දකුණ | 11 | 0 | 11 | 0 |
| 4 | ඉහල බෝමිරිය | 275 | 175 | 150 | 50 |
| 5 | වෑකේවත්ත | 196 | 30 | 126 | 40 |
| 6 | පහල බෝමිරිය | 350 | 150 | 100 | 100 |
| 7 | පහල බෝමිරිය | 43 | 28 | 15 | 0 |
| 8 | කොතලාවල | 75 | 0 | 75 | 0 |
| 9 | කඩුවෙල | 38 | 0 | 20 | 18 |
| 10 | හේවාගම | 1 | 1 | 0 | 0 |
| 11 | වැලිවිට | 67 | 15 | 30 | 22 |
| 12 | මහදෙනිය | 30 | 0 | 30 | 0 |
| 13 | බටේවෙල | 12 | 0 | 12 | 0 |
| 14 | ඔරුවල | 23 | 0 | 23 | 0 |
| 15 | ශාන්තාලෝකගම | 41 | 0 | 41 | 0 |
| 16 | වැලිහිද | 29 | 15 | 14 | 0 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | තුන්අදහේන | 3 | 7 | 20 | 11 |
| 18 | කලපලුවාව | 16 | 0 | 16 | 0 |
| 19 | කොටුවේගොඩ | 40 | 10 | 30 | 0 |
| | එකතුව | 2112 | 431 | 775 | 241 |

මූලාශ්‍රය: සම්පත් පැතිකඩ 2020, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්තාගත දත්තයන්ට අනුකූලව කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගං වතුර ආපදාවට ලක් වූ පවුල් සංඛ්‍යාව පහත රූප සටහන් 3.7 යටතේ නිරූපණය කෙරේ.

රූපය 3.7 : 2004 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ගං වතුර ආපදාවට ලක් වූ පවුල් සංඛ්‍යාව




මූලාශ්‍රය: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, 2020

මෙම ප්‍රදේශයෙහි වරින් වර ඇතිවන ගං වතුර ආපදා තත්වය හේතුවෙන් තම දෛනික අවශ්‍යතා ඉටු කර ගැනීමට පැමිනෙන ජනතාවට මෙන්ම ප්‍රදේශයෙහි බොහොමයක් ජනතාවට සෘජු හා වක්‍ර වශයෙන් බලපැමක් ඇති කරනු ලබයි. එය එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීමේ වෙබ් අඩවියේ ඇති දත්ත වලට අනුකූලව, 1989 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කඩුවෙල ප්‍රදේශයට වරින් වර ඇති වූ ගං වතුර ආපදා තත්වය හේතුවෙන් සිදු වී ඇති නිවාස හානි හා වක්‍ර වශයෙන් බලපැමට ලක්වූවන් පිළිබද තොරතුරු වාර්තා වේ. ඒ අනුව සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී.100 හෝ එය ඉක්මවූ අවස්ථාවන් හිදී සංඛ්‍යාත්මකව 1000 හෝ ඊට වැඩි පිරිසකට දේපළ හානි ඇතුළුව ප්‍රදේශයේ ජනතාවට සෘජු හා වක්‍ර වශයෙන් බලපැම් සිදු වී බව ඇති බව සඳහන්ය. ඒ බැවි පහත රූප සටහන් අංක 3.8 හා 3.9යටතේ නිරූපණය කෙරේ.

රූපය 3.8: 1989 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගං වතුර ආපදා තත්වය හේතුවෙන් සෘජු හා වක්‍ර වශයෙන් බලපෑමට ලක්වූවන් - කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය




මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීමේ වෙබ් අඩවිය, 2022

රූපය 3.9: 1989 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ගං වතුර ආපදා තත්වය හේතුවෙන් සිදු වී ඇති නිවාස හානි- කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය




මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීමේ වෙබ් අඩවිය, 2022

මෙසේ වර්තමාන නේවාසික, වාණිජ හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් පරිසර සංවේදී ප්‍රදේශයන්ට ව්‍යාප්ත වීම හා ඒ හේතුවෙන් මතු වී ඇති ගංවතුර අවධානම ප්‍රදේශයේ ජන ජීවිතයට සෘජු බලපෑමක් ඇති කරනු ලබයි. කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නිරන්තර ගංවතුර අවධානමට ලක් වන ප්‍රදේශ රූපය 3.10 මගින් නිරූපණය කෙරේ.

රූපය 3.10: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ගංවතුර අවධානමට ලක් වන ප්‍රදේශ




මූලාශ්‍රය: වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මේ තුළින් ගම්‍ය වන්නේ වර්තමාන සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් පරිසර සංවේදී ප්‍රදේශයන්ට සිදුව ඇති බලපෑම මත ඇති වී ඇති ගංවතුර අවධානම ප්‍රදේශයෙහි ජන ජීවිතයට මෙන්ම ප්‍රදේශය හරහා ගමන් ගන්නා ජනතාව කෙරෙහි ඇති කරනු ලබන බලපෑමෙහි ස්වභාවයයි. මෙකී සංවර්ධන ක්‍රියාකාරකම් අනාගතයේදී පරිසර සංවේදී ප්‍රදේශයන්ට තවදුරටත් වර්ධනය වුවහොත් මෙම ප්‍රදේශය තුළ පවතින සුළු ගංවතුර අවධානම ඉහළ ගොස් ජනජීවිතයට එය තවදුරටත් බලපෑමක් ඇති කරනු ඇත. එහෙයින් මෙම තත්වය අවම කර ගැනීමට සුදුසු ප්‍රතිකර්ම නොයෙදුවහොත්, ඉහත තත්වය තවදුරටත් තීව්‍ර කෙරෙනු ඇත. එබැවින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පවතින පාරිසරික සංවේදී ප්‍රදේශ තවදුරටත් හායනය වීම වළක්වා ගනිමින් මතු වී ඇති ගංවතුර අවධානම සුදුසු පිළියම් යෙදීම සම්බන්ධයෙන් සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ඉතාමත් විචාරාත්මක වේ.

### 3.2.4. සංවර්ධන ක්‍රියාකාරකම් හේතුවෙන් හරිත කලාපයෙහි සිදුවන හායනය මත ඇති වී ඇති හරිතාගාර ආවරණය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයට සංවර්ධනය ගලා ඒමේ ස්වභාවය මත හරිත කලාපයන්හි සිදුව ඇති වෙනස්වීම, පසුගිය හා වර්තමාන චන්ද්‍රිකා ඡායාරූප (1975, 1995, 2001 සහ 2016 වර්ෂ වල) උපයෝගී කරගෙන අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030 සඳහා සිදු කරන ලද සාමාන්‍යකරණය කරන ලද වෘක්ෂලතා වෙනස්වීමේ දර්ශකය (Normalized Difference Vegetation Index) මගින් හඳුනා ගත හැකිය. ඒ තුළින් නුසුදුසු ලෙස සිදුවූ නාගරික පැතිරීම නිසා කඩුවෙල නගරයේ හරිත ආවරණය අඩු වෙමින් ගොඩනැගිලි ප්‍රමාණය ක්‍රමයෙන් වර්ධනය වූ බව පැහැදිලිව හඳුනා ගත හැක. තවද 2008 වර්ෂයේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පැවති හරිත ප්‍රදේශය 2015 වන විට 7.13% කින් හීන වී ඇති බව අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030 සඳහා පාදක කරගත් ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ දත්ත මගින් ද තහවුරු වේ. පහත රූප සටහන් අංක.3 11 මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි 1975, 1995, 2001 සහ 2016 වර්ෂ වල චන්ද්‍රිකා ඡායාරූප උපයෝගී කරගෙන සිදු කරන ලද

සාමාන්‍යකරණය කරන ලද වෘක්ෂලතා වෙනස්වීමේ දර්ශකය (Normalized Difference Vegetation Index) මගින් නිරූපණය කෙරේ.

රූපය 3.11: 1975, 1995, 2001 සහ 2016 වර්ෂ වල චන්ද්‍රිකා ඡායාරූප ඇසුරෙන් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි වෘක්ෂලතා වෙනස්වීමේ දර්ශකය




මූලාශ්‍රය: අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030, නාගරික සංවර්ධන අධිකාරිය

ඉහත සඳහන් කරන ලද විශ්ලේෂණයට අනුකූලව කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි හරිත කලාපයෙහි සිදුව ඇති හායනය හෙක්ටයාර් 146 කි. එය ප්‍රතිශතයක් ලෙස 4.2% ක් ලෙස ගණන් බලා ඇත. මෙසේ හරිත කලාපයෙහි සිදුවන හායනය හේතුවෙන් අවට ප්‍රදේශයන්ට සාපේක්ෂව මෙහි පාරිසරික පද්දතියෙහි උෂ්ණත්වය ඉහළ යාමක් සිදුව ඇති බව 2017 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය තුළ සිදුකරන ලද සමීක්ෂණයක් මගින් වාර්තා වී ඇත.

රූපය 3 .12: 1995, 2005, 2016 වර්ෂයන් හි දී පරිසර උෂ්ණත්වයෙහි සිදුව ඇති වෙනස්වීම




මූලාශ්‍රය: සමීක්ෂණ දත්ත,කොළඹ දිස්ත්‍රික්කයේ හරිතාගාර ආවරණය, ඩබ්. එම්. පී.එල්. දිසානායක 2017

මෙම සමීක්ෂණ දත්තයන්ට අනුකූලව කොළඹ නගරය හා ඒ ආශ්‍රිත නගරවල 1995 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂ වන විට පරිසර උෂ්ණත්වයෙහි ඉහළ යාම පැහැදිලිව නිරූපණය වේ. මෙසේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ සිදුවන සීඝ්‍ර සංවර්ධනය හේතුවෙන් දැනට පවතින හරිත කලාපය තව දුරටත් හීන වී ගියහොත් පාරිසරික පද්දතියෙහි උෂ්ණත්වය ඉහළ යාම වළක්වා ගත නොහැක. පරිසර පද්දතියට සිදුවන අහිතකර බලපෑම සඳහා සුදුසු පිළියම් යොදා ගනිමින්, හරිතාගාර ආවරණය අවම කර ගැනීමට විධිමත් සංවර්ධන සැලැස්මක මගපෙන්වීම අවශ්‍යතාවය වේ.

### 3.2.5 මලාපවාහන හා අපජලය බැහැර කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ දෛනික සාමාන්‍ය මලාපවාහන හා අපජල බැහැර කිරීම දිනකට 65,000 $m^3$ පමණ වන අතර වර්තමානය වන විට බත්තරමුල්ල ඇතුළු පරිපාලන නගර සීමාවේ මලාපවාහන හා අපජලය කොළඹ අපජලය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානය හරහා බැහැර කිරීම හදුනා ගත හැකිය. එමෙන්ම කඩුවෙල, මාලබේ, අතුරුගිරිය ඇතුළු ප්‍රදේශ සඳහා මලාපවාහන හා අපජල බැහැර කිරීමට නිසි ක්‍රමවේදයක් නොමැති අතර වර්තමානයේ දී පවතින සංවර්ධන ප්‍රවණතාවයන් හේතුවෙන් අනෙකුත් පළාත් පාලන බල ප්‍රදේශයන්ට සාපේක්ෂව කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සංවර්ධන නැම්යාව ඉහල අගයක් ගන්නා බව නාගරික සංවර්ධන අධිකාරියේ කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය වෙත 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලද මූලික සැලසුම් නිරාකරණ අනුමැතින්, මානක සැලසුම් අනුමැතින් හා ගොඩනැගිලි අනුමැතින් තුළින් විද්‍යාමාන වේ.

රූපය: 3.13: සංවර්ධන ප්‍රවණතාවයන් 2017-2022




මූලාශ්‍රය: කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

මෙසේ ඉහළ යන සංවර්ධන ක්‍රියාවලීන් හමුවේ අපජලය හා මලාපවාහන බැහැර කිරීමේ ක්‍රමවේදය යාවත්කාලීන කළ යුතු බව ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයේ මතය වේ. ඒ අනුව බත්තරමුල්ල නගරය කේන්ද්‍ර කරගනිමින් හීනැටිකුඹුර ප්‍රදේශය සඳහා මලාපවාහන හා අපජල පිරිපහදු මධ්‍යස්ථානයක් ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය විසින් හඳුන්වා දෙන ලදී. මෙම ව්‍යාප්තියට අනුව එහි සේවා ප්‍රදේශය හෙක්ටයාර් 3400 කට ආසන්න වන අතර එහි ධාරිතාවය ජනගහනය 220,000 කට පමණ ප්‍රමාණවත් වේ. ඒ තුළින් ගංවතුර මට්ටම මීටර් 0.6 පාලනය කිරීම, ප්‍රදේශය තුළ නොමිලේ මලාපවහන සම්බන්ධතා ඇති කිරීම, භූගත ජලයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ කැණීම් ළිං යථා තත්ත්වයට පත් කිරීම, ගංවතුර රඳවා තබා ගැනීම  සඳහා අක්කර 15 ක වී වගා ප්‍රදේශය යොදා ගැනීම හා එම අක්කර 15 ක ප්‍රදේශය අවට ඇවිදින මංතීරු ලෙස සංවර්ධනය කිරීම වැනි යෝජනා ක්‍රම හරහා මෙම ප්‍රදේශයෙහි අපජලය හා මලාපවාහන නිසි ක්‍රමවේදයකට අනුව සිදු කිරීමට යෝජනා කරන ලදී. කෙසේ නමුත්, මෙම යෝජිත ව්‍යාප්තිය සඳහා අවට ප්‍රදේශයෙහි ජනතාවගෙන් මතු වූ විරෝධතා හමුවේ එය අතරමග නවතා දමන ලදී.

එහෙයින් මෙවැනි සංවර්ධන නැමියාවක් පවතින ප්‍රදේශයක් සඳහා මලාපවාහන හා අපජල බැහැර කිරීමට නිසි  ක්‍රමවේදයක අවශ්‍යතාවය හඳුනා ගනු ලැබුවද එය ක්‍රියාත්මක නොවීම ද ගැටළු සහගත වේ. ඒ තුළින් ප්‍රදේශයේ අනාගත සංවර්ධනය අධෛර්යමත් කරනු ඇත.

### 3.2.6. ප්‍රදේශය තුළ ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන් නේවාසික ප්‍රදේශයන්ට සිදුවන බලපෑම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන 20-30 ත් අතර ප්‍රමාණයක් පවතින අතර ඒවා කොරතොට, දැඩිගමුව, නවගමුව, කහන්තොට ආදී ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්තව පවතියි. ඒවා බොහොමයක් සක්‍රිය මට්ටමේ පවතින කලුගල් කැණීම් හා පිරිසැකසුම් මධ්‍යස්ථාන වන අතර ඇතැම් මධ්‍යස්ථාන අද වන විට කැණීම් කටයුතු අවසන් කර අතහැර දමා පවතියි.  තවත් සමහරක් මධ්‍යස්ථාන නේවාසික ප්‍රජාවගෙන් මතුවන විරෝධතා හමුවේ තවකාලිකව නවතා දමා ඇත.

මෙසේ ඉහත සඳහන් කරන ලද ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන, දැනට ක්‍රියාත්මක 2008-2020 කඩුවෙල සංවර්ධන සැලැස්ම මගින් හඳුන්වාදෙන ලද කලාපීකරණ සැලැස්මෙහි මිශ්‍ර නේවාසික කලාපය, නේවාසික කලාපය, උස්බිම් සංරක්ෂණ කලාපය  (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) - මුහුදු මට්ටමේ සිට මීටර් 25 දක්වා හා උස්බිම් සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) - මුහුදු මට්ටමේ සිට මීටර් 25 ට වඩා උසින් වූ  ප්‍රදේශය තුළ පිහිටා ඇත.  එනමුත් දැනට ක්‍රියාත්මක කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි ඉහත සඳහන් කලාපයන් තුළ ස්වභාවිකව පිහිටි ඛනිජ සම්පත් සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි අයුරින් මාර්ගෝපදේශනය කර නොතිබීම නිසා වර්තමානය වන විට ගැටළු සහගත තත්වයක් මතුවී ඇත. මෙය

කඩුවෙල සංවර්ධන සැලැස්ම 2008-2020 ඇතුළත් පහත කලාපයන් ආශ්‍රිත රෙගුලාසි තුළින් විද්‍යාමාන වන අතර පහත 3.14 රූපය මගින් ප්‍රදේශය තුළ පවතින ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන වල ස්වභාවය නිරූපණය වේ.

රූපය: 3.14: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ඛනිජ කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

සිතියම් අංක 3.2 : කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්නා ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන




සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2023

මෙකී ස්වභාවික ඛනිජ නිධි කැණීම් කිරීමේ දී යොදා ගනු ලබන ශිල්පීය ක්‍රම හා ඒ තුළින් ජනනය වන අධික ශබ්දය හේතුවෙන්, ඒ ආශ්‍රිත ප්‍රදේශයන් හි වෙසෙන නේවාසික ප්‍රජාවට නිරන්තරයෙන් අර්බුදකාරී තත්වයන්ට මුහුණ දීමට සිදුව පවතියි. එයට හේතු වී ඇත්තේ, මෙම ඛනිජ සම්පත් කැණීම් කිරීමේදී යොදා ගනු ලබන ශිල්පීය ක්‍රම නිරන්තර පරීක්ෂාවට ලක් කිරීම කිසිදු බලධාරී ආයතනයක ක්‍රියාපටිපාටියෙන් පරිබාහිරව පැවතිම වේ. එසේම, කහන්තොට හා කොරතොට ආශ්‍රිතව පවතින කැණීම් කටයුතු අවසන් කර අතහැර දමා පවතින ස්ථාන, කැණීම් කටයුතු සිදුකරගෙන යනු ලබන ස්ථාන පිළිබදව හා ඒ ආශ්‍රිතව සාමජයට මුහුණ දීමට සිදුව ඇති පහත සදහන් ගැටළුකාරී ස්වභාවයන් පිළිබදව පාර්ශවකරුවන්ගේ හමුවේ දී ද අදහස් ඉදිරිපත් විය.

- කැණීම් කටයුතු අවසන් කර අතහැර දමා පවතින කලුගල් වළවල් හේතුවෙන් ප්‍රදේශය තුළ මතුවී ඇති අනාරක්ෂිත තත්වය මත ඇතිවී ඇති ජීවිත අවධානම
- කැණීම් කටයුතු අවසන් කර අතහැර දමා පවතින කලුගල් වළවල් විධිමත් ආකාරට පුරවා අවසන් නොකිරීම නිසා මතුවී ඇති සමාජ හා පාරිසරික ගැටළු (පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු ප්‍රදේශ සදහා එල්ලවන තර්ජන)
- ඛනිජ නිධි කැණීම් කිරීමේ දී යොදා ගනු ලබන ශිල්පීය ක්‍රම, එනම් පිපිරවීමේ ක්‍රම හා ඒ සදහා යොදා ගනු ලබන ට්‍රැක් ඩ්‍රිල්, ජැක් හැමර්, රොක් බ්‍රේකර්, ප්‍රන්ට් එන්ඩ් ලෝඩර්ස් සහ වෙනත් යන්ත්‍රෝපකරණ හේතුවෙන් ද්වනිත වන අධික ශබ්දය නිසා අවට නේවාසික ප්‍රජාවට නිරන්තරයෙන් මුහුණ පෑමට සිදුව ඇති ගැටළුකාරී ස්වභාවය ( ශබ්ද දූෂණය, නිවාස වලට සිදුව ඇති අලාභානි)

මෙසේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීමෙහි මධ්‍යස්ථාන ආශ්‍රිත රූප රාමු 3.15 රූපය මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 3.15: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ අනාරක්ෂිත තත්වයක් ඇතිවී ඇති ඛනිජ කැණීම් කිරීමෙහි මධ්‍යස්ථාන



මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ඛනිජ ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පිරිසැකසුම් කිරීම සදහා නිසි ක්‍රමවේදයක් නොමැති වීම හේතුවෙන්, නේවාසික ප්‍රජාවට සිදුවන බලපෑම නිසි අයුරින් නියාමනය කිරීම සදහා මෙන්ම පවතින ස්වභාවික සම්පත් පාරිසරික හානිය අවම කරගනිමින් විධිමත් අයුරින් සංවර්ධන කටයුතු සදහා යොදා ගැනීමටත්, පවතින සංවර්ධනය සැලැසුම යාවත්කාලින කරමින් නව සංවර්ධනය සැලැසුමක් සකස් කිරීම විචාරාත්මක වේ.

## 3.3 හඳුනාගත් විභවතා

### 3.3.1 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ආර්ථික අංශයේ විභවයන් ගවේෂණය

බස්නාහිර පළාතට මායිම් වී ඇති කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය හෙක්ටයාර් 8780 ක භූමි වපසරියක විහිදී පවතින 60% පමණ කෘෂිකාර්මික හා නේවාසික භූමි පරිභරණයකින් යුත් සග්‍රික ප්‍රදේශයකි. ක්ෂේත්‍ර නිරීක්ෂණ හා ද්විතීය දත්ත පදනම අනුව බත්තරමුල්ල, පැලවත්ත, මාලබේ අතුරුගිරිය හා කඩුවෙල, මහ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රමුඛ මංසන්ධි ලෙස හඳුනා ගත හැකිය.

වර්ෂ 1982 ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්මෙහි ආගමනයේ සිට අද දක්වා බහුතරයක් පරිපාලනමය ආයතන (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවා) බත්තරමුල්ල හා පැලවත්ත කේන්ද්‍ර කොට ගෙන ස්ථානගතවී ඇත. එසේම නාගරික සංවර්ධන අධිකාරිය විසින් වර්ෂ 2005 නොවැම්බර් මස 09 වන දිනැති ගැසට් පත්‍රය යටතේ මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලසුම් ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම ප්‍රකාශයට පත් කිරීමත් සමග තොරතුරු තාක්ෂණ හා සම්බන්ධ අධ්‍යාපන ආයතන කිහිපයක් මාලබේ ප්‍රදේශය ආශ්‍රිතව ඒකරාශී වී තිබීම හඳුනා ගත හැකිය. එනමුත් වර්තමාන භූමි පරිභරණය හා සන්සන්දනය කර බලන කළ එය මුළු භූමි ප්‍රමාණයෙන් 1% ක, එනම් හෙක්ටයාර් 64.58 අඩු වපසරියක පිහිටා තිබීම තුළින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ආර්ථික අංශයේ විභවයන්හි ප්‍රශස්ත ආර්ථික ප්‍රතිලාභ ලබා ගෙන නොමැති බව පැහැදිලි වේ.

එමෙන්ම පරිපාලන නගරයේ හා තොරතුරු තාක්ෂණ නගරයේ ප්‍රතිලාභය ලබා ගනිමින් නව නුවර මාර්ගය ඔස්සේ රේඛියව විහිදී පවතින වාණිජ කටයුතු ක්‍රමයෙන් වර්ධනය වීමක් වර්තමානය වන විට හඳුනා ගත හැකිය. එමෙන්ම ප්‍රදේශය තුළ දිනෙන් දින වර්ධනය වන නේවාසික කලාප හමුවේ වාණිජ කටයුතු සැලකිය යුතු ප්‍රමාණයක වර්ධනයක් පැවතිය යුතුව තිබුන ද භූමි පරිභරණය හා සන්සන්දනය කර බලන කළ විට එය මුළු භූමි ප්‍රමාණයෙන් 3% ක තරම් සුළු ප්‍රාමාණයක් වීම ප්‍රාදේශීය ආර්ථිකය උසස් තත්වයකට පත් කරලීම කෙරෙහි සෘජුවම බලපෑමක් එල්ල කර ඇති බව පැහැදිලි වේ.

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නවගමුව, රණාල, කොරතොට, මාලබේ, වැලිවිට ආදී ප්‍රදේශ ආශ්‍රිතව එම ප්‍රදේශවල පවතින ස්වභාවික පිහිටීම හා ස්වභාවික සම්පත් පදනම් කරගනිමින් කාර්මික කටයුතු සංකේන්ද්‍රණය වී තිබීම හඳුනා ගත හැකිය. එය භූමි පරිභරණය හා සන්සන්දනය කර බලන කළ විට එය මුළු භූමි ප්‍රමාණයෙන් 4% ක තරම් සුළු ප්‍රාමාණයක් වේ. එනම් වෙනත් සංවර්ධනයන් සඳහා යොදාගත නොහැකි නිරන්තර ගංවතුර අවධානමට ලක් වන මෙම ප්‍රදේශයන්හි පවතින ආර්ථික විභවයන් හඳුනා ගෙන භූමියෙහි ප්‍රශස්ත ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට යොමු කිරීම කාලීන අවශ්‍යතාවය වේ.

කැළණි ගඟ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි මූලික ස්වභාවික විභවයකි. මෙකී ස්වභාවික විභවයට සාමාන්තරව ගොඩනැගී ඇති කඩුවෙල නගරය, කැළණි ගඟෙහි උපරිම ප්‍රතිලාභ ලබා ගනිමින් ගංගා ආශ්‍රිත නගරයක් ලෙස සංවර්ධනය වී නොමැති බව කඩුවෙල නගරය නිරීක්ෂණය කිරීමේ දී පැහැදිලි වේ. එසේ හෙයින් කැළණි ගඟ, කොළඹ දිස්ත්‍රික්කය තුළ පවතින ප්‍රධාන ගංගා ආශ්‍රිත නගරයක් ලෙස කඩුවෙල නගරය සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතියි. රූපය 3.16: කැළණි ගඟ ආශ්‍රිතව පවතින වර්තමාන තත්වය නිරූපනය කරයි.

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන නගරයක් වන අතුරුගිරිය, රට අනුබද්ධ විශේෂ ආර්ථික කටයුතු පදනම් කරගෙන ප්‍රධාන වාණිජ නගරයක් ලෙස ක්‍රමයෙන් මතුවී ඒ වටා වර්ධනය වුන නේවාසික කටයුතු වලට සේවා සපයනු ලබයි. මෙම ප්‍රදේශයට අනාගතයේ දී යෝජිත ව්‍යාපෘති හමුවේ මෙම නගරය ආර්ථික අතින් සමෘද්ධිමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් ඇත.

රූපය 3.16: කැළණි ගඟ ආශ්‍රිතව පවතින වර්තමාන කඩුවෙල නගරය






මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

එමෙන්ම, තවමත් ඉහළම කාර්යාල ගමනාන්තය වන්නේ කොළඹ මූල්‍ය අගනගරයයි. කෙසේ වුවද පරිපාලන අගනගරය ශ්‍රී ජයවර්ධනපුරයේ පිහිටුවීමේ තීරණය නිසාත්, කොළඹ නගරයේ පවතින අධික ඉඩම් මිළ හා ඉඩම් හිඟයත් නිසා පරිපාලන කටයුතු වේගයෙන් ප්‍රත්‍යන්ත ප්‍රදේශ වලට විශේෂයෙන් බත්තරමුල්ල කේන්ද්‍ර කරගෙන ස්ථානගත වීමේ ඉහළ ප්‍රවණතාවයක් දක්නට ඇත.

ජෝන්ග් ලෑන්ග් ලාසැලේ (Jhon Lang LaSalle) නිශ්චල දේපළ වාර්තාව අනුව කොළඹ මූල්‍ය අගනගරයෙහි පවතින ඉහළ කාර්යාල කුලී පදනම හේතුවෙන් රාජ්‍ය ආයතන හා පුද්ගලික කාර්යාල අඩු කාර්යාල කුලී පදනමක් සහිත ප්‍රමුඛ උප නැගෙනහිර ප්‍රත්‍යන්ත ප්‍රදේශයට ආකර්ෂණය කිරීමට බලාපොරොත්තු වේ. එය රූපය 3.17 මගින් විස්තර කරන ජෝන්ග් ලෑන්ග් ලාසැලේ නිශ්චල දේපළ වාර්තාවෙහි එන සිතියම මගින් විග්‍රහ කෙරේ.

රූපය 3.17: ජෝන්ග් ලෑන්ග් ලාසැලේ- ආර්ථික නගර වර්ගීකරණය




මූලාශ්‍රය: අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030

කොළඹ නගරයට සාපේක්ෂව මෙම ප්‍රදේශයේ පවතින අඩු ඉඩම් මිල, ප්‍රදේශයේ ආයෝජන සඳහා ආයෝජකයින් දිරිගන්වනු ඇත. උදාහරණයක් ලෙස කඩුවෙල සැලසුම් බල ප්‍රදේශයේ අවම ඉඩම් මිල පර්චසයක් සඳහා රුපියල් මිලියන 0.1 සිට ඉහළ මිල (බත්තරමුල්ල ප්‍රදේශය) පර්චසයක් සඳහා රුපියල් මිලියන 11.0 පමණ වන බව වාර්තා වේ. එය වර්තමාන කොළඹ නගරය හා සසදා බලන විට වාර්තා වන අවම ඉඩම් මිල පර්චසයක් සඳහා රුපියල් මිලියන 0.7 වන අතර ඉහළම ඉඩම් මිල පර්චසයක් සඳහා රුපියල් මිලියන 18.0 පමණ වේ. සෞභාග්‍යමත් නගරයක් සඳහා අපරවයුහ පහසුකම් වැඩි දියුණු කිරීම, ගතික ව්‍යාපාර පරිසරයක් බිහි කිරීම, සහ සංවර්ධනය වේගවත් කරන ව්‍යාපෘති හඳුන්වාදීම අත්‍යවශ්‍ය වන අතර ප්‍රදේශය තුළ පවතින කුඩා හා මධ්‍ය පරිමාණ පොකුරු කලාප සංවර්ධනය කිරීම මගින් ගුවමාරු කරගත හැකි පොදු අපරවයුහ පහසුකම් මත මානව සම්පත් සංකේන්ද්‍රණයට ප්‍රදේශය තුළ උපයෝගී කර නොගත් ආර්ථික විභවයන් යොදා ගත යුතු බව පැහැදිලිය.

රූපය 3.18: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්නා ඉඩම් මිළ



සැකසුම:සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2023

### 3.3.2 ඉදිරි සංවර්ධන ව්‍යාපෘති වලින් උපරිම ධනාත්මක බලපෑම් අත්කර ගැනීම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ විවිධ වගකිවයුතු ආයතන ඒකාබද්ධව ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති කීපයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. එබැවින් එම යෝජනාවන්හි විධානය කරන ලද අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගැනීම සඳහා එකී ජාතික වශයෙන් වැදගත් ව්‍යාපෘති මෙම සැලැස්මට ඇතුලත් කිරීමට කටයුතු කෙරේ.

#### 3.3.2.1 සැහැල්ලු දුම්රිය සංක්‍රමණ (Light Rail Transit) හා කුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගය (Elevated Express way)

ප්‍රවාහන ගමනාගමන තදබදය කොළඹ හා තදාසන්න ප්‍රදේශයන්හි පවතින උග්‍ර ගැටළුවක් බවට පත්වී ඇත. මෙම ගැටළුවට පිළියම් සඳහා සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ව්‍යාපෘතිය හා කුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගය (Elevated Express way) හඳුන්වා දී ඇත. රූපය 3.20 මගින් ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ සහයෝගයෙන් සමාරම්භය ලබා දුන් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියේ විහිදීම් රටාව හා කුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගය (Elevated Express way) දැක්වේ.

රූපය 3.19: සැහැල්ලු දුම්රිය සංක්‍රමණ (Light Rail Transit)



මූලාශ්‍රය:lankanewspapers.com/2018/03/30/

මෙසේ යොජිත සැහැල්ලු දුම්රිය සංක්‍රමණ (Light Rail Transit) සේවාවෙහි කොළඹ කොටුවේ සිට මාලබේ හරහා කඩුවෙල නගරයත්, අතුරුගිරිය නගරයත් සහසම්බන්ධ වන (Purple Line) ව්‍යාපෘතිය හා හුනුපිටියේ සිට මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වෙත සහසම්බන්ධ වන (Blue Line) ව්‍යාපෘතිය කොස්වත්ත, තලවතුගොඩ හරහා ගමන් කිරීමට යොජිත අතර එකී ව්‍යාපෘතීන් සෘජුවම කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ප්‍රවාහන තදබදයට විසඳුමක් ලෙස ධනාත්මක බලපෑමක් ඇතිකිරීමට ඉවහල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එමෙන්ම කුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගයෙහි (Elevated Express way) දෙවන අදියර රාජගිරියේ සිට අතුරුගිරිය දක්වා යෝජිත අතර එය කිලෝමීටර් 10.4 කින් යුතු වේ. මාර්ග සංවර්ධන අධිකාරියේ මගපෙන්වීම යටතේ ඉදිකිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය තුළින් ප්‍රදේශයෙහි ප්‍රවාහන සේවයෙහි නව පිබිදීමක් ඇති කරනු ඇත.

රූපය 3.20: සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියේ විහිදීම් රටාව හා තුලුණු මත ඉදිවන අධිවේගී මාර්ගය




මූලාශ්‍රය: බස්නාහිර කලාපීය යෝජිත සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය

### 3.3.3: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින ජෛව විවිධත්වය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි සමස්ත භූමි ප්‍රමාණයෙන් 20% ක භූමි ප්‍රමාණයක් පාරිසරික සංවේදී ප්‍රදේශ ගණයට අයත් වන අතර, ඉන් 58% කුඹුරු හා 22% වගුරු බිම් වේ. ශ්‍රී ජයවර්ධනපුර කුරුළු අභය භූමිය, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයට මායිම්ව පිහිටා තිබීමත් සහ තවත් වැදගත් පාරිසරික සංවේදී ප්‍රදේශ වන, තලංගම වැව පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය, දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය හා කොරතොට පන්සල් කන්ද පිහිටා තිබීම තුළින් මෙම ප්‍රදේශයෙහි ජෛව විවිධත්වය මානව විග්‍රහ කිරීමට ඉමහත් පිටුවහලක් වේ.

වර්ෂ 1985 ජනවාරි මස 09 වන දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වනජීවී අභය භූමියක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද අතර වර්ෂ 2018 ඔක්තෝම්බර් මස 25 වන දින ඩුබායි හි පැවති රැම්සාර් සම්මුතියේ 13 වන සමුළුවේදී කොළඹ පිහිටි තෙත්බිම් "රැම්සාර් නගරයක්" (Ramsar City) ලෙස ප්‍රකාශයට පත්කරන ලදී. එසේ සදහන් කරන ලද තෙත්බිම් අතරින් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ කුරුළු අභය භූමිය පිහිටි තෙත්බිම් පද්ධතියෙන් කොටසක් කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයට අයත් වීම ද සුවිශේෂිතාවයකි.

එසේම, සැලැස්මෙහි දෙවන පරිච්ඡේදය යටතේ සැලසුම් හා අවස්ථානුකූල සන්දර්භට අනුකූලව විස්තර කළ පරිදි පාරිසරික වැදගත්කමකින් යුක්ත මෙම තලංගම තෙත් බිම් පරිසර පද්ධතිය, 1980 අංක 47 දරණ ජාතික පරිසර පනතට අනුව 2007 මාර්තු 05 දින 'පාරිසරික ආරක්ෂන ප්‍රදේශයක්' බවට මධ්‍යම පරිසර අධිකාරිය මගින් අංක 1487/10 ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. වැව ආශ්‍රිත ප්‍රදේශය හෙක්ටයාර් 118ක භූමියකින් යුක්ත වන බව හඳුනා ගන්නා ලදී.

වගු අංක 3.3: කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින තෙත්බිම් පරිසර පද්ධතියෙහි ජෛව විවිධත්වය

| තෙත්බිම් පරිසර පද්ධතිය | ජෛව විද්‍යාත්මක පොහොසත්කම ජීවින් *10 | ආවේණික ජීවීන් | වඳවීයාමේ තර්ජනයට ලක් වී ඇති ජීවීන් | ආක්‍රමණශීලී ජීවීන් |
|---|---|---|---|---|
| තලංගම තෙත් බිම් පරිසර පද්ධතිය | 28,4 | 19 | 9 | 10 |
| මාලබේ තෙත් බිම් පරිසර පද්ධතිය | 20,6 | 19 | 5 | 3 |
| දියත උයන තෙත් බිම් පරිසර පද්ධතිය | 21 | 8 | 5 | 8 |
| තලවතුගොඩ තෙත් බිම් පරිසර පද්ධතිය | 8,7 | 3 | 1 | 7 |

මූලාශ්‍රය: පරිසර හා භූදර්ශන අංශය,, නාගරික සංවර්ධන අධිකාරිය 2022

එමෙන්ම ජෛව විවිධත්වයෙන් අනූන ශාක හා සත්ව ප්‍රජාවක් මෙම තෙත්බිම් ඇතුළු පාරිසරික පද්ධතිය තුළ වාසය කිරීම තුළින් ආනාගත සංවර්ධන ව්‍යාප්ති සිදුකිරීමේ දී සමස්ත පරිසර පද්ධතියෙහි පවතින මෙකී පාරිසරික විභවයන් පිළිබදව විමසිලිමත් දැසින් විමසා බැලීම අත්‍යවශ්‍ය වේ.

ජාතික පරිසර පනතට අනුව 'පාරිසරික ආරක්ෂන ප්‍රදේශයක්' බවට මධ්‍යම පරිසර අධිකාරිය මගින් ප්‍රකාශයට පත් කරන ලද තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය රූපය 3.21 මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 3.21: තලංගම පාරිසරික ආරක්ෂණ ප්‍රදේශය




මූලාශ්‍රය: මධ්‍යම පරිසර අධිකාරිය වෙබ් පිටුව ඇසුරෙනි.

# හතරවන පරිච්ඡේදය

# සංවර්ධන සැලැසුම් රාමුව

**හතරවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය**

**දැක්ම**

### 4.1 දැක්ම




### 4.2 දැක්මෙහි ප්‍රකාශනය

සුරක්ෂිතභාවය, රසවින්දනය, සහ නාගරික පරිශීලකයින් සඳහා ජීවත්වීමට හිතකර පරිසරයක් සහිත ප්‍රමුඛතම ආයතනික හා අගනා ආර්ථික අවස්ථාවන් වලින් සපිරි නගරය නිර්මාණය කිරීම

**ඉලක්ක**

### 4.3 ඉලක්ක

කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023- 2033 හි සැලසුමෙහි අපේක්ෂිත දැක්ම වෙත ළඟා වීම සඳහා ප්‍රධාන ඉලක්ක 04 ක් ගොඩ නඟා ඇත.

**ඉලක්ක 01 : ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම**

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය ශ්‍රී ලංකා පරිපාලන අගනගර බල ප්‍රදේශයට අයත් විවිධ පාරිසරික, ආර්ථික, සමාජීය ලක්ෂණ වලින් යුත් ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැක. මෙම ප්‍රදේශයට අයත් බත්තරමුල්ල, කොස්වත්ත, පැලවත්ත හා ඩෙන්සිල් කොබ්බෑකඩුව ප්‍රදේශයන්හි, ශ්‍රී ලංකාවේ ප්‍රධානතම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන පිහිටා ඇති අතර, මාලබේ ප්‍රදේශය තුල තොරතුරු තාක්ෂණික නගරයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රවර්ධන කටයුතු සිදු කර ඇත. මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ඇති විශේෂ වැදගත්කමකින් යුක්ත ප්‍රදේශ වුවත්, ප්‍රදේශය තුළ පවතින ස්වභාවය අනුව එය නිසිආකාරව නිරූපණය නොවේ. එහෙයින් මෙම ප්‍රදේශ වලට සේවා ලබා ගැනීමට පැමිණෙන ජනතාව ද දැඩි අපහසුතාවට පත් වන අතරම යෝජිත අවස්ථාවන්ද සීමා වනු ලැබේ. තවද මෙම ප්‍රදේශයේ උතුරු මායිමෙන් කැළණි ගඟ ගල යනු ලැබුවද කඩුවෙල නගරය සංවර්ධනය කිරීමේදී මෙතක් එය නගරයේ අනන්‍යතාවය ප්‍රවර්ධය කිරීමට දායක කරගෙන නොමැති අතර ප්‍රදේශය තුල පවතින පුරාවිද්‍යාත්මක ස්ථාන ද මෙතෙක් එම ප්‍රදේශයන්ගේ

ආවේණික උරුමයන් ලෙස සලකා සංවර්ධන කරා දායක කරගැනීමක් සිදු කර නොමැත. එම නිසා මෙම සැලසුම මගින් කඩුවෙල මහා නගර සභා ප්‍රදේශය තුල පවතින විශේෂ වූ ගති ලක්ෂණ හා උරුමයන් හදුනා ගෙන ප්‍රදේශයට ආවේණික අනන්‍යතාවයක් ගොඩ නැගීම මෙහි ප්‍රධාන අරමුණක් වේ.

**ඉලක්ක 02 : සුහුරු නාගරික පහසුකම් සහිත කාර්යක්ෂම නාගරික පද්ධතියකින් යුත් සෞභාගයමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීම**

මෙම සැලසුමේ ප්‍රධානතම උපායමාර්ගික ඉලක්කයක් ලෙස ප්‍රදේශයේ පවතින යටිතල පහසුකම් වැඩි දියුණු කරමින් ආර්ථික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධන කිරීමට හදුනා ගෙන ඇති අතරම ශ්‍රී ලංකා පරිපාලන අගනගරයේ ප්‍රමුඛතම ආයතනික කලාපය ලෙස ක්‍රියා කරන බත්තරමුල්ල, කොස්වත්ත, පැලවත්ත ප්‍රදේශ ද, මාලබේ ප්‍රමුඛ තොරතුරු තාක්ෂණික කලාපය ද, නවගමුව, කොරතොට, දැඩිගමුව ප්‍රදේශ තුල පවතින ස්වභාවික ඛණිජ නිධි හා කර්මාන්ත ශාලා ද, ප්‍රදේශය පුරා විහිදී පවතින කෘෂිකාර්මික ප්‍රදේශ ද, මෙම ප්‍රදේශය ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධන කිරීමට දායක කර ගත හැකි මූලික සම්පත් ලෙස හදුනා ගෙන ඇත.

ඒ අනුව හදුනා ගන්නා ලද ප්‍රදේශ තුළ පවතින සෑම ආර්ථික අංශයක්ම සංවර්ධන කිරීම හා සමස්ථ ශ්‍රී ලංකාවට නවෝත්පාදන ආර්ථික ආකෘතීන් නිරූපණය කරන ප්‍රදේශ ලෙස වැඩි දියුණු කිරීම මෙම සැලසුම මගින් අරමුණු කරගෙන ඇත. තවද මෙම ආර්ථික කටයුතු සදහා අවශ්‍ය නාගරික පරිසරයක් බිහිකිරීමට අවශ්‍ය කරන්නා වූ ප්‍රවාහන පද්ධතිය, ජල සැපයුම, විදුලි සැපයුම, මලපවාහන, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රමවේදය හා සුහුරු නගර සංකල්පය ප්‍රවර්ධනය කිරීම මගින් පහසු හා කාර්යක්ෂම නගරයක් ඇති කිරීම ද මෙහි ප්‍රධාන අරමුණක් වේ.

**ඉලක්ක 03: තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම**

ප්‍රදේශයේ තුළ පවතින හරිත පාරසරික පද්ධතිය ද කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයට ආවේණික වූ විභවතාවයකි. දියත තෙත්බිම, තලංගම තෙත්බිම, කැළණි ගඟ, දියවන්නා ඔය ඇතුළු හරිත හා නිල් පැහැති පාරිසරික උරුමයන්ගෙන් අනන්‍ය වූ හරිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමට පසුබිම සමත් කරදෙනු ලබයි. ඉතා වැදගත් කරුණ වනුවේ එම විභවතාවයන් තිරසාර ලෙස සංවර්ධනය සදහා යොදා ගැනීමයි. මේතුළින් නගරයේ මෙම වටිනා වත්කම් ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම සඳහා ස්වේච්ඡාවෙන් සේවය සැපයීමට ජනතාවට හිමිකාරිත්වයක් සහ හැඟීමක් ඇති කිරීමට මෙය ඉවහල් වේ. ඒ සදහා කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම මගින් ප්‍රදේශයෙහි පරිසර පද්ධතිය විවෘත කර නිල හරිත නගරයක් පුබුදු කරවීම සදහා උපකාරීවන උපායමාර්ගික ප්‍රවේශයක් හදුන්වා දී ඇත.

**ඉලක්ක 04: නේවාසිකයන් සදහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම**

ජාතික භෞතික සැලසුම මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය ඇතුළත් ප්‍රදේශය මිනිස් වාසය සදහා වඩාත් හිතකර ප්‍රදේශයක් ලෙස හදුනා ගෙන ඇත. එමෙන්ම අනාගතයේ පැමිණීමට නියමිත පොදු ප්‍රවාහනපහසුකම් දියුණු කිරීමේ ව්‍යාපෘති, නව ආර්ථික සංවර්ධන කටයුතු සමග ඇති විය හැකි නේවාසික ඉල්ලුම යන කරුණු පදනම් කොට ගෙන ප්‍රදේශයෙහි ඉදිරියේදී සංවර්ධන විය යුතු අධ්‍යාපනික, සෞඛ්‍ය, ඇතුළු සමාජීය මෙන්ම භෞතික යටිතල පහසුකම් සංවර්ධන කිරීම හා අවශ්‍ය කරන පොදු පහසුකම් සංවර්ධන කිරීම මගින් සුරක්ෂිතභාවය, රසවින්දනය පිරි හිතකර පරිසරයක් නිර්මාණය කිරීම ද මෙහි අරමුණක් වේ

**හතරවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය**

**අභිමතාර්ථ**

**4.4 අභිමතාර්ථ**

**ඉලක්ක 01 : ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම**

**අභිමතාර්ථ:**

1. බත්තරමුල්ල කොස්වත්ත, පැලවත්ත ආශ්‍රිත ප්‍රදේශයන් 2032 වර්ෂය වනවිට ශ්‍රී ලංකාවේ පරිපාලන අගනුවරෙහි ආයතනික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම.
2. සුහුරු දැනුම නගරය ලෙස මාලබේ නගරයේ අනන්‍යතාවය 2032 වර්ෂය වනවිට වර්ධනය කිරීම.
3. 2032 වර්ෂය වනවිට කඩුවෙල නගරය ගංගා ආශ්‍රිත නගරයක් ලෙස අනන්‍යතාවය වර්ධනය කිරීම
4. ප්‍රවාහනය මූලික වූ සංවර්ධන ප්‍රදේශයක් සහ නේවාසික කේන්ද්‍රස්ථානය ලෙස අතුරුගිරිය ප්‍රදේශයෙහි අනන්‍යතාවය 2032 වර්ෂය වනවිට සංවර්ධනය කිරීම
5. 2032 වර්ෂය වනවිට නවගමුව, රණාල, කොරතොට ප්‍රදේශ ආශ්‍රිතව කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම

**ඉලක්ක 02 : සුහුරු නාගරික පහසුකම් සහිත කාර්යක්ෂම නාගරික පද්ධතියකින් යුත් සෞභාගයමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීම**

**අභිමතාර්ථ:**

1. 2030 වර්ෂය වනවිට කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ විශ්වාසනීය, සුවපහසු සහ කාර්යක්ෂම පොදු ප්‍රවාහන පද්ධතියේ ජාලයක් නිර්මාණය කිරීම
2. කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පුරෝකථනය කරන ලද සංවර්ධනයට සරිලන පරිදි 100% ක් ජල සම්පාදන, විදුලි සැපයුම, මලාපවහන සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති ඇතුළු භෞතික යටිතල පහසුකම් 2032 වන විට වැඩිදියුණු කිරීම.
3. ආයතනික, වාණිජ, මිශ්‍ර සංවර්ධන සහ තොරතුරු තාක්ෂණ භාවිතයන් සඳහා සමස්ත සැලසුම් බල ප්‍රදේශය තුළින් හෙක්ටයර් 40 ක් ඉඩම් ප්‍රමාණයක් 2025 වර්ෂය වනවිට වෙන් කිරීම හා කලපිකරණය මගින් හෙක්ටයාර් 2500ක ප්‍රමාණයක් ප්‍රවර්ධනය කිරීම.

**ඉලක්ක 03: තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම**

**අභිමතාර්ථ:**

1. 2032 වර්ෂය වනවිට හෙක්ටයාර 1300 ක වපසරියකින් යුත් දැනට පවතින තෙත්බිම් පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම

2. 2030 වර්ෂය වනවිට තෙත්බිම් වලට හානියක් නොවන ආකාරයට හඳුනා ගන්න ලද හෙක්ටයාර් 200 ක ප්‍රමාණයක් වූ තෙත්බිම් ප්‍රමාණයක් පොදු විනෝදාස්වාදන කටයුතු සදහා භාවිත කිරීම
3. සංවර්ධන කටයුතු සඳහා කැලණි ගඟ අභිමුක කි.මී 4 .ප්‍රමාණයක් 2032 වර්ෂය වනවිට විවෘත කිරීම.

### ඉලක්ක 04: නේවාසිකයන් සදහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම

**අභිමතාර්ථ:**

1. හෙක්ටයාර් 3000 ක භූමි ප්‍රමාණයකින් සමන්විත නේවාසික කලාප 03 ක් ප්‍රවර්ධනය කිරීම
2. 2030 වර්ෂය වනවිට හදුනා ගනු ලැබූ නේවාසික කලාපය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් සැපයීම සඳහා කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම

# පස්වන පරිච්ඡේදය

# ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ විශ්ලේෂණය

# පස්වන පරිච්ඡේදය

## ශ. දු. අ. ත. විශ්ලේෂණය

### 5.1 සංක්ෂිප්ත ශ. දු. අ. ත. විශ්ලේෂණය

**ඉලක්ක 01: ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම**

| | ශක්තීන් | | දුර්වලතා |
|---|---|---|---|
| S1 | සමස්ත කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙන් 0.7% භූමි ප්‍රමාණයක පරිපාලන කටයුතු (රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන) බත්තරමුල්ල පැලවත්ත ආශ්‍රිතව ව්‍යාප්තව පැවතීම. | W1 | 75% ක් පමණ ප්‍රමුඛ පෙළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන බත්තරමුල්ල ආයතනික කලාපයෙන් පරිබාහිර ප්‍රදේශ වල ව්‍යාප්තව පැවතීම. |
| S2 | කඩුවෙල සැලසුම් බල ප්‍රදේශය තුළ සෙත්සිරිපාය අදියර I , අදියර II, ඉසුරුපාය, සම්පත්පාය, රන්මගපාය, සුහුරුපාය, මගනැගුම මහමැදුර, ලක්දිය මැදුර, මිහිකත මැදුර හා සංඛ්‍යාන මන්දිරය වැනි ආයතනික ගොඩනැගිලි රාශියක් පිහිටා තිබීම. | W2 | මාලබේ තොරතුරු තාක්ෂණ කලාපයෙහි ලක්ෂණ ස්මතුවන ආකාරයේ රෙගුලාසි සුදුසු මාර්ගෝපදේශනයක් නොමැතිවීම. |
| S3 | කඩුවෙල සංවර්ධන සැලැස්ම 2008-2020 ට අනුකූලව ගොඩනැගිලි හා නාගරික නිර්මාණ රෙගුලාසි හා නියමතා වර්තමානය වන විටත් භාවිතයේ පැවතීම. | W3 | කඩුවෙල නගරය ආශ්‍රිත සිදුකරනු ලබන වර්තමාන සංවර්ධන කටයුතු සඳහා කැළණි ගඟෙහි විභවතාවය ඒකාබද්ධ කර නොගැනීම. |
| S4 | කොළඹ වාණිජ නගරයට කිලෝමීටර් 11 ක දුරින් හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගරයේ කොටසක් ලෙස පිට තිබීම. | W4 | පොදු මහජනතාව වෙනුවෙන් සංවේදීතාවයක් ඇති කළ හැකි ආකාරයේ නාගරික මාර්ගෝපදේශනයක් බත්තරමුල්ල ආයතනික නගරය තුළ මෙන්ම අනෙකුත් ප්‍රදේශ තුල නොමැති වීම. |
| S5 | මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යාන සැලැස්ම ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබීම හා ඊට අනුකූලව තොරතුරු තාක්ෂණය කේන්ද්‍ර කරගත් ආයතන එම ප්‍රදේශයට සංකේන්ද්‍රණය වී තිබීම. | | |
| | **අවස්ථා** | | **තර්ජන** |
| O1 | ප්‍රමුඛ පෙළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන කොළඹ නගරයෙන් පරිබාහිරට රැගෙන ඒම සඳහා රජය විසින් ප්‍රතිපත්තිමය තීරණයක් යෝජනා කර පැවතීම. | T1 | වර්තමානයේ දී මෙරට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතැම් යෝජිත ව්‍යාප්ති ක්‍රියාත්මක කිරීම සඳහා පවතින මූල්‍යමය අපහසුතාවය. |
| O2 | වර්ෂ 1985 අගනගර සංවර්ධන සැලැස්මට සැලසුම් බල ප්‍රදේශයෙන් කොටසක් වන බත්තරමුල්ල හා පැලවත්ත ප්‍රදේශය ඇතුළත් කර තිබීම හා එහි ඇතුළත් සංවර්ධන ව්‍යාප්ති ක්‍රියාත්මක කර පැවතීම. | | |
| O3 | වර්ග මීටර් 123,900 ක කාර්යාල අවකාශයකින් යුතු සෙත්සිරිපාය අදියර III ව්‍යාප්තිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් යෝජනා කර ඉදිකිරීම් ආරම්භ කර පැවතීම. | | |
| O4 | නේවාසික හා රාජ්‍ය කාර්යාල සඳහා පවතින හිතකර තත්වය මත වර්තමානයේ දී ඉඩම් හා දේපල (ගොඩනැගිලි) සඳහා ඉහල ඉල්ලුමක් පැවතීම. | | |

**ඉලක්ක 02 : පහසු කාර්යක්ෂම නාගරික පද්ධතියක් තුළින් සුහුරු නාගරික පහසුකම් සහිත සෞභාගයමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීම**

| ශක්තීන් | | දුර්වලතා | |
|---|---|---|---|
| S1 | ජාතික වශයෙන් වැදගත්, අන්තර් කලාපීය සම්බන්ධතාවයක් පවතින නව නුවර මාර්ගය, ලෝ ලෙවල් මාර්ගය (පරණ අවිස්සාවේල්ල මාර්ගය) හා පිටත වටරවුම් අධිවේගී මාර්ගය මෙම සැලසුම් බල ප්‍රදේශය හරහා ගමන් කිරීම සහ පිටත වටරවුම් අධිවේගී මාර්ගයට අදාළ අන්තර් හුවමාරු මධ්‍යස්ථාන තුනක් මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබීම. | W1 | අඩු ඵලදිතාවයකින් හා අඩු ගුණත්වයකින් යුක්ත දුර්වල කළමනාකරණයක් සහිත පොදු ප්‍රවාහන සේවය සහ ඒ ආශ්‍රිතව පවතින අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් මතුවී ඇති අධික රථවාහන තදබදය. |
| S2 | කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සැලසුම් බල ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටීම. | W2 | සමස්ත සැළසුම් ප්‍රදේශයෙන් 27% ක භූමි ප්‍රමාණයක් ගංවතුර ඇතුලු ස්වාභාවික ආපදාවන්ගෙන් යුතු අවදානම් ප්‍රදේශයක් ලෙස හදුනාගෙන තිබීම |
| S3 | සාපේක්ෂව කලාපීය හා ප්‍රදේශීය මංසන්ධි අතර මනා අන්තර් සම්බන්ධතාවයක් පැවතීම. | W3 | සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින අපජලය පිරිපහදු කිරීමේ මධ්‍යස්ථානයක් හා මලාපවාහන බැහැරකිරීමේ සුදුසු ක්‍රමවේදයක් නොමැතිවීම. |
| S4 | වැල්ලවත්ත සිට බත්තරමුල්ල දක්වා අභ්‍යන්තර ජලාශ මූලික කරගත් ප්‍රවාහන සේවාවක් පැවතීම. | W4 | නව යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන්නාවූ ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම. |
| S5 | සමස්ථ සැළසුම් ප්‍රදේශයෙන් 73% කට ආසන්න වූ භූමි ප්‍රමාණයක් ස්වභාවික උවදුරු වලින් තොර ප්‍රදේශ වීම | | |
| S6 | ස්වභාවික සම්පත් හරහා ගොඩනැගුන කර්මාන්ත පොකුරු සහ අන්තර්ජාතික හා ජාතික වශයෙන් වැදගත් කර්මාන්ත මෙම ප්‍රදේශය තුළ පිහිටා තිබීම | | |
| S7 | නාගරික වර්ධනය සඳහා අවශ්‍ය සමාජයීය යටිතල පහසුකම් සැපයීමට අවශ්‍යවන අධ්‍යාපන, සෞඛ්‍ය, පහසුකම් ප්‍රදේශය තුළ සැලසුම් බල ප්‍රදේශයට ඉතා ආසන්නව පැවතීම. | | |
| S8 | සමස්ත කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙන් 19% භූමි ප්‍රමාණයක් කුඹුරු වගා හා කෘෂිකාර්මික ඉඩම් පැවතීම. | | |

| අවස්ථා | | තර්ජන | |
|---|---|---|---|
| O1 | පොදු ප්‍රවාහනය සේවය විධිමත් කිරීම සදහා සැහැල්ලු දුම්රිය සේවය , කුළුණු මතින් ඉදිවන අධිවේගී මාර්ගය , බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රමය හා ජල ප්‍රවාහන ක්‍රම ඇතුළුව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් වී තිබීම. | T1 | සැලසුම් කළාපයේ පිටත පවතින තරඟකාරී පොකුරු ආර්ථික සංවර්ධනය |
| O2 | යටිතලපහසුකම් ආශ්‍රිත යෝජිත ව්‍යාපෘති පැවතීම. | T2 | හීනටිකුඹුර ප්‍රදේශය තුල යෝජිත අපජල පධතිය සදහා ජනතා වීරෝධතාවය |
| O3 | කැළණි ගංගාව ආශ්‍රිතව පවතින ස්වාභාවික ආපදා අවදානම අවමකිරීම සදහා යෝජිත ව්‍යාපෘති පැවතීම | T3 | වර්තමානයේ දී මෙරට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතැම් යෝජිත ව්‍යාප්ති ක්‍රියාත්මක කිරිම සදහා පවතින මුල්‍යමය අපහසුතාවය. |

**ඉලක්ක 03: තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම**

| ශක්තීන් | | දුර්වලතා | |
|---|---|---|---|
| S1 | සමස්ත කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙන් 17% ක භූමි ප්‍රමාණයක තෙත්බිම් පරිසර පද්ධති ව්‍යාප්තව පැවතීම හා මුළු භූමි ප්‍රමාණයෙන් 3% ක් ජලජ පරිසර පද්දතිය ව්‍යාප්තව තිබීම. | W1 | 2014 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා සැලසුම් බල ප්‍රදේශය තුළ පවතින තෙත්බිම් 7% කින් හායනයවීම |
| S2 | බොහොමයක් තෙත්බිම් වල හිමිකාරීත්වය රාජ්‍ය ආයතන සතු වීම සහ ඒවා ජෛව විවිධත්වයෙන් අනූන වීම. | | |
| S3 | ප්‍රදේශය තුළ ස්වභාවිකව ජලය බැසයාම සඳහා තෙත්බිම් පරිසර පද්දති උපකාරී වීම. | | |
| **අවස්ථා** | | **තර්ජන** | |
| O1 | තෙත්බිම් සුරක්ෂිත කිරීම සඳහා පවතින නීතිමය බැදියාව. | T1 | තෙත් බිම් සහ කුඹුරු ඉඩම් 7% කට ආසන්න ප්‍රමාණයක් අනවසර ලෙස පිරවීම සහ මානව ජනාවාස ඉදිකිරීම. |
| O2 | රැම්සාර් සම්මුතිය (COP13) මගින් කොළඹ නගරය තෙත් බිම් නගරයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම | T2 | අනවසර ඉදිකිරීම් සහ අපද්‍රව්‍ය බැහැර කිරීම හේතුවෙන් ස්වාභාවික ජල මාර්ග වලට බාධා ඇති කර තිබීම. |
| O3 | කොළඹ නගරය ආශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශයන් වැඩි ප්‍රමාණයක් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුල පැවතීම. | T3 | වැලි සේදීම ආදි කර්මාන්ත කටයුතු වලින් ප්‍රදේශය තුළ පවත්නා ගංගා ඇළ දොළ ගොඩ වීම. |

**ඉලක්ක 04: කඩුවෙල මහා නගර සභා ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම**

| ශක්තීන් | |
|---|---|
| S1 | එක් එක් ආර්ථික මට්ටම් වලට අනුකූලව ක්‍රමවත්ව ස්ථාපනය වූ නේවාසික කලාප ප්‍රදේශය තුළ පැවතීම. |
| S2 | සමස්ත සැළසුම් ප්‍රදේශයෙන් 73% කට ආසන්න වූ භූමි ප්‍රමාණයක් ස්වභාවික උවදුරු වලින් තොර ප්‍රදේශ වීම. |
| S3 | කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් නාගරික ප්‍රදේශයන් හා සසඳන කළ බත්තරමුල්ල ප්‍රදේශය හැර අනෙකුත් ප්‍රදේශයන් නාගරීකරණ ලක්ෂණ අවම ප්‍රදේශ වීම. |
| S4 | සැලසුම් බල ප්‍රදේශය තුළ රජයේ රෝහල්, අර්ධ රාජ්‍ය රෝහලක් හා පෞද්ගලික රෝහල් පිහිටා තිබීම හා ශ්‍රී ජයවර්ධනපුර රෝහල , කොළඹ ජාතික රෝහල, කාසල් වීදියේ කාන්තා රෝහල හා ලේඩිරිජ්වේ ළමා රෝහල ආදී ප්‍රමුඛ පෙළ ජාතික රෝහල් හා ප්‍රමුඛ පෙළ පෞද්ගලික රෝහල් රැසක් සැලසුම් බල ප්‍රදේශට ඉතා ආසන්නව පිහිටා තිබීම. |
| S5 | කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජාතික පාසල් ඇතුළු රජයේ පාසල් 32ක් හා ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් රැසක් පිහිටා තිබීම. |
| S6 | කොළඹ නගරයට ඉතා ආසන්නව පිහිටීම හේතුවෙන් ප්‍රමුඛ පෙළ ජාතික පාසල් වලට සිසුන් යොමුකිරීමට ඇති හැකියාව ඉහළ වීම. |
| S7 | ජාතික තලයේ පෞද්ගලික විශ්වවිද්‍යාලයක් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ විශ්ව විද්‍යාලය ඇතුළු සුප්‍රසිද්ධ පෞද්ගලික විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සැලසුම් බල ප්‍රදේශය තුළ පිහිටා තිබීම. |
| S8 | පිටත වටරවුම් මාර්ගය ප්‍රදේශය තුළ පිහිටා තිබීම තුළින් ජනතාවට ප්‍රවාහන පහසුකම් වඩාත් ගුණාත්මකව ලබාගැනීමට ඇති හැකියාව. |

| දුර්වලතා | |
|---|---|
| W1 | නේවාසික ජනගහනයෙන් 0.3% කට ආසන්න ප්‍රමාණයක් තාවකාලික හා අඩු පහසුකම් සහිත නිවාස වල ජීවත් වීම. |
| W2 | සමස්ත සැළසුම් ප්‍රදේශයෙන් 27% ක භූමි ප්‍රමාණයක් ගංවතුර ඇතුලු ස්වාභාවික ආපදාවන්ගෙන් යුතු අවදානම් ප්‍රදේශයක් ලෙස හදුනාගෙන තිබීම. |
| W3 | ජනගහන වර්ධනයත් සමග පරිසර සංවේදී කලාපවලට ජනාවාස ව්‍යාප්ත වීම |
| W4 | නාගරික ජන ඝනනත්වය වැඩිවීම නිසා ඝන අපද්‍රව්‍ය, මලාපවාහන හා අපජල බැහැර කිරීම සඳහා ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් සහ විධිමත් ක්‍රමවේදයක් නොමැති වීම. |
| W4 | ප්‍රදේශය තුළ පවතින කලුගල් කැණීම් මධ්‍යස්ථාන හේතුවෙන් ප්‍රදේශයේ ජීවත් වන නේවාසික ප්‍රජාව නිරන්තරයෙන් පිඩාවට ලක්වීමට සිදුවීම. |

| අවස්ථා | |
|---|---|
| O1 | බත්තරමුල්ල නගරයෙහි සියළු රාජ්‍ය ආයතන ස්ථාපිත කිරීමට ඇති සැලැස්ම සමග කඩුවෙල සැලසුම් බල ප්‍රදේශයෙහි නේවාසික වර්ධනයට වැඩි ප්‍රවණතාවයක් ඇතිවීම |
| O2 | කොට්ටාව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සැලසුම් බල ප්‍රදේශයට ඉතා ආසන්නව පිහිටා තිබීම තුළින් ජනතාවට ප්‍රවාහන පහසුකම් වඩාත් ගුණාත්මකව ලබාගැනීමට ඇති හැකියාව. |

| තර්ජන | |
|---|---|
| T1 | කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින මාර්ගයන්හි පාසල් හා කාර්‍යාල වේලාවන් හිදී පවතින අධික රථ වාහන තදබදය නිසා දෛනික ජනජීවිතයට ඇතිවන බාධා |
| T2 | රාජ්‍ය ආයතන අතර (මාර්ග සංවර්ධන අධිකාරිය, ජල සම්පාදන මණ්ඩලය, ආදී) මනා සම්බන්ධීකරණයක් නොමැති වීම හේතුවෙන් සංවර්ධන ව්‍යාපෘති තුලින් ජන ජනජීවිතයට ඇතිවන බාධා |

| අවස්ථා | | තර්ජන | |
|---|---|---|---|
| O3 | කොළඹ වාණිජ නගරයට නදාසන්නව පිහිටීම සහ එහි ඉඩම් සඳහා පවතින අධික ඉල්ලුමට සාපේක්ෂව කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි අඩු ඉඩම් වටිනාකමක් පැවතීම. | T3 | වර්තමානයේ දී මෙරට පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ඇතැම් යෝජිත ව්‍යාප්ති ක්‍රියාත්මක කිරීම සදහා පවතින මුල්‍යමය අපහසුතාවය. |
| O4 | කඩුවෙල ප්‍රධාන බස් නැවතුම්පල හරහා ප්‍රදේශීය නගර අතර මෙන්ම අන්තර් පළාත් අතර ධාවනය වන විධිමත් මගී බස් රථ සේවාවක් පැවතීම. | | |

# හයවන පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්ම

**හයවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්ම**

**සංකල්පීය සැලැස්ම**

### 6.1 සංකල්පීය සැලැස්ම

කඩුවෙල සංවර්ධන සැලැස්ම එම ප්‍රදේශයෙහි අනාගත දැක්ම වන " **ශ්‍රී ලංකා ස්වෛරීත්ව කිරුළේ බලවත්ම කේන්ද්‍රස්ථානය** " යන දස අවුරුදු දැක්ම සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය කරන අපේක්ෂිත නගර පරිවර්තනය පුබුදුවාලීමට අවශ්‍ය නිවැරදි ප්‍රවේශයට අවතීර්ණ වීම, 1982 හි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අගනගර සැලස්ම, 2019-2030 අගනගර සංවර්ධන සැලස්ම යනාදි සැලසුම් තුළින් මූලික පදනමක් ලෙස ආරම්භ වුවද, එහි යළි පිබිදීම 2023-2033 කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි සංකල්පිත සැලැස්ම ගොඩනැගීමත් සමග ආරම්භ විය.

සුහුරු නාගරික පහසුකම් සහිත කාර්යක්ෂම නාගරික පද්ධතියකින් යුත් සෞභාගයමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීම, ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම, තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම හා නේවාසිකයන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම යන ප්‍රධාන අරමුණු 04 ක් මත පදනම්ව කඩුවෙල නගරය සඳහා වන සංකල්පිත සැලස්ම සකස් කරන ලදී.

ඒ අනුව නව නුවර මාර්ගය ප්‍රධාන සංවර්ධන කොරිඩෝව ලෙසත්, මෙරට ප්‍රමුඛ පෙළ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය රැසකින් සමන්විත ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශය හා කොස්වත්ත ප්‍රදේශය පරිපාලන හා සේවා මූලික කරගත් ආයතනික කලාපය ලෙසත්, මාලබේ චන්ද්‍රිකා කුමාරතුංග මාවත මූලික කරගත් වත්මන් තොරතුරු තාක්ෂණ කලාපය දැනුම නගර කලාපය ලෙසත්, අතුරුගිරිය ප්‍රදේශය ප්‍රවාහනය මූලික කරගත් නේවාසික කලාපය ලෙසත්, කොරතොට, නවගමුව හා රණාල ප්‍රදේශය කර්මාන්ත පදනම් කරගත් මිශ්‍ර සංවර්ධන කලාපය ලෙසත්, හා කැළණි ගඟ ආශ්‍රිත ප්‍රදේශය කැළණි ගඟ පදනම් කරගත් මිශ්‍ර සංවර්ධන කලාපයක් ලෙසත් සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

ඉහත සඳහන් ප්‍රදේශයන්ගෙන් පරිබාහිර ප්‍රදේශ, නේවාසික ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර නව නුවර මාර්ගය හා මාලබේ ගොඩගම මාර්ගය ප්‍රධාන වාණිජ කොරිඩෝව ලෙස සංවර්ධනය කිරීමට සැලැස්ම තුලින් අපේක්ෂිතය. එමෙන්ම, කඩුවෙල, බත්තරමුල්ල, මාලබේ, හා අතුරුගිරිය ප්‍රමුඛ නගර ලෙස සංවර්ධනය කිරීමට යෝජිත අතර, කොස්වත්ත, පැලවත්ත, කොරතොට, නවගමුව දෙවෙන පෙළ නගර ලෙස සංවර්ධනය කිරීමට කඩුවෙල සංකල්පිත සැලස්ම තුළින් බලාපොරොත්තු වේ.

එහිදී ප්‍රදේශය පුරා විසිර පවතින කුඹුරු සහ තෙත්බිම් හි අඛණ්ඩතාව ආරක්ෂාකරමින් නේවාසිකයන් සඳහා අවශ්‍ය කෘෂිකාර්මික හා පොදු එළිමහන් අවකාශය සංවර්ධනය කිරීමටද සැලැස්ම තුලින් අපේක්ෂිතය.

රූපය 6.1 : සංකල්පිත සැලස්ම 2023-2033




මූලාශ්‍රය: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

### 6.2 කඩුවෙල නගර සංවර්ධන සැලසුමෙහි සංයුතිය

සමස්ත කඩුවෙල සංවර්ධන සැලැස්ම පහත විස්තර කර ඇති උපායමාර්ග පහකින් සමන්විත වේ. තිරසාර සංවර්ධනය සහ සුහුරු නගර සංකල්ප වැනි මූලික මූලධර්ම මත පදනම් වෙමින් ඒවා යෝජනා කොට ඇත. 'තිරසාර නගර සහ ප්‍රජාවන්' යන 11 වන ගෝලීය තිරසාර සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා මෙම සියලු උපාය මාර්ග සාමූහිකව දායක වේ.

#### 6.2.1 නාගරික ආකෘතිය නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි අනාගත සංවර්ධනය වාණිජ, නේවාසික මෙන්ම වැඩි සහ අඩු ඝනත්වයෙන් යුක්ත මිශ්‍ර සංවර්ධන හා දැනුම නගර කලාපයන්ගෙන් සහ සංවේදීතාවය අනුව වර්ගීකරණය කරන ලද තෙත්බිම් කලාප වලින් සමන්විත වනු ඇත.

මීට අමතරව, පාර්ලිමේන්තු විශේෂිත රෙගුලාසි අදාළ වන ප්‍රදේශයන්හි ඊට අදාළ වන නියමතාවයන් හා එකී නියමතාවයන් තුළින් ගොඩනැගිලි හි උස පාලනයන් සිදුකර ඇති අතර අතුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිතව ආරක්ෂාව තහවුරු කරනු වස් ඊට අදාළ සුවිශේෂී නියමතා තුළින් මෙම සංවර්ධන සැලස්මෙහි නාගරික ආකෘතිය නියාමනය කර ඇත. බත්තරමුල්ල ආයතනික නගරයේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන ස්ථාපනය දිරිගැන්වීම හා එම ප්‍රදේශය විධිමත් ලෙස නියාමය කිරීම සඳහා වන රෙගුලාසි ඇතුළත් ආයතනික කලාපය සහ තොරතුරු තාක්ෂණය මූලික කරගත් අධ්‍යාපනික කටයුතු හා ඊට අදාළ අනුශාංගික භාවිතයන් ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන්ට සුදුසු දිරිගැන්වීම ඇතුළත් රෙගුලාසි වලින් සමන්විත දැනුම නගරය වැඩි සහ අඩු ඝනත්ව වශයෙන් කලාප දෙකකින් යුක්ත වේ. අතුරුගිරිය, එකී ප්‍රදේශය තුළ පවතින නේවාසික ප්‍රමුඛ කොටගත් වාණිජ මිශ්‍ර සංවර්ධනය දිරිගැන්වීම සඳහා වන මාර්ගෝපදේශනයන් ඇතුළත් කර ඇති අතර කොරතොට, නවගමුව, රණාල ප්‍රදේශයන්හි පවතින කර්මාන්ත

ප්‍රමුඛ කරගත් ආර්ථික සංවර්ධනය තවදුරටත් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය මගපෙන්වීම සපයනු වස් කඩුවෙල නගර සංවර්ධන සැලැස්මෙහි නාගරික ආකෘතිය සකස් කිරීම සඳහා අවශ්‍ය වන නියමතා වලින් මෙම සැලැස්ම සමන්විත වේ. නව නුවර මාර්ගයෙහි සහ ,මාලබේ අතුරුගිරිය මාර්ගයෙහි වාණිජ සංවර්ධනය දිරි ගැන්වීම සඳහා වන නියමතාවයන්ගෙන් සමන්විත වන මෙම සැලැස්මෙහි සංවේදීතාවය අනුව වර්ගීකරණය කරන ලද තෙත්බිම් පරිසර පද්ධති තුළින් ප්‍රදේශයෙහි ගංවතුර පාලනයට අවශ්‍ය ජල රැඳවුම් ලෙස ක්‍රියාකිරීමට අවශ්‍ය නීතිමය මගපෙන්වීම තුළින් නාගරික ආකෘතියට හරිතවත් ජීවයක් ලබා දී ඇත.

### 6.2.2 ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම

විශේෂ ආර්ථික දිස්ත්‍රික්ක සංවර්ධන සැලැස්ම හා නගර මධ්‍ය සංවර්ධනය යන උප සැලසුම් දෙකකින් සමන්විත මෙම සැලැස්මෙහි සෙත්සිරිපාය, සුහුරුපාය යන පරිපාලන ගොඩනැගිලි මූලික කරගත් බත්තරමුල්ල නාගරික ප්‍රදේශය, බත්තරමුල්ල ආයතනික නගරයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘතීන්ගෙන් ද, ආයතනික නගරයට හා ඒ අවට ප්‍රදේශයට අවශ්‍ය මූලික යටිතල පහසුකම් සැපයීම තුළින් ආර්ථික ශක්‍යතාවය වැඩිදියුණු කිරීම සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘතීන්ගෙන් සමන්විත වේ. කොස්වත්ත ආයතනික නගර සංවර්ධනය, තුළින් ආයතනික නගරයෙහි යාන්ත්‍රණය ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සඳහා මූලිකත්වය ලබා දී ඇත. නේවාසිකයින්ට අවශ්‍ය පහසුකම් සපයමින් නේවාසික ආකර්ෂණය වැඩිදියුණු කිරීම සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘතීන් ඇතුළත් අතුරුගිරිය ප්‍රවාහන කේන්ද්‍රීය සංවර්ධනය, කර්මාන්තපුර සංවර්ධනය සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘතීන් ඇතුළත් ඔරුවල වානේ කර්මාන්තශාලා ප්‍රදේශය යලි පිබිදවීමේ ව්‍යාපෘතිය, කැළණි ගඟ නගර අලංකරණ කටයුතු සඳහා යොදා ගැනීම, ගංගා ආශ්‍රිත නගරයක් ලෙස නගර අලංකරණය කිරීම, පොදු විනෝදාත්ම කටයුතු සඳහා ඉඩම් මුදා හැරීම යන අරමුණු මූලික කරගත් කඩුවෙල ජලභිමුඛ නගර සංවර්ධනය ව්‍යාපෘතිය, මාලබේ නගර මධ්‍ය සංවර්ධනය හා පොළ හා බස් නැවතුම්පොළ ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘති ඇතුළත් මාලබේ නගර මංසන්ධි සංවර්ධන ව්‍යාපෘතිය, යන ව්‍යාපෘතීන්ගෙන් මෙම ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම සමන්විත වේ.

### 6.2.3 භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගය

මෙම ප්‍රදේශය මෙරට පරිපාලන හා ආයතන කටයුතු හේතුවෙන් ජනාකීර්ණ ප්‍රදේශයක් වන බැවින් ජාතික වශයෙන් වැදගත්වන අන්තර් ප්‍රවාහන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති හා ප්‍රදේශය තුළ ප්‍රාදේශීය සම්බන්ධතා සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතීන්ගෙන් සමන්විත මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ උප සැලැස්ම, ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය සඳහා වන ව්‍යාපෘතීන්ගෙන් සමන්විත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වන උප සැලැස්ම, අපජල කළමනාකරණ උප සැලැස්ම යන භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් රැසකින් සමන්විත වේ.

තවද මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම සැලැස්ම තුළි ප්‍රදේශයේ අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමටත් නේවාසික ජනගහනයට වඩාත් සුමට වූ ගමනාගමන පහසුකම් ලබාදීමටත් අරමුණු කෙරේ. නගරය තුළ ජීවත් වන සහ පිටතින් පැමිණෙන ප්‍රජාවට ප්‍රමාණවත් පරිදි සමාජ යටිතල පහසුකම් සැපයීම, නගරයේ සමාජ ආර්ථික සම දේශපාලන ක්‍රියාවලීන්හි මෘදු

ගලා යාම තහවුරු කිරීම සහ සමස්ත වශයෙන් කාර්යක්ෂම අපරවයුහ පහසුකම් ජාලකරණයක් ඇති කිරීම මෙම සැලැස්ම මගින් සිදු කෙරේ.

ප්‍රදේශයක භෞතික යටිතල පහසුකම් සංවර්ධන මෙන්ම ප්‍රදේශයක ජීවත්වන ජනතාවට අවශ්‍යකරන්නා වූ සමාජීය යටිතල පහසුකම් වන සෞඛ්‍ය, අධ්‍යාපනය යන ක්ෂේත්‍රයන් හි සංවර්ධනය ද ප්‍රදේශයක සමස්ත සංවර්ධනයට මහත් පිටුවහලක් වේ. ඒ අනුව මෙම සැලැස්ම මගින් ප්‍රදේශයෙහි ජීවත්වන ජනයාගේ මෙන්ම ප්‍රදේශයට දෛනිකව සේවා ලබාගැනීමට හා සේවා සැපයීමට පැමිණෙන මගී ජනයාට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සපැයීම සඳහා ඉවහල් වන්නා වූ ව්‍යාපෘතීන් ගෙන් ද, වයෝවෘද ජනයාට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සැපයීම සදහා වන ව්‍යාපෘතින් ගෙන් ද, අතුරුගිරිය, නවගමුව, දැඩිගමුව සහ කොරතොට ප්‍රදේශයන් තුල "පොකුරු පාසල්" සංකල්පය ප්‍රවර්ධනය කිරීම හා ප්‍රදේශයෙහි අධ්‍යාපනය දිරිගැන්වීම සදහා අවශ්‍ය ව්‍යාපෘතින් ගෙන් ද මෙම සැලැස්ම සමන්විත වේ.

### 6.2.4.තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගය

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීම, ගංවතුර ආපදා අවම කිරීම, ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූ දර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම සදහා වන ව්‍යාපෘතින්ගෙන් ද, තෙත්බිම් හායනය තවදුරටත් සිදුවීම අවමකිරීමේ අරමුණ පෙරදැරි කරගනිමින් සංරක්ෂණය කළ යුතු පවත්නා තෙත්බිම් තවදුරටත් තෙත්බිම් හා ඒ ආශ්‍රිත උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම සදහා වන ව්‍යාපෘතින්ගෙන් ද, ප්‍රදේශය තුළ පවතින පුරාවිද්‍යා ස්ථාන සංරක්ෂණය කරගනිමින් එම ස්ථාන වක්‍ර විනෝදාස්වාද අවකාශයන් ලෙස නියාමනය කිරීම සහ සංස්කෘතික උරුමයන් කළමනාකරණ සදහා වන නියමතාවගෙන් ද මෙම උපායමාර්ගය සමන්විත වේ.

### 6.2.5.ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

ප්‍රදේශයේ නේවාසික භාවිතයන්ට වඩාත් යෝග්‍ය ප්‍රදේශ හදුන්වාදීම, නේවාසිකයන්ට අවශ්‍ය මූලික පහසුකම් සැපයීම සදහා වන සේවා මංසන්ධි ලෙස කොරතොට හා අරංගල මංසන්ධි සංවර්ධනය මගින් සුවපහසු ආකර්ශනීය නේවාසික වටපිටාවක් ඇති කිරීම මෙම සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ.

## 6.3 නාගරික ආකෘතිය නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම

### 6.3.1 හැඳින්වීම

නාගරික ආකෘතිය නගරයක ත්‍රිමාණ සජීවීකරණය පිටතට ගෙන හැර පාන කැඩපතකි. එසේ හෙයින්, නගර සංවර්ධන සැලැස්මක නාගරික ආකෘති නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම මූලික ස්ථානයක් ලබා ගන්නා අතර, එය නගරය කෙසේ විය යුතුද යන්න පිළිබඳ මූලික අඩිතාලම වේ. කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මෙහි එන නාගරික ආකෘති නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්මෙහි මූලික කර්තව්‍යයක් ලෙස, නගරය සඳහා වඩාත් උචිත නාගරික අවකාශීය විකාශනය හඳුනා ගැනීම සහ එය භූමිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපායමාර්ගික ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම හදුනාගත හැකිය.

### 6.3.2 අරමුණ

කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම 2023-2033 හි නාගරික ආකෘති නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්මෙහි මූලික අරමුණ ලෙස කඩුවෙල මහනගර සභා ප්‍රදේශය සඳහා වඩාත් උචිත අවකාශීය ව්‍යුහය, ඝනත්වයේ රටාවන්, ප්‍රමුඛ භාවිතයන්, පාරිසරික ලක්ෂණයන් මත පදනම්ව තීරණය කිරීම සහ අහිතකර පාරිසරික හා සමාජයීය බලපෑම් අවම කර ගනිමින් සුහුරු නාගරික ලක්ෂණයන් හා සම්මිශ්‍රිත සුවපහසු නාගරික රටාවක් සහ ර්‍ට ආවේණික වූ නාගරික ප්‍රතිරූපයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාම වේ.

### 6.3.3 කඩුවෙල නගර සංවර්ධන සැලැස්ම 2023-2033 ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය

මෙම නාගරික ආකෘතිය නැවත සකස් කිරීමේ උපායමාර්ගය කඩුවෙල මහනගර සංවර්ධන සැලැස්මෙහි පළමු ඉලක්කය වන ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම, තෙවන අරමුණ වන තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම සහ සිව්වන අරමුණ වන නේවාසිකයන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම යන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ඍජු දායකත්වයක් සලසනු ලැබේ.

### 6.3.4 විෂය පථය

නාගරික ආකෘතිය නැවත සකස් කිරීමේ උපායමාර්ග සැලසුම් රාමුව පහත සඳහන් කරුණු තුළින් සමන්විත වේ.

1) කඩුවෙල මහනගර සභා ප්‍රදේශය සඳහා ඝනත්ව රටාවන් ගෙන් සමන්විත යෝජිත භූමි පරිහරණ සැලැස්ම.
2) අපේක්ෂිත නේවාසික හා සංචරණ ජනගහන පුරෝකථනය.
3) පාර්ලිමේන්තු කලාප හා විශේෂ ආරක්ෂක කලාපයන්ගෙන් සමන්විත විශේෂිත පාලන කලාපයන්.

#### 6.3.4.1 කඩුවෙල මහනගර සභා ප්‍රදේශය සඳහා ඝනත්ව රටාවන්ගෙන් සමන්විත යෝජිත භූමි පරිහරණ සැලැස්ම

කඩුවෙල මහ නගර ප්‍රදේශය ආර්ථික වශයෙන් සවිමත් සියලු පහසුකම් වලින් සමන්විත ආයතනික, වාණිජ, දැනුම, නේවාසික හා කර්මාන්ත පදනම් කරගත් කැළණි ගඟෙහි ආස්වාදය ලබා ගත හැකි කඩුවෙල නගරයටම අනන්‍ය වූ නාගරික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කරමින් ප්‍රදේශයේ විභවතාවයන් හා ප්‍රවණතාවයන් මෙවලමක් ලෙස යොදා ගනිමින් ජනයාට ජීවත්වීමට සුදුසු වඩාත් සුවපහසු හරිතවත් පරිසරයක් නිර්මාණය කිරීම සහ දෛනිකව සේවා ලබාගැනීමට හා සේවා සැපයීමට පැමිණෙන මගී ජනයාට සුහුරු පරිසරයක් නිර්මාණය කිරීමේ අපේක්ෂාව පෙරදැරි කරගනිමින් කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම 2023-2033 හි යෝජිත භූමි පරිහරණ සැලැස්ම සම්පාදනය කර ඇත.

ඒ අනුව, කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මෙහි යෝජිත භූමි පරිහරණ සැලැස්ම මගින් අපේක්ෂිත නගර ආකෘතිය නිර්මාණය කර ගැනීම සඳහා අවශ්‍ය අපේක්ෂිත ඝනත්ව රටාවන් ද මෙම සැලැස්ම තුළින් යෝජනා කර ඇත. රූපය 6.1 මගින් බත්තරමුල්ල නගර ආකෘතියෙහි හරස්කඩ ඉදිරිපත් කෙරේ.

රූපය: 6.2 අපේක්ෂිත නගර ආකෘතිය - බත්තරමුල්ල නගර ආකෘතියෙහි හරස්කඩ




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,2023

රූපය: 6.3 අපේක්ෂිත නගර ආකෘතිය - කැළණි ගඟෙහි සිට ලෝලෙවල් මාර්ගය හරහා හරස්කඩ




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,2023

කඩුවෙල මහනගර සභා සැලසුම් බල ප්‍රදේශය සඳහා යෝජිත භූමි පරිහරණ රටාව අනුව ඇතැම් කලාප ඝනත්වය මත පදනම්ව පහත පරිදි වර්ගීකරණය කරන ලද අතර ඒ අනුව ඉහළ ඝනත්ව කලාපය හා පහළ ඝනත්ව කලාපය වශයෙන් ප්‍රධාන ඝනත්ව කලාප දෙකක් යටතේ වර්ගීකරණය කෙරේ.

වගුව 6.1: අපේක්ෂිත ඝනත්ව කලාප

| කලාපය | යෝජිත භූමි පරිභෝජන රටාව |
|---|---|
| අධි ඝනත්ව කලාපය | අධි ඝණත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය |
| අඩු ඝනත්ව කලාපය | අඩු ඝනත්ව නේවාසික කලාපය<br>අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2023

ප්‍රදේශයෙහි පවතින භූමි පරිහරණ රටාව, පවතින භාවිතයන් හි ස්වභාවය, එක් එක් ප්‍රදේශය තුළ පවතින ආවේණිකත්වය, අපේක්ෂිත නගර ආකෘතිය යන කරුණු සැලකිල්ලට ගෙන ඉහත සඳහන් ඝනත්ව කලාපයන්ට පරිභාහිරව පාර්ලිමේන්තුව අවට සංවර්ධනය නියාමනය කිරීම සඳහා විශේෂ නේවාසික කලාපය ද, බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශය සඳහා විවිධ කාලීනව රජයන් විසින් ගනු ලැබූ ප්‍රතිපත්මය තීරණයන්ට අනුකූලව ආයතනික කලාපය ද, තොරතුරු තාක්ෂණය මූලික කරගත් අධ්‍යාපනය දිරි ගැනිවීම සඳහා මාලබේ චන්ද්‍රිකා කුමාරතුංග මාවත ආශ්‍රිත ප්‍රදේශය දැනුම නගර කලාප I හා II ලෙසද, කැළණි ගඟ ආශ්‍රිතව සංවර්ධනය නියාමනය කිරීම සඳහා සහ කැළණි ගඟෙහි විභවතාවය ප්‍රයෝජනයට ගැනීම සඳහා වන කැළණි ගඟ අභිමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය ද, කඩුවෙල නගරයෙහි පවතින වාණිජ භාවිතයන් දිරිගැන්වීම සඳහා වන වාණිජ කලාපය ද, අතුරුගිරිය ප්‍රදේශයෙහි යෝජිත ප්‍රවාහනය මූලික කරගත් නේවාසික මිශ්‍ර වාණිජ භාවිතය මත පදනම් වන යෝජිත වාණිජ මිශ්‍ර සංවර්ධන කලාපය ද සෙසු මිශ්‍ර නේවාසික ප්‍රදේශ වන මාලබේ , තලාහේන, අරංගල, අතුරේගොඩ, වල්පොල ආදී ප්‍රදේශ සඳහා වන අධි ඝනත්ව නේවාසික කලාපය ද ඝනත්වය මත පදනම් නොවී යෝජිත භූමි පරිහරණය තුළින් අපේක්ෂිත නගර ආකෘතිය ළඟා කර ගැනීම සඳහා යෝජනා කර ඇත.

කඩුවෙල මහ නගර සභා සීමාව තුළ පවතින පාරිසරික ප්‍රදේශයන් හි පවතින සංවේදීතාවය මත පදනම්ව පාරිසරික සංවේදී ප්‍රදේශ පහත වර්ගීකරණය යටතේ යෝජනා කර ඇත.

1. අධි සංවේදී තෙත්බිම් සංරක්ෂණ කලාපය
2. මධ්‍යම සංවේදී තෙත්බිම් සංරක්ෂණ කලාපය
3. අඩු සංවේදී තෙත්බිම් සංරක්ෂණ කලාපය

### 6.3.4.2 අපේක්ෂිත ජනගහන පුරෝකථනය

ප්‍රදේශයේ පවතින ලක්ෂණයන්, විභවතාවයන් හා අපේක්ෂිත සංවර්ධනයන් සැලකිල්ලට ගෙන කඩුවෙල මහනගර සභා ප්‍රදේශය තුළ අපේක්ෂිත නේවාසික ජනගනහය පුරෝකථනය කරන ලද අතර හා ප්‍රදේශයෙහි වත්මන් මගී ජනගහනය හා යෝජිත සංවර්ධනයන් හමුවේ අපේක්ෂිත ජනගනය මත පදනම්ව සංචරණ ජනගහණය ද එක් එක් කලාපයන් මූලික කරගනිමින් පහත පරිදි පුරෝකථනය කරන ලදී.

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ නේවාසික ජනගහනය පුරෝකථනය කිරීමේදී අවස්ථා කිහිපයක් යටතේ ගණනය කිරීම් සිදුකරන ලද අතර එහිදී 2011- 2020 කාල පරාසය තුළ එක් එක් ග්‍රාම නිලධාරී වසම් හි පවතින ජනගහන වර්ධන වේගයන් හි වැඩිම මාතය වන 4% වර්ධන වේගය හා 2033 වර්ෂය සඳහා අපේක්ෂිත සංවර්ධනය සැලකිල්ලට ගෙන යෝජිත කලාප අනුව ජනගහනය පුරෝකථනය කරන ලදී.

වගුව 6.2 : කඩුවෙල මහනගර සභා ප්‍රදේශය තුල අපේක්ෂිත නේවාසික හා සංචරණ ජනගහණය-2033

| සංවර්ධන කලාපය | | ජනගහනය 2020 | ජනගහනය 2033 | සංචරණ ජනගහනය 2033 |
|---|---|---|---|---|
| ආයතනික කලාපය | | 15,232 | 24,616 | 120,000 |
| විශේෂ නේවාසික කලාපය | | 6,756 | 10,919 | 10,000 |
| නේවාසික කලාපය | අධි ඝනත්ව නේවාසික කලාපය | 124,730 | 201574 | 51,000 |
| | අඩු ඝනත්ව නේවාසික කලාපය | 30,320 | 48,999 | 1,000 |
| වාණිජ කලාපය | | 12,360 | 19,975 | 25,000 |
| දැනුම නගර කලාපය | දැනුම නගර කලාපය I | 8,641 | 13,964 | 30,000 |
| | දැනුම නගර කලාපය II | 7,413 | 11,979 | 6,000 |
| මිශ්‍ර සංවර්ධන කලාපය | වාණිජ ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය | 20,566 | 33,235 | 10,000 |
| | අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය | 22,071 | 35,669 | 10,000 |
| | අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය | 17,733 | 28,658 | 5,000 |
| | කැළණි ගඟහිමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය | 15,485 | 25,025 | 5,000 |
| **පුරෝකථනය කරන ලද සමස්ත ජනගහනය** | | **281,308** | **454,614** | **273,000** |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2023

සටහන : එක් එක් කලාපය තුල අපේක්ෂිත සමුච්චිත සංචරණ ජනගහනය දක්වා ඇති අතර සියලු කලාපයන් තුළ එක් අවස්ථාවකදී අපේක්ෂිත සංචරණ ජනගහනය **273,000** ක් පමණ වේ. රාජ්‍ය ආර්ථික දර්ශනය හා ප්‍රතිපත්තිය ස්ථායීව පවතියි යන උපකල්පනය මත පදනම්ව හා යෝජිත සංවර්ධන ව්‍යාපෘති 2033 වර්ෂය වන විට එලෙසම ක්‍රියාත්මක වේ යැයි පදනම මත පදනම්ව අපේක්ෂිත සංචරණ ජනගහනය ගණනය කිරීම සිදුකර ඇත.

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයේ අපේක්ෂිත භූමි පරිභෝජන රටාව සිතියම අංක 6.2 මගින් ඉදිරිපත් කෙරේ.

සිතියම 6.1 : කඩුවෙල මහනගර සභා ප්‍රදේශයේ අපේක්ෂිත භූමි පරිභෝජන රටාව




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.3.4.3 පාර්ලිමේන්තු කලාප හා විශේෂ ආරක්ෂක කලාපයන්ගෙන් සමන්විත විශේෂිත පාලන කලාපයන්

#### 6.3.4.3.1 පාර්ලිමේන්තු කලාපයන්ගෙන් සමන්විත විශේෂ නේවාසික කලාපය

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහා නගර සභාව හා මහරගම නගර සභාව යන පළාත් පාලන බල ප්‍රදේශයන් හි කොටස් ආවරණය වන පරිදි 2014 වර්ෂයෙහි සිට මූලික සැලසුම් කමිටු අංක 09/2014 මගින් ගනු ලැබූ තීරණයන් පරිදි ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ආශ්‍රිත පාලිත කලාපය මෙම සංවර්ධන සැලැස්ම සඳහා යම් යම් සංශෝධන සහිතව සැලසුම් බල ප්‍රදේශයෙහි අපේක්ෂිත ආකෘතිය ළඟා කර ගැනීමේ අරමුණ පෙරදැරි කොටගෙන ඇතුළත් කර ඇත.

රටෙහි ප්‍රධාන පරිපාලන ආයතනය වන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙහි ආරක්ෂාව සැල්කිල්ලට ගෙන මෙම සංවර්ධන පාලිත කලාපය හඳුන්වා දී ඇති අතර එය උප පාලිත කලාපයන් 3 කට වෙන් කර ඇත. ඒ අනුව පාර්ලිමේන්තුවේ සිට මීටර් 0 – 500 අතර අරයක් සහිත දුරකින් යුතු ප්‍රදේශය පාර්ලිමේන්තු කලාප I ලෙස හඳුන්වා දී ඇත. මෙම කලාපයෙහි දෙමහල් නිවාස (G+1) සඳහා පමණක් අවසර ලබාදෙනු ලබන අතර ගොඩනැගිල්ලෙහි උපරිම උස අඩි 30 ක් දක්වා සීමා කර ඇත.

දෙවන කලාපය ලෙස මීටර් 500 සිතියම 6.3 මගින් පෙන්වා දී ඇති භෞතික මායිම ඇතුළත් ප්‍රදේශය හඳුන්වා දී ඇති අතර මෙම කලාපයේ තෙමහල් (G+2) ගොඩනැගිලි සඳහා අවසර ලබා දෙනු ලැබේ. එසේම එම ගොඩනැගිල්ලෙහි අවම උස අඩි 40 දක්වා සීමා කර ඇත. එමෙන්ම, පාර්ලිමේන්තු කලාප II හි භෞතික සීමාවට මායිම් වන පන්නිපිටිය බත්තරමුල්ල (174) බස් මාර්ගයෙහි සිංහපුර මාර්ගයේ සිට උද්‍යාන මාර්ගය දක්වා වූ ප්‍රදේශය තුළ පළමු බිම් කට්ටිය (පළමු මීටර් 30 ට ආසන්න ප්‍රමාණය) තුළ සිදුකරනු ලබන සංවර්ධනයන් සඳහා පාර්ලිමේන්තු කලාප III ට අදාළ නියමතාවයන්ට අනුකූලව ගොඩනැගිලි වල උස නිර්ණය කිරීම සඳහා වන රෙගුලාසි ඇමුණුම අංක 17 හි ඇතුළත් 2023 අගෝස්තු මස 09 දිනැති ප්‍රධාන සැලසුම් කමිටු අංක 11/2023 හි අනු අංක 2.3 ට ලබාදී ඇති තීරණය අනුව යමින් එහි ඇතුළත් සංශෝධන සහිතව මෙම සැලැස්මට ඇතුළත් කර ඇත.

තවද, මෙම කලාප දෙකෙහිම ගොඩනැගිලි වල පාර්ලිමේන්තුව දෙසට පියැසි මහල, සඳළුතල සහ විවෘත ප්‍රදේශ, මායිම් තාප්ප පවත්වා ගෙන යාම ආදී වාස්තු විද්‍යාත්මක මගපෙන්වීම සඳහා වන විශේෂ නියමතාවයන් හඳුන්වා දී ඇති අතර එය හත්වන හා අටවන පරිච්ඡේද යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කෙරේ.

තුන්වන කලාපය ලෙස දෙවන කලාපයෙහි භෞතික මායිමත් මීටර් 1500 ත් අතර අරයක් සහිත දුරකින් යුතු ප්‍රදේශය හඳුන්වා දී ඇති අතර මෙම කලාපය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් හත්වන හා අටවන පරිච්ඡේද යටතේ හඳුන්වා දී ඇති රෙගුලාසීන්ට අනුකූල වන සේ සංවර්ධන කටයුතු සිදු කිරීමේ අවකාශ හඳුන්වා දී ඇත.

කෙසේ වුවත් , මෙම කලාපයන් තුනෙහිම සිදුවන සියළු සංවර්ධන කාර්යන්හිදී නාගරික සංවර්ධන අධිකාරිය, අදාළ පළාත් පාලන ආයතනය හා පාර්ලිමේන්තුවෙහි අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව 2014 වර්ෂයේ සිට මේ දක්වා සංවර්ධන බල ප්‍රදේශය තුළ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව අවට පවත්වා ගෙන යනු ලැබූ භූමි පරිහරණ රටාව හා සංවර්ධන පීඩනයෙහි නියාමනය ඇතුළු කරුණු සැලකිල්ලට ගෙන තවදුරටත් මෙම ප්‍රදේශය නියාමනය කරනු වස්, පාර්ලිමේන්තු කලාප වලින් සමන්විත විශේෂ නේවාසික කලාපයක් ලෙස කලාපීකරණ සැලැස්ම මඟින් තව දුරටත් හඳුන්වා දී ඇත. එමගින් මෙම ප්‍රදේශය තුල නේවාසික භාවිතය සඳහා වැඩි අවස්ථා හිමිකර දීම හා අඩු ඝනත්ව ප්‍රදේශයක් ලෙස සංවර්ධනය සඳහා දායක කර ගැනීම අරමුණු කරගෙන තිබේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ ප්‍රෞඪත්වය හා සුවිශේෂී බව රැකෙන අයුරින් අවම භූමි පරිභෝජනය පවත්වාගෙන යාම හා අවිධිමත් සංවර්ධනයක් සඳහා වන අවස්ථාව පාලනය කර තිබේ.

සිතියම් අංක 6.2 මගින් පාර්ලිමේන්තු කලාප පිළිබද අවබෝධයක් ලබා ගත හැකි අතර සිතියම් අංක 6.3 මගින් පාර්ලිමේන්තු කලාප 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි යෝජිත කලාප අතිච්ඡාදනය වී ඇති ආකාරය පැහැදිලි කෙරේ.

සිතියම් අංක 6.2 : පාර්ලිමේන්තු කලාප




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2022

### 6.3.4.3.2 අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිතව යෝජිත විශේෂ ආරක්ෂක කලාප

ශ්‍රී ලංකාවේ පරිපාලන කටයුතු බත්තරමුල්ල, පැලවත්ත ප්‍රදේශයට ආකර්ෂණය වීමට සමගාමීව මෙරට ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණය අකුරේගොඩ ආශ්‍රිත ප්‍රදේශයට සංකේන්ද්‍රණය විය. ඒ අනුව 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි යෝජිත කලාප අතිච්ඡාදනය කරමින් ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණයෙහි ආරක්ෂාව තහවුරු කරනු වස් විශේෂ ආරක්ෂක කලාප දෙකක් මෙම සැලැස්ම මගින් හඳුන්වා දී ඇති අතර එය භෞතික සීමා මත පදනම්ව මෙම සැලැස්මෙහි කලාපීකරණ සැලැස්මට ඇතුළත් කර ඇත.

මෙහිදී ආරක්ෂක අමාත්‍යාංශය මගින් 2022 සැප්තැම්බර් මස 23 දින අංක 2298/53 නැමති අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද අකුරේගොඩ ආරක්ෂක අමාත්‍යාංශය හා ත්‍රිවිධ හමුදා මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත අධි ආරක්ෂක කලාපයට අයත් භෞතික සීමාව විශේෂ ආරක්ෂක කලාප I ලෙස හඳුන්වා දී ඇති ඇත. එම කලාපය තුළ සංවර්ධන සැලැස්ම මගින් ගොඩනැගිලි හි උස පාලනයක් සිදු කර නොමැති අතර වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියළු සන්නිවේදන කුළුණු සඳහා මෙම කලාපය තුළ අවසර හිමි නොවේ. තවද මෙම ප්‍රදේශය තුළ හත්වන හා අටවන පරිච්ඡේද යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කරන ලද කලාපීකරණ රෙගුලාසි ඒ ආකාරයෙන්ම මෙම කලාපය සඳහා බල පැවැත්වෙන අතර මෙම කලාපයෙහි සිදුකරනු ලබන සියළු සංවර්ධන කාර්යන්හිදී නාගරික සංවර්ධන අධිකාරියෙන් හා ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිර්වුල් සහතිකය ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ.

විශේෂ ආරක්ෂක කලාප II, අකුරේගොඩ ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයෙහි සිට මීටර් 550 හා කිලෝ මීටර් 1ක වපසරියක දක්වා විහිදෙන භෞතික සීමාවකින් සමන්විත වන අතර මෙම කලාපය තුළ විශේෂ නියාමනයක් ලෙස බිම් මහල හා තවත් මහල් පහක් හෝ එය ඉක්මවන ගොඩනැගිලි සහ වහලය මත ඉදිකරනු ලබන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ. තවද සංවර්ධන සැලැස්මෙහි හත්වන හා අටවන පරිච්ඡේද යටතේ හඳුන්වා දී ඇති රෙගුලාසීන්ට අනුකූල ව අනෙකුත් සංවර්ධන කටයුතු සිදු කිරීමේ අවකාශය සලසා ඇත.

ඒ අනුව ආරක්ෂක මූලස්ථාන සංකීර්ණයෙහි ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය කරන්නා වූ නියාමනයන් මෙම සැලැස්මට ඇතුළත් කර අතරම ඒ තුළින් එම ප්‍රදේශය අවට යම් යම් සීමාවන්ට යටත්ව ප්‍රදේශයෙහි අපේක්ෂිත නාගරික ආකෘතිය ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය කරන්නා වූ මූලික මගපෙන්වීම සිදු කර ඇත.

සිතියම් අංක 6.3 මගින් විශේෂ ආරක්ෂක කලාප 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි යෝජිත කලාප අතිච්ඡාදනය වී ඇති ආකාරය පැහැදිලි කෙරේ.

සිතියම 6.3 : පාර්ලිමේන්තු කලාප හා විශේෂ ආරක්ෂක කලාප




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2023

**හයවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්ම**

**ආර්ථික සංවර්ධනය**

## 6.4 ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම

### 6.4.1 හැඳින්වීම

ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම කඩුවෙල සැලසුම් බල ප්‍රදේශයෙහි ආර්ථික කටයුතු, එහි සමස්ත නාගරික ආකෘතිය සමඟ අනුබද්ධ කරමින් සංවර්ධන සැලසුමෙහි අපේක්ෂිත දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය පූර්ව මාර්ගෝපදේශනය සැපයීම සිදු කරනු ලබයි. මෙහිදී විවිධත්වය තුළින් ප්‍රදේශයෙහි ආර්ථික ශක්‍යතාවය ඔප්නැංවීම සඳහා අවශ්‍ය භෞතික සංවර්ධනය සිදුකිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයන්හි ආයෝජන දායකත්වය අත්‍යවශ්‍ය වේ.

### 6.4.2. අරමුණ

ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගයෙහි අරමුණ වනුයේ, කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය සඳහා වන අපේක්ෂිත දැක්ම සහ භෞතික නාගරික ආකෘතිය ළඟා කරගැනීමට අවශ්‍ය සැලසුම් කරන ලද වෙනස්කම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙළඳපොළ සහ ආයෝජන ආකර්ෂණය තහවුරු කිරීමයි . මෙම උපායමාර්ගයෙහි මූලික පරමාර්ථයක් වනුයේ පවතින එක් එක් ප්‍රදේශයට ආවේණික වූ ආර්ථික ශක්‍යතාවය පිළිබඳ මනා අවබෝධයක් තුළින් ප්‍රදේශයට අනන්‍ය වූ සේවා, කර්මාන්ත හා වෙළඳපොළ ප්‍රමුඛ කරගත් ආර්ථික අංශයන් විවෘත කිරීම හා කඩුවෙල මහ නගර සභා ජාතික වශයෙන් වැදගත්වන ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමයි.

### 6.4.3. කඩුවෙල මහ නගර ප්‍රදේශ සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මෙහි පළමු ඉලක්ක වන ප්‍රදේශයේ අවේණික ලක්ෂණයන් අනුව එකිනෙකට අනන්‍ය වූ නාගරික ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම සාක්ෂාත් කර ගැනීම සඳහා මූලික දායකත්වය සපයනු ලබයි. එහිදී ප්‍රදේශයෙහි පවතින අවකාශය වඩාත් ඵලදායී ලෙස ප්‍රයෝජනය ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීම තුළින් ප්‍රදේශයෙහි ආර්ථිකය නංවාලීම යන අභිමතාර්ථය සාක්ෂාත් කරගැනීමේ ලා මෙම උපායමාර්ගික සැලසුම සෘජුවම දායක වේ.

තවද මෙම සැලැස්ම තුළින් සෘජු හා වක්‍ර ලෙස ආර්ථික සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීමට අපේක්ෂා කරන අතර ඒ තුළින් වාණිජ හා මිශ්‍ර සංවර්ධන භාවිතය සඳහා නිදහස් කිරීමට අපේක්ෂිත මුළු සංවර්ධන භූමි ප්‍රමාණය හෙක්ටයාර් 40 ක් පමණ වේ. එමෙන්ම කාර්යාලීය භාවිතය සඳහා එකතු කිරීමට අපේක්ෂිත මුළු භූමි ප්‍රමාණය වර්ග මීටර් 1,280,000 පමණ වන අතර 2033 වර්ෂය වන විට රජය හා අර්ධ රාජ්‍ය රැකියා 20,000 පමණ කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයට ආකර්ෂණය කර ගැනීමට නියමිත වේ. යෝජිත නව ව්‍යාපෘති හමුවේ වර්ග මීටර් 45,000ක පමණ ප්‍රදේශයක් කර්මාන්ත භාවිතය සඳහා නිදහස් කිරීමට අපේක්ෂා කෙරේ.

### 6.4.4. විෂය පථය

ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම තුළින් පහත සඳහන් අංශ කෙරෙහි මූලික අවධානය යොමු කරයි.

- විශේෂ ආර්ථික දිස්ත්‍රික්ක සංවර්ධනය
- මංසන්ධි සංවර්ධනය

#### 6.4.4.1 විශේෂ ආර්ථික දිස්ත්‍රික්ක සංවර්ධනය

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුල එකිනෙකට වෙනස්වූ නාගරික ලක්ෂණ, ආර්ථික විභවතාවයන් යුතු නගර පිහිටා ඇති අතර මෙම සංවර්ධන සැලසුම මගින් මෙම නාගරික ලක්ෂණ හා ආර්ථික විභාවත්වයන් ඔප් නංවමින් ප්‍රදේශයෙහි ආර්ථිකය සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය ඉඩකඩම්, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති, විනෝදාස්වාද කටයුතු ආදී විවිධ සේවා කටයුතු ලබා දීම සඳහා කටයුතු සැලසුම් කර ඇත. ඒ අනුව පහත වර්ගීකරණයන්ට අනුව විශේෂ ආර්ථික දිස්ත්‍රික මෙම උපායමාර්ගික සැලැස්ම මගින් යෝජනා කර ඇත.

##### 6.4.4.1.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: විධායක සහ රාජ්‍යතාන්ත්‍රික පරිවර්තන ප්‍රදේශය

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ප්‍රමුඛ කරගත් පරිපාලන කටයුතු එම අවට ප්‍රදේශයන්ට සංකේන්ද්‍රණය කිරීමේ ජාතික ප්‍රතිපත්ති වල ප්‍රතිපඵලක් ලෙස යෝජිත විධායක සහ රාජ්‍යතාන්ත්‍රික පරිවර්තන ප්‍රදේශය තුළ යෝජිත නව ජනාධිපති මන්දිරය හා ජනාධිපති ලේකම් කාර්‍යාලය සඳහා අවශ්‍ය අවකාශය මේ වන විට සාකච්ජා මට්ටමේ පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 09 යුත් ජාතික සදුන් උයන ව්‍යාපෘති භූමිය සඳහා යෝජිත සැලැස්ම මෙම සැලැස්ම සඳහා ඒකාබද්ධ කරගෙනෙ ඇත. ඒ අනුව පහත රූපය 6.5 මගින් යෝජිත විධායක සහ රාජ්‍යතාන්ත්‍රික පරිවර්තන ප්‍රදේශයෙහි අපේක්ෂිත ආකෘතිය නිරූපණය කෙරේ.

රූපය 6.5 : යෝජිත විධායක සහ රාජ්‍යතාන්ත්‍රික පරිවර්තන ප්‍රදේශයෙහි අපේක්ෂිත ආකෘතිය




මූලාශ්‍රය: අගනගර සංවර්ධන සැලැස්ම 2019-2030 , නාගරික සංවර්ධන අධිකාරිය

### 6.4.4.1.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාපය

යෝජිත අවකාශීය සංකල්පයට අනුව බත්තරමුල්ල ප්‍රදේශය පරිපාලන අගනගරයේ ආයතනික නගරය ලෙසද ජාතික මට්ටමේ අනන්‍යතාවයක් සහිතව ගොඩ නැගීමට අවශ්‍ය සැලසුම් මෙම සැලැස්ම මගින් නිර්මාණය කර ඇත. බත්තරමුල්ල දියත උයනෙහි සිට පොල්දූව මාර්ගය ඔස්සේ නාගරික සංවර්ධන අධිකාරිය සතු තාවකාලික බස් නැවතුම් ප්‍රදේශය දක්වා මෙම ආයතනික ප්‍රවර්ධන කලාපයෙහි උතුරු මායිම විහිදෙන අතර බත්තරමුල්ල පන්නිපිටිය මාර්ගයෙහි ජයන්තිපුර ප්‍රධාන පටුමග , ඉන් අනතුරුව අශෝක මාවත, රජමල්වත්ත මාර්ගය හරහා ශ්‍රී ජයවර්ධනපුර මාවත දක්වා මෙහි දකුණු මායිම ව්‍යාප්ත වී ඇත. රූපය 6.6 මගින් බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපයෙහි මායිම් පැහැදිලි කෙරේ.

බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපීය උපායමාර්ගික ව්‍යාපෘතියෙහි මූලික අරමුණු ලෙස පහත සදහන් අරමුණු හඳුනාගෙන ඇත.

- වාණිජ හා කාර්යාල භාවිතයන් සඳහා ඉඩම් නිදහස් කිරීම
- නාගරික පරිශීලකයන් සඳහා සුව පහසු නගරයක් ඇති කිරීම
- වාහන තදබදය අඩු කාර්යක්ෂම නගරයක් ඇති කිරීම

රූපය 6.6 : බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපයෙහි යෝජිත වින්‍යාස සැලැස්ම හා යෝජිත අනු ව්‍යාපෘති




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

ඒ අනුව බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපීය ප්‍රධාන වශයෙන් ආයතනික, වාණිජ, නේවාසික හා පාරිසරික සංරක්ෂණ යන භූමි පරිහරණයන්ට අයත් වන අතර ඉහත අනු අංක මගින් හඳුන්වා දී ඇති මෙම උපායමාර්ගික ව්‍යාපෘතියෙහි අනු ව්‍යාපෘති පහත වගු අංක 6.3 පරිදි යෝජනා කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පිළිබද තව දුරටත් ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය යටතේ විස්තර කර ඇත.

වගු අංක 6.3: බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපීය උපායමාර්ගික ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන ඇති අනු ව්‍යාපෘති

| අනු අංකය | යෝජිත අනු ව්‍යාපෘති | අනු ව්‍යාපෘති අංකය | භූමි ප්‍රමාණය (දළ වශයෙන්) | ඉඩම් අයිතිය |
|---|---|---|---|---|
| 1 | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය- බත්තරමුල්ල මංසන්ධිය | EP02/01 | අක්කර 5.04 | නා. සං. අ. හා පුද්ගලික |
| 2 | රථ වාහන නැවතුම හා මිශ්‍ර සංවර්ධන ව්‍යපෘතිය | EP02/02 | අක්කර 0.8 | නා. ස. අ |
| 3 | සෙත්සිරිපාය තෙවන අදියර | EP02/03 | | නා. ස. අ |
| 4 | ගොඩනැගිලි මුහුණත සංවර්ධනය (බත්තරමුල්ල මංසන්ධියේ සිට දියත පාලම දක්වා වූ වාණිජ ගොඩනැගිලි) | EP02/04 | කි.මී.1.14 | නා. සං. අ. හා පුද්ගලික |
| 5 | ඇවිදින මංතීරු (පොල්දුව මාර්ගය, නව නුවර මාර්ගය , සුභූතිපුර මාර්ගය , සෙත්සිරිපාය පරිශ්‍රය තුළ හා ඉඩම් අමාත්‍යංශය හා කෘෂිකර්මාන්ත දෙපර්තමේන්තුව ආසනයේ ඇති තෙත්බිම් අවට( | EP02/05 | කි5 මී. | මා. සං. අ., නා. සං. අ, ඉඩම් අමාත්‍යංශය හා පුද්ගලික |
| 6 | විදුලි රැහැන් භූ ගත කිරීම (නව නුවර මාර්ගය සහ පොල්දුව මාර්ගය) | EP02/06 | කි මී.1.1 හා කි.මී.1.2 | මා. සං. අ |
| 7 | භූ දර්ශන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (නව නුවර මාර්ගය) | EP02/07 | කි මී.1.1 | මා. සං. අ , කඩුවෙල මහ නගර සභාව |
| 8 | සුහුරු බස් නැවතුම් ස්ථාන | EP02/08 | - | මා. සං. අ |
| 9 | ප්‍රජා පහසුකම් උද්‍යානය | EP02/09 | අක්කර 2 | නා. සං. අ. |
| 10 | නව නුවර මාර්ගය සහ පොල්දුව සම්බන්ධිත මාර්ගය | EP02/10 | මීටර් 180 | නා. සං. අ. හා පුද්ගලික |
| 11 | පොදු චතුරස්‍ර සංවර්ධනය (පොල්දුව හා සුභූතිපුර මාර්ගය හමුවන මං සන්ධිය) | EP02/11 | - | මා. සං. අ |
| 12 | පදික මාර්ගය -සුභූතිපුර | EP02/12 | මීටර් 160 | මා. සං. අ, කඩුවෙල මහ නගර සභාව |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

එපමණක් නොව බත්තරමුල්ල නගරයට සුහුරු නගර සංකල්පය ඒකාබද්ධ කරගනිමින් මහජන ආරක්ෂාව සහ පහසුව, සුහුරු යටිතල පහසුකම් හා නාගරික ක්‍රියාකාරීත්වය සඳහා මහජන සහය ලබා ගැනීම සඳහා වන පහත සඳහන් අනු ව්‍යාපෘති ද මෙම උපායමාර්ගය යටතේ යෝජනා කර ඇත.

මහජන ආරක්ෂාව සහ මහජන පහසුව සඳහා සුහුරු නගර සංකල්පය ඒකාබද්ධ කිරීම

- බත්තරමුල්ල නගරය තුළ සුහුරු සංචලන පද්දතියක් ස්ථාපිත කිරීම
- බත්තරමුල්ල ආයතනික කලාපය අවට ආයතන, පොදු ස්ථාන හා මාර්ග හඳුනාගැනීම සඳහා සුහුරු නාමපුවරු හඳුන්වා දීම
- ආරක්ෂිත කැමරා පද්දතියක් හරහා පොලිස් ස්ථානය, මාර්ග සංවර්ධන අධිකාරිය හා නාගරික සංවර්ධන අධිකාරයේ නාගරික පර්යේෂණ අංශය සම්බන්ධ කිරීම
- සුහුරු රථවාහන හැසිරවීමේ වර්ණ ආලෝක පද්දතියක් හඳුන්වා දීම
- පලාත් පාලන ආයතනය හා ඒකාබද්ධ කරමින් සුහුරු කසළ කළමණාකරන සැලැස්මක් හඳුන්වා දීම
- රථවාහන නැවතුම් මධ්‍යස්ථාන සුහුරු සංකල්පය හා ඒකාබද්ධ කරමින් සුහුරු රථවාහන ක්‍රමවේදයක් හඳුන්වා දීම

ප්‍රදේශයෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සුහුරු නගර සංකල්පය ඒකාබද්ධ කිරීම

- සුහුරු සුඝාලෝක පද්ධතියක් හඳුන්වා දීම
- රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන සඳහා සූර්ය පැනල හඳුන්වා දීම
- සූර්ය ආලෝක පද්ධතියක් වීදි තුළ ස්ථාපිත කිරීම

බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපයෙහි ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාවය මෙන්ම මහජනතාව මුහුණපාන හා පවතින ගැටලු පිළිබද අදාළ වගකියයුතු ආයතන දැනුවත් කිරීම සඳහා සුහුරු තාක්ෂණික ක්‍රමවේදයන් හරහා පුරවැසියන් සම්බන්ධ කරගැනීම.

රූපය 6.7 : සුහුරු නගර සංකල්පය ඒකාබද්ධ කරගනිමින් යෝජිත අනු ව්‍යාපෘති




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්

### 6.4.4.1.3 උපායමාර්ගික ව්‍යාපෘති 03: කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාපය

බත්තරමුල්ල ප්‍රදේශයෙහි වර්තමානය වනවිට පවතින ඉහළ ආයතනික ඝනත්ව මත කාර්යාලීය හා වාණිජ කටයුතු තවදුරටත් ව්‍යාප්ත වීම සඳහා අවශ්‍ය අවකාශය එම ප්‍රදේශය තුළ නොමැති බැවින් එම අරමුණ සාක්ෂාත් කරගනිමින් බත්තරමුල්ල නගරය මෙරට ආයතනික නගරය ලෙස සංවර්ධනය කිරීමේ වැඩපිළිවෙලෙහි තවත් එක් නියමු ව්‍යාපෘතියක් ලෙස කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාපය හැඳින්විය හැකිය.

ඒ අනුව මෙම උපාය මාර්ගික ව්‍යාපෘතියෙහි මූලික අරමුණු ලෙස පහත සඳහන් අරමුණු හඳුනාගෙන ඇත.

- කාර්යාලීය හා වාණිජ කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කිරීම
- බත්තරමුල්ල ප්‍රදේශය සඳහා අවශ්‍ය පොදු ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම
- පොදු විනෝදස්වාදන කටයුතු සඳහා පවතින අවකාශය ප්‍රදේශයට උචිත ලෙස සංවර්ධනය කිරීම

රූපය 6.8 : කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාපයෙහි යෝජිත වින්‍යාස සැලැස්ම හා යෝජිත අනු ව්‍යාපෘති




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

වගුව 6.4: කොස්වත්ත ආයතන ප්‍රවර්ධන උපායමාර්ගික ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන ඇති අනු ව්‍යාපෘති

| අනු අංකය | යෝජිත අනු ව්‍යාපෘති | අනු ව්‍යාපෘති අංකය | භූමි ප්‍රමාණය (දළ වශයෙන්) | ඉඩම් අයිතිය |
|---|---|---|---|---|
| 1 | බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය | EP03/01 | අක්කර 08 | ශ්‍රී ලංගම |
| 2 | සැහැල්ලු දුම්රිය නැවතුම් පල | EP03/02 | - | මා.සං. අ. |
| 3 | සෙත්සිරිපාය අදියර 04 | EP03/03 | අක්කර 02 | නා. ස. අ |
| 4 | කොස්වත්ත පාපැදි මංතිරුව | EP03/04 | කි මී. 1 | මා.සං. අ. හා පුද්ගලික |
| 5 | පාලමයට අවන්හල | EP03/05 | අක්කර 0.75 | මා.සං. අ. හා පුද්ගලික |
| 6 | ජල උද්‍යානය හා ජල රැඳවුම් පොකුණ | EP03/06 | අක්කර 02 | නා. සං. අ. හා පුද්ගලික |
| 7 | තාවකාලික බස් නැවතුම් මධ්‍යස්ථානය | EP03/07 | අක්කර 01. රූඩ් 01 | නා. සං. අ. |
| 8 | කොස්වත්ත තෙත්බිම් ඇවිදින මංතිරුව | EP03/08 | මීටර් 350 | මා. සං. අ හා පුද්ගලික |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

මෙම උපායමාර්ගික ව්‍යාපෘතියෙහි අනු ව්‍යාපෘති ඉහත වගු අංක 6.4 පරිදි යෝජනා කර ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පිළිබඳ නව දුරටත් ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගය යටතේ විස්තර කර ඇත.

### 6.4.4.1.4 උපායමාර්ගික ව්‍යාපෘති 04: මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය

මෙම සංවර්ධන සැලැස්ම මගින් මාලබේ, අතුරුගිරිය, කඩුවෙල දෙවන පෙළ නගර ලෙස හඳුනා ගෙන ඇති අතර මාලබේ නගරය තොරතුරු තාක්ෂණික පදනම් කරගත් දැනුම නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. එහිදී තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ව්‍යාපාරික ආයතන, විශ්වවිද්‍යාල, සහ රට අදාළ නේවාසික භාවිතයන්ට අවශ්‍ය අවකාශ පහසුකම් ලබාදීමට අවශ්‍ය අනු ව්‍යපෘති ඇතුළත් අභිප්‍රේරක ව්‍යාපෘතියක් ලෙස මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති ප්‍රදේශය ලෙස නාගරික සංවර්ධන අධිකාරිය මගින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද තොරතුරු තාක්ෂණ කලාප ප්‍රදේශය ඇතුළත් මාලබේ චන්ද්‍රිකා කුමාරතුංග මාවත අවට ප්‍රදේශය හදුන්වා දියහැකි අතර එය රූපය 6.9 මගින් නිරූපණය කෙරේ.

මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික අරමුණු ලෙස පහත සඳහන් අරමුණු හඳුනාගෙන ඇත.

- තොරතුරු තාක්ෂණය ප්‍රමුඛ වාණිජ හා නේවාසික කටයුතු සඳහා ඉඩම් මුදා හැරීම
- පොදු විනෝදාත්මක කටයුතු දියුණු කිරීම
- ප්‍රවාහන මාධ්‍ය දියුණු කිරීම
- ගංවතුර තර්ජන අවම කිරීම

මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි පහත සඳහන් ව්‍යාපෘති අනු ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඇති අතර එම එක් එක් අනු ව්‍යාපෘති සඳහා යෝජිත ප්‍රදේශයන් රූපය 6.9 මගින් නිරූපණය කෙරේ.

1. පිවිසුම් දොරටුව සංවර්ධනය
2. ක්‍රීඩා මධ්‍යස්ථානය
3. ජල රැඳවුම් ප්‍රදේශය I හා ඔරු පැදීමේ පථය
4. ජාල රැඳවුම් පොකුණ, ඇල මාර්ග සංවර්ධනය හා ඇවිදින මංතීරු සංවර්ධනය
5. තෙත්බිම් කාබානා ව්‍යාපෘතිය
6. වාණිජ හා නිවාස ව්‍යාපෘතිය
7. ජාල රැඳවුම් ප්‍රදේශය II හා ඔරු පැදීමේ පථය

එමෙන්ම, මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව පැඩල් බෝට්ටු මෙම ප්‍රදේශය තුළ පවතින ඇල මාර්ග සඳහා හඳුන්වා දීම හා මාලබේ සුහුරු දැනුම කලාපය සඳහා වෙබ් අඩවිය නිර්මාණය කිරීම ද මෙම ව්‍යාපෘතියෙහි මූලිකාංග ලෙස හඳුන්වා දිය හැකිය.

රූපය 6.9 : මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම හා යෝජිත අනු ව්‍යාපෘති




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

වගුව 6.5: මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම හා යෝජිත අනු ව්‍යාපෘති

| අනු අංකය | යෝජිත අනු ව්‍යාපෘති | අනු ව්‍යාපෘති අංකය | භූමි ප්‍රමාණය (දළ වශයෙන්) | ඉඩම් අයිතිය |
|---|---|---|---|---|
| 1 | පිවිසුම් දොරටුව සංවර්ධනය | EDP/04/01 | අක්කර 4.7 | නා. සං. අ. |
| 2 | ක්‍රීඩා මධ්‍යස්ථානය | EDP/04/02 | අක්කර 2 | නා. සං. අ. |
| 3 | ජල රැඳවුම් ප්‍රදේශය I හා ඔරු පැදීමේ පථය | | අක්කර 14.8 | ශ්‍රී. ල. ඉ. සං. ස |
| 4 | ජල රැඳවුම් පොකුණ, ඇල මාර්ග සංවර්ධනය හා ඇවිදින මංතීරු සංවර්ධනය | EDP/04/03 | අක්කර 41<br>මීටර් 900 | පුද්ගලික |
| 5 | තෙත්බිම් කාබානා ව්‍යාපෘතිය | EDP/04/04 | අක්කර 10 | පුද්ගලික |
| 6 | වාණිජ හා නිවාස ව්‍යාපෘතිය | EDP/04/05 | අක්කර 6 | පුද්ගලික |
| 7 | ජල රැඳවුම් ප්‍රදේශය II හා ඔරු පැදීමේ පථය | EDP/04/06 | අක්කර 26 | පුද්ගලික |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

### 6.4.4.1.5. උපායමාර්ගික ව්‍යාපෘති 05: අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්ම මගින් අතුරුගිරිය නගරය සමස්ත කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහිම නේවාසික පහසුකම් සලසන නගරය ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර එහිදී ප්‍රදේශය තුළ පවතින හා යෝජිත ප්‍රවාහනය මූලික කරගත් ව්‍යාපෘතීන් හි ප්‍රතිලාභ ප්‍රදේශයෙහි නේවාසිකයින්ට අත්පත් කරදීම තුළින් ප්‍රවාහනය ඉලක්ක කරගත් නේවාසික නගරයක් ලෙස අතුරුගිරිය නගරය සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙහිදී දැනට පවතින අධිවේගී මාර්ගය සහ දැනට ඉදිකරීම් කටයුතු

ආරම්භ කර ඇති යෝජිත කණුමත ඉදිවන අධිවේගී මාර්ගය සැලකිල්ලට ගනිමින් ප්‍රවාහනය මූලික කරගත් නේවාසික නගරයක් (Transport oriented residential center) ලෙස නව අනන්‍යතාවයක් අතුරුගිරිය නගරයට ලබා දීමට අවශ්‍ය සැලසුම්ය ව්‍යාපෘති හඳුනා ගෙන ඇත. ඒ අනුව පහත අරමුණු පෙරදැරි කරගනිමින් අතුරුගිරිය නගරය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනයක් කරා යොමු කිරීමට අපේක්ෂා කෙරේ.

- අතුරුගිරිය ප්‍රදේශය සඳහා යෝජිත නව ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘති මගින් ප්‍රදේශය සංවර්ධනය කිරීම
- යෝජිත නව සංවර්ධන ව්‍යාපෘති මගින් වැඩි වන වාණිජ හා නේවාසික භාවිත ඉල්ලුමට සරිලන ඉඩම් නිදහස් කිරීම
- ප්‍රදේශය තුළ අපේක්ෂිත නාගරික ජනගහනයට සරිලන පරිදි විනෝදාත්මක කටයුතු සංවර්ධනය කිරීම හා නාගරික ගංවතුර තර්ජනය අවම කිරීම

අතුරුගිරිය නගරය සඳහා යෝජිත ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධන ව්‍යාපෘතිය මෙම සංවර්ධන සැලැස්ම මගින් මූලික අදියර දෙකක් යටතේ හඳුනාගෙන ඇති අතර එහි පළමු අදියර ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 08 කින් පමණ යුත් නිසාකෝ ගොඩනැගිල්ල අසළ ඉඩම සඳහා යෝජනා කර ඇති අතර එය රූපය 6.10 මගින් අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය ව්‍යාපෘතියෙහි පළමු අදියර- යෝජිත වින්‍යාස සැලැස්ම හා එහි අනු ව්‍යාපෘති නිරූපණය කෙරේ.

රූපය 6.10: අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය ව්‍යාපෘතියෙහි පළමු අදියර- යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

මෙම ව්‍යාපෘතියෙහි දෙවන අදියර ලෙස, අතුරුගිරිය පිටත වටරවුම් මාර්ගයෙහි අන්තර්හුවමාරුව ආසන්නයේ පවතින මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන යමින් පවතින අක්කර 11 පමණ වන කොස්කදවිල කුඹුර නැමති ඉඩම හඳුනාගෙන ඇති අතර ඒ සඳහා බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් හා ඊට අනුශාංගික භාවිතයන් මෙන්ම ප්‍රදේශය තුළ යෝජිත සංවර්ධනයන් හේතුවෙන් ඇතිවිය හැකි ගංවතුර අවධානම අවම කිරීම සඳහා ජල රැඳවුම් පොකුණක් හා ඒ අවට ඇවිදීමේ මංතීරුවක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර එය රූපය 6.11 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.11: අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය ව්‍යාපෘතියෙහි දෙවන අදියර- යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

### 6.4.4.1.6. උපායමාර්ගික ව්‍යාපෘති 06: අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යානය- කොරතොට

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ආර්ථික ශක්‍යතාවය වැඩිදියුණු කිරීමෙහි එක් උපාය මාර්ගික ව්‍යාපෘතියක් ලෙස කොරතොට අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යානය හැඳින්විය හැකිය. ඒ අනුව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා පුද්ගලික අයිතිය සතු අක්කර 14 පමණ ඉඩමක් මේ සඳහා කඩුවෙල මහ නගර සභාවෙහි යෝජනා මත හඳුනාගන්නා ලදී. කඩුවෙල මහ නගර සභාවෙහි පිළිසරු ව්‍යාපෘතිය මගින් දෛනිකව එක් රැස් කරගනු ලබන නොදිරන කසල එනම් ප්ලාස්ටික්, පොලිතීන් හා වීදුරු ප්‍රතිචක්‍රීකරණය කිරීම මගින් නව නිෂ්පාදන සිදුකිරීම සඳහා දිරි ගැන්වීමක් සිදුකරන ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය හඳුන්වා දිය හැකිය. තවද මෙම ව්‍යාපෘතිය සිදුකිරීම තුළින් ප්‍රදේශයෙහි ආර්ථික ශක්‍යතාවය සඳහා දායකත්වයක් සැපයීම මෙන්ම ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට නව රැකියා අවස්ථා උත්පාදනය කිරීමට ද අපේක්ෂා කෙරේ. ඒ අනුව යෝජිත ව්‍යාපෘතිය පහත අරමුණ මත පදනම් වී ඇත.

- ප්‍රදේශයේ එක්රැස් කරන්නාවූ නොදිරන ප්ලාස්ටික්, පොලිතීන් හා වීදුරු මගින් නව නිෂ්පාදන සිදුකිරීම. (මල් බඳුන්, සෙල්ලම් භාණ්ඩ, වීදුරු බඳුන්, කොසු ,ඉදල්, විසිතුරු භාණ්ඩ, බුමුතුරුණු ආදි නිෂ්පාදන)

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යාන ව්‍යාපෘතියෙහි මූලිකාංග පහත පරිදි වන අතර එම ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශය රූපය 6.12 මගින් ඉදිරිපත් කෙරේ. යෝජිත ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරී ස්වභාවය රූපය 6.13 මගින් නිරූපණය කෙරේ.

1. අපද්‍රව්‍ය ප්‍රතිචක්තිකරණ කර්මාන්තපුරය
2. හරිත බාධක කලාපය

රූපය 6.12: ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශය ඇතුළත් ගූගල් සිතියම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

රූපය 6.13: අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යාන ව්‍යාපෘතියෙහි ක්‍රියාකාරී ස්වභාවය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්

### 6.4.4.1.7. උපායමාර්ගික ව්‍යාපෘති 07: කාර්මික උද්‍යාන සංවර්ධනය - ඔරුවල

ඔරුවල වානේ සංස්ථාව සතු ඉඩම පුනර්ජනනය කිරීම ව්‍යාපෘතියක් ලෙස කාර්මික උද්‍යාන සංවර්ධනය සඳහා වන උපාය මාර්ගික ව්‍යාපෘතිය හැඳින්විය හැකිය. ඒ අනුව යෝජිත ව්‍යාපෘතිය පහත අරමුණ මත පදනම් වී ඇත.

- වර්තමානය වන විට ඌණ උපයෝගීතා මට්ටමේ පවතින වානේ සංස්ථාව සතු ඉඩම ඉහළම සහ හොඳම භාවිතය යොදා ගැනීම

ඒ අනුව මෙම යෝජිත ව්‍යාපෘතිය යටතේ වානේ සංස්ථාව සතු අක්කර 20 ක පමණ ප්‍රදේශයක් නව කාර්මික කලාපයක් ලෙස නව මුහුණුවරක් සැපයීම හා අක්කර 12 ට ආසන්න ප්‍රමාණයක් තුළ කාර්මික කලාපය තුළ සේවයෙහි නියුක්තවන්නන් හට අවශ්‍ය නවාතැන් පහසුකම් සැපයීම සඳහා වන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමටත්, තවත් අක්කර 7ක් පමණ වන වානේ සංස්ථාව සතු වත්මන් ක්‍රීඩා පිටිය, ක්‍රීඩා හා විනෝදාත්මක ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම තුළින් යෝජනා කර ඇති අතර එය රූපය 6.14 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.14: ව්‍යාපෘතිය සඳහා යෝජිත වින්‍යාස සැලැස්ම ඇතුළත් ගූගල් සිතියම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

### 6.4.4.1.8. උපායමාර්ගික ව්‍යාපෘති 08: ජලාභිමුඛ නගර සංවර්ධනය- කඩුවෙල

කඩුවෙල නගරයෙහි උතුරු මායිමෙන් ගලා බසින කැළණි ගංගාවෙහි පවතින ආර්ථික හා සෞන්දර්‍යාත්මක වටිනාකම ප්‍රයෝජනයට ගනිමින් කඩුවෙල නගරය සංවර්ධනය කිරීම මෙම උපාය මාර්ගික ව්‍යාපෘතියෙහි මුඛ්‍ය පරමාර්ථය වේ. ඒ අනුව යෝජිත ව්‍යාපෘතිය පහත අරමුණු මත පදනම් වී ඇත.

- කැළණි ගඟ නගර අලංකරණ කටයුතු සඳහා යොදා ගැනීම
- ගංගා ආශ්‍රිත නගරයක් ලෙස පෙනුන කරන ආකාරයට නගර අලංකරණ කටයුතු කිරීම
- නාගරික පරිශීලකයන්ට පහසු නගරයක් ලෙස වැඩි දියුණු කිරීම
- වාණිජ හා නේවාසික කටුතු සඳහා ඉඩම් මුදා හැරීම
- පොදු විනෝදාත්ම කටුතු සඳහා ඉඩම් මුදා හැරීම
- පොදු ප්‍රවාහන මාධ්‍ය වැඩි දියුණු කිරීම

මෙම ව්‍යාපෘතිය මගින් කඩුවෙල නගරය ජලභිමුඛ නගරයක් ලෙස සහ පරිපාලන අගනගරයේ ප්‍රධාන පිවිසුම් ද්වාරයක් ලෙස පිළිබිඹුවන ආකාරයේ ප්‍රතිරූපයක් ගොඩ නැගෙන ආකාරයට වාණිජ කටයුතු වලට මුල්තැනක් දෙමින් නිර්මාණය කිරීමට මෙම උපායමාර්ගික සැලස්ම මගින් යෝජනා කර ඇත. ඒ අනුව මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය මගින් පහත මූලිකාංග උප ව්‍යාපෘති ලෙස හදුනාගෙන ඇති අතර එම එක් එක් අනු ව්‍යාපෘති සඳහා යෝජිත ප්‍රදේශයන් රූපය 6.15 මගින් නිරූපණය වේ. තවද එම අනු ව්‍යාපෘතීන්ට අදාළ තොරතුරු වගු අංක 6.6 මගින් විස්තරාත්මකව ඉදිරිපත් කෙරේ.

වගුව අංක 6.6: කඩුවෙල ජලාභිමුඛ නගර සංවර්ධනය ව්‍යාපෘතියෙහි යෝජිත අනු ව්‍යාපෘති

| අනු අංකය | යෝජිත අනු ව්‍යාපෘති | අනු ව්‍යාපෘති අංකය | භූමි ප්‍රමාණය (දළ වශයෙන්) | ඉඩම් අයිතිය |
|---|---|---|---|---|
| 1 | කැළණි ගංගා රක්ෂිතය තුල භූ දර්ශන අලංකරණ ව්‍යාපෘතිය | EDP/08/01 | කිලෝ මීටර් 4 | වාරි මාර්ග දෙපාර්තමේන්තුව |
| 2 | කැළණි ගඟ පිවිසුම් මාර්ගය නව මුහුණු වරකින් වැඩි දියුණු කිරීම | EDP/08/02 | මීටර් 6 | කඩුවෙල මහනගර සභාව |
| 3 | කැළණි ගඟට මුහුණලා කඩුවෙල මහා නගර සභාවට අයත් භූමියෙහි පොදු උද්‍යාන හා විවෘත රංග භූමිය නිර්මාණය කිරීම | EDP/08/03 | පර්චස් 65 | කඩුවෙල මහනගර සභාව |
| 4 | කඩුවෙල මහා නගර සභාවට අයත් නව නුවර මාර්ගයට මුහුණලා ඇති ඉඩමෙහි මිශ්‍ර සංවර්ධන ව්‍යපෘති II | EDP/08/04 | අක්කර 0.4 | කඩුවෙල මහනගර සභාව හා පුද්ගලික |
| 5 | කඩුවෙල තෙත්බිම් උද්‍යානය | EDP/08/05 | අක්කර 20.8 | පුද්ගලික |
| 6 | නගර මධ්‍යයේ සිට දෙපසට මීටර 150 දුරක් ගොඩනැගිලි මුහුණත වැඩි දියුණු කිරීම | EDP/08/06 | මීටර 150 | පුද්ගලික |
| 7 | නගර මධ්‍යයේ සිට දෙපසට මීටර 150 දුරක් භූ දර්ශන හා පදික වේදිකා වැඩි දියුණු කිරීම | EDP/08/07 | මීටර 150 | පුද්ගලික |
| 8 | බහු විධ ප්‍රවාහන මධ්‍යස්ථානය<br>මිශ්‍ර සංවර්ධන ව්‍යපෘති I | EDP/08/08 | අක්කර 3<br>අක්කර 2 | කඩුවෙල මහනගර සභාව හා පුද්ගලික |

සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

පුද්ගලික අනුග්‍රහ භවතුන්ගේ සහය යටතේ කඩුවෙල නගර මධ්‍යයේ වටරවුම භූ දර්ශනය හා අලංකරණය කිරීම , කඩුවෙල නගර පාලම අලංකරණ කටයුතු කිරීම ද මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන ඇති අතර එය මෙම අධිකාරියෙහි පරිසර හා භූ දර්ශන අංශයෙහි වරලත් භූ දර්ශන ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

රූපය 6.15: කඩුවෙල ජලාභිමුඛ නගර සංවර්ධනය ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

කැළණි ගඟට මුහුණලා පවතින කඩුවෙල මහා නගර සභාවට අයත් භූමියෙහි නාගරික සංවර්ධන අධිකාරිය මගින් සියත් නගර ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන ඉදිකිරීම් කටයුතු සිදුකර ඇති පොදු උද්‍යාන හා විවෘත රංග භූමියට අදාළ පිරිසැලසුම රූපය 6.16 මගින් නිරූපණය කරන අතර එම ව්‍යාපෘතිය මෙම සංවර්ධන සැලැස්ම තුළට ඇතුළත් කර ඇත.

රූපය 6.16: කඩුවෙල ජලාභිමුඛ නගර සංවර්ධනය ව්‍යාපෘතියෙහි පොදු උද්‍යාන හා විවෘත රංග භූමියට අදාළ පිරිසැලසුම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය හා ව්‍යාපෘති කළමණාකරණ අංශය, නා.සං. අ.

### 6.4.4.1.9. උපායමාර්ගික ව්‍යාපෘති 09: මාලබේ නගර සංවර්ධනය

නගර අලංකරණය මගින් කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයට ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම හා ප්‍රදේශයේ පවතින ආර්ථික ඉල්ලුමට අදාළ සංවර්ධනයන් සඳහා ඉඩම් නිදහස් කිරීම මගින් ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනය කරගැනීම මෙම නගර සංවර්ධන උපායමාර්ගය මගින් අපේක්ෂා කෙරේ. නාගරික සංවර්ධන අධිකාරියෙහි කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය විසින් හඳුනාගෙන ඇති මෙම ව්‍යාපෘතිය කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මට අන්තර්ගත කර ඇත. ඒ අනුව යෝජිත මාලබේ නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි මූලික අදියර දෙකකි.

- පළමු අදියර: මාලබේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය
- දෙවන අදියර: මාලබේ පොළ හා වාණිජ සංවර්ධන ව්‍යාපෘතිය

ඉන් පළමු අදියර ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 1.95 පමණ භූමිය මාලබේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය යෝජනා කර ඇති අතර එය පහත අරමුණු මත පදනම් වී ඇත.

- මාලබේ මංසන්ධියේ වාණිජ, කාර්යාලීය හා නේවාසික භාවිතයන් සඳහා ඉඩම් නිදහස් කිරීම
- මාලබේ මන්සන්ධිය භූ දර්ශන අලංකරණ ව්‍යාපෘතිය
- ප්‍රවාහන පහසුකම් සංවර්ධනය

මාලබේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය මගින් පහත මූලිකාංග යෝජන කර ඇති අතර ඒ තුළින් මාලබේ නගරයට ආර්ථික ප්‍රතිලාභ රැසක් අත්පත් කරදීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතියට අදාළව නාගරික සංවර්ධන අධිකාරියෙහි කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය විසින් යෝජිත වින්‍යාස සැලැස්ම රූපය 6.17 මගින් නිරූපණය කෙරේ.

- යෝජිත වාණිජ, කාර්යාලීය හා නේවාසික ගොඩනැගිලි සංවර්ධනය

මෙම සංවර්ධනයේදී හරිත නගර සංකල්පය භාවිත කල යුතු අතර ගොඩනැගිලි ගස් වැල් භාවිත කරමින් අලංකරණය කල යුතු වේ. නව ගෘහ නිර්මාණ ශිල්පය විදහාපාන නිර්මාණයක් විය යුතු වේ. මෙම ව්‍යාපෘතියෙහි අවසන් අදියරෙහි දී ප්‍රදේශය භූ දර්ශන කිරීම, මාලබේ මංසන්ධි අලංකරණය , වාණිජ සංවර්ධනය, ස්මාර්ට් බස් නැවතුම්පොළ හා සැහැල්ලු දුම්රිය නැවතුම ස්ථාපනය කිරීම, නව නුවර මාර්ගය හා අතුරුගිරිය මාර්ගය සම්බන්ධ කරන්නාවූ මීටර් 6 පළල සේවා මාර්ගය ඉදිකිරීම උප ව්‍යාපෘතීන් ලෙස හදුනාගෙන ඇත.

රූපය 6.17: මාලබේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

මාලබේ නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි දෙවන අදියර ලෙස මාලබේ පොළ පුනස්ථාපන ව්‍යාපෘතිය හදුන්වා දිය හැකි අතර ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 12 පමණ වූ නියඹලාව ඉඩම හදුනාගෙන ඇත. එම ව්‍යාපෘතිය යටතේ වාණිජ සංවර්ධනයට දිරි ගන්වන අතර රථගාල සංවර්ධනය, පොළ සංවර්ධනය, ආපනශාලා සහ භූ දර්ශන ව්‍යාපෘතිය, ජල රැදවුම් පොකුණ සංවර්ධනය, ඇළ සංවර්ධනය හා ඇවිදින මංතිරු සංවර්ධනය, විකල්ප මාර්ග සංවර්ධනය යන උප ව්‍යාපෘති මෙම ව්‍යාපෘතියෙහි මූලිකාංග ලෙස

හඳුනාගෙන ඇත. රූපය 6.18 මගින් මාලබේ පොළ හා වාණිජ සංවර්ධන ව්‍යාපෘතියෙහි කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය විසින් යෝජිත වින්‍යාස සැලැස්ම නිරූපණය කෙරේ.

රූපය 6.18: මාලබේ නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2022

### 6.4.4.1.10. උපායමාර්ගික ව්‍යාපෘති 10: අතුරුගිරිය නගර සංවර්ධනය

නගර සංවර්ධන ව්‍යාපෘති යටතේ හඳුනාගෙන ඇති තවත් එක් උපාය මාර්ගික ව්‍යාපෘතියක් ලෙස අතුරුගිරිය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය. ඒ තුළින් අතුරුගිරිය මංසන්ධිය තුල පවතින මාර්ග තදබදය අවම කිරීම හා නගරය තුළ සංවර්ධන කටයුතු දිරිමත් කිරීම අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ අතුරුගිරිය නගර මධ්‍යයේ පවතින බස් පර්යන්තය මාර්ගසථ මගී ප්‍රවාහන අධිකාරියේ එකගතාවය මත සුදුසු ස්ථානයකට විතැන් කිරීම තුළින් අතුරුගිරිය නගර මධ්‍යයේ බස් පර්යන්තය පවතින ස්ථානයට මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සමග සුහුරු පහසුකම් සහිත බස් නැවතුමක් හඳුන්වා දීමට මෙම සැලැස්ම මගින් අපේක්ෂා කෙරේ. තවද මංසන්ධි මාධ්‍ය අලංකරණ හා ගොඩනැගිලි මුහුණත් අලංකරණ ව්‍යාපෘතියක් ද මෙම උපායමාර්ගික ව්‍යාපෘතියෙහි එක් මූලිකාංගයක් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව ඔරලෝසු කණුව මංසන්ධියේ සිට දෙපසට මීටර් 350 වන ලෙස මංසන්ධි මාධ්‍ය අලංකරණ හා ගොඩනැගිලි මුහුණත් අලංකරණ ව්‍යාපෘතිය යෝජනා කර ඇත.

ඒ අනුව අතුරුගිරිය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතියෙහි වින්‍යාස සැලැස්ම රූපය 6.18 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.19: අතුරුගිරිය නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතියෙහි වින්‍යාස සැලැස්ම




සැකසුම: සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

තවද යෝජිත සැහැල්ලු දුම්රිය සේවාව අතුරුගිරිය දක්වා සංවර්ධනය කිරීමෙහි වර්තමානයෙහි පවතින යෝජනාව ශ්‍රී ලංකා රජය මගින් ක්‍රියාත්මක කරන ලබන කාලවකවානුවෙහි දී ඊට ප්‍රථම එම ව්‍යාපෘතියට අදාළව සුදුසු පරිදි  සුදුසු ස්ථාන අනුව භූමිය හඳුනා ගැනීම සිදු කළ යුතුය.

එමෙන්ම ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම යටතේ යෝජිත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම, එම අවස්ථාවේ දී  යෝජිත භූමියෙහි  පවතින ස්වභාවය අධ්‍යයනය කර, මෙම සැලැස්ම මගින් ව්‍යාපෘති සඳහා යෝජිත මූලිකාංග නොවනස්වන ආකාරයට වින්‍යාස සැලැස්ම කාලෝචිතව වෙනස් කිරීමෙහි හැකියාව අදාළ නගරනිර්මාණ ශිල්පීන් සතු වන අතර එහිදී එම එක් එක් ව්‍යාපෘතියට අදාළව ශක්‍යතා අධයනයක් හා ආපදා අවමකිරීමේ සැලැස්මක් සකස් කර, ඊට අනුකූලව එකී ව්‍යාපෘතිය කාලෝචිතව ක්‍රියාත්මක කළ හැකිද යන්න විස්තරාතමකව විශ්ලේෂණය කර ක්‍රියාවට නැන්වීම සිදුකළ යුතුය.

**හයවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්ම**

**භෞතික යටිතල පහසුකම් සංවර්ධනය**

## 6.5 භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

### 6.5.1 හැඳින්වීම

භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම, කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි වැදගත්ම උපාය මාර්ගික සැලස්මක් වන අතර, එමගින් හෙවන පරිච්ඡේදය වන සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කරන ලද ගැටළු කිහිපයකට විවිධ උපායමාර්ගික මැදිහත්වීම් ඔස්සේ විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරේ.

සජීවී සහ ක්‍රියාකාරී නගරයක් බිහිකිරීමෙහි ලා එහි අවකාශීය වශයෙන් ස්ථාපනය වී ඇති මාර්ග පද්ධතිය හේතු සාධක වේ. ඒ අනුව යම් නගරයක වින්‍යාසය නේවාසික, වාණිජ, සේවා හෝ වෙනත් ඕනෑම භාවිතයක් වන අවස්ථාවක එහි මාර්ග පද්ධතිය අදාළ නිර්මිත පරිසරයේ වැදගත් අංගයක් වේ. එපමනක් නොව නගරයක කාර්යක්ෂම වූ ක්‍රියාකාරීත්වයක් ඇති කිරීමෙහි ලා හොඳින් කළමනාකරණය කරන ලද භෞතික යටිතල පහසුකම් පැවතීම මූලික අවශ්‍යතාවයකි. ඥානාන්විත සම්පත් පරිහරණය, සම්පත් සංරක්ෂණය හා යටිතල පහසුකම් සඳහා සමාන ප්‍රවේශය තහවුරු කිරීම උදෙසා අපරව්‍යූහ පහසුකම් කළමනාකරණය කිරීමේදී සාකල්‍ය හා ඒකාබද්ධ ක්‍රමවේදයක් අනුගමනය කළ යුතුය. කාර්යක්ෂම යටිතල පහසුකම් කළමනාකරණයෙහි මූලික කාර්යයන් ලෙස ඉල්ලුම හඳුනා ගැනීම සහ ඉල්ලුමට සරිලන ආකාරයෙන් සැපයුම තහවුරු කිරීම මෙම උපාය මාර්ගයෙහි එක් පරමාර්ථයක් වේ.

තවද සැලසුම් ප්‍රදේශය තුළ වෙසෙන ජනතාවගේ මෙන්ම මෙම ප්‍රදේශය තුළින් විවිධ සේවා ලබා ගැනීමට පැමිණෙන මගී ජනතාවට අවශ්‍ය සාමාජීය යටිතල පහසුකම් වන සෞඛ්‍ය ක්ෂේත්‍රයෙහි මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි කාලෝචිත අවශ්‍යතාවයන් වෙනුවෙන් ඉල්ලුමට උචිත ලෙස ප්‍රදේශය සකස් කිරීම මෙම උපාය මාර්ගයෙහි දෙවන පරමාර්ථය වේ.

### 6.5.2 අරමුණ

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යටතේ හඳුනාගත් යටිතල පහසුකම් ආශ්‍රිත ගැටළු සඳහා අවශ්‍ය විවිධ උපායමාර්ගික මැදිහත්වීම් ඔස්සේ විසඳුම් ලබා දෙමින්, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන්ට මෙන්ම ප්‍රදේශය තුළින් විවිධ සේවා ලබා ගැනීමට පැමිණෙන මගී ජනතාවට ද අවශ්‍ය මූලික යටිතල පහසුකම් සපයමින් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම මෙම උපාය මාර්ගයේ ප්‍රධාන අරමුණ ලෙස හඳුනාගත හැකිය. ඒ තුළින් ප්‍රදේශයේ සියලු ජනතාවට අවශ්‍ය භෞතික, සමාජීය යටිතලපහසුකම් හා පොදු සේවා පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් සුවපහසු නේවාසික වටපිටාවක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

### 6.5.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය

කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මේ දෙවන ඉලක්ක වන සුහුරු නාගරික පහසුකම් සහිත කාර්යක්ෂම නාගරික පද්ධතියකින් යුත් සෞභාග්‍යමත් නගරයක් ලෙස කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා මෙම උපායමාර්ගික සැලැස්ම සෘජුවම දායක වේ.

ඒ තුළින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ විශ්වාසනීය, සුවපහසු සහ කාර්යක්ෂම පොදු ප්‍රවාහන පද්ධතියේ ජාලයක් නිර්මාණය කිරීම, ප්‍රදේශයෙහි පුරෝකථනය කරන ලද සංවර්ධනයට සරිලන පරිදි 100% ක් ජල සම්පාදන, විදුලි සැපයුම, මලාපවහන සහ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පද්ධති ඇතුළු භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ප්‍රදේශය තුළින් ආයතනික, වාණිජ, මිශ්‍ර සංවර්ධන සහ තොරතුරු තාක්ෂණ භාවිතයන් සඳහා සමස්ත සැලසුම් බල ප්‍රදේශය තුළින් හෙක්ටයාර් 40 ක පමණ ඉඩම් ප්‍රමාණයක් නිදහස් කිරීම හා කලාපීකරණය මගින් හෙක්ටයාර් 2500ක පමණ ප්‍රමාණයක් එකී භාවිතයන් සඳහා ප්‍රවර්ධනය කිරීම යන අභිමතාර්ථ සාක්ෂාත් කරලීම සඳහා මෙම උපායමාර්ගය තුළින් සෘජු දායකත්වයක් සැපයීමට අපේක්ෂා කෙරේ.

### 6.5.4 විෂය පථය

භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම පහත සඳහන් අංශ කෙරෙහි මූලික අවධානය යොමු කරයි.

1. මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම
2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විධිමත් කිරීම
3. අපජල කළමනාකරණ විධිමත් කිරීම
4. සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

### 6.5.5.1 මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ පවතින පොකුරු සංවර්ධනයේ වාසි ලබා ගැනීම සහ පොදු ජනතාවට වඩාත් කාර්යක්ෂම හා සුවපහසු සේවාවක් සැපයීමේ අරමුණින් මෙම සංවර්ධන සැලැස්මෙහි භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්මෙහි පළමු උපායමාර්ගික සැලැස්ම ලෙස මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම හඳුන්වා දී ඇත. ඒ අනුව නව මාර්ග හඳුන්වා දීම සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘති, ප්‍රදේශය තුළ පවතින මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘති හා ප්‍රවාහන ක්ෂේත්‍රය සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන උපායමාර්ගික ව්‍යාපෘති ඊට ඇතුළත් කර ඇත. සිතියම අංක 6.4 මගින් මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්මෙහි සංයුක්ත සිතියම නිරූපණය කෙරේ.

#### 6.5.5.1.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: නව මාර්ග සංවර්ධනය සඳහා වන යෝජනා

මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය හරහා පහත සඳහන් මාර්ගයන් හි දිගුවක් ලෙස නව මාර්ග ලෙස සංවර්ධනය කිරීම සඳහා යෝජනා කර ඇති අතර එම මාර්ග සිතියම අංක 6.5 මගින් නිරූපණය කෙරේ.

1. පොල්දූව මාර්ගයෙහි දිගුව නව නුවර මාර්ගය හා සම්බන්ධිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම
2. චන්ද්‍රිකා කුමාරතුංග මාර්ගයෙහි දිගුවක් ලෙස කැනෑල් මාර්ගය නව නුවර මාර්ගයෙහි සිට කෝට්ටේ බෝපේ මාර්ගය එනම් අතුරුගිරිය මාර්ගය දක්වා සංවර්ධනය කිරීම

සිතියම අංක 6.4: මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්මෙහි සංයුක්ත සිතියම




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

සිතියම අංක 6.5: මාර්ග සහ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම මගින් යෝජිත නව මාර්ග




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

#### 6.5.5.1.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: නාගරික ක්‍රියාකාරී මාර්ග පුළුල් කිරීම සඳහා වන යෝජනා

ප්‍රාදේශීය සම්බන්ධතා වැඩිදියුණු කිරීම සඳහා ප්‍රධාන කොරිඩෝ තුනක් ලෙස නව නුවර පාර සහ ලෝ ලෙවෙල් මාර්ගය සහ කෝට්ටේ බෝපේ මාර්ගය (මාලබේ -අතුරුගිරිය- ගොඩගම මාර්ගය) සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දී ඇති පළමු අදියර වේ. ඒ අනුව එම මාර්ගයන් මෙම කඩුවෙල මහ නගර සභා සැලැස්ම මගින් නාගරික ක්‍රියාකාරී මහාමාර්ග ලෙස නම් කර ඇත. එපමණක් නොව ප්‍රදේශය තුළ පවතින පොකුරු සංවර්ධනය විධිමත් කිරීම සඳහා එම එක් එක් ප්‍රධාන ප්‍රදේශීය කලාපයන් අතර කාර්යක්ෂම මාර්ග පද්ධතියක අවශ්‍යතාවය හඳුන්වා දෙමින් කොස්කදවිල -හෝකන්දර මාර්ගය, කඩුවෙල-අතුරුගිරිය මාර්ගය හා කලපළුවාව- තලංගම මාර්ගය ද පුළුල් කිරීම සඳහා වන යෝජනා මෙම උපාය මාර්ගික ව්‍යාපෘතිය යටතේ හඳුන්වා දී ඇත. එම යෝජිත මාර්ගයන් හා එකී මාර්ගයන්ට අදාළව යෝජිත හරස් කඩ පිළිවෙලින් වගුව අංක 6.7 මගින් හා රූපය 6.21 මගින් නිරූපණය කෙරේ.

වගුව අංක 6.7: පුළුල් කිරීම සඳහා යෝජිත මාර්ග

| අංකය | යෝජිත මාර්ග | යෝජිත මාර්ග පළල (මීටර්) |
|---|---|---|
| 01. | නව නුවර මාර්ගය | 30 |
| 02. | ලෝලෙවල් මාර්ගය | 24 |
| 03. | මාලබේ -අතුරුගිරිය- ගොඩගම මාර්ගය (කෝට්ටේ බෝපේ මාර්ගය) | 30 |
| 04. | කොස්කදවිල හෝකන්දර මාර්ගය | 24 |
| 05. | කඩුවෙල -අතුරුගිරිය මාර්ගය | 24 |
| 06. | කලපළුවාව- තලංගම මාර්ගය | 24 |

සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

රූපය 6.21: නාගරික ක්‍රියාකාරී මහාමාර්ග සඳහා යෝජිත හරස්කඩ




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

#### 6.5.5.1.3 උපායමාර්ගික ව්‍යාපෘති 03: උප ප්‍රධාන මාර්ග පුළුල් කිරීම සඳහා වන යෝජනා

නව නුවර මාර්ගයේ කාර්යබහුල වේලාවන් හි දී දැනට පවතින වාහන තදබදය අවම කර එය වෙනත් දිශාවකට යොමු කරවීම සඳහා සහ ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම මගින් මෙම ප්‍රදේශයට හඳුන්වා දුන් නව උත්පේරක ව්‍යාපෘති හරහා ආර්ථික පොකුරු සංවර්ධනය ප්‍රවර්ධනය දිරිමත් කිරීමට නාගරික ක්‍රියාකාරී මහාමාර්ග සම්බන්ධ කරමින් උප ප්‍රධාන මාර්ග මෙම සැලැස්මෙහි උපායමාර්ගික ව්‍යාපෘති 03 මගින් හඳුන්වා දී ඇත. ඒ අනුව යෝජිත උප ප්‍රධාන මාර්ගයන් හා යෝජිත පළල වගුව අංක 6.8 මගින් ඉදිරිපත් කරන අතර සිතියම අංක 6.6 මගින් යෝජිත උප ප්‍රධාන මාර්ගයන් නිරූපණය කෙරේ.

වගුව අංක 6.8: යෝජිත උප ප්‍රධාන මාර්ග හා යෝජිත පළල

| මාර්ගය | යෝජිත අවම පළල (මීටර්) | මාර්ගයේ දිග | යෝජිත ගොඩනැගිලි සීමාව (මීටර්) |
|---|---|---|---|
| වැක්කියවත්ත මාර්ගය | 12 | කි.මී 2.2 පමණ | 6.09 |
| ගල්වරුසාව මාර්ගය | 12 | කි.මී 4 පමණ | 6.09 |
| අතුරුගිරිය -නවගමුව මාර්ගය | 12 | කි.මී 3.66 පමණ | 6.09 |
| උඳුගොඩ මාර්ගය | 12 | කි.මී 3.17 පමණ | 6.09 |
| හබරකඩ -රණාල මාර්ගය | 12 | කි.මී 7.7 පමණ | 6.09 |
| වැලිවිට මාර්ගය | 12 | කි.මී 2.8 පමණ | 6.09 |
| සුභද්‍ර මාවත | 12 | කි.මී 1.4 පමණ | 6.09 |
| කහන්තොට මාර්ගය | 12 | කි.මී 3.7 පමණ | 6.09 |
| හෝකන්දර -කොට්ටාව මාර්ගය | 12 | කි.මී 1.3 පමණ | 6.09 |
| අමරගොඩ මාර්ගය | 12 | කි.මී 1.3 පමණ | 6.09 |
| පොතුඅරාව මාර්ගය | 12 | කි.මී 2.2 පමණ | 6.09 |
| උඩවත්ත මාර්ගය | 12 | කි.මී 1.5 පමණ | 6.09 |
| ලේක් මාර්ගය | 12 | කි.මී 3.6 පමණ | 6.09 |
| රොබට් ගුණවර්ධන මාර්ගය | 12 | කි.මී 2.5 පමණ | 6.09 |
| සූරිය මාවත | 12 | කි.මී 1.4 පමණ | 6.09 |

සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

සිතියම අංක 6.6: පුළුල් කිරීම සඳහා යෝජිත උප ප්‍රධාන මාර්ග




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, 2023

#### 6.5.5.1.4 උපායමාර්ගික ව්‍යාපෘති 04: සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය

යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මෙම සංවර්ධන සැලැස්මට ඒකාබද්ධ කර ප්‍රදේශය තුළ පවතින ප්‍රවාහන ගැටලු සඳහා තිරසාර විසඳුම් ලබා දීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව ඇමුණුම් අංක 17 මගින් සැහැල්ලු දුම්රිය සේවා ව්‍යාපෘතිය අනුව දම්පැහැති රේඛාව මගින් දැක්වෙනෙ කොළඹ කොටුව සිට බත්තරමුල්ල හරහා කඩුවෙල හා අතුරුගිරිය දක්වා යෝජිත ව්‍යාපෘතිය නිරූපණය කරන අතර මාර්ග සංවර්ධන අධිකාරිය මගින් නව කැළණි පාලම සිට අතුරුගිරිය දක්වා යෝජිත කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මෙම සැලැස්ම සඳහා ඇමුණුම් අංක 18 මගින් ඇතුළත් කර ඇත.

#### 6.5.5.1.5 උපායමාර්ගික ව්‍යාපෘති 05: කොස්වත්ත, කඩුවෙල හා අතුරුගිරිය නගර සඳහා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන හඳුන්වාදීම

ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම මගින් හඳුන්වා දුන් කොස්වත්ත, කඩුවෙල හා අතුරුගිරිය නගර කේන්ද්‍ර කර ගනිමින් යෝජිත ව්‍යාපෘති යටතේ හඳුන්වා දෙන ලද උප ව්‍යාපෘතීන් ලෙස එම එක් එක් නගර සඳහා යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘති හඳුන්වා දිය හැකිය.

ඒ අනුව තලංගම බස් ඩිපෝව සතු අක්කර 8 කට ආසන්න භූමිය, එම ප්‍රදේශය හරහා යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා කණු මතින් ඉදිවන අධිවේගී මාර්ග ව්‍යාපෘතිය පදනම් කරගනිමින් සහ බත්තරමුල්ල ප්‍රදේශයෙහි යෝජිත ආයතනික නගරයට උපරිම ප්‍රතිලාභ ලබා ගත හැකිවන අයුරින් බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම මගින් හඳුන්වාදුන් කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාපය උපායමාර්ගික ව්‍යාපෘතියෙහි උප ව්‍යාපෘතිය මෙම සැලැස්ම සඳහා ඒකාබද්ධ කර ඇත.

අතුරුගිරිය ප්‍රවාහනය ඉලක්ක කරගත් සංවර්ධනය පදනම් කරගනිමින් යෝජිත ව්‍යාපෘතියෙහි දෙවන අදියර යටතේ අතුරුගිරිය පිටත වටරවුම් මාර්ගයෙහි අන්තර්හුවමාරුව ආසන්නයේ පවතින මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් අත්පත් කරගෙන යමින් පවතින අක්කර 11 පමණ වන කොස්කදවිල කුඹුර නැමති ඉඩම සඳහා අතුරුගිරිය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම යටතේ යෝජනා කරන ලද අතර එම ව්‍යාපෘතිය මෙම සැලැස්ම සඳහා ඒකාබද්ධ කර ඇත. අතුරුගිරිය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සඳහා යෝජිත ඉඩම රූපය 6.11 මගින් ඉදිරිපත් කර ඇත.

කඩුවෙල නගරය, කඩුවෙල මහ නගර සභා සීමාව තුළ ප්‍රධාන වාණිජ නගරයක් ලෙස මෙන්ම ජලාභිමුඛ නගරය ලෙස සංවර්ධනය කිරීමේදී ප්‍රදේශයෙහි පවතින ගැටලු වලට විසඳුමක් ලෙස පොදු ප්‍රවාහන මාධ්‍ය වැඩි දියුණු කිරීමේ අරමුණින් කඩුවෙල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුන්වා දුන් කඩුවෙල ජලාභිමුඛ නගර සංවර්ධන උපායමාර්ගික ව්‍යාපෘතියෙහි උප ව්‍යාපෘතියක් ලෙස හඳුනාගන්නා ලද අතර එම උප ව්‍යාපෘතිය මෙම සැලැස්ම සඳහා ඒකාබද්ධ කර ඇත. එහිදී පවත්නා බස් පර්යන්තය හා කඩුවෙල පොළ ආශ්‍රිත ප්‍රදේශය කඩුවෙල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට මෙම සැලැස්ම මගින් යෝජනා කර ඇත. කඩුවෙල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සඳහා යෝජිත ඉඩම රූපය 6.15 මගින් ඉදිරිපත් කර ඇත

### 6.5.5.2 ඝන අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්ම

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ 2022 වර්ෂය වන විට ජනගනයට අනුව දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය ටොන් 200ක් පමණ වන අතර එයින් ටොන් 75ක් පමණ කඩුවෙල මහ නගර සභාව මගින් කළමණාකරන කටයුතු සිදු කරනු ලබයි. ඉතිරිය ප්‍රදේශය තුළ ජීවත් වන ජනතාව විසින් විධිමත් හා අවිධිමත් ක්‍රමෝපායන් යටතේ තම පරිශ්‍රය තුළ හා පරිශ්‍රයෙන් පරිබාහිරව පවතින හිස් අවකාශයන් තුළට බැහැර කිරීම සිදු කරනු ලබයි. කෙසේ වෙතත්, කඩුවෙල මහ නගර සභාව මගින් දෛනික එක් රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය ජෛව හායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය හා ජෛව හායනයට ලක් නොවන ඝන අපද්‍රව්‍ය ලෙස වර්ගීකරණය කල හැකි අතර එය පිලිවෙළින් ටොන් 48 හා ටොන් 23-25 ත් අතර වේ. ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනය (IWMI) මගින් සකස් කරන ලද වාර්තාවට අනුව 2019 වර්ෂයේ නොවැම්බර් මස දෛනිකව එක්රැස් කරන ලද කසල ධාරිතාවය හා එය හා ජෛව හායනයට ලක් නොවන ඝන අපද්‍රව්‍යයන්හි ප්‍රතිශතය රූපය 6.22 මගින් දක්වා ඇත.

රූපය 6.22: කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි 2019 වර්ෂයේ නොවැම්බර් මස දෛනිකව එක්රැස් කරන ලද කසල ධාරිතාවය




මූලාශ්‍රය: ජාත්‍යන්තර ජල කළමණාකරණ ආයතනය (IWMI)

මෙම ඝන අපද්‍රව්‍ය එක්ලැස් කිරීම වර්ගීකරණයක් යටතේ කඩුවෙල මහ නගර සභාවෙහි, කඩුවෙල දිස්ත්‍රික් කාර්‍යාලය, බත්තරමුල්ල දිස්ත්‍රික් කාර්‍යාලය හා අතුරුගිරිය දිස්ත්‍රික් කාර්‍යාලය මගින් දිනපතා සිදු කරනු ලබයි. එසේ එක්ලැස් කරන ලද ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කටයුතු කඩුවෙල කසල අංගනය මගින් සිදුකරනු ලබන අතර එහි ධාරිතාවය අනුව දෛනිකව ජෛව හායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය ටොන් 10-15 ක ප්‍රමාණයක් මගින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම සිදුකරනු ලබයි. ජෛව හායනයට ලක්වන ඉතිරි ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය මුතුරාජවෙල කසල කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමු කරනු ලබයි. සැලසුම් ප්‍රදේශයෙහි ප්ලාස්ටික්, හා වීදුරු අපද්‍රව්‍ය කළමනාකරණ සඳහා 100% ක්ම පෞද්ගලික අංශය සහය ලබා ගන්නා අතර පොලිතීන් අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා කෙලවරපිටිය (Western Power Project) මගින් කළමනාකරණය කිරීම සිදුකරනු ලබයි.

සැලසුම් ප්‍රදේශය තුළ 2033 වර්ෂයේ පුරෝකතනය කරන ලද ජනගහන දත්තයන්ට අනුව, පුරෝකතනය කරන ලද දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය ටොන් 350 පමණ වේ. ඒ අනුව, එම සමස්ත දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනය කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළම කළමණාකරනය සිදුකරනු ලබන්නේ නම්, දෛනික ඝන අපද්‍රව්‍ය ටොන් 275 පමණ ධාරිතාවයක් කළමනාකරනය කිරීම සඳහා අවශ්‍ය ධාරිතාවයෙහි වැඩි කිරීමක් සිදු කළ යුතුය. නමුත්, වර්තමානය වන විට කඩුවෙල මහ නගර සභා කසල අංගනය මගින් සැලසුම් ප්‍රදේශය තුළ දෛනික ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනයෙන් 37.5% ප්‍රතිශතයක් පමණක් කළමණාකරනය සිදු කරනු ලබයි. එහෙයින් එහි ධාරිතාවය දෛනික ජෛව හායනයට ලක්වන ඝන අපද්‍රව්‍ය නිෂ්පාදනයෙන් 50% ක් දක්වා කඩුවෙල මහ නගර සභාව තුළම කළමණාකරනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පවතින කසල අංගනය අක්කර 01 ප්‍රමාණයකින් පුළුල් කිරීම සඳහා කඩුවෙල මහ නගර සභාව මගින් සිදුකරන ලද යෝජනාව මෙම සැලැස්මට ඇතුළත් කරගෙන ඇත. එම සැලැස්ම සඳහා යෝජිත ප්‍රදේශය රූපය 6.23 මගින් ඉදිරිපත් කෙරේ. ඒ තුළින් බත්තරමුල්ල කඩුවෙල වැනි නාගරික ප්‍රදේශ තුළ ඉදිරි වසර දහය තුළ දෛනිකව එක් රැස් විය හැකි කසල ප්‍රදේශය තුළම විධිමත් ලෙස කළමණාකරනය කිරීමට හැකි වනු ඇත.

රූපය 6.23: කසල අංගනය පුළුල් කිරීම සඳහා වන වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

එමෙන්ම, මෙම ඝන අපද්‍රව්‍ය කළමණාකරන සැලැස්ම වර්තමානය වන විට අවිධිමත් ලෙස බැහැර කරනු ලබන කසල විධිමත් ලෙස බැහැර කරවීමට මග සලසන අතර කැලිකසල ජනනය වීම එක්ලැස් කිරීම හා අවසාන වශයෙන් බැහැර කිරීම සම්බන්ධයෙන් ද පහත සැලසුම් යෝජනා කරන ලදී.

**6.5.5.2.1 ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම**

ගෘහස්ත, වෙළඳ. කාර්මික යන සියලු ක්ෂේත්‍රයන්හි ඝන අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සඳහා විධික්‍රම හඳුන්වා දීම. මෙහිදී පාසල්, ආයතන, නිවැසියන් කඩුවෙල මහ නගර සභාව මගින් දැනුවත් කිරීම. ( කසල කළමණාකරනය සම්බන්ධයෙන් 3R සංකල්පය හඳුන්වා දීම, ඒ අනුව කසල බැහැර කිරීම අවම කිරීම, නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය කිරීම)

**6.5.5.2.2 ජනනය වන කසල විධිමත් ලෙස වෙන් කිරීම**

සියලු ක්ෂේත්‍රයන් තුළින් උත්පාදනය වන කසල වෙන් කිරීම හා වෙන් වෙන් වශයෙන් නගර සභාව වෙත භාරදීම සඳහා කඩුවෙල මහ නගර සභාව සතුව පවතින වත්මන් වැඩ සටහන පිළිබඳව තවදුරටත් මහජනතාව දැනුවත් කිරීම මින් අපේක්ෂා කෙරේ.

**6.5.5.2.3 ජනනය වන කසල සඳහා මිලක් ලබා දීම.**

විවිධාංගීකරණය කරන ලද ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල මිල දී ගැනීම සඳහා කඩුවෙල මහ නගර සභාව මගින් වර්තමානය වන විට පවත්වා ගෙන යනු ලබන කසල පොළ පිළිබදව තවදුරටත් ප්‍රජාව මට්ටමින් දැනුවත් කිරීම් සිදු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල පුද්ගලික වශයෙන් එක් රැස් කරන්නන් කඩුවෙල මහ නගර සභාව තුළ ලියාපදිංචි කිරීම හා ඔවුන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම.

**6.5.5.2.4 නිවස තුළ ජනනය වන කසල නිවස තුළම බැහැර කිරීම**

දිරාපත් වන කසල නිවස තුළම කළමණාකරනය කිරීම තුළින් ගෘහස්ත කොම්පෝස්ට් නිෂ්පාදනයට දිරි ගන්වන අතර මෙමගින් නිවෙස් තුළින් ජනනය වන කසල අවම කිරීම කිරීමටත් පොහොර ලෙස මෙම කොම්පෝස්ට් යොදා ගැනීම මගින් ආර්ථික වාසි ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

තවද ප්‍රදේශය තුළින් ජනනය වන ජෛව හායනයට ලක්නොවන අපද්‍රව්‍ය තවදුරටත් කෙලවරපිටිය හා කරදියාන ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීමට යෝජිත කසල අංගන මගින් කළමණාකරනය කිරීමට අපේක්ෂා කෙරේ.

**6.5.5.3 මළ ද්‍රව්‍ය හා අප ජල කළමණාකරන සැලැස්ම**

කඩුවෙල සැලසුම් ප්‍රදේශයෙහි මල හා අපජල කළමනාකරණය සැලසුම් හා තත්ව සන්දර්භයෙහි පැහැදිලි කළ පරිදි කඩුවෙල මහ නගර සභාව හා පෞද්ගලික අංශය යටතේ සිදු කරනු ලබයි. කඩුවෙල මහ නගර සභාව තුළ නිවාස, ව්‍යාපාරික ආයතන හා බොහොමයක් කර්මාන්තශාලා හා අනෙකුත් ආයතන ස්ථානීය සනීපාරක්ෂක පද්ධති (OSS) භාවිතයෙන් සනීපාරක්ෂක අවශ්‍යතා ඉටු කර ගනු ලබන අතර එසේ ස්ථානීය සනීපාරක්ෂක පද්ධති තුළට එක් රැස් වන මළ හා අප ජලය පුද්ගලික සහ රාජ්‍ය අංශයන් විසින් එක්රැස් කිරීම සිදු කරනු ලබයි. එය දෛනිකව දළ වශයෙන් 181 m3 පමණ වන බව ඇස්තමේන්තු කර ඇත.

කෙසේ වෙතත්, කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි බත්තරමුල්ල ප්‍රදේශය ආවරණය වන පරිදි ජාතික ජලසම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලය, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය හා එක්ව ශ්‍රී ජයවර්ධනපුර ප්‍රදේශීය ලේකම් කොට්ඨාශය , කඩුවෙල හා මහරගම ප්‍රදේශීය ලේකම් කොට්ඨාශ වල කොටස් ද ඇතුළත් වන අයුරින් නල මල ප්‍රවාහන පහසුකම් ව්‍යාපෘතියක් ප්‍රධාන රාජ්‍ය ආයතන ඇතුළත්ව ජනගහනය මිලියන 2.2 ඉලක්ක කරගනිමින් හෙක්ටයාර 3400 ක ප්‍රදේශයක් ආවරණය වන පරිදි කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි හීනැටි කුඹුර ප්‍රදේශය සඳහා යෝජනා කර ඇති නමුත්, දීර්ඝ කාලයක සිට එම ව්‍යාපෘතියට මතු වී ඇති මහජන විරෝධතා හමුවේ මේ වන විට එම ව්‍යාපෘතියෙහි ඉදිරි දැක්ම පිළිබද අපැහැදිලිතාවයක් පවතී.

කෙසේ වෙතත්, 2033 වර්ෂයට පුරෝකතනය කරන ලද නේවාසික හා මගී ජනගනයට සාපේක්ෂව බත්තරමුල්ල ඇතුළු කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළට අධි ජනගනයක් ඒකාරාශී වීමේ ප්‍රවණතාවයක් පවතින අතරම එම ප්‍රදේශය තුළට යෝජිත මහල් ගොඩනැගිලි හේතුවෙන් මළ ද්‍රව්‍ය හා අප ජල කළමණාකරන සම්බන්ධයෙන් සංවර්ධන සැලැස්ම තුළින් විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ඒ අනුව මෙම සැලැස්ම මගින් මළ ද්‍රව්‍ය හා අප ජල කළමණාකරනයට විසදුමක් ලෙස මහල් හා බහු මහල් ගොඩනැගිලි ඉදිකිරීමේ දී නව තාක්ෂණික ක්‍රමවේද භාවිතාකරමින් එකී පරිශ්‍ර තුළම මළ ද්‍රව්‍ය හා අප ජල කළමණාකරනයට සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගතයුතු බවත්, ඊට කඩුවෙල මහ නගර සභා සංවර්ධන සැලැස්මෙහි 7 වන හා 8 වන පරිච්ඡේදය මගින් විස්තර කර ඇති පරිදි අදාළ ආයතනය හරහා අවශ්‍ය නිර්දේශ ලබා ගත යුතු බවත් මෙම සැලැස්ම මගින් යෝජනා කෙරේ.

### 6.5.5.3.4 ජල සැපයුම් හා විදුලි සැපයුම් කළමනාකරණය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජල සැපයුම් අවශ්‍යතාවයෙන් 90% ආසන්න ප්‍රතිශතයක් ආවරණය කිරීම ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. 2022 වර්ෂය වන විට ප්‍රදේශය තුළ පැවති සම්පූර්ණ ජල සැපයුම් සබධතා ගණන 84,250 ක් පමණ වූ අතර එය 2032 වර්ෂයේ දී අපේක්ෂිත ජල සැපයුම් ආවරණය 100% දක්වා වැඩිදියුණු කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව 2030 වර්ෂය වන විට ප්‍රදේශයෙහි අපේක්ෂිත දෛනික ජල අවශ්‍යතාවය වන 72490$m^3$ ප්‍රමාණය වැලිවිට ජල සැපයුම් පද්ධතියේ පළමු අදියර ව්‍යාපෘතිය හරහා එම ව්‍යාපෘතියෙහි සමස්ත දෛනික 180,000 $m^3$ ජල සැපයුම තුළින් සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයෙහි පුරෝකථනයන්ට අනුව 2028 පුරෝකථනය සඳහා දෛනික විදුලි ඉල්ලුම - 183.40 MVA වන අතර එය කඩුවෙල මහ නගර සභා සීමාවෙහි අපේක්ෂිත දෛනික විදුලි ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් වේ. තවද 2021 වර්ෂයේ ජූලි මස 08 වන දින අංක 2235/54 සැලසුම් හා පොදු රෙගුලාසි මගින් හරිත ගොඩනැගිලි සහතික ක්‍රමවේදය හරහා පුනර්ජනනීය බලශක්ති භාවිතය ප්‍රදේශය තුළ දිරිමත් කරනු ලැබේ. එහිදී අධි මහල් ආයතනික, සභාධිපත්‍ය ආදී ගොඩනැගිලි සංවර්ධනයේදී හරිත ගොඩනැගිලි ක්‍රමවේදය අනුගමනය කළ යුතු වේ.

### 6.5.5.3.5 සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම

සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ සැලැස්ම මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් ප්‍රදේශය තුළ සමාජීය යටිතල පහසුකම් සංවර්ධනයට අපේක්ෂා කෙරේ. මෙහිදී බත්තරමුල්ල ආයතනික නගරයට අනුරූපීව රෝහල් පරිශ්‍රයෙහි භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන

යෝජනා, කඩුවෙල නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන වයෝවෘද ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ ප්‍රදේශයේ ජීවත්වන වයෝවෘද ජනතාවට දිවා කාලයෙහි විවේකීව ගත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා වන යෝජනා ප්‍රදේශයේ ජීවත්වන සමස්ත ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන යෝජනා,පොදු ප්‍රජා පහසුකම් සංවර්ධනය කිරීම සඳහා වන යෝජනා, හා අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි සංවර්ධනය සඳහා අවශ්‍ය "පොකුරු පාසල්" සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා වන යෝජනා මෙම සැලැස්මට ඇතුළත් කර ඇත.

### 6.5.5.3.5.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: තලංගම රෝහල පරිශ්‍රය වැඩිදියුණු කිරීම

බත්තරමුල්ල, කොස්වත්ත ආයතනික නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ ප්‍රයත්නයෙහි එක් පැතිකඩක් ලෙස මෙම ප්‍රදේශයට දෛනිකව එක් රැස්වන මහජනතාවට අවශ්‍ය සමාජයීය යටිතල පහසුකම් සැපයීම සඳහා බත්තරමුල්ල ආයතනික නගරයට අනුරූපීව තලංගම රෝහල් පරිශ්‍රයෙහි භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත. ඒ අනුව තලංගම රෝහල් අධ්‍යක්ෂතුමාගේ උපදෙස් පරිදි තලංගම රෝහල් පරිශ්‍රයෙහි හදිසි ප්‍රතිකාර ඒකකය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම, ව්‍යායාම මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා රෝහල් පරිශ්‍රය භූ දර්ශනය කිරීම යන ප්‍රතිසංස්කරණ මෙම සැලැස්මෙහි මූලිකාංග ලෙස හඳුනාගෙන ඇත. රූපය 6.24 මගින් තලංගම රෝහල් පරිශ්‍රය ඉදිරිපත් කෙරේ.

රූපය 6.24 : තලංගම රෝහල් පරිශ්‍රය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.5.5.3.5.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානය - අතුරුගිරිය

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි ජීවත්වන වයෝවෘද්ධ ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් ප්‍රවර්ධනය කිරීම අරමුණින් ඔරුවල ප්‍රදේශයෙහි අතුරුගිරිය ප්‍රදේශීය රෝහල පරිශ්‍රය ආසන්නයේ එම රෝහලෙහි සහය ඇතිව වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් සඳහා මෙම ප්‍රදේශයෙහි රජ්‍ය රෝහල් අධ්‍යක්ෂවරුන්ගේ උපදෙස් පරිදි මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත. මෙහිදී කිසිදු භාරකාරීත්වයක් නොමැති අසරණ වැඩිහිටි ප්‍රජාව සඳහා මුල් තැනක් ලබා දෙන අතර එම වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානය සඳහා යෝජිත ප්‍රදේශය වන අතුරුගිරිය ප්‍රදේශීය රෝහලට යාබදව පිහිටි වානේ සංස්ථාව සතු පර්චස් 40කට ආසන්න භූමිය රූපය 6.25 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.25: වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානය සඳහා යෝජිත භූමිය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

මෙම ව්‍යාපෘතියෙහි මූලිකාංග ලෙස වයෝවෘද්ධ ජනතාවට අවශ්‍ය සායනික පහසුකම සැපයීම , සායනික පහසුකම් සැපයීමෙන් අනතුරුව භාරකාරීත්වයක් නොමැතිව අසරණ වූ වයෝවෘද්ධ ජනතාවට ඔවුන්ගේ මරණය තෙක් නේවාසික පහසුකම් ලබාදීම හා අනෙකුත් වයෝවෘද්ධ ජනතාවට අවශ්‍ය දිවා සුරැකුම් හා විනෝදාස්වාද පහසුකම් ලබා දීම හඳුනාගෙන ඇත. යෝජිත වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානයෙහි ස්වභාවය රූපය 6.26 මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 6.26: යෝජිත වැඩිහිටි අතරමැදි සත්කාර මධ්‍යස්ථානයෙහි ස්වභාවය




මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්, 2023

### 6.5.5.3.5.3 උපායමාර්ගික ව්‍යාපෘති 03: වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය - බත්තරමුල්ල

බත්තරමුල්ල ආයතනික නගරයට අනුරූපීව එහි සේවයෙහි නියුතු රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවකයින්ට ඔවුන්ගේ වයෝවෘද දෙමාපියන් ආරක්ෂාකාරීව රැකබලා ගැනීම සඳහා ආයතන ප්‍රවර්ධන කලාපය තුළම වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා වන මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය සංවර්ධන සැලැස්ම මගින් හදුනාගෙන ඇත. කඩුවෙල නගර සභා බල ප්‍රදේශයේ ජීවත්වන වයෝවෘද ජනතාවට දිවා කාලයෙහි විවේකීව ගත කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව බත්තරමුල්ල ආයතනික ප්‍රවර්ධන කලාපය තුළ ළමා දිවා සුරකුම් මධ්‍යස්ථානයට යාබද සෙත්සිරිපාය පරිශ්‍රය තුළ පිහිටි පර්චස් 60ක ට ආසන්න භූමිය මේ සඳහා යෝජනා කර ඇති අතර එය රූපය 6.27 මගින් නිරූපණය කෙරේ. මෙම ව්‍යාපෘතියෙහි මූලිකාංග ලෙස කුඩා පුස්තකාලයක්, සනීපාරක්ෂක පහසුකම්, ගෘහස්ථ ක්‍රීඩා පහසුකම්, ව්‍යායාම මධ්‍යස්ථානයක්, භාවනා මධ්‍යස්ථානයක්, ඇතුළත් පොදු සේවා ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීමට යෝජිත අතර එම ව්‍යාපෘති භූමිය තුළ ගෙවතු වගා භූමියක් ඇතුළත් එළිමහන් උද්‍යානයක් ඉදිකිරීමට මෙම සැලැස්ම මගින් යෝජනා කෙරේ. යෝජිත වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි ස්වභාවය රූපය 6.28 මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 6.27: වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහා යෝජිත භූමිය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

රූපය 6.28 : යෝජිත වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි ස්වභාවය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්, 2023

### 6.5.5.3.5.4 උපායමාර්ගික ව්‍යාපෘති 04: සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශය - කඩුවෙල

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ කඩුවෙල නගරය ආසන්නයේ දැනට අබලන් තත්වයේ සහ අත්හැර දමා ගොඩනැගිලි ඇතුළත් මධ්‍යම බෙහෙත් ශාලාව, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ප්‍රදේශය සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව මෙම ප්‍රදේශය සෞඛ්‍ය සේවා පහසුකම් සපයන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම,

සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්‍යාලය, මධ්‍යම බෙහෙත් ශාලාව සහ අනෙකුත් සෞඛ්‍ය ආශ්‍රිත පහසුකම් සඳහා සේවා ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය හා නිසි භාවිතයට යොමු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා ඉඩම් කළමනාකරණ තාක්ෂණය භාවිතා කරමින් භූමිය ප්‍රශස්ත ප්‍රතිලාභ අත්පත් කර ගැනීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වේ. ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පෞද්ගලික අංශය සමඟ හවුල්කාරීත්වයක් සහිත මූල්‍ය ආකෘතියක් මෙම ව්‍යාපෘතිය මගින් යෝජනා කෙරේ. සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශය සඳහා යෝජිත පර්චස් 130ක ට ආසන්න භූමිය රූපය 6.29 මගින් ඉදිරිපත් කෙරේ.

රූපය 6.29: සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශය සඳහා යෝජිත ප්‍රදේශය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

#### 6.5.5.3.5.5 උපායමාර්ගික ව්‍යාපෘති 05: කොරතොට ශ්‍රී සෝමානන්ද විද්‍යාලයට පහසුකම් සැපයීම

අතුරුගිරිය, නවගමුව, දැඩිගමුව සහ කොරතොට ප්‍රදේශයන් තුල "පොකුරු පාසල්" සංකල්පය ප්‍රවර්ධනය කිරීම සඳහා කොරතොට ශ්‍රී සෝමානන්ද විද්‍යාල පරිශ්‍රය තුළ ගුරු නේවාසික මධ්‍යස්ථානයක් පිහිටුවීම සදහා කලාප අධ්‍යාපන කාර්‍යාලය මගින් යොමු කරන ලද යෝජනාව මෙම සැලැස්මට ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රදේශයෙහි ජීවත්වන ශිෂ්‍ය ප්‍රජාවගේ අධ්‍යාපන සංවර්ධනයක් ඇතිකිරීමට අවධානය යොමු කර ඇත.

භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගික සැලැස්ම මගින් යෝජිත සියලු යෝජනා එක් එක් පාර්ශව ආයතනයන්ගේ සම්පත් දායකයින් විසින් ප්‍රදේශය තුළ අදාළ ක්ෂේත්‍රයන් ආශ්‍රිතව ප්‍රයෝගිකව මුහුණපාන ගැටළු වලට පිළියම් ලෙස ඉදිරිපත් කරන ලද යෝජනා වන අතර එම යෝජනා මෙම සැලැස්ම තුළට ඒකාබද්ධ කිරීම තුළින් ප්‍රදේශයෙහි සමස්ත සංවර්ධනය මෙන්මෙ සංවර්ධන සැලැස්මෙහි දැක්ම සාක්ෂාත් කර ගැනීමට මහත් රුකුලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 6.6 තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම

**හයවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්ම**

**තිරසාර පාරිසරික සංවර්ධනය**

### 6.6.1හැඳින්වීම

තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම ,කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි වැදගත්ම උපායමාර්ගික සැලස්මක් වන අතර, එමගින් හෙවන පරිච්ඡේදය වන සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කරන ලද ගැටළු කිහිපයකට විවිධ උපායමාර්ගික මැදිහත්වීම් ඔස්සේ විසදුම් ලබා දීමට අපේක්ෂා කෙරේ. තිරසාර පාරිසරික වටපිටාවක් පවත්වාගැනීම සුවපහසු ආකර්ශනීය නගරයකට අත්‍යවශ්‍ය අංගයකි. ශීඝ්‍රාචාරයන්ගේ දියුණුවත් සමගම වර්ධනය වූ ජනාවාස හේතුවෙන් ස්වභාවික පරිසරයේ සුවිශේෂීත්වය හා වැදගත්කම වර්තමානය වනවිට හායනය වෙමින් පවතී. තිරසාර පාරිසරික වටපිටාවක් පවත්වාගැනීම තුළින් බොහෝ සෞඛ්‍ය හා පාරිසරික ප්‍රතිලාභ ලබාගත හැකි වේ. එමෙන්ම, කඩුවෙල ප්‍රදේශය තුළ පවතින රැම්සාල් තෙත්බිම් ඒ ආකරයෙන්ම පවත්වාගෙනෙ යාමටත්, ප්‍රදේශය තුළ පවතින වගා කළ හැකි කුඹුරු ඉඩම්, වාණිජ කෘෂිකාර්මික කටයුතු සඳහා යොදාගැනීමත්, තවදුරටත් අනවසර ලෙස තෙත්බිම් ගොඩවීම වළක්වාලමින් ඇතිවිය හැකි ගංවතුර උවදුරු අවම කිරීම හා තෙත්බිම් පොදු විනෝද්වාද කටයුතු සඳහා භාවිතයට අවශ්‍ය උපායමාර්ගික මැදිහත් වීම සිදුකරනු ලබන ආකාරය මෙම සැලසුම තුළින් විස්තර කෙරේ.

### 6.6.2 අරමුණ

තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීම, ගංවතුර ආපදා අවම කිරීම, ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූදර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම හා යෝජිත සංවර්ධන අවශ්‍යතාවයට ගැලපෙන පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු සංවර්ධනය කිරීම මෙම උපායමාර්ගය තුලින් අරමුණු කෙරේ.

### 6.6.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි ඉලක්ක සහ අභිමතාර්ථ සඳහා වන දායකත්වය

කඩුවෙල සංවර්ධන සැලැස්මේ හෙවන ඉලක්කය වන තෙත්බිම් හා ජලාශ්‍රිත දාමයක් තුළින් පිබිදුනු නගරයක අත්දැකීමක් ඇති කිරීම සඳහා සහ දැනට පවතින තෙත්බිම් පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම, තෙත්බිම් වලට හානියක් නොවන ආකාරයට හදුනා ගන්න ලද තෙත්බිම් පොදු විනෝදාස්වාදන කටයුතු සඳහා භාවිත කිරීම සහ කැලණි ගඟ අභිමුඛ කි.මී 4 . පමණ ප්‍රමාණයක් සංවර්ධන කටයුතු වලින් නිදහස් කිරීම යන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම සැලැස්ම තුළින් දායකත්වය සපයනු ලබයි.

තවද මෙම සැලැස්ම ක්‍රියාතමක කිරීම තුළින් නාගරික උද්‍යාන සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස, 0.5km ස්වාරක්ෂක ප්‍රදේශය (සම්මත බලපෑම ප්‍රදේශය) තුළ පවතින දේපල වෙළඳපල වටිනාකම ඉහල යන අතර එය, නේවාසික ඉඩම් සදහා 41% ප්‍රමාණයකින් සහ වාණිජ ඉඩම් සඳහා 77% ප්‍රමාණයකින් ඉහල යනු ඇතැයි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, දේපල කළමනාකරණ හා තක්සේරු අධ්‍යයනාංශය මගින් සිදුකරන ලද සමීක්ෂණයක් මගින් තහවුරු කර ඇත. ඒ අනුව මෙම සැලැස්ම ක්‍රියාතමක කිරීම තුළින්

කඩුවෙල මහ නගර සභා ප්‍රදේශය තුළ සමස්ත ඉඩම් මිල ඉහල යාමේ ප්‍රවණතාවය සහිත භූමි ප්‍රමාණය වර්ග කිලෝ මීටර් 37 ක් පමණ වන බව හඳුනාගෙන ඇත. එසේ ඉඩම් මිල ඉහල යා හැකි ප්‍රදේශ ඇතුළත් සිතියම ඇමුණුම අංක 19 මගින් ඉදිරිපත් කර ඇත.

**6.6.4 විෂය පථය**

තිරසාර පාරිසරික උපායමාර්ගික සැලසුම් රාමුව පහත සඳහන් කරුණු තුළින් සමවිත වේ.

- හරිත ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම
    - ✓ තෙත්බිම් ජාල වර්ගීකරණය
    - ✓ තෙත්බිම් උද්‍යාන සංවර්ධනය
- නිල ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම
    - ✓ ජලාශ්‍රිත ප්‍රදේශ නිරීක්ෂණ සැලැස්ම
- ආපදා කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම
    - ✓ ජලාපවහන හා වාරිමාර්ග ජාල සංවර්ධනය
- පොදු විවෘත අවකාශය කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම
- උරුම සංරක්ෂණ හා කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම

**6.6.4. හරිත ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම**

හරිත ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්මෙහි පළමු උපායමාර්ගය ලෙස තෙත්බිම් ජාල වර්ගීකරණය හැඳින්විය හැකිය. තිරසාර සමාජයීය, ආර්ථික සහ පාරිසරික භාවිතයන් සඳහා කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත් බිම් යොදා ගැනීමත්, ඒවායේ විභවයන් සලකා බලා ජලය රඳවා ගැනීමේ හැකියාව සහ අනෙකුත් පාරිසරික ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමත් එමගින් ප්‍රදේශයේ සිදුවන අනවසර අත්පත් කර ගැනීම් සහ නුසුදුසු භාවිතයන් වැලැක්වීමත් මෙම තෙත්බිම් ජාල වර්ගීකරණයෙහි හා තෙත්බිම් උද්‍යාන සංවර්ධනයෙහි ප්‍රධාන ඉලක්ක වේ. ඒ අනුව තෙත්බිම් ජාල වර්ගීකරණය හා තෙත්බිම් උද්‍යාන සංවර්ධනය පහත අරමුණු මත පදනම් වී ඇත.

- කඩුවෙල මහනගර සභා සීමාව තුල මානව ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන ගංවතුර බලපෑම් අවම කිරීම මගින් පරිසරහිතකාමී නගරයක් ඇති කිරීම.
- විද්‍යාත්මක, පර්යේෂණ සහ අධ්‍යාපනික දැනුවත් කිරීම් සඳහා තෙත්බිම් යොදා ගැනීම.
- ජෛව විවිධත්වය ඉහල නංවමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථා වැඩි කිරීම සඳහා තෙත්බිම් යොදා ගැනීම.
- අනවසර අත්පත්කරගැනීම්, පරිසරයට හානි වන, නොගැලපෙන සහ නුසුදුසු ඉදිකිරීම් මඟින් ප්‍රදේශයට සිදුවන හානිකර බලපෑම අවම කරගැනීම.

### 6.6.4.1 තෙත්බිම් ජාල වර්ගීකරණය

ඒ අනුව පහත පරිදි කඩුවෙල මහනගර සභා බල ප්‍රදේශයේ පවතින තෙත්බිම් කලාප තුනක් යටතේ තෙත්බිම් ජාල වර්ගීකරණය අනුව හදුනාගත හැකිය.

1. තෙත්බිම් වර්ගීකරණය I

මෙම තෙත්බිම් සංරක්‍ෂණ තෙත්බිම ලෙස හදුන්වන අතර ජාත්‍යන්තර සම්මුතියකින්, දේශීය පනතකින් හෝ ගැසට් පත්‍රයක් මගින් තෙත්බිම් ආරක්‍ෂක ප්‍රදේශයක් ලෙස හෝ විශේෂ තෙත්බිම් ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති තෙත් බිම් මේ යටතට ගැනෙන අතර සැලසුම් බල ප්‍රදේශයේ උතුරු දෙසට වන්නට පවතින දියවන්නා ඔය හා පාර්ලිමේන්තුව අවට වගුරුබිම් කොටස් කිහිපයක් වන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අභය භූමිය හා මධ්‍යම පරිසර අධිකාරිය මගින් ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත් කර ඇති තලංගම පාරිසරික තෙත්බිම් පරිසර පද්ධතිය මෙයට අයත් වේ.

1. තෙත්බිම් වර්ගීකරණය II

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීම හා පාලනය කිරීම සඳහා හේතුවන තෙත්බිම් මෙන්ම ජල රැදවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස හදුනාගත් ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ. කඩුවෙල මහ නගර සභා සීමාව තුළ පවතින බොහොමයක් තෙත්බිම් මෙම වර්ගීකරණයට අයත් වේ.

1. තෙත්බිම් වර්ගීකරණය III

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය,ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ මෙන්ම බස්නාහිර පළාත තුළ තෙත්බිම් ආශ්‍රිත කෘෂි කර්මාන්තය සිදු කෙරෙන ප්‍රදේශ මෙම වර්ගීකරණයට අයත් වේ.

ඒ අනුව, එක් එක් වර්ගීකරණයන් ක්ෂේත්‍රය තුළ වැඩිදුරටත් අධ්‍යයනය කිරීමෙන් අනතුරුව කඩුවෙල මහ නගර සභා සීමාව තුළ පවතින යාවත්කාලීන කරන ලද තෙත්බිම් සම්බන්ධයෙන් වන කලාපීකරණය, මාර්ගෝපදේශයන් හා සංවර්ධන නියමතා මෙම සංවර්ධන සැලැස්මෙහි පරිච්ඡේද 7 හා 8 මගින් හදුන්වා දී ඇත.

### 6.6.4.2 තෙත්බිම් උද්‍යාන සංවර්ධනය

කඩුවෙල මහනගර සභා සීමාව තුල නාගරීකරණයත් සමග සිදුවන මානව ක්‍රියාකාරකම් හේතුවෙන් අවධානමට ලක් විය හැකි තෙත්බිම් ජෛව විවිධත්වය ආරක්ෂා කර ගනිමින් පාරිසරික, සංචාරක හා විනෝදාත්මක අවස්ථාවන් සදහා යොදා ගැනීම තෙත්බිම් උද්‍යාන සංවර්ධනය උපායමාර්ගයෙහි මූලික අරමුණ වේ. තවද මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූදර්ශන ලක්ෂණ සංරක්ෂණය කිරීම සහ තීව්‍ර කිරීම ප්‍රධානම අරමුණ වේ. එතුළින් නගරයක පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගත හැකිවේ.

එයට අමතරව පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මගින් විවිධ පරිසර පද්ධති මං මාවත් ආදිය තිරසාර ලෙස භූ දර්ශන ප්‍රදේශ ලෙස සංවර්ධනය මෙම සැලැස්ම මගින් අපේක්ෂිතය. එමගින් කඩුවෙල මහනගර සභාවට අනාගතයේ දී ගෝලීය කාලගුණ විපර්යාස සඳහා මුහුණ දීමට අවශ්‍ය මංපෙත් සලසන තෙත්බිම් උද්‍යාන සංවර්ධන සැලැස්ම පහත අරමුණු අනුව සැකසී ඇත.

1. නාගරික උෂ්ණත්වය වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා තත්ත්වයන් අවම කිරීම සඳහා නාගරික වන ගහනය වර්ධනය කිරීම.
2. නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විවිධත්වයක් සහිතව පරිසරයට එක් කිරීම.
3. පදිකයින් තවදුරටත් දිරිමත් කිරීමට සහ පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු රුක්ෂලතා වලින් සෙවන සැලසෙන ආකාරයට හා ආසන සහිතව ලබාදීම.
4. සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥානවන්ත භාවිතය (Wise use) හඳුන්වා දීම මඟින් තෙත්බිම් තිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනීම.
5. නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරව්‍යුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශ ජනතාව වෙනුවෙන් නිර්මාණය කිරීම .
6. විවිධ උද්‍යාන, මං තීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.

ඒ අනුව ඉහත අරමුණු පෙරදැරි කරගමින් යෝජිත තෙත්බිම් උද්‍යාන සංවර්ධන සැලැස්ම පහත සදහන් උපායමාර්ගික ව්‍යාපෘති වලින් සමන්විත වේ.

#### 6.6.4.2.1 උපායමාර්ගික ව්‍යාපෘති 01: තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය

දියසරු උද්‍යානය ආශ්‍රිතව පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 78 ක භූමි ප්‍රමාණයකින් යුත් තෙත්බිම් ජාලය මෙම තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය සඳහා හඳුනාගෙන ඇති අතර එමගින් තෙත්බිම් උද්‍යාන ජාලයක් හරහා පවතින තෙත්බිම් මහජනතාව සඳහා විවෘත කිරීම හා ප්‍රදේශයෙහි පවතින තෙත්බිම් රෙගුලාසි මාර්ගයෙන් වැඩිදුරටත් සංරක්ෂණය කිරීම මෙම ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය පහත අංගයන්ගෙන් සමන්විත වන අතර ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි මාර්ගෝපදේශයන්ට යටත්ව ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.

- පිවිසුම් දොරටුව හා රථවාහන නැවතුම් ස්ථානය
- සේවා ප්‍රදේශය
- ජල උල්පත් සහිත ජල රැඳවුම් පොකුණ
- පරිසර හිතකාමී තෙත්බිම් බෝට්ටු සවාරිය
- කුරුළු උද්‍යානය හා දුරදක්න පහසුකම් සහිත කුරුළු නැරඹුම් කුළුණු
- සමනල උද්‍යානය
- හදුන් දිවියා සහ කිඹුලන් නැරඹීමේ ස්ථාන (තට්ටු)
- කඳවුරු ගත කිරීම සදහා යෝජිත ස්ථාන
- ඡායාරූප ගත කිරීම සදහා යෝජිත ස්ථාන
- තෙත්බිම් ආපන ශාලාව
- අනතුරු ඇඟවීමේ පද්ධතිය

තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශය ඇතුළත් වින්‍යාස සැලැස්ම රූපය 6.30 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.30: තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශය ඇතුළත් වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.4.2.2. උපායමාර්ගික ව්‍යාපෘති 02: ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යානය

බත්තරමුල්ල දියත උද්‍යානය හා වෝටස්එජ් හෝටල් පරිශ්‍රය ආශ්‍රිතව නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතින හෙක්ටයාර් 32 ආසන්න භූමිය කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය මගින් හඳුනාගෙන ඇති ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යාන ව්‍යාපෘතිය මෙම සැලැස්ම සඳහා ඒකාබද්ධ කර ඇත. ඒ අනුව යෝජිත ඇළ මාර්ගයක් මගින් ලේක් දූපත් දාමය සංවර්ධනය කිරීම, ලෝක මට්ටමේ ක්‍රීඩා ක්‍රියාකාරකම් මෙම යෝජිත ප්‍රදේශය සඳහා හඳුන්වා දීම, සුඛෝපභෝගී ස්වභාවික හෝටල් හඳුන්වා දීම හා තෙත්බිම් උද්‍යාන ස්වභාවධර්මයේ හරයෙන් පොහොසත් කිරීම යන අරමුණු මත පදනම් වී ඇත. එමෙන්ම, මෙම ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් මූලික සැලසුම් නිරාකරණ සඳහා නිකුත් කර ඇති වන මාර්ගෝපදේශන ඇමුණුම් යටතේ යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කර ඇත. යෝජිත ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යාන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම රූපය 6.31 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.31: ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යාන ව්‍යාපෘතියෙහි යෝජිත වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.4.2.3. උපායමාර්ගික ව්‍යාපෘති 03: කඩුවෙල තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානය

ප්‍රදේශය තුළ පවතින තෙත්බිම් වැඩිදුරටත් සංරක්ෂණය කරමින් වැඩි වන නාගරික ජනගහනයට අවශ්‍ය කරන්වූ විනෝදාත්මක පහසුකම් සැපයිම සඳහා ගංගා ආශ්‍රිත නගරයක් ලෙස කඩුවෙල නගරයට අලංකරණයක් එක් කිරීම, අනවසර ලෙස තෙත්බිම් ගොඩකිරීම සීමාකර ප්‍රදේශයෙහි ඇතිවිය හැකි ගංවතුර තර්ජනය අවම කිරීම හා මහජනතාවට ස්වභාවික තෙත්බිම් නිවාඩු නිකේතනයක අත්දැකීම ලබාදෙමින් තෙත්බිම් උද්‍යාන ස්වභාවධර්මයේ හරයෙන් පොහොසත් කිරීම යන අරමුණු පදනම් කරගනිමින් මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය සංවර්ධන සැලැස්මට ඇතුළත් කර ඇති අතර ඒ සඳහා වර්තමානය වන විට අභියෝගයන්ට ලක්ව පවතින කඩුවෙල අතුරුගිරිය හා නව නුවර මාර්ගයට මැදිව ගොඩැල්ල මාර්ගය දෙපස පිහිටි අක්කර 48 ක පුද්ගලික භූමිය පරිසරයෙහි ස්වභාව සුන්දරත්වය බාධා නොවන ආකාරයෙන් තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීම මෙම උපායමාර්ගික ව්‍යාපෘතියෙහි මූලික අරමුණ වේ. ඒ අනුව උක්ත ව්‍යාපෘතිය සඳහා යෝජිත ප්‍රදේශය රූපය 6.32 මගින් හා යෝජිත ආකෘතියෙහි ස්වභාවය රූපය 6.33 මගින් ඉදිරිපත් කෙරේ.

ඒ අනුව, එම භූමිය තුළ රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වයක් සහිත මූල්‍ය ක්‍රමවේදයක් යටතේ පහත නියමතාවයන්ට අනුකූලව පරිසර හිතකාමී නිකේතනයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

- උපරිම බිම් ආවරණය: 20%
- පරිසර හිතකාමී ද්‍රව්‍ය පමණක් භාවිතා කළ යුතුය
- වර්ණ භාවිතයේ දී දීප්තිමත් වර්ණයකට අවසර නැත
- යෝජිත නිර්මාණය පරිසරයට අනුකූල විය යුතු අතර පරිසරයට කිසිම අයුරකින් බාධාවක් නොවිය යුතුය

රූපය 6.32 කඩුවෙල තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

රූපය 6.33 කඩුවෙල තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානය සඳහා යෝජිත ආකෘතියෙහි ස්වභාවය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්

#### 6.6.4.2.4. උපායමාර්ගික ව්‍යාපෘති 04: කොස්වත්ත ජල උද්‍යානය

ප්‍රදේශය තුළ පවතින පාරිසරික වශයෙන් අනූන වූ රැම්සාර් තෙත්බිම් ජාලය කොස්වත්ත ප්‍රදේශය ආශ්‍රිතව අනවසරයෙන් ගොඩකිරීම සීමාකර අධික වර්ෂා සහිත කාලවලදී ඇතිවිය හැකි ගංවතුර තර්ජනය අවම කිරීම මූලික කරගනිමින් මෙම කොස්වත්ත ජල උද්‍යාන ව්‍යාපෘතිය සංවර්ධන සැලැස්ම මගින් හඳුන්වා දී ඇත. ඒ අනුව අනවසර ගොඩකිරීම් සීමාව ඉහළ අගයක් පවතින එකමුතු මාවත හා දුටුගැමුණු මාවත අතර නව නුවර මාර්ගයෙහි දකුණු දිශාවෙහි පවතින  මේවන විට අනවසර ලෙස ගොඩකිරීම ආරම්භ කර පවතින තෙත්බිම් ප්‍රදේශය හා ඒ ආශ්‍රිත තෙත්බිම කොස්වත්ත ජල උද්‍යානය ලෙස සංවර්ධනය කරමින් රැම්සාර් තෙත්බිම් ජාලය ආරක්ෂා කර ගනිමින් එය ආර්ථිකමය වශයෙන් ප්‍රදේශයට ප්‍රතිලාභ අත්පත් කරදීමට අපේක්ෂා කෙරේ. පුද්ගලික අයිතිය සතු දළ වශයෙන්

පර්චස් 500 ආසන්න භූමිය මීට හඳුනාගෙන ඇති අතර ඒ සඳහා යෝජිත භූමිය ඇතුළත් වින්‍යාස සැලැස්ම රූපය 6.34 මගින් නිරූපණය කෙරේ.

රූපය 6.34 කොස්වත්ත ජල උද්‍යානය සඳහා යෝජිත භූමිය ඇතුළත් වින්‍යාස සැලැස්ම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.4.2.5. උපායමාර්ගික ව්‍යාපෘති 05: කඩුවෙල නගර මල් උද්‍යානය

ආර්ථික ශක්‍යතා හා විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගය යටතේ හඳුන්වා දුන් කඩුවෙල ජලාභිමුඛ නගර සංවර්ධන ව්‍යාපෘතියෙහි එන එක් උප ව්‍යාපෘතියක් ලෙස කඩුවෙල නගර මල් උද්‍යානය හැඳින්විය හැකිය.

ඒ අනුව කඩුවෙල නගර මධ්‍යයේ පුද්ගලික හිමිකාරිත්වය සතුව පවතින අක්කර 22 කට ආසන්න තෙත්බිම කඩුවෙල නගර මල් උද්‍යානය ලෙස නම් කර සංරක්ෂණය කිරීම තුළින් ගංගා ආශ්‍රිත නගරයක් ලෙස කඩුවෙල නගරයට අලංකරණයක් එක් කිරීම හා ප්‍රදේශය තුළ ඇතිවිය හැකි ගංවතුර තර්ජනය අවම කිරීම මූලික අරමුණ කර ඇත.

මෙම ව්‍යාපෘතිය මගින් තෙත්බිම වටා වූ මායිම් ප්‍රදේශය හරිත තීරුවක් ලෙස සංවර්ධනය කරමින් නගර උද්‍යානයක පවතින මූලික පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ. ඒ තුළින් තෙත්බිම අනවසර ගොඩකිරීම් හා විනාශ කිරීම් තුළින් වළක්වා ගැනීමට අපේක්ෂිතය. රූපය 6.35 මගින් කඩුවෙල නගර මල් උද්‍යානය සඳහා යෝජිත තෙත්බිම ඉදිරිපත් කෙරේ.

රූපය 6.35: කඩුවෙල නගර මල් උද්‍යානය සඳහා යෝජිත තෙත්බිම




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.4.2.6. උපායමාර්ගික ව්‍යාපෘති 06: දැඩිගමුව නාගරික වන උද්‍යානය

හරිත සංකල්පය යටතේ දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය රෙගුලාසි මාර්ගයෙන් වැඩිදුරටත් සංරක්ෂණය කිරීම අරමුණ කරගනිමින් දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය නාගරික වන උද්‍යානයක් ලෙස සංරක්ෂණය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. ඒ අනුව මෙම ව්‍යාපෘතිය තුළින් පරීක්ෂකයන්ට අවශ්‍ය පාරිසරික පරීක්ෂණ කිරීමට අවකාශය සැලසෙන අතර ඒ සඳහා රක්ෂිත ප්‍රදේශය තුළ බොරළු සහිත ඇවිදීමේ මාර්ගයක් තුළින් දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය තුළට පිවිසීමට හැකියාව හිමිවේ. එමෙන්ම මෙම රක්ෂිත ප්‍රදේශය තුළ වර්ග මීටර් 150 ලී ආපන ශාලාවක් සඳහා පමණක් මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය මගින් අවසර හිමිවේ. දැඩිගමුව නාගරික වන උද්‍යානය සඳහා යෝජිත ප්‍රදේශය රූපය 6.37 මගින් නිරූපණය කරන අතර පරිච්ඡේද 7 හා 8 මගින් ඉදිරිපත් කරන ලද කලාපීකරණ නියමතා මගින් ප්‍රදේශය තවදුරටත් නියාමනය වේ.

රූපය 6.36: දැඩිගමුව රක්ෂිත ප්‍රදේශය සඳහා යෝජිත ආකෘතියෙහි ස්වභාවය



මූලාශ්‍රය: අන්තර්ජාලය ඇසුරෙන්

රූපය 6.37: දැඩිගමුව නාගරික වන උද්‍යානය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

#### 6.6.4.2.7. උපායමාර්ගික ව්‍යාපෘති 07: කැලණි ගඟ රක්ෂිතය භූ දර්ශනය

ජලාධරික ප්‍රදේශ සංරක්ෂණ හා කළමනාකරණය කිරීම තුළින් ජලාධරික ප්‍රදේශ මහජනතාව සඳහා විවෘත අවකාශ ලෙස විවෘත කිරීම හා ප්‍රදේශයෙහි පවතින ජලාධරික ප්‍රදේශ හා ඒ ආශ්‍රිත බාධක කලාපය රෙගුලාසි මාර්ගයෙන් වැඩිදුරටත් සංරක්ෂණය කිරීම යන අරමුණු මුදුන්පමුණුවා ගැනීම සඳහා මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මගින් කැලණි ගඟ සඳහා කිලෝමීටර් 4 ක භූ දර්ශන තීරුවක් යෝජනා කර ඇති අතර එය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ගංවතුර උවදුර අවම කිරීම සඳහා යෝජිත ව්‍යාපෘතිය හා ඒකාබද්ධ සැලැස්මක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. රූපය 6.38 මගින් භූ දර්ශනය සඳහා යෝජිත කැලණි ගඟ රක්ෂිත ප්‍රදේශය නිරූපණය කෙරේ.

රූපය 6.38: භූ දර්ශනය සඳහා යෝජිත කැලණි ගඟ රක්ෂිත ප්‍රදේශය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය හා පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.5 නිල ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම හා ආපදා කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම

ජලාශ්‍රිත ප්‍රදේශ නිරීක්ෂණ සැලැස්ම නිල ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්මෙහි එන පළමු උපායමාර්ගික සැලැස්ම වේ. මෙමඟින් සිදුවිය හැකි ආපදා අවදානම අඩු කිරීමත්, පාරිසරික හිතකාමී ක්‍රියාවලියක් තුළින් ජනාවාස සඳහා ආරක්ෂාව සපයාදීමත් සිදු කෙරේ. මතුපිට ජලය ගලායාම අවම කිරීම ප්‍රධාන අරමුණක් වන අතර, ජලය ගලායන මාර්ග වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයක් තුළින් කැළණි ගඟට එක් වන ජල ප්‍රමාණය අවම කර ගඟ තුළ ප්‍රශස්ථ ජල ධාරිතාවක් පවත්වා ගැනීම මෙම උපාය මාර්ග මඟින් අපේක්ෂා කෙරේ. ඒ අනුව නිල ජාල කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම පහත අරමුණු හා කාර්යයන් පෙරදැරි කරගනිමින් සකස් වී ඇත.

- පහත්බිම් ප්‍රදේශ වල ඉදි කිරීම් කටයුතු අවම කිරීම හා එම ප්‍රදේශයන්හි වැසි ජලය බැසයාමේ නිසි ක්‍රමවේදයන් සකස් කිරීම
- ගංවතුර බාධක බැමි ඉදිකිරීමට සුදුසු ස්ථාන සඳහා නියමිත සැලසුම් සකස් කිරීමට යෝජනා කිරීම
  - ✓ පවතින වේලි හා ඇල මාර්ගවල ජල ගේට්ටු ප්‍රතිසංස්කරණය කිරීම නිසි ක්‍රම වේදයකට අනුව සිදු කිරීම.
  - ✓ හදුනාගත් ඇල මාර්ගවල නව ජල ගේට්ටු ඉදිකර ගඟේ ජලය වැඩි වූ විට ඇල මාර්ග ඔස්සේ ගමන් කිරීමට සිදු කිරීම මගින් දෙපස සිටින ජනතාවට සහ දේපල වලට සිදුවන හානිය වලක්වා ගැනීමට සුදුසු සැලසුම් සකස් කිරීම .
- ගංවතුරට අවදානමට ලක්වන ප්‍රදේශ, එයට ඔරොත්තුදෙන අනුමත භාවිතයන් සඳහා පමණක් යොදා ගැනීම.
- ගංවතුර රැඳවුම් ජලාශ ඉදිකිරීම සඳහා යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
- ජල පෝෂක ප්‍රදේශයන්හි වන වගා කිරීමට සුදුසු ස්ථාන හඳුනා ගැනීම. ගංවතුර අවදානම අඩු කිරීම සඳහා ජල රඳවා ගැනීමේ අවස්ථා වැඩි කිරීම.
  - ✓ තෙත්බිම්/පහත්බිම් වැනි ජලය රදවාගැනීමේ /බැසයාමේ ප්‍රදේශ සංරක්ෂණය කිරීම.
  - ✓ අනවසර ලෙස පහත් බිම් /තෙත්බිම් ගොඩකිරීම තහනම් කිරීම.
- ගංවතුර අවදානම අඩු කිරීම සඳහා ගංගා/ඇළ ඉවුරු වල ශක්තිමත් භාවය වැඩි වන පරිදි ශාක වගා කිරීමට සුදුසු ස්ථාන හඳුනා ගැනීම හා එම ස්ථානයන් හි පරිසර හිතකාමී ශාක වගා කිරීම (උණ ගස්, කුඹුක් ගස්, මී ආදී)
- විධිමත් කලාපීකරණ සැලස්මක් මගින් පිටාර තැනි (flood plain) සඳහා සැලසුම් සකස් කිරීම.
- ප්‍රදේශයේ පවතින ඇළ මාර්ග පිරිසිදු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීමට සුදුසු සැලසුම් සකස් කිරීම.
- ප්‍රදේශය තුළ දැනට පවතින ජල බස්නා කාණු පද්ධතිය විධිමත් සැලසුමකට අනුව ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම.
- ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ලෙස ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම හා ආපදා අවම කිරීමට නව රෙගුලාසි හඳුන්වා දීම.

ඒ අනුව මෙම සැලැස්ම යටතේ ජල ප්‍රදේශ අධීක්ෂණය සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, කැළණි ගඟ ආශ්‍රිතව සුදුසු ස්ථානයන්හි ගංවතුර බාධක බැමි ඉදිකිරීමට සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, හෙට්ටිගේ ඔය ජල පෝෂක ප්‍රදේශය සහ කඩුවෙල නගරය ආශ්‍රිතව ඇතිවන ජල ගැලීම් තත්ත්වය පාලනයට වැසි ජල පොම්පාගාර ස්ථාපිත කිරීම සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, හෙට්ටිගේ ඔය - බෝමිරිය අමුණ, පල්ලේවෙල අමුණ, අඹතලේ ඇළ ආදී පවතින වේලි හා ඇළ මාර්ගවල ජල ගේට්ටු

ප්‍රතිසංස්කරණය කිරීම නිසි ක්‍රම වේදයකට අනුව සිදු කිරීම සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, ප්‍රදේශයේ පවතින කැළණි ගඟ හා සම්බධවන අඹතලේ ඇල, හෙට්ටිගේ ඔය, මහ ඇල යන ජල මාර්ග ගැඹුරු කිරීම, පිරිසිදු කිරීම, විධිමත්ව ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, ප්‍රදේශය තුළ දැනට පවතින ජල බස්නා කාණු පද්ධතිය විධිමත් සැලසුමකට අනුව ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම, ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ලෙස ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම හා ආපදා අවම කිරීමට නව රෙගුලාසි හඳුන්වා දීම සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම මෙම සැලැස්ම යටතේ ඉදිරිපත් කර ඇත.

### 6.6.5.1 ජල ප්‍රදේශ අධීක්ෂණය සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම

වගුව අංක 6.6.1: ජල ප්‍රදේශ අධීක්ෂණය සඳහා වන උපායමාර්ගික මැදිහත් වීම

| අංකය | ඇළ | දිග (කි.මී) | පළල | හිමිකාරිත්වය |
|---|---|---|---|---|
| 1 | හෙට්ටිගෙදෙණිය ඇළ | 2.5 | අඩි 5 | කෘෂිකර්ම දෙපා. |
| 2 | හෙට්ටිගේ ඔය | 2 | මීටර් 5 | වාරිමාර්ග දෙපා. |
| 3 | මොරමුල්ලයාය මැද ඇළ පිට ඇළ | 3.5 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| 4 | බෝවිල ඇළ | 3.5 | අඩි 4 | කෘෂිකර්ම දෙපා. |
| 5 | ඉලුක්මන්ඩිය ඇල | 0.5 | අඩි 2 | කෘෂිකර්ම දෙපා. |
| 6 | රන්වල ඇළ | 0.5 | අඩි 2 | කෘෂිකර්ම දෙපා. |
| 7 | රාමහර ඇළ | 2.43 | අඩි 10 | කෘෂිකර්ම දෙපා. |
| 8 | විලත්ගමුවයාය පිට ඇළ සහ දෙපා ඇළ | 6 | මීටර් 1.5 | කෘෂිකර්ම දෙපා. |
| 9 | මාලබේ නැගෙනහිර පිට ඇළ හා මැද ඇළ | 11 | අඩි 4 | කෘෂිකර්ම දෙපා. |
| 10 | බිබිල ගහමුල්ල දෙපා ඇළ | 2 | මීටර් 1.5 | කෘෂිකර්ම දෙපා. |
| 11 | වාවේයේ ඇළ | 6.5 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| 12 | තලංගම උතුර පිට ඇළ | 0.5 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| 13 | තලංගම උතුර අරිද්දගයාය පිට ඇළ | 2.5 | අඩි 4 | කෘෂිකර්ම දෙපා. |
| 14 | තලංගම උතුර අස්වැද්දුමයාය පිට ඇළ | 1.5 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| 15 | මැද ඇළ, දෙපා ඇළ | - | අඩි 3 | වාරිමාර්ග දෙපා. |
| 16 | පුංගන්වෙලදෙණිය පිට ඇළ | 8 | අඩි 5 | කෘෂිකර්ම දෙපා. |
| 17 | හල්ගහ කුඹුරුයාය පිට ඇළ | | අඩි 6 | |
| 18 | අටපන්දෙණිය පිට ඇළ | | අඩි 7 | |
| 19 | මඩ ඇළ | 3 | අඩි 12 | වාරිමාර්ග දෙපා. |
| 20 | පුවක්ගහදෙණිය පිට ඇළ | 2 | අඩි 5 | කෘෂිකර්ම දෙපා. |
| 21 | දිගාලදෙණිය ඇළ | 3 | අඩි 5 | කෘෂිකර්ම දෙපා. |
| 22 | ගමවෙල පිට ඇළ | 2.5 | අඩි 4 | කෘෂිකර්ම දෙපා. |
| 23 | ඉදිගහමලදෙණිය පිට ඇළ සහ මඩ ඇළ | - | - | - |
| 24 | දොරකඩකුඹුර පිට ඇළ සහ මැද ඇළ | - | - | - |
| 25 | බණ්ඩාරවෙල ඇල්ල | - | - | - |
| 26 | කබල්දෙණිය ඇළ | - | අඩි 6 | - |
| 27 | හීනටිකුඹුර ඇළ | 1.6 | අඩි 6 | කෘෂිකර්ම දෙපා. |

| | | | | |
|---|---|---|---|---|
| **28** | අරංගල මඩවෙල යාය ඇළ | - | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| **29** | ප්‍රනාන්දුගොඩ යාය මැද ඇළ | 0.6 | අඩි 8 | කෘෂිකර්ම දෙපා. |
| **30** | ප්‍රනාන්දුගොඩ යාය පිට ඇළ | 0.7 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| **31** | අමරගොඩයාය පිට ඇළ | 0.65 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| **32** | පට්ටියදෙණියපිට ඇළ | 3 | අඩි 4 | කෘෂිකර්ම දෙපා. |
| **33** | හීටිගේ ඇළ | 1.5 | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| **34** | ඇවරිහේනමඩ ඇළ | 0.6 K | අඩි 3 | කෘෂිකර්ම දෙපා. |
| **35** | මීගහ කුඹුර ඇළ | 0.6 | - | - |

### 6.6.5.2 කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර බාධක බැම් ඉදිකිරීමට සුදුසු ස්ථාන සඳහා නියමිත සැලසුම් සකස් කිරීමට යෝජනා කිරීම

කඩුවෙල මහ නගර සභාවෙහි උතුරු මායිමෙහි පිහිටි කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර බාධක බැම් ඉදිකිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් යෝජිත ව්‍යාපෘතිය ඒකාබද්ධ කරමින් පහත රූපය 6.39 පරිදි කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර බාධක බැම්ම මෙම සැලැස්ම මගින් යෝජනා කර ඇත.

රූපය: 6.39 : කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර බාධක බැම් ඉදිකිරීමට සුදුසු ස්ථාන




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය හා පරිසර භූ දර්ශන අංශය,  නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.5.3 හෙට්ටිගේ ඔය ජල පෝෂක ප්‍රදේශය සහ කඩුවෙල නගරය ආශ්‍රිතව ඇතිවන ජල ගැලීම් තත්ත්වය පාලනයට වැසි ජල පොම්පාගාර ස්ථාපිත කිරීමට යෝජනා කිරීම.

මෙම සැලැස්ම මගින් කඩුවෙල නගරය ආසන්නව පිහිටි හෙට්ටිගේ ඔය ජල පෝෂක ප්‍රදේශය  ආශ්‍රිතව ඇතිවන ජල ගැලීම් තත්ත්වය පාලනයට වැසි ජල පොම්පාගාර ස්ථාපිත කිරීමට යෝජනා කරන ලද අතර එහි පොම්පාගාර වැලිවිට මංසන්ධිය ආශ්‍රිතව, අධිවේගී මාර්ගය හා කඩුවෙල මංසන්ධිය අතර මැදි ප්‍රදේශය ආශ්‍රිතව හා වෙලේ හංදිය මංසන්ධිය ආශ්‍රිතව ස්ථාපිත කිරීමට යෝජනා කරන ලදී. එය රූපය  6.40 මගින් නිරූපණය කෙරේ.

### 6.6.5.4 පවතින වේලි හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම නිසි ක්‍රම වේදයකට අනුව සිදු කිරීම.

මෙහිදී මෙම සැලැස්ම මගින් හෙට්ටිගේ ඔය - බෝමිරිය අමුණ, පල්ලේවෙල අමුණ, අඹතලේ ඇළ ආදී පවතින වේලි හා ඇළ මාර්ගවල ජල ගේට්ටු ප්‍රතිසංස්කරණය කිරීම නිසි ක්‍රම වේදයකට අනුව සිදු කිරීම හා ප්‍රදේශයේ පවතින කැළණි ගඟ හා සම්බන්ධවන අඹතලේ ඇල, හෙට්ටිගේ ඔය, මහ ඇල යන ජල මාර්ග ගැඹුරු කිරීම, පිරිසිදු කිරීම සහ විධිමත්ව ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම. රූපය 6.41 මගින් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ඇළ මාර්ගයන් නිරූපණය කෙරේ.

රූපය 6.40: වැසි ජල පොම්පාගාර ස්ථාපිත කිරීමට යෝජිත ප්‍රදේශ




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය හා පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

රූපය 6.41: ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ඇළ මාර්ගයන් හා ඒවායේ වර්තමාන ස්වභාවය




සැකසුම: කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය හා පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.5.5. ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ආකාරයේ පරිසරයක් නිර්මාණය කිරීම

මෙහිදී ප්‍රදේශය තුළ දැනට පවතින ජල බස්නා කාණු පද්ධතිය විධිමත් සැලසුමකට අනුව ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම හා ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ලෙස ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම හා ආපදා අවම කිරීමට නව රෙගුලාසි හඳුන්වා දීම ප්‍රදේශය තුළ පවතින ආපදා කළමණාකරනය කිරීමේ තවත් උපායමාර්ගික ක්‍රමවේදයක් වේ. රූපය 6.42 මගින් ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ලෙස ගොඩනැගිලි සැලසුම් නිර්මාණය කිරීම සඳහා වන එක් උදාහරණයක් ඉදිරිපත් කෙරේ.

විශේෂයෙන්ම යෝජිත කලාපීකරණය තුළින් කැළණි ගංගාව ආශ්‍රිතව නිරන්තරයෙන් ජල ගැලීම් වලට ලක් වන ප්‍රදේශයන් තුළ මහල් නිවාස සඳහා දිරිගන්වන අතර එහිදී එවැනි ගොඩනැගිලි සැලසුම් තුළින් ආපදා මගින් සිදුවිය හැකි අවදානම අවම කිරීමට මග පාදනු ලැබේ.

රූපය 6.42 : ජල ගැලීම් අවස්ථාවන්ට ඔරොත්තු දෙන ආකාරයට නිර්මාණය කරන ලද ගොඩනැගිලි සැලසුම්




මූලාශ්‍රය: අන්තර් ජාලය ඇසුරෙන්, 2023

### 6.6.6.පොදු විවෘත අවකාශය කළමනාකරණ උපායමාර්ගික සැලැස්ම

කඩුවෙල මහ නගරසභා බල ප්‍රදේශය තුළ 2033 වන විට ජනගහනය 454,614 ලෙස පුරෝකථනය කර ඇත. ඒ අනුව 2033 වන විට පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර් 227 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. කඩුවෙල මහ නගරසභා බල ප්‍රදේශයේ වසර 2023–2033 සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම වගු අංක 6.6.2 දක්වා ඇත. මෙම සැලසුම සඳහා අනුමත භාවිතයන් වගු අංක 6.6.3 යටතේ දක්වා ඇත .

වගුව අංක 6.6.2: කඩුවෙල මහ නගරසභා බල ප්‍රදේශය යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (Ha) |
|---|---|---|
| 01. | යෝජිත අසල උද්‍යාන (Proposed Local Parks (PLP) | 1.25 |
| 02. | යෝජිත වන උද්‍යාන (Proposed Forest Parks (PEP) | 71.76 |
| 03. | යෝජිත තෙත්බිම් උද්‍යාන (Proposed Wetland Parks (PWP) | 165.22 |
| 04. | යෝජිත රේඛීය උද්‍යාන (Proposed Linear Parks (PLiP) | 13.94 |
| | **එකතුව** | **252.17** |
| | **පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය (Existing PORS)** | **29.83** |
| | **සමස්ත එකතුව** | **282.00** |

සැකසුම: පරිසර හා දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

නාගරික සංවර්ධන අධිකාරියේ සම්මතයන්ට අනුව පවතින භූමි ප්‍රමාණය විවේක හා විනෝද කටයුතු සඳහා ප්‍රමාණවත් නොවීම හා කඩුවෙල මහ නගරසභා බල ප්‍රදේශයට අයත් බොහෝමයක් ප්‍රදේශ වැඩි ඉඩකඩ ප්‍රමාණයකින් යුතු ගෙවතුවලින් සමන්විතවීම නිසා වසර 2033වන විට සපුරාගත යුතු භූමි අවශ්‍යතාවය සඳහා පවතින පහත් බිම් ප්‍රදේශ අවිධිමත් ලෙස ක්‍රීඩා කටයුතු සඳහා යොදා ගැනීමට මෙමගින් යෝජනා කෙරේ. ප්‍රදේශය පුරා විහිදුණු දර්ශණීය මං පෙත් සහ දර්ශණීය ස්ථාන තෙත්බිම් ආශ්‍රිතව බහුලව හඳුනාගත හැකි බැවින් එම ස්ථාන ද මේ සඳහා භාවිතා කිරීමට යෝජනා කෙරේ. අවිධිමත් ලෙස ජල ක්‍රීඩාවේ යෙදිය හැකි ස්ථාන,

අලංකාර ජලජ පුෂ්පයන්ගෙන් සමන්විත ජලජ ශාක සහ සත්ත්ව විශේෂ සහිත පොකුණු, සුරතල් මසුන් ඇතිකරන මධ්‍යස්ථාන ආදිය ද කඩුවෙල, අතුරුගිරිය ආශ්‍රිත අභ්‍යන්තර ප්‍රදේශවල හඳුනාගත හැකි බැවින් එම ස්ථාන ද මේ සඳහා යොදාගත හැකිය.

සංස්කෘතික උත්සව, සාහිත්‍ය කටයුතු, ප්‍රදර්ශන සහ ත්‍යාග ප්‍රදානෝත්සව ආදිය සඳහා බත්තරමුල්ල "අපේ ගම" පරිශ්‍රය වැනි ස්ථාන යොදා ගැනීමට යෝජනා කෙරේ.

### 6.6.6.1 පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබද අවකාශීය සැලැස්ම (PORS) සඳහා උපායමාර්ග

1. කැළණි ගඟ රක්ෂිත ප්‍රදේශය, ඇල රක්ෂිත ප්‍රදේශ සහ පවතින හා යෝජිත මාර්ග දෙපස රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම.
2. කැළණි ගඟ ආශ්‍රිත දිය නෑම සඳහා පවතින තොටුපල ප්‍රදේශ ප්‍රති සංවර්ධනය කිරීමත්, එවැනි ස්ථාන හඳුනාගෙන විධිමත් ලෙස සංවර්ධනය කිරීම.
3. ප්‍රතිසංවර්ධනය කළයුතු දැනට පවතින පොදු ක්‍රීඩාංගන, මහජනයා රැස්වන ස්ථාන හා ළමා උද්‍යාන ප්‍රතිසංවර්ධනය කිරීම.
4. යෝජිත පොදු එළිමහන් විවේක විනෝද කටයුතු සැලැස්මෙන් හඳුනාගන්නා ලද ස්ථාන ආශ්‍රිතව ඉතා කුඩා උද්‍යාන, කුඩා උද්‍යාන, ප්‍රාදේශීය උද්‍යාන, ප්‍රජා උද්‍යාන, නගර උද්‍යාන, මධ්‍ය නගර උද්‍යාන, රේඛීය උද්‍යාන, තෙත්බිම් උද්‍යාන ස්ථාපනය කිරීම.
5. දර්ශණීය මංපෙත් හා පරිසර සංවේදී ප්‍රදේශ සඳහා මාර්ගෝපදේශ සැකසීම.
6. සුවිශේෂී ලක්ෂණ සහිත දර්ශනීය ප්‍රදේශ (දැඩිගමුව කන්ද, තෙත්බිම් ප්‍රදේශ) හඳුනාගෙන පොදු ජනතාවට එම ස්ථාන නැරඹීම සඳහා ප්‍රවේශ මාර්ග ඇති කිරීම.
7. දර්ශනීය ස්ථාන අවහිර කර ඇති ඉදිකිරීම් ඉවත්කර එම ස්ථාන ඉදිකිරීම්වලින් තොර කලාපයක් ලෙස පවත්වාගෙන යාම සඳහා මාර්ගෝපදේශ සැකසීම.
8. දර්ශනීය ස්ථාන හා සම්බන්ධ පාරිසරික වශයෙන් වැදගත් ස්වභාව සම්පත් (ජලදේහ, කඳුවැටි, දියදහරා) ඒවායේ විභවතාවය අනුව නාගරික ජනතාවගේ විවේක හා විනෝද කටයුතු අවශ්‍යතා සපුරාලීම සඳහා සුදුසු ලෙස සංවර්ධනය කිරීම.
9. ඉඩම් අනු බෙදීම්වල දී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් විවේක හා විනෝද කටයුතු පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.
10. බත්තරමුල්ල, පැලවත්ත,මාලබේ,කඩුවෙල,අතුරුගිරිය නගර සඳහා භූ දර්ශන අලංකරණ සැලසුම් සකස් කිරීම
11. මාර්ග දෙපස රුක් රෝපණය කිරීම

| | | |
|---|---|---|
| PTPR 1 | කොල්ලුපිටිය - ශ්‍රී ජයවර්ධනපුර (A00) | 0.22 Km |
| PTPR 2 | කොළඹ - හංවැල්ල ලෝ ලෙවල් මාර්ගය (AB10) | 11.48 Km |
| PTPR 3 | බත්තරමුල්ල - පන්නිපිටිය (B047) | 3.49 Km |
| PTPR 4 | කඩුවෙල - අතුරුගිරිය (B174) | 9.50 Km |
| PTPR 5 | කෝට්ටේ - බෝපේ (B240) | 12.96 Km |
| PTPR 6 | මාලබේ - කඩුවෙල (B263) | 5.61 Km |
| PTPR 7 | පනාගොඩ - හේන්පිට (B354) | 1.06 Km |
| PTPR 8 | වල්ගම - අතුරුගිරිය (B451) | 1.20 Km |
| PTPR 9 | වල්ගම - දියගම (B452) | 0.67 Km |
| PTPR 10 | වැලිකඩ - කොහිලවත්ත (B469) | 1.10 Km |
| PTPR 11 | පැලවත්ත පිවිසුම් මාර්ගය (B533) | 0.88 Km |

වගු අංක 6.6.3 : පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබද අවකාශීය සැලැස්ම (PORS)

| **අනු අංකය** | **උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගය** | **ප්‍රමාණය (ha)** | **වර්තමාන භාවිතය** | **යෝජිත භාවිතය** | **ග්‍රාම නිලධාරී කොට්ඨාසය** |
|---|---|---|---|---|---|
| **යෝජිත අසල උද්‍යාන - Proposed Local Parks (PLP)** | | | | | |
| 01. | $PLP_1$ | 1.25 | | අසල උද්‍යානය | බොරළුගොඩ,තල්දියාවල |
| | **උප එකතුව** | **1.25** | | | |
| **යෝජිත නාගරික වන උද්‍යාන - Proposed Urban Forest Parks (PCP)** | | | | | |
| 02. | $PUFP_1$ | 71.76 | කදු ප්‍රදේශය | නාගරික වන උද්‍යාන | දැඩිගමුව |
| | **උප එකතුව** | **71.76** | | | |
| | | | | | |
| **යෝජිත රේඛීය උද්‍යාන - Proposed Linear Parks (PLiP)** | | | | | |
| 03. | $PLi.P_1$ | 13.94 | කැළණි ගඟ රක්ෂිත ප්‍රදේශය (15m) | රේඛීය උද්‍යාන | වැලිවිට, රග්ගහවත්ත, හේවාගම, කඩුවෙල, පහළ බෝමිරිය, ඉහළ බෝමිරිය, වැකෙවත්ත, නවගමුව, රණාල |
| | **උප එකතුව** | **13.94** | | | |
| **යෝජිත තෙත්බිම් උද්‍යාන - Proposed Wetland Parks (PWP)** | | | | | |
| 04. | $PWP_1$ | 1.97 | | තෙත්බිම් උද්‍යාන | තලංගම උතුර , මුත්තෙට්ටුගම |
| 05. | $PWP_2$ | 5.44 | | තෙත්බිම් උද්‍යාන | රජමල්වත්ත |
| 06. | $PWP_3$ | 7.96 | | තෙත්බිම් උද්‍යාන | හේවාගම , කඩුවෙල |
| 07. | $PWP_4$ | 12.06 | වගුරුබිම්, මැටිවලවල් | තෙත්බිම් උද්‍යාන | රණාල |
| 08. | $PWP_5$ | 16.06 | | තෙත්බිම් උද්‍යාන | වැලිවිට |
| 09. | $PWP_6$ | 17.78 | | තෙත්බිම් උද්‍යාන | කලපලුවාව,වල්පොල,කොටුවේගොඩ |
| 10. | $PWP_7$ | 19.04 | | තෙත්බිම් උද්‍යාන | කලපලුවාව |
| 11. | $PWP_8$ | 22.6 | | තෙත්බිම් උද්‍යාන | පහළවෙල |
| 12. | $PWP_9$ | 27.46 | | තෙත්බිම් උද්‍යාන | කඩුවෙල,මාලබේ නැගෙනහිර |
| 13. | $PWP_{10}$ | 34.85 | | තෙත්බිම් උද්‍යාන | තුන්අඳහේන |
| | **උප එකතුව** | **165.22** | | | |
| | **මුළු එකතුව** | **252.17** | | | |

සැකසුම: පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

වගු අංක 6.6.4 : **පොදු එළිමහන් විවේක හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS) සඳහා වන අනුමත භාවිතයන්**

| **අංකය** | **උද්‍යාන වර්ගය** | **ප්‍රමාණය** | **අනුමත භාවිතයන්** |
|---|---|---|---|
| 01. | අසල උද්‍යාන (Local Parks) | හෙක්ටයාර 1.0 – 3.0 අතර (අක්කර 2.5 – 7.5) | • පාපන්දු ක්‍රීඩාංගනයක් සමඟ ළමා උද්‍යානයක්<br>• විවේක ගත හැකි ඇවිදිමත් ස්ථාන<br>• කුඩා වන උද්‍යාන<br>• පුහුණු ධාවනපථ |
| 02 | වන උද්‍යාන (Forest Parks) | | • අධ්‍යාපන හා පර්යේෂණ කටයුතු<br>• පාරිසරික අධ්‍යාපනික චාරිකා<br>• කඳවුරු ගැසීම්<br>ආරක්ෂක කුටි |
| 03. | තෙත්බිම් උද්‍යාන (Wetland Parks) | හෙක්ටයාර 4ට වැඩි (අක්කර 10 වැඩි) | • තෙත්බිම් ස්වභාවික උද්‍යාන - Wetland Nature Parks |

| | | | |
|---|---|---|---|
| | | | • ස්වභාවික මංතීරු - Nature trails<br>• පරිසර හිතකාමී ගිමන්හල් (වර්ග අඩි 1200) – Ecofriendly Rest huts<br>• සක්මන් තීරු - Walkways<br>• විනෝද චාරිකා - Picnicking<br>• කඳවුරු - Camping<br>• ක්ෂේත්‍ර අධ්‍යයන මධ්‍යස්ථාන/ තොරතුරු මධ්‍යස්ථාන - Field study/ Information Center<br>• කුඩා සම්මන්ත්‍රණ ශාලා (වර්ග අඩි 1500)- Mini Conference Halls<br>• ආරක්ෂක කුටි - Security huts |
| 04. | රේඛීය උද්‍යාන (Linear Parks) | පවතින ගඟ/ඔය/ඇල/ මාර්ග රක්ෂිත අනුව රේඛීය උද්‍යාන තීරණය වේ. | • ඇවිදින මංතීරු<br>• ව්‍යායාම කිරීමට ස්ථාන<br>• පාපැදි මංතීරු<br>• ස්වභාවික මංතීරු<br>මංසන්ධි උද්‍යාන (Nodal Parks) |

සැකසුම: පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

**සිතියම් අංක 6.6. කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම**




සැකසුම: පරිසර භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 6.6.7 උරුම සංරක්ෂණ හා කළමනාකරණ උපාය මාර්ගික සැලැස්ම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පවතින පුරාවිද්‍යා ස්ථාන එකී පුරාවිද්‍යාත්මක වටිනාකම ආරක්ෂා කර ගනිමින් වක්‍ර විනෝදාස්වාද අවකාශයන් ලෙස සංවර්ධනය කිරීම මෙම සැලැස්ම මගින් අරමුණු කෙරේ. ඒ අනුව පහත උපායමාර්ගික මැදිහත්වීම් මෙම සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇත.

- සංස්කෘතික, ඓතිහාසික සහ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්වන කොරතොට රජමහා විහාරය, නවගමුව කටාරම් ලෙන , නවගමුව දේවාලය කොතලාවල සන්බපිටිටි විහාරය ,ආඳාදොළ කන්ද යන ස්මාරක පමණක් පුරාවිද්‍යාත්මක ක්‍රමවේද යටතේ සංරක්ෂණය කිරීම.
- කොරතොට රජමහා විහාරය හා නවගමුව දේවාලය යන සංරක්ෂණය කරන ලද ස්මාරක නිසි පරිදි නඩත්තු කිරීම මගින් සංචාරක ආකර්ශනය ඇතිකිරීම
- ඓතිහාසික හා සංස්කෘතික පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව දැනුවත් භාවයක් ඇති කිරීම සහ ස්මාරක ජාල ගත කිරීම (Connectivity) මගින් දේශීය හා විදේශීය සංචාරක වැඩසටහන් ප්‍රවර්ධනය කර ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබා ගැනීමට කටයුතු කිරීම.
- නවගමුව දේවාලයේ ලී කැටයම් හා අනෙකුත් ස්මාරක,කොතලාවල සන්බපිටිටි විහාරයේ චිත්‍ර හා ලී කැටයම් සංරක්ෂණය හා විද්‍යාත්මක පර්යේෂණ මත පදනම් වූ උරුමයන් රැක ගැනීම.
- රන්කඩු පත්තිනි දේවාලයේ හා නවගමුව පත්තිනි දේවාලයේ නරඹන්නන් සඳහා යටිතල පහසුකම් වැඩි කිරීම සහ විධිමත් වෙළඳ කටයුතු (replica අනුරූහල්) වැඩි දියුණු කිරීම මගින් ජාතික ආර්ථිකයට වටිනාකමක් ලබා ගැනීම.
- පවතින ස්මාරක පුරාවිද්‍යාත්මක ඓතිහාසික සහ සංස්කෘතික වටිනාකම රැකෙන පරිදි සංරක්ෂණය කිරීම මගින් ආර්ථික හා සමාජීය අවශ්‍යතාවයන්ට ලඟාකර ගැනීමට ප්‍රතිසංවර්ධනය කිරීම (සිහිවටන ඡායාරූප මගින්). (උදා: නවගමුව දේවාලය හා කොරතොට විහාරය)
- සංචාරක ආකර්ෂණය වැඩි ස්මාරක සංචාරක මණ්ඩලයේ සංචාරක මාර්ගෝපදේශ සැලැස්මට (Tourism Guide Plan) ඇතුලත් කිරීම. ( උදා : කොරතොට විහාරය හා බැළුම්ගල , ආදා දොළ කන්ද , නවගමුව දේවාලය ,)
- පුරා විද්‍යා ස්ථාන, ස්මාරක හා වංචල පුරාවස්තු ප්‍රදර්ශනය කිරීම.
- ප්‍රකාශන, සමුළු දේශන හා සම්මන්ත්‍රණ මගින් ජනතාව සිසුන් දැනුවත් කිරීම. (අන්තර් ජාලය ඇතුළු සන්නිවේදන ක්‍රම ඔස්සේද මෙය කළ හැකිය )

#### 6.6.7.1 අපේගම පරිශ්‍රය ප්‍රතිනිර්මාණය කිරීම

මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ එක් නියමු ව්‍යාපෘතියක් ලෙස අපේ ගම පරිශ්‍රය අතීත සංස්කෘතිය විදහාපාන භෞතික වාස්තු විද්‍යාවෙන් සමන්විත සංස්කෘතිකාංග වලින් සපිරුණු ප්‍රදේශයක් නිර්මාණය කිරීම හැදින්විය හැකිවේ. එහි ව්‍යාපෘති සංකල්පය ලෙස පුරාණ රාජධානිය නව රාජධානිය සමග ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාවේ පුරාණ ගමක ගතිලක්ෂණ නව ආරයකින් ප්‍රතිනිර්මාණය කිරීම පෙන්වා දිය හැකිවේ. නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 25 කින් යුතු භූමිය තුළ අක්කර 8 රූඩ් 1 පර්චස් 14.97

භූමියක් තුළ අපේගම පරිශ්‍රය රූපය 6.43 ඇතුළත් මූලිකාංග සහිතව ප්‍රතිනිර්මාණය කිරීමට යෝජනා කර ඇති සැලැස්ම මෙම උපායමාර්ගය හා ඒකාබද්ධ කරගෙන ඇත.

රූපය 6.43: අපේගම පරිශ්‍රය සඳහා යෝජිත නව ආකෘතිය




එමෙන්ම මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ යෝජිත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම, එම අවස්ථාවේ දී යෝජිත භූමියෙහි පවතින ස්වභාවය අධ්‍යයනය කර, මෙම සැලැස්ම මගින් ව්‍යාපෘති සඳහා යෝජිත මූලිකාංග නොවනස්වන ආකාරයට වින්‍යාස සැලැස්ම පාරිසරික හානියකින් තොරව කාලෝචිතව වෙනස් කිරීමෙහි හැකියාව අදාළ නගරනිර්මාණ ශිල්පීන් සතු වන අතර එහිදී එම එක් එක් ව්‍යාපෘතියට අදාළව ශක්‍යතා අධ්‍යයනයක් හා ආපදා අවමකිරීමේ සැලැස්මක් සකස් කර, ඊට අනුකූලව එකී ව්‍යාපෘතිය කාලෝචිතව ක්‍රියාත්මක කළ හැකිද යන්න විස්තරාත්මකව විශ්ලේෂණය කර ක්‍රියාවට නැංවීම සිදුකළ යුතුය.

## 6.7 ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

**හයවන පරිච්ඡේදය**

**සංවර්ධන සැලැස්ම**

**ජනාවාස සංවර්ධනය**

### 6.7.1 හැඳින්වීම

ජනාවාස සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම, කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි වැදගත්ම උපාය මාර්ගික සැලස්මක් වන අතර, එමගින් හෙවන පරිච්ඡේදය වන සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යටතේ සවිස්තරාත්මකව විග්‍රහ කරන ලද ගැටළු කිහිපයකට විවිධ උපායමාර්ගික මැදිහත්වීම් ඔස්සේ විසදුම් ලබා දීමට අපේක්ෂා කෙරේ. තවද, ප්‍රදේශයකට සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේදී එහි වෙසෙන මහජනතාව කෙරෙහි වැඩි අවධානයක් යොමු කර යුතු අතරම ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට උචිතව සකසන ලද සංවර්ධන සැලැස්ම වඩාත් ප්‍රයෝගික වේ. සංවර්ධන සැලැස්ම තුළින් ප්‍රජාවට අවශ්‍ය නේවාසික පහසුකම් මෙන්ම නේවාසික ප්‍රදේශ සඳහා අවශ්‍ය වන භෞතික, සමාජීය යටිතලපහසුකම් හා පොදු සේවා පහසුකම් සඳහා ඉඩ ප්‍රස්තාව සැලසීම, මෙම සැලැස්මෙහි අත්‍යවශ්‍ය කර්තව්‍යක් ලෙස හඳුනාගත හැකිය. එමෙන්ම, උසස් තත්වයේ නිවාස හා ජනාවාස පහසුකම් තුළින් ඉහළ ඉල්ලුමක් නිර්මාණය කරමින් වර්තමානයේ නගර තුළට ජනතාව ආකර්ෂණය කරගනී. එකලොස්වන තිරසාර සංවර්ධන ඉලක්කය වන “ධරණීය නගර හා ජනාවාස” යන ගෝලීය ඉලක්කය පිළිබඳව සැලකීමේදී, එමගින් විශේෂ අවධානය ගුණාත්මක නිවාස සැපයීම, නගර හා ජනාවාස සමස්ත ජනතාව සඳහා අනුකූල වීම, ආරක්ෂා සහිත වීම, ප්‍රත්‍යස්ථ වීම සහ තිරසාර වීම යන කරුණු කෙරෙහි අවධානය යොමු කර ඇත.

### 6.7.2 අරමුණ

සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය යටතේ හඳුනාගත් ගැටළු සඳහා අවශ්‍ය විවිධ උපායමාර්ගික මැදිහත්වීම් ඔස්සේ විසදුම් ලබා දෙමින්, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම ජනාවාස සංවර්ධන උපාය මාර්ගයේ ප්‍රධාන අරමුණ ලෙස හඳුනාගත හැකිය. ඒ තුළින් ප්‍රදේශයේ සියලු නේවාසික ජනතාවට අවශ්‍ය භෞතික, සමාජීය යටිතලපහසුකම් හා පොදු සේවා පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් සුවපහසු නේවාසික වටපිටාවක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

### 6.7.3 කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033 හි අරමුණු සහ පරමාර්ථ සඳහා වන දායකත්වය

කඩුවෙල සංවර්ධන සැලැස්මේ සිව්වන ඉලක්කය වන කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන් සඳහා ජීවත් වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම යන ඉලක්කය සාක්ෂාත් කරගැනීමේ ලා යෝජිත ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම සෘජුවම දායක වේ.

### 6.7.4 විෂය පථය

ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම පහත සඳහන් කරුණු වලින් සමන්විත වේ.

1. නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන කලාප හඳුනාගැනීම. (නේවාසික කලාප ප්‍රවර්ධන සැලැස්ම)
2. නේවාසික කලාපය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් සැපයීම සඳහා කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම

### 6.7.5 නේවාසික යෝග්‍යතාවය අනුව ජනාවාස ප්‍රවර්ධන කලාප හඳුනාගැනීම. (නේවාසික කලාප ප්‍රවර්ධන සැලැස්ම)

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා යෝජිත නේවාසික කලාප ප්‍රවර්ධන සැලැස්ම හරහා විශේෂිත නේවාසික කලාපය ඇතුළු කලාප තුනක් (අධි ඝනත්ව නේවාසික කලාපය, හාඅ අඩු ඝනත්ව නේවාසික කලාපය) නේවාසික සංවර්ධනයන් සඳහා ප්‍රමුඛ කලාපයන් ලෙස හඳුනා ගෙන ඇත. ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ හඳුනාගැනීමේ ප්‍රධාන නිර්ණායක ලෙස නේවාසික සංවර්ධනය සඳහා වන යටිතල පහසුකම්වල සුලබතාවය, ස්වභාවික උවදුරුවලින් තොර කලාපයක් වීම තුළින් නේවාසික සංවර්ධනය සඳහා වන යෝග්‍යතාවය හා නේවාසික සංවර්ධනය සඳහා වන වෙළඳපළ ප්‍රවණතාවය යන කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන ලදී.

මෙසේ කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ නේවාසික යෝග්‍යතාවයට සුදුසු ප්‍රදේශ ලෙස ගංවතුර අවධානම් ප්‍රදේශ, පාරිසරික සංවේදී ප්‍රදේශ හා කාර්මික ප්‍රදේශ හැර සෙසු සියළුම ප්‍රදේශ නේවාසික යෝග්‍යතාවයට සුදුසු ප්‍රදේශ ලෙස සැලසුම්මය වශයෙන් තහවුරු වී ඇත. කෙසේ නමුත් මෙම ප්‍රදේශ තුළ පවතින ප්‍රමුඛ ලක්ෂණ, නේවාසික සංවර්ධනය සඳහා වන වෙළඳපළ ප්‍රවණතාවය සහ නේවාසික අවශ්‍යතාව ද සැලකිල්ලට ගනිමින් පහත ආකාරයට කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ නේවාසික කලාපයන්, නේවාසික කලාප ප්‍රවර්ධන සැලැස්ම තුළින් හඳුන්වා දී ඇත.

වගු අංක 6.7.1 යෝජිත ජනාවාස ප්‍රවර්ධන ප්‍රදේශ

| අනු අංකය | නේවාසික කලාපය | සමස්ත ග්‍රාම නිලධාරි ප්‍රදේශ හා ග්‍රාම නිලධාරි ප්‍රදේශයන් හි කොටස් |
|---|---|---|
| 01 | විශේෂිත නේවාසික කලාපය | බත්තරමුල්ල උතුර, බත්තරමුල්ල දකුණ, පහලවෙළ, කුමාරගේවත්ත, රජමල්වත්ත, ආසිරි උයන, අරුප්පිටිය |
| 02 | අඩු ඝනත්ව නේවාසික කලාපය | වල්පිට, අතුරුගිරිය, බටේවෙල, දැඩිගමුව, ඇඹිල්ලදෙණිය, කොරතොට, කොතලාවල, නවගමුව, ඔරුවල, පහළ බෝමිරිය බී, පෝරේ, රණාල, ශාන්තලෝකාගම, තුන්අදහේන, වැලිහින්ද, වැලිපිල්ලෑව |
| 04 | අධි ඝනත්ව නේවාසික කලාපය | අරංගල, හෝකන්දර නැගෙනහිර, හෝකන්දර උතුර, කලපළුවාව, කොටුවේගොඩ, කුමාරගේවත්ත, මාලබේ බටහිර, මාලබේ නැගෙනහිර, මාලබේ උතුර, මුත්තෙට්ටුගොඩ, පෝරේ, පොතුඅරාව, සුභූතිපුර, තලාහේන උතුර, තලාහේන දකුණ, තලංගම උතුර ඒ, තලංගම උතුර බී, තුන්අදහේන, වල්පොළ, අරුප්පිටිය, බටපොත, ඇවරිහේන, ජයවඩනගම, කුමාරගේවත්ත, මුත්තෙට්ටුගොඩ, පොතුඅරාව, සුභූතිපුර, තලංගම උතුර ඒ, උඩුමුල්ල, වල්පොළ, වික්‍රමසිංහපුර |

සැකසුම: : කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

සිතියම් අංක 6.7 කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ යෝජිත ජනාවාස ප්‍රවර්ධන කලාප




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

### 6.7.6. නේවාසික කලාපය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් සැපයීම සඳහා කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම

කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් සැපයීම සඳහා කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කිරීම මෙම සැලසුමෙහි මූලික අරමුණයි. මෙම ප්‍රදේශය තුළ ජීවත්වන ජනතාවට වඩා සුවපහසු ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මූලික පහසුකම් වන වෙළඳෙළඳ මධ්‍යස්ථාන, ආදී මූලික යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා සකසා ඇති මෙම සැලැස්මෙහි කොරතොට හා අරංගල මංසන්ධි සේවා මධ්‍යස්ථාන ලෙස ප්‍රවර්ධනය කරනු ලබන ආකාරය පහත පරිදි විස්තර කෙරේ.

#### 6.7.6.1.උපායමාර්ගික ව්‍යාපෘති 01: අරංගල මංසන්ධි සංවර්ධනය

මෙම ව්‍යාපෘතිය කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන්ට හා මගී ජනතාවට අවශ්‍ය ආරක්ශිත ලෙස පදික පහසුකම් වැඩිදියුණු කිරීම, නගර මධ්‍ය සංවර්ධනය, සමාජීය යටිතල පහසුකම් හා විනෝදකාමී පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත. රූපය 6.44 මගින් අරංගල මංසන්ධියේ යෝජිත සංවර්ධනය නිරූපණය කෙරේ.

රූපය 6.44: අරංගල මංසන්ධි සංවර්ධනය




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

මෙම ව්‍යාපෘතිය තුළ යෝජිත අංග ලෙස පහත මූලිකාංග පෙන්වා දිය හැකි අතර එම උප ව්‍යාපෘති මාර්ග සංවර්ධන අධිකාරියේ සහ කඩුවෙල මහ නගර සභාවෙහි සහය යටතේ සාක්ෂාත් කර ගැනීමට යෝජිතය. ඒ තුළින් ප්‍රදේශය තුළ පදිංචිකරුවන්ට අවශ්‍ය සුවපහසු වාසස්ථානයක් ලෙස අරංගල සංවර්ධනය කිරීමට මෙමගින් යෝජනා කර ඇත.

- නගර මධ්‍ය සංවර්ධනය

මේ තුළින් ප්‍රදේශය තුළ වාහන තදබදය අවම කරමින් මංසන්ධියක් ලෙස මාර්ග සංවර්ධන අධිකාරියෙහි නියාමනය යටතේ සංවර්ධනය සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

- හරිත මාර්ගයක් ලෙස නිදහස් මාවත සංවර්ධනය

ප්‍රදේශය තුළ ජීවත් වන පදිංචිකරුවන්ට සුවපහසු ජීවන රටාවක් ගත කිරීමට අවශ්‍ය ව්‍යායාම ලබාගැනීම අවශ්‍ය පහසුව සලසමින් හරිත මාර්ගයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශයේ මගපෙන්වීම හා කඩුවෙල මහ නගර සභාවේ සහය සහිතව නිදහස් මාවත සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

- පදික මගී පහසුකම් වැඩිදියුණු කිරීම

මෙය අරංගල මංසන්ධියේ සිට නිදහස් මාවත දක්වා මාර්ගය දෙපස සඳහාම යෝජනා කර ඇති අතර මාර්ග සංවර්ධන අධිකාරියෙහි නියාමනය යටතේ සංවර්ධනය සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

#### 6.7.6.2 උපායමාර්ගික ව්‍යාපෘති 02: කොරතොට මංසන්ධි සංවර්ධනය

කොරතොට ප්‍රදේශය තුළ ජීවත් වන ජනගහනයට මෙන්ම කොරතොට පූජා භූමිය වෙත පැමිණෙන බැතිමතුන්ට අවශ්‍ය සමාජීය යටිතල පහසුකම් සැපයීම හා පහසුකම් සැපයීමේ අරමුණින් සහ ජීවත්වන ජනතාවට වඩා සුවපහසු ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මූලික පහසුකම් වන වෙළඳෙළඳ මධ්‍යස්ථාන මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියෙහි මූලිකාංග ලෙස කුඩා වෙළඳ මධ්‍යස්ථාන සංවර්ධනය, බැතිමතුන්ට අවශ්‍ය සේවා පහසුකම් සංවර්ධනය, පදික මගී පහසුකම් වැඩිදියුණු කිරීම පෙන්වා දිය හැකිය.

රූපය 6.45 කොරතොට මංසන්ධි සංවර්ධනය




සැකසුම : සැලසුම් කණ්ඩායම, කොළඹ මහා නාගරික ප්‍රදේශ අංශය,නාගරික සංවර්ධන අධිකාරිය 2022

වෙළඳෙළඳ මධ්‍යස්ථාන සංවර්ධනය, බැතිමතුන්ට අවශ්‍ය සේවා පහසුකම් සංවර්ධනය සඳහා යෝජිත ප්‍රදේශ පුද්ගලික හිමිකාරීත්වය සතු ඉඩම් වන අතර ඒවා පිළිවෙළින් දළ වශයෙන් පර්චස් 100 හා පර්චස් 29 පමණ වේ. මෙම ඉඩම් නගර සංවර්ධනය සඳහා නාගරික

සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙනු ලබන මාර්ගෝපදේශනයන්ට අනුකූලව එම ඉඩම් හිමිකරුවන්ට සංවර්ධනය කිරීමේ හැකියාව පවතියි. ඒ තුළින් කොරතොට ප්‍රදේශය තුළ ජීවත් වන ජනගහනයට මෙන්ම කොරතොට පූජා භූමිය වෙත පැමිණෙන බැතිමතුන්ට අවශ්‍ය සමාජීය යටිතල පහසුකම් සැපයීම හා පහසුකම් සැපයීම අපේක්ෂා කෙරේ. කොරතොට පූජා භූමියෙහි සිට මීටර් 100 පමණ අතුරුගිරිය දෙසට පදික මඟී පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියෙහි නියාමනය යටතේ සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම මෙම උපායමාර්ගික සැලැස්ම යටතේ යෝජිත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රථම, එම අවස්ථාවේ දී යෝජිත භූමියෙහි පවතින ස්වභාවය අධ්‍යයනය කර, මෙම සැලැස්ම මගින් ව්‍යාපෘති සඳහා යෝජිත මුලිකාංග නොවනස්වන ආකාරයට වින්‍යාස සැලැස්ම කාලෝචිතව වෙනස් කිරීමෙහි හැකියාව අදාළ නගරනිර්මාණ ශිල්පීන් සතු වන අතර එහිදී එම එක් එක් ව්‍යාපෘතියට අදාළව ශක්‍යතා අධයනයක් හා ආපදා අවමකිරීමේ සැලැස්මක් සකස් කර, ඊට අනුකූලව එකී ව්‍යාපෘතිය කාලෝචිතව ක්‍රියාත්මක කළ හැකිද යන්න විස්තරාතමකව විශ්ලේෂණය කර ක්‍රියාවට නැන්වීම සිදුකළ යුතුය.

## 6.8 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම

### 6.8.1 ව්‍යාපෘති ප්‍රමුඛතාගත කිරීම හා ව්‍යාපෘති සඳහා වන ආයතනික වගකීම

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම, කඩුවෙල සංවර්ධන සැලැස්මෙහි තවත් වැදගත් උපාය මාර්ගික සැලස්මක් වන අතර, එමගින් හයවන පරිච්ඡේදයෙහි ඇතුළත් එක් එක් උපායමාර්ගික සැලසුම් වල ඇතුළත් උපායමාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන ආකාරය වැඩිදුරටත් විස්තර කෙරේ. එහිදී එක් එක් උපායමාර්ගික සැලසුම් වල ඇතුළත් උපායමාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කිරීමට අපේක්ෂිත කාල වකවානු, එම එක් එක් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දරණු ලබන පාර්ශවකරුවන් සහ උපායමාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අනුපිළිවෙළ සවිස්තරාතමකව විසතර කර ඇත. තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අනුපිළිවෙළ නිර්ණය කිරීම දී පහත කරුණු පදනම් කර ගෙන ඇත.

1. ව්‍යපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ
2. සංවර්ධන සැලැස්මෙහි අපේක්ෂිත දැක්ම සඳහා වන දායකත්වය
3. අවිනිශ්චිතභාවය, සංකීර්ණත්වය සහ පාර්ශවකරුවන්ගේ විවිධ මතභේදයන් හේතුවෙන් ගැටළුකාරී තත්වයන් ඇතිවිය හැකි අවධානම

| උපායමාර්ගික සැලැස්ම | පළමු අදියර (2023-2025) | දෙවන අදියර (2025-2027) | තෙවන අදියර (2027-2030) |
|---|---|---|---|
| **නාගරික ආකෘතිය නැවත සකස් කිරීමේ උපායමාර්ගික සැලැස්ම** | නැත | නැත | නැත |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ආර්ථික ශක්‍යතාවය සහ විවිධත්වය වැඩිදියුණු කිරීමේ උපායමාර්ගික සැලැස්ම** | 1 | අතුරුගිරිය නගර සංවර්ධනය - ප්‍රවාහන අමාත්‍යාංශය හා මා.ස.අ. | 1 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ බත්තරමුල්ල මංසන්ධියේ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය- - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 1 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ විදුලි රැහැන් භූ ගත කිරීම (නව නුවර මාර්ගය සහ පොල්දුව මාර්ගය)- ශ්‍රී. ල.වි.ම. හා ල. වි. පු. ස. |
| | 2 | කැළණි ගඟට මුහුණලා කඩුවෙල මහා නගර සභාවට අයත් භූමියෙහි පොදු උද්‍යාන හා විවෘත රංග භූමිය නිර්මාණය කිරීම - නා. ස. අ. මගපෙන්වීම යටතේ කඩුවෙල මහ නගර සභාව | 2 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ නව නුවර මාර්ගය සහ පොල්දුව සම්බන්ධිත මාර්ගය - නා. ස. අ හා මා.ස.අ | 2 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ සුහුරු බස් නැවතුම් ස්ථාන සංවර්ධනය -මා. ස. අ. |
| | 3 | කඩුවෙල නගර මධ්‍යයේ සිට දෙපසට මීටර 150 දුරක් ගොඩනැගිලි මුහුණත වැඩි දියුණු කිරීම, භූ දර්ශන හා | 3 | ගොඩනැගිලි මුහුණත සංවර්ධනය (බත්තරමුල්ල මංසන්ධියේ සිට දියත පාලම දක්වා වූ වාණිජ | 3 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ පොදු චතුරස්‍ර සංවර්ධනය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | පදික වේදිකා වැඩි දියුණු කිරීම- කඩුවෙල මහ නගර සභාව හා නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | | ගොඩනැගිලි) - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | | (පොල්දුව හා සුභූතිපුර මාර්ගය හමුවන මං සන්ධිය) නා. ස. අ හා මා.ස.අ මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 4 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ සෙත්සිරිපාය තෙවන අදියර - නා. ස. අ | 4 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ ප්‍රජා පහසුකම් උද්‍යානය - නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. | 4 | ඇවිදින මංතීරු (පොල්දුව මාර්ගය, නව නුවර මාර්ගය , සුභූතිපුර මාර්ගය , සෙත්සිරිපාය පරිශ්‍රය තුළ හා ඉඩම් අමාත්‍යාංශය හා කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුව ආසනයේ ඇති තෙත්බිම් අවට ) - නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. |
| | 5 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ සුභූතිපුර පදික මාර්ගය - නා. ස. අ හා මා.ස.අ | 5 | කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ ජල උද්‍යානය හා ජල රැඳවුම් පොකුණ - නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. | 5 | කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ සෙත්සිරිපාය අදියර 04- නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 6 | බත්තරමුල්ල ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ භූ දර්ශන ප්‍රවර්ධන ව්‍යාපෘතිය (නව නුවර මාර්ගය)- නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 6 | කොස්වත්ත ආයතන ප්‍රවර්ධන කලාප ව්‍යාපෘතිය යටතේ කොස්වත්ත පාපැදි මංතිරුව - නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. | 6 | කඩුවෙල මහා නගර සභාවට අයත් නව නුවර මාර්ගයට මුහුණලා ඇති ඉඩමෙහි මිශ්‍ර සංවර්ධන ව්‍යපෘති II-- නා. ස. අ. මගපෙන්වීම යටතේ කඩුවෙල මහ නගර සභාව |
| | 7 | කොස්වත්ත තෙත්බිම් ඇවිදින මංතිරුව- නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. | 7 | මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජල රැදවුම් පොකුණු, ඇල මාර්ග සංවර්ධනය, ඔරු පැදීමේ පථ හා ඇවිදින මංතීරු සංවර්ධනය - නා. ස. අ. හා ශ්‍රී ල. ඉ.ස. ස. | 7 | කැළණි ගඟ පිවිසුම් මාර්ගය නව මුහුණු වරකින් වැඩි දියුණු කිරීම - මා.ස.අ. හා නා. ස. අ |
| | 8 | මාලබේ සුහුරු දැනුම නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පිවිසුම් දොරටුව සංවර්ධනය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 8 | ඔරුවල කාර්මික උද්‍යාන ප්‍රතිනි මාණය කිරීම- ශ්‍රී.ල.ව.ස. හා නා. ස. අ | 8 | කොරතොට අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ කර්මාන්ත උද්‍යානය - ඉඩම් අමාත්‍යාංශය හා නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | | | 9 | කඩුවෙල මිශ්‍ර සංවර්ධන ව්‍යපෘති I - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 9 | මාලබේ නගර සංවර්ධනය - නා. ස. අ. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| **භෞතික හා සමාජීය යටිතල පහසුකම් සංවර්ධන උපායමාර්ගය** | 1 | මාලබේ -අතුරුගිරිය-ගොඩගම මාර්ගය මීටර් 30 දක්වා පුළුල් කිරීම (කෝට්ටේ බෝපේ මාර්ගය)- මා.ස.අ. | 1 | චන්ද්‍රිකා කුමාරතුංග මාර්ගයෙහි දිගුවක් ලෙස කැනැල් මාර්ගය නව නුවර මාර්ගයෙහි සිට කෝට්ටේ බෝපේ මාර්ගය එනම් අතුරුගිරිය මාර්ගය දක්වා සංවර්ධනය කිරීම - කඩුවෙල මහ නගර සභාව හා නා. ස. අ. | 1 | පොල්දූව මාර්ගයෙහි දිගුව නව නුවර මාර්ගය හා සම්බන්ධිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම - නා. ස. අ. |
| | 2 | ලෝලෙවල් මාර්ගය පුළුල් කිරීම- මා.ස.අ. | 2 | සූරිය මාවත, රොබට් ගුණවර්ධන මාර්ගය, ලේක් පාර, උඩවත්ත මාර්ගය, පොතුඅරාව මාර්ගය, අමරගොඩ මාර්ගය හා හෝකන්දර -කොට්ටාව මාර්ගය යන උප ප්‍රධාන මාර්ග පුළුල් කිරීම- කඩුවෙල මහ නගර සභාව | 2 | වැක්කියවත්ත මාර්ගය, ගල්වරුසාව මාර්ගය, අතුරුගිරිය -නවගමුව මාර්ගය, උඩුගොඩ මාර්ගය, හබරකඩ -රණාල මාර්ගය, වැලිවිට මාර්ගය, කහන්තොට මාර්ගය, සුහද මාවත යන උප ප්‍රධාන මාර්ග පුළුල් කිරීම- කඩුවෙල මහ නගර සභාව |
| | 3 | කලපළුවාව- තලංගම මාර්ගය පුළුල් කිරීම - බ.පා.මා.ස.අ. | 3 | කොස්කදවිල හෝකන්දර මාර්ගය පුළුල් කිරීම - බ.පා.මා.ස.අ. | 3 | බත්තරමුල්ල වැඩිහිටි දිවා සුරැකුම් මධ්‍යස්ථානය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 4 | කඩුවෙල -අතුරුගිරිය මාර්ගය පුළුල් කිරීම - බ.පා.මා.ස.අ. | 4 | තලංගම රෝහල පරිශ්‍රය වැඩිදියුණු කිරීම - සෞඛ්‍ය අමාත්‍යාංශය | 4 | කඩුවෙල සෞඛ්‍ය සේවා පහසුකම් පුනර්ජනනීය ප්‍රදේශය - නා. ස. අ. මගපෙන්වීම යටතේ කඩුවෙල මහ නගර සභාව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | 5 | කඩුවෙල කසල අංගනය පුළුල් කිරීම - කඩුවෙල මහ නගර සභාව | 5 | කොස්වත්ත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය- නා. ස. අ. මගපෙන්වීම යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය හා මා.ස.අ. | 5 | කොරතොට ශ්‍රී සෝමානන්ද විද්‍යාලයට පහසුකම් සැපයීම- අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | | | | 6 | කඩුවෙල හා අතුරුගිරිය බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන - නා. ස. අ. මගපෙන්වීම යටතේ ප්‍රවාහන අමාත්‍යාංශය හා මා.ස.අ. |
| | | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම** | 1 | තෙත්බිම් කලාපීකරණය අනුකූලව සංවර්ධනය නියාමනය කිරීම සඳහා තෙත්බිම් ආශ්‍රිත කලාපීකරණය රෙගුලාසි පැනවීම - නා. ස. අ. | 1 | ෆ්‍රොලික් අයිලන්ඩ් විනෝද උද්‍යානය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 1 | කැලණි ගඟ රක්ෂිතය භූ දර්ශනය - කඩුවෙල මහ නගර සභාව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| | 2 | අපේගම පරිශ්‍රය ප්‍රතිනිර්මාණය කිරීම - නා . ස. අ. | 2 | තෙත්බිම් සත්වෝද්‍යාන ව්‍යාපෘතිය- ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | 2 | කඩුවෙල නගර මල් උද්‍යානය -- නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 3 | දැඩිගමුව නාගරික වන උද්‍යානය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 3 | කොස්වත්ත ජල උද්‍යානය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය | 3 | කඩුවෙල තෙත්බිම් නිවාඩු නිකේතන උද්‍යානය හා තෙත්බිම් කාබානා ව්‍යාපෘතිය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | | | | | | |
| **ජනාවාස සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම** | 1 | නේවාසික යෝග්‍යතාවය අනුව යෝජිත ජනාවාස ප්‍රවර්ධන කලාප ආශ්‍රිත කලාපීකරණය රෙගුලාසි ක්‍රියාවට නැන්වීම - නා. ස. අ. | 1 | හරිත මාර්ගයක් ලෙස අරංගල නිදහස් මාවත සංවර්ධනය- මා.ස.අ. හා පුද්ගලික අංශය | 1 | කොරතොට මංසන්ධිය ආශ්‍රිතව බැතිමතුන්ට අවශ්‍ය සේවා පහසුකම් සංවර්ධනය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 2 | අරංගල මංසන්ධිය ආශ්‍රිතව පදික මගී පහසුකම් වැඩිදියුණු කිරීම- මා.ස.අ. | 2 | අරංගල නගර මධ්‍ය සංවර්ධනය - මා.ස.අ. හා පුද්ගලික අංශය | 2 | කොරතොට මංසන්ධිය ආශ්‍රිතව වෙළඳ මධ්‍යස්ථාන සංවර්ධනය - නා. ස. අ. මගපෙන්වීම යටතේ පුද්ගලික අංශය |
| | 3 | කොරතොට මංසන්ධිය ආශ්‍රිතව පදික මගී පහසුකම් වැඩිදියුණු කිරීම -මා.ස.අ. | | | | |

# දෙවන කොටස

# හත්වන පරිච්ඡේදය

# සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමතා

### 7.1 හැඳින්වීම

කඩුවෙල සංවර්ධන සැලැස්ම 2023-2033"**ශ්‍රී ලංකා ස්වෛරීත්වයේ කිරුළේ බලවත්ම කේන්ද්‍රස්ථානය"** යන දැක්ම සාක්ෂාත් කරගැනීම අරමුණු කරගනිමින් සකස් කරන ලද්දකි. එමගින් කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි දැනට පවතින ගැටළු හඳුනා ගැනීම තුලින්, එම ගැටළු විසඳීමටත්, කඩුවෙල මහ නගර සභා ප්‍රදේශයෙහි පවතින අවස්ථාවන් හා විභවතාවයන් ප්‍රයෝජනයට ගනිමින් වඩාත් යහපත්, තිරසාර හා සුරක්ෂිත නගරයක් ඇති කිරීමටත් සැලසුම් සකස් කර තිබේ එම අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා සංවර්ධන උපාය මාර්ගයන් 05 ක් ඔස්සේ යමින් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත .

ඒ අනුව වර්තමාන භූමි පරිභෝජන රටාව,ජනගහන හා ගොඩනැගිලි ඝනත්වය , පාරිසරික සංවේදී කලාපයන් යෝජිත රෙගුලාසීන්/ව්‍යාපෘතීන් ආදිය සැලකිල්ලට ගනිමින් කලාපීකරණ සැලැස්ම හා නියමතා හඳුන්වා දී ඇත

මෙම පරිච්ඡේදය මගින් කලාපීකරණ සැලැස්ම ,කලාප සංගුණකය ,සංවර්ධන කලාප , එක් එක් කලාපයන්හි අනුමත භාවිතයන් හා එම සංවර්ධන කලාපයන්හි අදාල අනුමත භාවිතයන් හා එම සංවර්ධන කලාපයන් සඳහා බලපාන පොදු රෙගුලාසි හා නියමයන් පිළිබඳ විස්තරයක් සිදු කර ඇත.

## 7.2 කලාපීකරණ සැලැස්ම (2023-2033)

සිතියම් අංක 7.1: කඩුවෙල කලාපීකරණ සැලැස්ම 2023-2033




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 7.3 සංවර්ධන කලාප සහ කලාප සංගුණකය

කඩුවෙල සංවර්ධන සැලැස්ම මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය ප්‍රධාන සංවර්ධන කලාප 7කට බෙදා ඇති අතර එම ප්‍රධාන සංවර්ධන කලාප අපේක්ෂිත සංවර්ධන ඝනත්වය මත පදනම්ව නැවත උප කලාප වලට බෙදා දක්වා ඇත. එකී ප්‍රධාන සංවර්ධන කලාප 7 න් විශේෂ නේවාසික කලාපයට හා ආයතනික කලාපයට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තු කලාප හදුනාගෙන ඇති අතර , නේවාසික කලාපයෙහි මිශ්‍ර නේවාසික කලාපය හා ආයතනික කලාපය බලපැවැත්වෙන පරිදි ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප හදුනාගෙන ඇත. ඒ අනුව, එම සංවර්ධන කලාපය සඳහා අපේක්ෂිත සංවර්ධන ඝනත්වය හා සංවර්ධනය කල හැකි භූමි ප්‍රමාණය මත පදනම්ව කලාප සංගුණකය නිර්ණය කරන ලදී. (වගු අංක 7.1)

වගු අංක 7.1: සංවර්ධන කලාප සහ කලාප සංගුණකයන්

| සංවර්ධන කලාපය | උප සංවර්ධන කලාපය | කලාප කේතය | කලාප සංගුණකය |
|---|---|---|---|
| විශේෂ නේවාසික කලාපය (Special Residential Zone) | විශේෂ නේවාසික කලාපය I | SRZ1 | - |
| | විශේෂ නේවාසික කලාපය II | SRZ2 | - |
| | විශේෂ නේවාසික කලාපය III | SRZ3 | 2.76 |
| | විශේෂ නේවාසික කලාපය IV | SRZ4 | 2.11 |
| නේවාසික කලාපය (Residential Zone) | අධි ඝනත්ව නේවාසික කලාපය | HDRZ1 | 2.11 |
| | අඩු ඝනත්ව නේවාසික කලාපය | LDRZ2 | 1.50 |
| වාණිජ කලාපය(Commercial Zone) | | CZ | 1.65 |
| මිශ්‍ර සංවර්ධන කලාපය (Mix Development Zone) | මිශ්‍ර සංවර්ධන කලාපය I - වාණිජ ප්‍රමුඛ | MD1 | 1.51 |
| | මිශ්‍ර සංවර්ධන කලාපය II- අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ | MD2 | 1.21 |
| | මිශ්‍ර සංවර්ධන කලාපය III- අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ | MD3 | 1.18 |
| | මිශ්‍ර සංවර්ධන කලාපය IV- කැළණි ගඟාභිමුඛ | MD4 | 1.05 |
| ආයතනික කලාපය (Institutional Zone) | ආයතනික කලාපය | IZ | 2.76 |
| දැනුම නගර කලාපය (Knowledge City Zone) | දැනුම නගර කලාපය I | KZI | 1.54 |
| | දැනුම නගර කලාපය II | KZ II | 1.24 |
| සංරක්ෂණ කලාපය (Conservation Zone) | උස්බිම් සංරක්ෂණ කලාපය **(**කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය**)** මුහුදු මට්ටමේ සිට මීටර් **25** දක්වා ප්‍රදේශය | CZ I | - |
| | උස්බිම් සංරක්ෂණ කලාපය **(**කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය**)** මුහුදු මට්ටමේ සිට මීටර් **25** වඩා උසින් වූ ප්‍රදේශ | CZ II | - |
| | උස්බිම් සංරක්ෂණ කලාපය **(**දැඩිගමුව කදු ප්‍රදේශය**)** මුහුදු මට්ටමේ සිට මීටර් **30** දක්වා වූ ප්‍රදේශ | CZ III | - |
| | උස්බිම් සංරක්ෂණ කලාපය **(**දැඩිගමුව කදු ප්‍රදේශය**)** මුහුදු මට්ටමේ සිට මීටර් **30** වඩා උසින් වූ ප්‍රදේශ | CZ IV | - |
| | අධි සංවේදී සංරක්ෂණ කලාපය | HSZ | - |
| | මධ්‍ය සංවේදී සංරක්ෂණ කලාපය | MSZ | - |
| | අඩු සංවේදී සංරක්ෂණ කලාපය | LSZ | - |
| *නව නුවර මාර්ගය සහ මාලබේ අතුරුගිරිය මාර්ගයෙහි කහන්තොට මාර්ගය **(**අරංගල මංසන්ධිය) දක්වා ප්‍රධාන මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය සඳහා වාණිජ කලාපයෙහි භාවිතයන් සඳහා අනුමැතිය ලබා දෙන අතර කලාප සංගුණකය 3.05 ක් වේ. | | | |

සිතියම් අංක 7.2: සංවර්ධන කලාප සහ කලාප සංගුණක 2023-2033




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය, 2023

### 7.4 සැලසුම් ප්‍රදේශය සඳහා බලපැවැත්වෙන පොදු කලාපීකරණ නියමතා

**i.** වර්ෂ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3 (1) හා (2) වගන්තිය යටතේ අංක 56/6 හා 1979 ඔක්තෝම්බර් මස 01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් නාගරික සංවර්ධන අධිකාරී බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ පරිපාලන සීමාවන් තුළ පිහිටි සියලුම ප්‍රදේශයන් සඳහා මෙම නියමතා බල පැවැත්වේ.

**ii.** කිසියම් සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේදී**,** ඊට අදාලවන සැලසුම් හා සංවර්ධන නියමතා සඳහා මෙම කලාපිකරණ සැලැස්මේ නියමතාවන්ට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2021 ජූලි මස 08 දිනැති හා අංක 2235/54 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති සැලසුම් හා ගොඩනැගිලි නියෝග /රෙගුලාසි (පොදු) කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය සඳහා බලාත්මක වේ.

**iii.** 2009 නොවැම්බර් මස 23 වන දිනැති හා අංක 1629/6 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇති මාලබේ තොරතුරු තාක්ෂණ උද්‍යානය සඳහා වන සැලසුම් හා ගොඩනැගිලි නියෝග /රෙගුලාසි මෙම මගින් අවලංගු වේ.

**iv.** 1986. 03. 10 දිනට පෙර අනුබෙදුම් කර ඇති බිම් කට්ටි පවතින බිම් කට්ටියක් ලෙස සලකා බලනු ලැබේ.

**v.** බත්තරමුල්ල හා ෆ්‍රොලික් අයිලන්ඩ් සංවර්ධන නියාමන ප්‍රදේශ සඳහා සංවර්ධන නියාමන සැලසුම් මගින් හඳුන්වා දෙනු ලබන රෙගුලාසි අදාළ වන අතර එම රෙගුලාසි හඳුන්වාදෙන තෙක් මෙම සැලැස්මේ සඳහන් කලාපිකරණ රෙගුලාසි එම ප්‍රදේශය සඳහාද බල පැවැත්වේ. කෙසේවුවද**,** ඉහත සංවර්ධන නියාමන ප්‍රදේශයන්හි සිදුකිරීමට නියමිත සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබාගත යුතු අතර**,** අධිකාරිය විසින් සකස් කර ඇති කෙටුම්පත් සංවර්ධන නියාමන සැලැස්ම ප්‍රකාරව සංවර්ධනයන් තීරණය කිරීමේ බලය අධිකාරිය සතු වේ.

**vi.** යම් ඉඩමක වීථි රේඛාවට**/**යෝජිත මාර්ග පළලට අයත් වන ඉඩම් කොටස මාර්ගය සඳහා වන්දියකින් තොරව ප්‍රදානය කරන්නේ නම්**,** යෝජිත සංවර්ධන කටයුත්ත සඳහා වන අවසරලත් ගෙබිම් අනුපාතය සඳහා සම්පූර්ණ ඉඩමේ ප්‍රමාණය සලකා බලනු ලබන අතර බිම් කට්ටි ආවරණ ප්‍රතිශතය ගණනය කිරීමේදී වීථි රේඛාවට**/** යෝජිත මාර්ග පළලට අයත් වන කොටස හැර ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබේ.

**vii.** ආනතියක් සහිත භූමියක ඉවුරු කැපීම සිදුකරනු ලබන අවස්ථාවන්හිදී අදාළ ආයතනවල නිර්දේශ ලබා ගතයුතු අතර බෑවුම් තලය කෙලවරේ සිට මායිම දක්වා අවම වශයෙන් මීටර් 1ක රක්ෂිතයක් පවත්වා ගත යුතුය.

**viii.** කිසියම් ඉඩමක් කලාප දෙකකට හෝ වැඩි ගණනකට අයත් වනසේ පෙන්වා දී ඇති අවස්ථාවන්හිදී, එම බිම් ප්‍රදේශයට අයත්වන කලාපය තීරණය කරනු ලබන්නේ, එම බිම් කොටසට ප්‍රවේශය ලබන ප්‍රධාන ප්‍රවේශ මාර්ගය අයත් කලාපය මගිනි.

එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් කලාපය අදාළ කරගත යුතුය. *සංරක්ෂණ කලාප සඳහා මෙම නියමතාවය අදාළ නොවේ.

**ix.** කිසියම් බිම් කොටසක් පළාත් පාලන බල ප්‍රදේශ දෙකක් අතරට අයත් වනසේ ඇත්නම්, එම බිම් කොටස එයට ප්‍රධාන ප්‍රවේශය ලබන පළාත් පාලන බල ප්‍රදේශයට අදාළ කලාපයේ භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ.
එකී බිම් කොටස, එකම පළලින් යුක්ත මාර්ග දෙකකින් හෝ වැඩි ගණනකින් ප්‍රවේශය ලබන්නේ නම්, එම බිම් කොටසෙන් වැඩි බිම් ප්‍රමාණයක් අයත් පළාත් පාලන බල ප්‍රදේශයට අදාළ රෙගුලාසි බලාත්මක වේ.

**x.** යම් ප්‍රවේශ මාර්ගයක පළමු බිම් කොටස හරහා කලාප මායිම් වැටී ඇති විටක, එකී බිම් කොටසේ ප්‍රවේශ මාර්ගයට සමාන්තරව ඇතින්ම පිහිටි අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතු වේ.
යම්හෙයකින්, පිටුපස බිම් කොටස් පළමු බිම් කොටසට ඒකාබද්ධ කර තනි ඉඩමක් ලෙස අනුමත කර ඇතිවිටක, එකී තනි ඉඩමේ අවසාන මායිම දක්වා කලාප මායිම ලෙස සැලකිය යුතුය. නමුත් පාර්ලිමේන්තු කලාපයන් හි දී පමණක් පළමු මීටර් 30 අදාළ ප්‍රදේශය පමණක් පළමු බිම් කට්ටිය ලෙස සලකනු ලැබේ.

**xi.** යම් සංවර්ධනයක් සඳහා අවශ්‍ය වන ප්‍රවේශ මාර්ගයේ පළල ප්‍රමාණවත් නොවන අවස්තාවකදී සංවර්ධනයේ ස්වභාවය, පරිමාණය, ප්‍රදේශයේ භූමි භාවිතය, ප්‍රවේශ මාර්ගයෙහි ධාරිතාවය සැලකිල්ලට ගෙන මාර්ගයේ අවම පළල මීටර් 6 ක් වන අවස්තාවේදී, අදාළ ඉඩම තුළින් ප්‍රවේශ මාර්ගය අවශ්‍ය ප්‍රමාණය දක්වා පුලුල් කර සංවර්ධනය සඳහා අවසර ලබාදීම නාගරික සංවර්ධන අධිකාරියට තීරණය කළ හැකි අතර එකී යෝග්‍යතාවය සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණයක් සඳහා අයදුම් කළ යුතු වේ.

**xii.** ඉහත **Xii.** දැක්වෙන පරිදි, අදාළ ඉඩම තුළින් අවශ්‍ය ප්‍රවේශ මාර්ගය පුලුල් කර සංවර්ධනය සඳහා අවසර ලබාදීම සිදු කරනු ලබන අවස්ථාවකදී, ඊට අදාළ මිනින්දෝරු සැලැස්මෙහි ප්‍රවේශ මාර්ගය සඳහා යෝජිත බිම් තීරුව නව බිම් කට්ටියක් ලෙස සලකනු කර අනුමත කර ගත යුතුය. එකී බිම් කොටස සංවර්ධනයට පෙර භෞතිකව ප්‍රවේශ මාර්ගයට මුදාහැරිය යුතුය. මීටර් 6ක් සහිත ප්‍රවේශ මාර්ගයක කෙළවර (**Dead-end**) පවතින ඉඩම් කොටස් සඳහා අවසර ලබාදීම තීරණය කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතුවේ.

**xiii.** කලාපිකරණ සැලැස්මේ පෙන්වා දී ඇති මායිම්, භෞතික මායිම් හා භූගෝලීය ඛණ්ඩාංක යන දෙකෙන්ම නිර්වචනය කර ඇති අවස්ථාවකදී මායිම් වෙනසක් සිදු වුවහොත් ඒ පිලිබඳ අවසාන තීරණය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

**xiv.** කලාපිකරණ සැලැස්මේ අවසරලත් භාවිත කාණ්ඩයේ සඳහන් නොවන නමුත්, කලාපීකරණ සැලැස්මට අනුකූලව ප්‍රදේශයෙහි පවතින ලක්ෂණයන්ට හානියක් නොවන පරිදි හා එකී කලාපයේ අවසරලත් භාවිතයන් හා සමාන භාවිතයන් සඳහා අනුමැතිය ලබාදීම පිලිබඳ තීරණය කිරීමේ බලය නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

**xv.** යෝජිත කලාපිකරණ සැලැස්ම තුල අනුමත භාවිතයන් නොවන නමුත් දැනට පවත්වාගෙන යන භාවිතයන් තවදුරටත් පවත්වාගෙන යාම සදහා පමණක් අවසර ලබාදීම සලකා බලනු ලැබේ. නමුත් පවත්නා භාවිතයන් තවදුරටත් පුළුල් කිරීම සදහා අනුමැතිය ලබා දීම පිලිබදව සලකා බලනු නොබලන අතර භාවිතය දිගින් දිගටම පවත්වාගෙන යාම අහිතකර යැයි හැඟී යන්නේ නම් එකී භාවිතය නතර කරන ලෙස අධිකාරියට නියම කරනු ලැබිය හැක.

**xvi.** අවසරලත් කලාපයන් හි පමණක් ගොඩනැගිලි සීමාව තුල මායිම් තාප්ප ඉදිකිරීම සඳහා මාර්ගය අයත් ආයතනය සමග නිර්වන්දි ගිවිසුමක් අත්සන් කිරීමට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

**xvii.** ප්‍රදේශයේ මංසන්ධි මාර්ග දෙපස ගොඩනැගිලි සීමා, මාර්ග පළල් කිරීමේ සීමා හා රක්ෂිත තුල විවිධ ආගමික ප්‍රතිමා, ආගමික සංකේත, සලකුණු හෝ ඒ සමාන ඉදිකිරීම් සදහා අවසර නොදෙන අතර, එවැනි ඉදිකිරීම් ඉවත් කිරීමේදී ඒ සඳහා වන්දි ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**xviii.** සුසාන භූමියක්/ආදාහනාගාරයක් සඳහා යම්කිසි ඉඩමක් වෙන් කරනු ලබන්නේ නම් එය සුසාන භූමි පනතට අනුව කටයුතු කළ යුතු වේ.

**xix.** පහත්බිම් සම්බන්ධයෙන් තෙත්බිම් කලාපිකරන සැලැස්ම යටතේ කටයුතු කල යුතු අතර, එම කලාපයට අයත් නොවන යම් සංවර්ධන කලාපයක පවතින වගුරු බිම්, කුඹුරු, තෙත්බිම් හෝ ඕවිට හෝ ලක්ෂණ සහිත පහත්බිම් සංවර්ධනයට මුදාහැරීම පිළිබද සලකා බැලීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ අදාළ ආයතන වල නිරවුල් සහතිකයක් ලබාගත යුතුය.

**xx.** තෙත් බිමක් සම්බන්ධව යම් ගැටළුවක් පැන නගින අවස්ථාවකදී ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව හා නාගරික සංවර්ධන අධිකාරියේ පරිසර හා භූ දර්ශන අංශය මගින් ඒකාබද්ධ ක්ෂේත්‍ර

පරීක්ෂණයක් සිදුකිරීමෙන් අනතුරුව අදාළ ආයතනයන්ගේ නිර්දේශ වලට යටත්ව තීරණ ගැනීමේ හැකියාව නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

**xxi.** කලාපීකරණ සැලැස්මට අනුව යම් බිම්කට්ටියක් තෙත්බිම් සංරක්ෂණ කලාපයකට හා සංවර්ධන කලාපයකට යන කලාප දෙකකට අයත් වන අවස්ථාවේදී ,එම යෝජිත ඉඩමෙන් 50 % හෝ ඊට වැඩි ප්‍රතිශතයක් සංවර්ධන කලාපයට අයත්ව එකී සංවර්ධන කලාපයේ අදාළ වන අවම බිම් ප්‍රමාණයට වඩා අඩු වන අවස්ථාවක ,සංවර්ධන කලාපයේ අවම අනුබෙදුම් බිම් කට්ටියට අදාළ සංවර්ධනය, ප්‍රදේශයේ ක්‍රියාකාරකම් වලට බාධා නොවන පරිදි අනුමැතිය ලබා දීම පිළිබද තීරණය කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කමිටුව සතු වේ.

**xxii.** යම් සංවර්ධනයක් සඳහා කුළුණු දොඹකර භාවිතා කරනු ලබන්නේ නම් ඒ සදහා සුදුසුකම්ලත් ඉංජිනේරුවරයකුගේ නිර්දේශ සහ රක්ෂණාවරණයක් සහිතව අවසර පත්‍රයක් අදාළ සංවර්ධනය සදහා අනුමැතිය ලබාදුන් ආයතනයෙන් ලබාගතයුතුය.

**xxiii.** පාසල් හා ළමා නිවාස සදහා ගොඩනැගිලි ඉදිකිරීමේදී විවෘත ඉඩකඩ වශයෙන් භූමියෙන් **50%**ක ප්‍රමාණයක් විවෘතව තැබිය යුතුය.

**xxiv.** රථවාහන නැවතුම් ඉඩකඩ සංවර්ධන භූමිය තුළින්ම සැපයීමට නොහැකි අවස්තාවලදී **,** උපරිමය මීටර 200ක වපසරිය තුළ පවතින භූමියක් ඒ සඳහා යොදා ගැනීම මූලික සැලසුම් නිරාකරණයකට යටත්ව සිදුකළ හැකිය. එකී භූමිය බදු පදනම මත ලබාගෙන පවතින්නේ නම් සංවර්ධන භූමියෙහි බදුකාලයට හෝ අවම වශයෙන් වසර 35 ක බදු කාලයක් විය යුතු අතර සංවර්ධනය සදහා අවශ්‍ය අවම බිම් ප්‍රමාණය සදහා එකී භූමිය අදාල කර ගත නොහැක.

**xxv.** අධිකාරිය විසින් හඳුනා ගනු ලබන ප්‍රදේශ වල අනන්‍යතාවය ආරක්ෂා වන පරිදි ගෘහ නිර්මාණ/ සැලසුම්කරණ නියමතා පැනවිය හැකිය**.**

**xxvi.** සැලසුම් ප්‍රදේශය තුල පවතින රාජ්‍ය ආයතන දෙපාර්තමේන්තු, මණ්ඩල හෝ සංස්ථාවන්ගේ විෂයපතයන්ට අයත් ඉඩම් හෝ රක්ෂිත කලාපයන්හි සංවර්ධන කටයුතු සිදු කිරීමට ප්‍රථමයෙන් අදාළ ආයතනයන්ගේ නිර්දේශයන් ලබා ගත යුතු වේ**.** (උදා: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව**,** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව**,** වාරිමාර්ග දෙපාර්තමේන්තුව**,** ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව**,** ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**,** භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යනාදී ආයතන වේ)

**xxvii.** සියලු කැණීම් කටයුතු භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඇතුළු අදාළ ආයතනයන්හි නිර්දේශයන්ට අනුව සිදු කල යුතු අතර**,** එම කටයුත්ත නිම වීමෙන් පසුව එකී ආයතනයේ නිර්දේශයට අනුකූලව කැණීම් කරන ලද ස්ථාන යථා තත්වයට පත් කිරීම හෝ සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය.

**xxviii.** කලාපීකරණ සැලැස්මට අනුව, කැණීම් කටයුතු සඳහා අවසර ලබා නොදෙන සංවර්ධන කලාපයන් හි (අදාළ ආයතන මගින් සංරක්ෂණය කළ යුතු යැයි හඳුනාගත් ප්‍රදේශ හැර) භූමිය සංවර්ධනය කිරීමේ දී මතුවිය හැකි කළුගල් හෝ ඛනිජ නිධි කැණීම සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිර්දේශයන්ට යටත්ව අනුමැතිය සඳහා සලකා බැලිය හැක.

**xxix.** යම්කිසි සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසියක් සම්බන්ධයෙන් හෝ එහි අර්ථකථනය සම්බන්ධයෙන් හෝ ප්‍රායෝගික භාවිතය සම්බන්ධයෙන් ගැටළුවක් පැන නැගෙන අවස්ථාවක**,** ඒ සම්බන්ධයෙන් අවසන් තීරණය ලබා දීම නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව සතුවේ.

**xxx.** ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප I (භෞතික සීමාව ) බලපැවැත්වෙන 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි ආයතනික කලාපය සහ අධි ඝනත්ව නේවාසික කලාපය තුළ, සිදු කිරීමට නියමිත සියලු සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ. (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප I (භෞතික සීමාව ) - ඇමුණුම මගින් දක්වා ඇත.)

**xxxi.** ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාපය II බලපැවැත්වෙන 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි ආයතනික කලාපය, අධි ඝනත්ව නේවාසික කලාපය තුළ, වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සහ උස මීටර් 15 ( බිම් මහලේ සිට තවත් මහල් 5ක්) හෝ එය ඉක්මවන සියලුම ගොඩනැගිලි සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ. (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප **II (**භෞතික සීමාව ) - ඇමුණුම මගින් දක්වා ඇත.)

**xxxii.** ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප, පාර්ලිමේන්තු කලාප තුළ ස්ථානගත වී පවතින අවස්ථාවන්හිදී ඉහත සඳහන් කරන ලද නියමතා අංක XXX, සහ XXXI දෙක මගින් සඳහන් කරන ලද නිරවුල් සහතිකයන්ට අමතරව ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ.

**xxxiii.** ප්‍රදේශයේ පවතින සියලු ගංගා**,** වැව් ඇළ හා දොළ මාර්ග සඳහා අදාළ ආයතන අණපනත් ගැසට් නිවේදන හා චක්‍රලේඛන මගින් පනවා ඇති රක්ෂිතයන් බල පැවැත්වේ.

**xxxiv.** ඉන්ධන පිරවුම්හල් සඳහා වන අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 1000 (පර්චස් 40) ක් සහ ඉඩමෙහි මුහුණත පළල අවම මීටර් 30**.**5 (අඩි 100) ක් විය යුතුය.

**xxxv.** මහල් නිවාස සංවර්ධනය කිරීමේ දී යෝජිත මලපහවන පද්ධතිය පොදු මලාපහවන බැහැර කිරීමේ පද්ධතියකට සම්බන්ධ කිරීමට නොහැකි අවස්ථාවන් හි දී නවීන තාක්ෂණික ක්‍රමවේද භාවිතා කරමින් මලපහවන පද්ධතිය, පරිශ්‍රය තුළම ස්ථාපිත කළ යුතු අතර එය ඉදිකිරීමට ප්‍රථම මධ්‍යම පරිසර අධිකාරියේ හා අනෙකුත් අදාළ ආයතනවල නිර්දේශ ලබා ගත යුතුය.

**xxxvi.** අවසරලත් කලාපයන් හි සන්නිවේදන කුළුණු ඉදිකිරීමේ දී ගසක ආකෘතියෙන් නිර්මාණය කළ යුතුය.

**xxxvii.** චන්ද්‍රිකා කුමාරතුංග මාවත හරහා කිසිදු නව මාර්ගයක් සදහා ප්‍රවේශකත්වය ලබා ගැනීමට අවසර හිමි නොවේ.දැනුම නගර කලාපයෙහි විශේෂ ආයෝජන අවස්තා ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම් කරනු ලබන අවස්තාවන්හිදී එම භාවිතය සදහා පමණක් සැලසුම් කමිටුවේ නිර්දේශය මත චන්ද්‍රිකා කුමාරතුංග මාවත හරහා සෘජු ප්‍රවේශකත්වය ලබා දීම සළකා බැලිය හැකිය.

**කළුගල් කැණීම හා ඒ ආශ්‍රිත ප්‍රදේශ සදහා වන පොදු මාර්ගෝපදේශ**

**xxxviii. කළුගල් කැණීම සදහා අවසරලත් කලාපයන් සදහා පහත රෙගුලාසීන් බලපැවැත්වේ.**

1. **පවත්නා කළුගල් කැණීම් ස්ථානයක කැණීම් සීමාවේ සිට මීටර් 100 ක වපසරිය තුළ**,

   අ) නව නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීම සදහා අවසර හිමි නොවේ.

   ආ). පවතින ගොඩනැගිලි වල අළුත්වැඩියා කිරීම් සහ අභ්‍යන්තර සංශෝධන සලකා බලන අතර නව කොටස් එකතු කිරීම .සදහා අවසර හිමි නොවේ (පවතින ගෙබිම් ප්‍රමාණය වැඩිකර ගැනීම)

   ඇ). කැණීම් ස්ථානයේ ක්‍රියාකාරීත්වය මත ගැටළුකාරී තත්වයක් මතු විය නොහැකි කර්මාන්ත සදහා පමණක් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්දේශ වලට යටත්ව සලකා බැලිය හැකිවේ

2. **පවත්නා කළුගල් කැණීම් ස්ථානයක කැණීම් සීමාවේ සිට මීටර් 100 සිට 200 දක්වා වපසරිය තුළ,**

   අ) නව නිවාස සහ ගොඩනැගිලි ඉදිකිරීම සදහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ නිර්දේශ වලට යටත්ව සලකා බැලිය යුතුවේ.

3. නව කැණීම් බලපත්‍ර ලබාදීමේදී කැණීම් සීමාවේ සිට මීටර් 100 වපසරිය තුළ නිවාස පවතින්නේ නම් එම නිවාස වල එකගතාවය මත හෝ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් සිදුකරනු ලබන පිපුරුම් පරීක්ෂණයකින් අනතුරුව අදාළ ආයතනයන්ගේ නිර්දේශ මත නව බලපත්‍ර ලබාදීම පිළිබද සලකා බැලිය හැකිවේ

**xxxix.** කලාපීකරණ සැලැස්මට අනුව, කැණීම් කටයුතු සදහා අවසර ලබා නොදෙන සංවර්ධන කලාපයන් හි (අදාළ ආයතන මගින් සංරක්ෂණය කළ යුතු යැයි හදුනාගත් ප්‍රදේශ හැර) භූමිය සංවර්ධනය කිරීමේ දී මතුවිය හැකි කළුගල් හෝ ඛණිජ නිධි කැණීම සම්බන්ධයෙන් භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙහි නිදේශයන්ට යටත්ව අවසර ලබාදීම සලකා බැලිය හැකිවේ

**තෙත් බිම් සඳහා වන පොදු නියමතා හා මාර්ගෝපදේශ**

XXXX. **පහත මාර්ගෝපදේශ කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ පිහිටි සියළු තෙත් බිම් සඳහා පමණක් වලංගු වේ .**

අ. දේශගුණික විපර්යාස හේතුවෙන් ඇති වන ආන්තික කාලගුණික තත්ත්වයන් වල තීව්‍රතාවය වැඩිවීම හා තෙත්බිම් වල සිදු කර ඇති ගොඩකිරීම් හා ඉදිකිරීම් හේතුවෙන් වැසි ජලය ගලා යන තීව්රතාවය සැළකිල්ලට ගනිමින් ගංවතුර ධාරිතාවය නඩත්තු කිරීම සහ අනෙකුත් සංවර්ධන කටයුතු උපලේඛන V සඳහන් ආයතන වල සම්බන්ධීකරණය තුළින් ලබා ගන්නා තීරණ අනුව සිදු කළ යුතුය .

ආ. අවසරලත් කලාපයන් හි අවසරලත් භාවිතයන් සඳහා පහත් බිමක් පුරන්වූ කුඹුරු සහ වගා කුඹුරු සංවර්ධනය කිරීමට/ .පෙර නාගරික සංවර්ධන අධිකාරියේ සහ උපලේඛනයේ සඳහන් අංක01, 03, දරණ ආයතන වලින් අනුමැතිය 09 හා 05 04 ලබා ගත යුතුය ඒසේම විවිධ පනත් මගින් තෙත්බිම් වල අයිතිය අදාළ ආයතන වල විෂය පථයට අයත් වන අවස්ථා වලදී . .උපලේඛනයේ සඳහන් ආයතන වලින් සහ අනෙකුත් අදාළ ආයතන වලින් අවශ්‍ය නිර්දේශය සහ අනුමැතිය ලබා ගත යුතුය

ඇ. තෙත්බිම් ආශ්‍රිත පරිසරයට බලපෑම් ඇති විය හැකි ඕනෑම සංවර්ධන කටයුත්තක් සඳහා අදාළ ආයතන වලින් පරිසර නිරවුල් කිරීමේ සහතිකය හෝ පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතු අතර නියමිත කාලය ඉක්මවීමට පෙර එකී බලපත්‍රය වාර්ෂිකව යාවත්කාලීන කළ යුතුය.

ඈ. තෙත්බිම්වල ආගන්තුක ආක්‍රමණශීලී ශාක හා සතුන් හැර වෙනත් ශාක හා සතුන් ඉවත් නොකළ යුතුය .

ඉ. ජල රැඳවුම් ධාරිතාවය විශේෂයෙන් වැදගත් වන සෑම තෙත්බිමකම සිදු කරන අනුමත භාවිතයකදී ජල රැඳවුම් ධාරිතාව අඩුවීම සහ පාරිසරික සේවාවන්ට සිදුවන බලපෑමට හිලව් වන සේ විකල්ප ස්ථාන සුදුසු ලෙස ස්ථාපනය කල යුතුය. ඒ සඳහා අදාළ ආයතනවල අනුමැතිය ලබාගත යුතුය.

ඊ. සාම්ප්‍රදායික ධීවර කටයුතු හැර මසුන් හෝ වෙනත් ජලජ ජීවීන් ඇල්ලීමේ ක්‍රියාවලියේදී යාන්ත්‍රික බෝට්ටු, ධීවර ආම්පන්න, ඉන්ධන හෝ වෙනත් යාත්‍රා භාවිතා නොකළ යුතුය.

උ. පැහැදිලිව හඳුනාගත හැකි ඉහල ජෛව විවිධත්වය ඇති තෙත්බිම් ප්‍රදේශ සංරක්ෂණය කල යුතුය.

ඌ. මසුන් සහ අනෙකුත් ජලජ ජීවීන් අභිජනනය වන සියලු ප්‍රදේශ විශේෂයෙන් ආරක්ෂා කල යුතුය.

එ. තෙත්බිම්වල කසළ බැහැර කිරීම සඳහා අවසර දෙනු නොලැබේ

ඔ. තෙත්බිම් වලට අපජලය බැහැර නොකළ යුතු අතර පිරිපහදු කළ ජලය බැහැර කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ වලට යටත්ව සිදු කළ යුතුය.

# අටවන පරිච්ඡේදය

# කලාපීකරණ රෙගුලාසි

### 8.1. කලාපීකරණ රෙගුලාසි

කඩුවෙල සංවර්ධන සැලැස්ම මගින් කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයේ ප්‍රධාන සංවර්ධන කලාප 7 ක් සඳහා බලපැවැත්වෙන කලාපීකරණ නියමතා පහත දක්වා ඇත.

#### 8.1.1. විශේෂ නේවාසික කලාපය

වගු අංක 8.1: විශේෂ නේවාසික කලාපය

| | | | | |
|---|---|---|---|---|
| **i. ප්‍රධාන කලාපය** | විශේෂ නේවාසික කලාපය | | | |
| **ii. කලාප ලක්ෂණ** | පාර්ලිමේන්තු පරිශ්‍රය ආශ්‍රිත ප්‍රදේශය මූලික කරගත් විශේෂ ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනා ගත් ප්‍රදේශයකි. | | | |
| **iii. කලාප මායිම්** | **උතුරට:** රජමල්වත්ත මාර්ගය, අශෝක මාවත, ජයන්තිපුර ප්‍රධාන මාර්ගය<br>**නැගෙනහිරට:** පන්නිපිටිය බත්තරමුල්ල (174) බස් මාර්ගය<br>**දකුණට:** පිටකෝට්ටේ තලවතුගොඩ මාර්ගය හා මහරගම නගර සභා බල ප්‍රදේශය<br>**බටහිරට:** ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව මාර්ගය, පාර්ලිමේන්තු ඩ්‍රයිව් මාර්ගය | | | |
| **iv. උප කලාපය** | විශේෂ නේවාසික කලාපය **I** | විශේෂ නේවාසික කලාපය **II** | විශේෂ නේවාසික කලාපය **III** | විශේෂ නේවාසික කලාපය **IV** |
| **v. කලාප අංකය** | **SRZ1** | **SRZ2** | **SRZ3** | **SRZ4** |
| **vi. කලාප සංගුණකය** | - | - | 2.76 | 2.11 |
| **vii. අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | බිම් මහල සහ තවත් මහල් එකක්<br>**(G+1)**<br>උපරිම උස අඩි **30** | බිම් මහල සහ තවත් මහල් දෙකක්<br>**(G+2)**<br>උපරිම උස අඩි**40** | ඇමුණුම I හි සඳහන් "අ" සහ "ආ" පෝරමය අනුව විය යුතුය | |
| **viii. අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | ***උපලේඛණය* II** සහ **III** හි සදහන් **"ආ"** සහ **"ඉ"** ආකෘති අනුව වියයුතුය | | | |
| **ix. වීථෘත අවකාශයන් සහ උපරිම උස** | ***උපලේඛණය* III** හි සදහන් **"ඉ"** ආකෘතිය අනුව වියයුතුය | | | |

<table>
<tr><td>x. අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="3">ව.මීටර් 150 හා උපලේඛණය IV හි සදහන් "උ" ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td colspan="4">XI. අවසරලත් භාවිතයන්</td></tr>
<tr><td>ප්‍රධාන භාවිතයන්</td><td>SRZ1</td><td>SRZ2</td><td>SRZ3 සහ SPZ4</td></tr>
<tr><td>නේවාසික</td><td>1</td><td>1, 5, 9, 10, 12, 13, 16,18</td><td>1,2,3,4,5,6,7,8, 9, 10, 11,12,13,14,15,16, 17,18,19,20,21</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>-</td><td>2, 3, 4, 5, 6, 7, 9,10</td><td>2 ,3, 4, 5, 6, 7, 9, 10,11,12</td></tr>
<tr><td>කාර්යාල හා ආයතනික</td><td>-</td><td>2</td><td>1, 2, 3, 4</td></tr>
<tr><td>වාණිජ</td><td>-</td><td>2,7,8,18, බුටික් හෝටලය (Boutique hotel), පරිසර නවාතැන් (Eco lodges)</td><td>1,2,4,6,7,8,9,10,11,12,<br>15,16,17,18,19,20,21,24,25,27,28,32,31,33</td></tr>
<tr><td>අධ්‍යාපනික</td><td>-</td><td>1</td><td>1</td></tr>
<tr><td>විනෝදාත්මක</td><td>2, 5, 6, 9</td><td>1,2,3, 4, 5,6, 8, 9</td><td>1,2,3, 4, 5,6, 8, 9</td></tr>
<tr><td>වෙනත්</td><td>-</td><td>4,10</td><td>1,2,3,4,10</td></tr>
<tr><td colspan="4">එක් එක් කලාප සඳහා වන පොදු හා විශේෂ රෙගුලාසි</td></tr>
<tr><td colspan="2">විශේෂ නේවාසික කලාපය I (SRZ1)</td><td>විශේෂ නේවාසික කලාපය II (SRZ2)</td><td>විශේෂ නේවාසික කලාපය III (SRZ3)</td></tr>
<tr><td colspan="2">අ) ප්‍රවේශ මාර්ග මායිමේ සිට ගොඩනැගිල්ල දෙසට මීටර් 2 ක බිම් තීරුවක් සුදුසු ශාඛ වගාවන් සහිත මෘදු භූ දර්ශනයක් සහිතව පවත්වා ගත යුතුය.<br><br>ආ) පාර්ලිමේන්තුව දිශාවට සෘජුව දර්ශනය වන ඉඩම් සංවර්ධනයේ දී අවම මීටර් 1 ක ස්වාරක්ෂප කලාපයක් ලෙස නඩත්තු කල යුතු අතර එය මෘදු භූ දර්ශනයක් සහිතව පවත්වා ගත යුතුය.</td><td>ආ) විශේෂ නේවාසික කලාපය II හි භෞතික සීමාවට මායිම් වන පන්නිපිටිය බත්තරමුල්ල (174) බස් මාර්ගයෙහි සිංහපුර මාර්ගයේ සිට උද්‍යාන මාර්ගය දක්වා වූ ප්‍රදේශය තුළ පළමු බිම් කට්ටිය ට ආසන්න 30 පළමු මිටර්) තුළ සිදුකරනු ලබන (ප්‍රමාණය සංවර්ධනයන් සදහා පාර්ලිමේන්තු කලාපIII අදාළ ඇමුණුම හි 1 සඳහන් "අ" සහ "ආ" පෝරමය අනුව රෙගුලාසි බල පැවැත්වේ . 2023)අගෝස්තු මස දිනැති 09 ප්‍රධාන සැලසුම් කමිටු අංක ට ලබාදී 2.3 හි අනු අංක 2023/11 (ඇති තීරණය පරිදි වේ</td><td>-</td></tr>
<tr><td colspan="3">විශේෂ නේවාසික කලාපය I (SRZ1) සහ විශේෂ නේවාසික කලාපය II (SRZ2)</td><td>විශේෂ නේවාසික කලාපය III (SRZ3)</td></tr>
</table>

<table>
<tr><td colspan="2">
අ) පාර්ලිමේන්තු සංකීර්ණයේ සිට භෞතික සිමාව දක්වා ප්‍රදේශයහි (විශේෂ නේවාසික කලාපය I ,II) යෝජිත ගොඩනැගිලි වහලය පරිසරයට අනුකූල වන සේ ගොඩනැගිය යුතු අතර උළු, ෂීට් වලින් වහලය ආවරණය කළ යුතුය.<br><br>
අ) පාර්ලිමේන්තු සංකීර්ණයේ දිශාවට පැතලි වහලවල්, ටෙරස්, විවෘත කිරීමේ බැල්කනි සදහා අවසර දෙනු නොලැබේ.<br><br>
ඇ) ගොඩනැගිල්ලේ බාහිර පෙනුම සදහා පරාවර්තනය නොවන ද්‍රව්‍ය සහ වර්ණයන් භාවිතා නොකළ යුතුය<br><br>
ඈ) පාර්ලිමේන්තු සංකීර්ණයට දෙසට මුහුණලා පවතින ඉඩම් කොටස් සදහා මායිම් තාප්ප ඉදිකිරීම සදහා අවසර දෙනු නොලැබේ. ගස් වැටක් හෝ කම්බි දැලක් ඉදි කිරීම සිදු කල හැකිය.<br><br>
ඉ) මායිම් වැට ස්වභාවික බිම් මට්ටමේ සිට මීටර් 1.8 ක උපරිම උසක් පවත්වා ගත යුතු අතර මායිම් වැටෙහි සියලුම කොටස් (තුළුණු හැර )රූපය 8.1 දැක්වන පරිදි දෘශ්‍යමය ආකාරයෙන් නිර්මාණය කළ යුතුය.<br><br>
රූපය 8.1: දෘශ්‍යමය මායිම් වැටෙහි ස්වභාවය<br>

</td><td>-</td></tr>
<tr><th>විශේෂ නේවාසික කලාපය I (SRZ1)</th><th colspan="2">විශේෂ නේවාසික කලාපය II (SRZ2) සහ විශේෂ නේවාසික කලාපය III (SRZ3)</th></tr>
<tr><td>-</td><td colspan="2">
අ) කිඹුලාවල මංසන්ධියේ සිට පාර්ලිමේන්තු මංසන්ධිය දක්වා ශ්‍රී ලංකා ජපන් මිත්‍රත්ව මාර්ගය සහ නව පාර්ලිමේන්තු මාර්ගයට මුහුණලා පවතින බිම් කොටස් සදහා විශේෂ නේවාසික කලාපය I හි භාවිතයන් සදහා පමණක් අවසර ලබා දෙනු අතර එම කලාපයෙහි අනෙකුත් රෙගුලාසි අදාළ වේ.<br><br>
ආ) මෙම කලාපයන් තුළ අවසරලත් සංචාරක භාවිතයන් සදහා අදාළ අවම භූමි ප්‍රමාණය වර්ග මීටර් 1000 කි.<br><br>
ඇ) බුටික් හෝටල් සහ පරිසර හිතකාමී ලැගුම්හල් සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු වේ
</td></tr>
<tr><td colspan="3">
විශේෂ නේවාසික කලාපය I ,II,III සදහා පමණක් පහත රෙගුලාසීන් බලාත්මක වේ.<br><br>
අ) මෙම කලාපයන්) විශේෂ නේවාසික කලාපය I ,II,III (තුළ සිදුකරන සියලු සංවර්ධන කටයුතු සදහා මූලික සැලසුම් නිරාකරණය නාගරික සංවර්ධන අධිකාරියෙන් හා පාර්ලිමේන්තු මහලේකම්වරයගෙන් ලබා ගත යුතුය<br><br>
ආ) කිසිදු දැන්වීම් පුවරුවක් සඳහා මෙම කලාපයන්) විශේෂ නේවාසික කලාපය I ,II,III (තුළ ඉඩ ලබා නොදෙන අතර කලාපයේ අවසර ලත් සංචාරක සහ විවේක කටයුතු පිළිබඳ දැන්වීම් සඳහා ලී පුවරුවක් පමණක් භාවිතා කළ යුතුවේ<br><br>
ඇ) මෙම කලාපය තුළ රෝපණය කරනු ලබන ශාක, පැළෑටි වගු අංක පරිදි විය යුතුය 8.1.1.
</td></tr>
</table>

වගු අංකය 8.1.1**:** ශාකපැළෑටි , ලැයිස්තුව

විශේෂ නේවාසික කලාපයෙහි කලාපය සඳහා යොදා ගත හැකි ගස් පදුරු සහ වැල් වර්ග පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 1) කරද | 2) මගුල් කරද | 3) මුරුත | 4) කුඹුක් |
| 5) වල් ඇහැළ | 6) මැයි මාර | 7) කොබෝලීල | 8) රුක්අත්තන |
| 9) මදටිය | 10) දියමිදෙල්ල | 11) දොඹ | 12) දවට |
| 13) කහකෝණ | 14) කස | 15) මුනමල් | 16) ගම්මාලු |
| 17) පාරේ මාර | 18) අසෝක | 19) ගන්සූරිය | |

### 8.1.2 නේවාසික කලාපය

වගු අංක 8.2: නේවාසික කලාපය

| | | | |
|---|---|---|---|
| **i.** | **ප්‍රධාන කලාපය** | **නේවාසික කලාපය** | |
| **ii.** | **කලාප ලක්ෂණ** | නේවාසික භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලබන කලාපයකි. ප්‍රදේශයෙහි පවතින අපරවයුහ පහසුකම් සැලකිල්ලට ගෙන නේවාසික කලපය අධිඝනත්ව හා අඩුඝනත්ව නේවාසික ලෙස කලාප දෙකකට වෙන් කර ඇත. | |
| **iii.** | **කලාප මායිම්** | **අධි ඝනත්ව නේවාසික කලාපය** | **අඩු ඝනත්ව නේවාසික කලාපය** |
| | | **උතුරට:** කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව<br>**නැගෙනහිරට:** පිටත වටරවුම් අධිවේගී මාර්ගය, චන්ද්‍රිකා කුමාරතුංග මාවත, කොට්ටාව මාලබේ මාර්ගය<br>**දකුණට:** මහරගම නගර සභා සීමාව<br>**බටහිරට:** අකුරේගොඩ මාර්ගය | **උතුරට:** උඩුගොඩ මාර්ගය, කනත්ත මාර්ගය<br>**නැගෙනහිරට:** හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව<br>**දකුණට:** හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව<br>**බටහිරට:** හබරකඩ හෝමාගම බස් මාර්ගය |
| **iv.** | **උප කලාපය** | අධි ඝනත්ව නේවාසික කලාපය | අඩු ඝනත්ව නේවාසික කලාපය |
| **v.** | **කලාප අංකය** | HR**1** | **LR2** |
| **vi.** | **කලාප සංගුණකය** | 2.11 | 1.50 |
| **vii.** | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | **උපලේඛණය I** සහ **II** හි සදහන් **"අ"** සහ **"ආ"** ආකෘති අනුව වියයුතුය | |
| **viii.** | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | **උපලේඛණය II** සහ **III** හි සදහන් **"ආ"** සහ **"ඉ"** ආකෘති අනුව වියයුතුය | |
| **ix.** | **වීථෘත අවකාශයන් සහ උපරිම උස** | **උපලේඛණය III** හි සදහන් **"ඉ"** ආකෘතිය අනුව වියයුතුය | |

| | | | |
|---|---|---|---|
| x. | අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | ව.මීටර් 150 හා **උපලේඛණය IV** හි සදහන් "උ" ආකෘතිය අනුව වියයුතුය | |
| xi. | **අවසරලත් භාවිතාවන්** | **ප්‍රධාන භාවිතය** | **අවසරලත් භාවිතයන් ( උපලේඛණය IV** හි සදහන් "උ" ආකෘතිය අනුව**)** |
| | | නේවාසික | 1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16, 17,18,19,20,21 |
| | | සෞඛ්‍ය | 2,3,4,5,6,7,9,10,12,13 |
| | | කාර්යාල හා ආයතනික | 1,2,4 |
| | | වාණිජ | 1,2,4,5,6,7,8,9,10,11,12,18,19,21,23,24,25,27,28,29,30,31,32 |
| | | අධ්‍යාපනික | 1,2,3,4,5,6,7,8,9,10,12,13 |
| | | සමාජ හා ආගමික | 1,4,6 |
| | | කර්මාන්ත | 5,10,11,13*(අඩු ඝනත්ව නේවාසික කලාපය තුළ පමණි),15 |
| | | විනෝදාත්මක | 1,3,4,5,6,8,9,10 |
| | | වෙනත් | 1,2,3,4,5*,7*(අඩු ඝනත්ව නේවාසික කලාපය තුළ පමණි),10,11<br>*ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප I (භෞතික සීමාව ) බලපැවැත්වෙන 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි අධි ඝනත්ව නේවාසික කලාපය තුළ වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සඳහා අවසර හිමි නොවේ. |
| | | *වැදගත් - නව නුවර මාර්ගය සහ මාලබේ අතුරුගිරිය මාර්ගයයෙහි කඟන්තොට මාර්ගය (අරංගල හංදිය) දක්වා ප්‍රධාන මාර්ගයන්ට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය සඳහා **වාණිජ කලාපයෙහි පවතින සියළු භාවිතයන් සඳහා අවසර හිමි වේ.**<br>**වැදගත් - **කළපළුවාව මාර්ගයෙහි හා තලවතුගොඩ හෝකන්දර මාර්ගයෙහි පළමු බිම් කට්ටිය සඳහා** මෙම සැලැස්මෙහි ඇතුළත් **වාණිජ කලාපයෙහි පවතින සියළු භාවිතයන් සඳහා අවසර හිමි වේ**. | |
| xii. | **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | අ) ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප බලපැවැත්වෙන අධි ඝනත්ව නේවාසික කලාපය තුළ, සිදු කිරීමට නියමිත සියලු සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ )ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ .<br><br>ආ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාපය II බලපැවැත්වෙන අධි ඝනත්ව නේවාසික කලාපය තුළ වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සහ උස මීටර් 15 ( බිම් මහල හා තවත් මහල් 5ක් ) හෝ එය ඉක්මවන සියලුම ගොඩනැගිලි සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ )ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය (නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ | |

| | |
|---|---|
| | ඈ)නව නුවර මාර්ගය සහ මාලබේ අතුරුගිරිය මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය සඳහා **සියලු වාණිජ භාවිතයන් සඳහා අවසර හිමි වන අතර එකී පළමු බිම් කට්ටිය සඳහා බලපැවැත්වෙන කලාප සංගුණකය 3.05 කි.**<br><br>ඈ) සේවා මහල් නිවාස සඳහා අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් **500** විය යුතුවේ.<br><br>ඉ) හෝටල් හා තරු පංති හෝටල් සඳහා නාගරික සංවර්ධනය අධිකාරිය මගින් මූලික සැලසුම් නිරකරණයක් ලබා ගැනීම අනිවාර්ය වේ.<br><br>ඊ) විදුලි උප පොලවල් සංවර්ධනය කිරීමේ දී ඉඩම වටා අවම වශයෙන් මීටර් 2.5ක .ස්වාරක්ෂක කලාපයක් නඩත්තු කළ යුතුය<br><br>උ) නේවාසික කලාපය තුළ ගෘහස්ත ක්‍රිඩාගාර හා විවෘත පිට්ටනි සංවර්ධනයේ දී එය , .අවට නේවාසිකයින්ට අවහිර නොවන ආකාරයෙන් පවත්වා ගත යුතු වේ<br><br>ඌ) අධි ඝනත්ව නේවාසික කලාපය තුළ ගල් කැඩීම සඳහා ඉඩ ලබා නොදේ.<br><br>එ) නේවාසික භාවිතයන්ට බාධා නොවන අයුරින් කඟන්තොට මාර්ගය දෙපස පළමු හා දෙවන බිම් කට්ටි තුල වාණිජ ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය තුල අනුමත භාවිතයන් සලකා බැලිය හැකි අතර එහි බිම් කට්ටි ආවරණය 50% ක් විය යුතුය. ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකයක් ලබා ගත යුතුවේ.<br><br>ඒ) ෆ්‍රොලික් අයිලන්ඩ් විශේෂ ව්‍යාපෘති ප්‍රදේශය සඳහා යෝජිත ඉඩම් කට්ටි සඳහා එකී යොජිත භාවිතයන් සඳහා අවසර හිමි වේ. |

### 8.1.3 ආයතනික කලාපය

වගු අංකය 8.3: ආයතනික කලාපය

| | | |
|---|---|---|
| i. | **කලාපයේ නම** | **ආයතනික කලාපය** |
| ii. | **කලාප ලක්ෂණ** | පරිපාලන අග නගරයේ රාජ්‍ය, අර්ධ රාජ්‍ය, අනෙකුත් හා රට අදාළ ආනුෂාංගික භාවිතයන් ස්ථාපිත වීම ප්‍රමුඛ කරගත් කලාපයකි. |
| iii. | **කලාප මායිම්** | **උතුරට:** පොල්දූව මාර්ගය<br>**නැගෙනහිරට:** අකුරේගොඩ පාර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය<br>**දකුණට:** දියවන්නා උද්‍යාන මාවත<br>**බටහිරට:** පන්නිපිටිය බත්තරමුල්ල (174) බස් මාර්ගය, රජමල්වත්ත පාර |
| iv. | **කලාපයේ අංකය** | IZI |
| v. | **කලාප සංගුණකය** | 2.76 |
| vi. | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | **උපලේඛණය I** සහ **II** හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය |
| vii. | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | **උපලේඛණය II** සහ **III** හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය |
| viii. | **විවෘත අවකාශයන් සහ උපරිම උස** | **උපලේඛණය III** හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය |

| | | | |
|---|---|---|---|
| **ix.** | අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | ව.මීටර් 150 හා ***උපලේඛණය* IV** හි සඳහන් **"***උ***"** ආකෘතිය අනුව වියයුතුය | |
| **x.** | **අධි ඝනත්ව අයතික කලාපය සඳහා අවසරලත් භාවිතාවන්** | **ප්‍රධාන භාවිතය** | **අවසරලත් භාවිතයන් ( *උපලේඛණය* IV** හි සඳහන් **"***උ***"** ආකෘතිය අනුව**)** |
| | | නේවාසික | 1, 2, 3, 4, 5,6,7,8,9,10,16,17,18,19,20 |
| | | සෞඛ්‍ය | 2, 3,4, 5, 6,9,12 |
| | | කාර්යාල හා ආයතනික | 1, 2, 3, 4, 5 |
| | | වාණිජ | 1,2,4,5,7,8,11,12,16,17,18,19,21,28, 30,31,32,34 |
| | | අධ්‍යාපනික | 1 |
| | | සමාජ හා ආගමික | 7,8 |
| | | කර්මාන්ත | 10,11 |
| | | විනෝදාත්මක | 1,2, 3, 4, 8, 9, 10 |
| | | වෙනත් | 1*,2*,3*,4,5,9,10,11<br>*ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප I (භෞතික සීමාව ) බලපැවැත්වෙන 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි ආයතනික කලාපය තුළ වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සඳහා අවසර හිමි නොවේ. |
| **xi.** | **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | අ) ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාප I (භෞතික සීමාව) බලපැවැත්වෙන ආයතනික කලාපය තුළ, සිදු කිරීමට නියමිත සියලු සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරියේ සහ ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ.<br><br>ආ) ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය ආශ්‍රිත විශේෂ ආරක්ෂක කලාපය II බලපැවැත්වෙන 2023-2033 කලාපීකරණ සැලැස්මෙහි විශේෂ නේවාසික කලාපය තුළ වහලය මත ඉදිවන සන්නිවේදන කුළුණු ඇතුළත් සියලුම ආකාරයේ සන්නිවේදන කුළුණු සහ උස මීටර් 15 (බිම් මහල හා තවත් මහල් 5ක්) හෝ එය ඉක්මවන සියලුම ගොඩනැගිලි සඳහා ආරක්ෂක ආමාත්‍යාංශයේ (ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය) නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්යය වේ.<br><br>ඇ) මෙම කලාපයෙහි පාර්ලිමේන්තු කලාප III ට ඇතුළත් වන ප්‍රදේශය තුළ සිදුකරන සියලු සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණය හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තු නිරවුල් සහතික ලබා ගත යුතුය.<br><br>ඈ) බත්තරමුල්ල විශේෂ ව්‍යාපෘති ප්‍රදේශය සඳහා තුළ සිදුකරනු ලබන සියලු සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ මූලික සැලසුම් නිරාකරණ සහතිකයක් ලබා ගැනීම අනිවාර්ය වේ.<br><br>ඉ) නව නුවර මාර්ගයට මුහුණලා ඇති බිම් කට්ටි සඳහා කලාප සංගුණකය 3.05 කි. | |

ඊ) මෙම කලාපය තුළ දැන්වීම් පුවරු ස්ථාපනය කිරීමේදී පහත රෙගුලාසි අනුගමනය කල යුතු වේ.

අ) කලාපය තුළ කිසිදු ගොඩනැගිල්ලක වහලය මත බිල්පත් පුවරු සවි කිරීම සිදු නොකළ යුතුය.

ආ) මෙම කලාපය තුළ මුද්‍රිත දැන්වීම්, කටවුට් ( කඩදාසි රෙදි, ප්ලාස්ටික්, පොලිතීන්)සඳහා අවසර හිමි නොවේ. මරණ දැන්වීම්, අධ්‍යාපනික ආයතන දැන්වීම්, වෙළඳ ප්‍රචාරණ දැන්වීම්, දේශපාලනික දැන්වීම්,සහ ආගමික ප්‍රචාරණ දැන්වීම් ඉහත මුද්‍රිත දැන්වීම් ගණයේ ලා සැලකේ.

ඇ) මෙම කලාපය තුළ පොදු ස්ථාන තුළ පවතින පොදු ගොඩනැගිලි, පාලම්, විදුලි පහන් කණු සහ රජයට අයත් පොදු දේපලයන් හී දැන්වීම් ප්‍රචාරණය නොකල යුතුය

ඈ) ප්‍රධාන මාර්ගයන් අසළ වාණිජ සහ ලාබ ඉපයීම මත පදනම්ව බිල්පත් පුවරු, ඩිජිටල් පුවරු ගොඩනැගිලි මුහුණතේ සවිකිරීමේ දී ගොඩනැගිලි මුහුණතේ සිට අඩි 1 ½ සීමාවක් තුළ දැන්වීම් පුවරු සවිකළ යුතු අතර එම දැන්වීම් පුවරු බිම් මට්ටමේ සිට අඩි 10ක උසින් යුත්තව සවි කළ යුතු වේ.

උ) මෙම කලාපය තුළ ඉදිකරනු ලබන බිම් මහලෙහි සිට තවත් මහල් හතරක් හෝ ඊට වඩා වැඩි උසින් යුතු ආයතනික ගොඩනැගිලි සඳහා පහත රෙගුලාසි බලපැවැත්වේ.

අ) ගොඩනැගිලි වහලය මත වර්ග අඩි 150 (වර්ග මීටර් 14) ඉක්මවන ඇන්ටනා කුලුණු ස්ථාපනය නොකළ යුතුය.

ආ) රාජ්‍ය ආයතන සහ පොදු ජනතාව සමග කටයුතු කරනු ලබන සියලු ආයතන ගොඩනැගිලි ඉදිකිරීමේදී, පැමිණෙන ජනතාවට රැඳී සිටීමට හැකි වන පරිදි අවකාශය නිර්මාණය කළ යුතු අතර එම අවකාශය එළිමහන් ස්ථානයක ඉදිකරන විට ජනතාවට අසුන් ගෙන සිටීමට සහ ආරක්ෂිතව රැඳී සිටීමට හැකි වන ලෙස එම අවකාශය නිර්මාණය කිරීම අනිවාර්‍ය වේ.

ඇ) වීදි සහ ප්‍රධාන මාර්ගයන්ට යාබදව පිහිටි ආයතනවල ගොඩනැගිලි සඳහා පැහැදිලි හඳුනාගත හැකි ඉදිරිපස දොරටු එකක් හෝ ඊට වැඩි ගණනක් පවත්වා ගත යුතු අතර එම ස්ථාන තුළ ජනතාවට අසුන් ගෙන සිටීමට සහ ආරක්ෂිතව රැඳී සිටීමට හැකි වන ලෙස පොදු අවකාශයක් පවත්වා ගත යුතු වේ.

ඈ) ගොඩනැගිලි ප්‍රවේශයන් පැහැදිලිව ප්‍රක්ෂේපණය කළ යුතු අතර ඒ සඳහා සුදුසු වර්ණයන්, සංඥා පුවරු සහ ආලෝකයන් සුදුසු පරිදි භාවිතා කළ යුතු වේ.

ඉ) වාණිජ හා පොදු ගොඩනැගිලි වල වීදි හා ප්‍රධාන මාර්ගයන්ට යාබද ජනේල අඳුරු නොවන, පාරදෘශ්‍ය මාධ්‍ය (වීදුරු) භාවිතා කරමින් සකස් කිරීම අනිවාර්‍ය වේ.

ඌ) රජයේ ආයතන සඳහා මායිම් තාප්ප යෙදීමට දිරිගැන්වීම් නොකළ යුතු වන අතර අත්‍යාවශ්‍ය අවස්ථාවකදී යොදා ගන්නේ නම් පහත පරිදි ඉදිකිරීම වඩාත් යෝග්‍ය වේ.



| | |
|---|---|
| | ඒ) මෙම කලාපය තුළ ඉදිකරනු ලබන සියලු ඉන්ධන පිරවුම්හල් අවට මායිම භූ දර්ශනය කළ යුතු වේ.<br><br>ඒ) මෙම කලාපය තුළ පොදු සහ පුද්ගලික එළිමහන් රථගාල් හි නවතා තබනු ලබන වාහන ගණන පහකට වඩා වැඩි වන අවස්ථාවන් හි දී රථගාල තුළ අනතුරුදායක නොවන පරිදි ශාක මගින් සෙවණ සැපයිය යුතුය.<br>අ) එම රථගාල් ප්‍රධාන මාර්ගයට ආසන්නව පවතින විට විදුලි ආලෝක පහන් සහිතව නිර්මාණය කිරීම කළ යුතු අතර විදුලි ආලෝකය ලබා ගැනීම සඳහා සූර්ය බලශක්තිය යොදා ගැනීම දිරිගැන්විය යුතුය<br>ආ) රථගාල් සඳහා බිම් ඇතුරුම් ගල් යොදනු ලබන අවස්ථාවේදී තණකොළ සහිතව ඇතුරුම් ගල් භාවිතා කිරීම අනිවාර්ය වේ.<br><br>ඔ) වීදි ආලෝක පහන් භාවිතයේදී රාත්‍රී අහසෙහි දර්ශනයට බාධා නොවන පරිදි ආලෝක පහන් ස්ථාපනය කළ යුතු අතර අහස දෙසට විහිදෙන ආකාරයේ ආලෝක ලාම්පු, විදුලි බල්බ සහ ඩිජිටල් පුවරු ස්ථාපනය නොකළ යුතුය.<br><br>ඕ) ස්වභාවික තෙත්බිම් ආසන්නයේ පිහිටි වීදි ලාම්පු අවම තීව්‍රතාවයකින් පවත්වා ගත යුතු අතර සතුන්ට හා පරිසරයට හානි නොවන ලෙස එම වීදි පහන් කණු සවි කිරීම කළ යුතුය.<br><br>ක) වගුව 8.3.1 අනුව තෝරා ගන්නා ලද වෘක්ෂයන් වීදි දෙපස සිටුවීමට යෝග්‍ය වන අතර නිසි පරතරයකින් යුක්තව වෘක්ෂයන් රෝපණය කළ යුතු වේ.<br><br>ග) පදික වේදිකා තුළ සහ මාර්ගයට යාබදව ශාක රෝපණ කිරීමේදී පදික ප්‍රදේශයට යටින් ගැඹුරු ශාක මුල් වර්ධනය අවම කිරීම සඳහා ශාක රෝපණ කිරීමේදී නිර්මිත කොන්ක්‍රීට් සිලින්ඩරයක හෝ ඒ හා සමාන ව්‍යුහාත්මක ඉදිකිරීමක් තුළ සිදු කළ යුතු අතර ඉඩකඩ අවම ස්ථානයන්හි දී මල් බඳුන් සහ පෝච්චි භාවිතය තුළින් හරිත ගහනය වර්ධනය සිදුවන ආකාරයට පවත්වා ගත යුතුය.<br><br>ජ) ප්‍රධාන මාර්ගයන්ට සහ වීදීන්ට මුහුණලා ඇති ගොඩනැගිලි හි සදළුතල හා පියසි මහල (roof terrace) හරිත ආවරණයන් සහිතව පවත්වා ගත යුතුය. |

වගු අංකය 8.3.1. වෘක්ෂ ලැයිස්තුව

ආයතනික කලාපය සඳහා යොදා ගත හැකි ගස් පදුරු සහ වැල් වර්ග පහත පරිදි වේ.

| | | | |
|---|---|---|---|
| 1) කරද | 2) මගුල් කරද | 3) මුරුත | 4) කුඹුක් |
| 5) වල් ඇහැළ | 6) මැයි මාර | 7) කොබෝලීල | 8) රුක්අත්තන |
| 9) මදටිය | 10) දියමිදෙල්ල | 11) දොඹ | 12) දවට |
| 13) කහකෝණ | 14) කස | 15) මූනමල් | 16) ගම්මාලු |
| 17) පාරේ මාර | 18) අසෝක | 19) ගන්සූරිය | |

### 8.1.4 මිශ්‍ර සංවර්ධන කලාප I- වාණිජ ප්‍රමුඛ කරගත් මිශ්‍ර සංවර්ධන කලාපය

වගු අංකය 8.4: මිශ්‍ර සංවර්ධන කලාප I- වාණිජ ප්‍රමුඛ කරගත් මිශ්‍ර සංවර්ධන කලාපය

<table>
<tr><td>i.</td><td>ප්‍රධාන කලාපයේ නම</td><td colspan="2">වාණිජ ප්‍රමුඛ කරගත් මිශ්‍ර සංවර්ධන කලාපය</td></tr>
<tr><td>ii.</td><td>කලාප ලක්ෂණ</td><td colspan="2">වාණිජ ප්‍රමුඛ කරගත් මිශ්‍ර භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලබන කලාපයකි</td></tr>
<tr><td>iii.</td><td>කලාප මායිම්</td><td colspan="2">උතුරට: ගොඩගම මාර්ගයෙහි පළමු බිම් කට්ටියේ සීමාව<br>නැගෙනහිරට: හෝමාගම ප්‍රදේශීය සභා සීමාව<br>දකුණට: මහරගම නගර සභා සීමාව<br>බටහිරට: කොට්ටාව මාලබේ මාර්ගය</td></tr>
<tr><td>iv.</td><td>කලාප අංකය</td><td colspan="2">MD1</td></tr>
<tr><td>v.</td><td>කලාප සංගුණකය</td><td colspan="2">1.51</td></tr>
<tr><td>vi.</td><td>අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය</td><td colspan="2">උපලේඛණය I සහ II හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>vii.</td><td>අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය</td><td colspan="2">උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>viii.</td><td>විවෘත අවකාශයන් සහ උපරිම උස</td><td colspan="2">උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td>ix.</td><td>අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="2">ව.මීටර් 150 හා උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td rowspan="10">x.</td><td rowspan="10">අවසරලත් භාවිතාවන්</td><td>ප්‍රධාන භාවිතය</td><td>අවසරලත් භාවිතයන් ( උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව)</td></tr>
<tr><td>නේවාසික</td><td>1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14, 16,17,18,19,20,21</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>1,2,3,4,5,6,7,8,9,10,11,12,13</td></tr>
<tr><td>කාර්යාල හා ආයතනික</td><td>1,2,3,4,5</td></tr>
<tr><td>වාණිජ</td><td>1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16, 17,18,19,20,21,22,2,3,24,25,26,27,28, 29,30,31,32,33,34</td></tr>
<tr><td>අධ්‍යාපනික</td><td>1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14</td></tr>
<tr><td>සමාජ හා ආගමික</td><td>1,2,3,4,5,6,7,8</td></tr>
<tr><td>කර්මාන්ත</td><td>1,2,4,5,10,11,12,13,14,15</td></tr>
<tr><td>විනෝදාත්මක</td><td>1,2,3,4,5,6,7,8,9,10</td></tr>
<tr><td>වෙනත්</td><td>1,2,3,4,5,7,8,9,10,11,12</td></tr>
</table>

| | | |
|---|---|---|
| **xi.** | **කලාපය සඳහා වන පොදු රෙගුලාසි** | අ) මෙම කලාපය තුළ අවසරලත් කර්මාන්ත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිරවුල් සහතිකය ලබා ගැනීම අනිවාර්ය වේ. |

### 8.1.5 මිශ්‍ර සංවර්ධන කලාපය II- අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය

වගු අංකය 8.5: මිශ්‍ර සංවර්ධන කලාපය II- අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය

| | | | |
|---|---|---|---|
| **i.** | **ප්‍රධාන කලාපය** | **අධි ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය** | |
| **ii.** | **කලාප ලක්ෂණ** | කර්මාන්ත භාවිතයන් ප්‍රමුඛ කර ගනිමින් මිශ්‍ර සංවර්ධන භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලබන කලාපයකි | |
| **iii.** | **කලාප මායිම්** | **උතුරට:** වැක්කියවත්ත පාර**,** කුඹුරු මායිම<br>**නැගෙනහිරට:** හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව, හබරකඩ හෝමාගම මාර්ගය<br>**දකුණට:** අභයතිස්ස මාවත,<br>**බටහිරට:** කඩුවෙල අතුරුගිරිය මාර්ගය, ගල්වරුසාව පාර, | |
| **iv.** | **කලාප අංකය** | **MD2** | |
| **v.** | **කලාප සංගුණකය** | 1.2**1** | |
| **vi.** | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | **උපලේඛණය I** සහ **II** හි සඳහන් **"**අ**"** සහ **"**ආ**"** ආකෘති අනුව වියයුතුය | |
| **vii.** | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | **උපලේඛණය II** සහ **III** හි සඳහන් **"**ආ**"** සහ **"**ඉ**"** ආකෘති අනුව වියයුතුය | |
| **viii.** | **වීථෘත අවකාශයන් සහ උපරිම උස** | **උපලේඛණය III** හි සදහන් **"**ඉ**"** ආකෘතිය අනුව වියයුතුය | |
| **ix.** | අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | වර්ග මීටර් **150** හා **උපලේඛණය IV** හි සඳහන් **"**උ**"** ආකෘතිය අනුව වියයුතුය | |
| **x.** | **අවසරලත් භාවිතාවන්** | **ප්‍රධාන භාවිතය** | **අවසරලත් භාවිතයන් ( උපලේඛණය IV** හි සදහන් "උ" ආකෘතිය අනුව**)** |
| | | නේවාසික | 1,5,8,9,10,18 |
| | | සෞඛ්‍ය | 2,3,4,5,6,9 |
| | | කාර්යාල හා ආයතනික | 1, 4 |
| | | වාණිජ | 2,4,5,6,7,8,18,21,24,25,26,27,28,29,30,31,32 |
| | | අධ්‍යාපනික | 8,14 |
| | | සමාජ හා ආගමික | 5,8 |
| | | කර්මාන්ත | 1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16,17 |
| | | විනෝදාත්මක | 4,6,7,9 |
| | | වෙනත් | 1,2,3,4,5,7,8,9,10,11,12 |

| | | |
|---|---|---|
| xi. | කලාපය සඳහා වන පොදු රෙගුලාසි | ආ) මෙම කලාපය තුළ අවසරලත් කර්මාන්ත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිරවුල් සහතික ලබාගැනීම අනිවාර්යය වන අතර ,සැලසුම් කමිටුවෙහි නිර්දේශයට යටත්ව අදාළ අනෙකුත් ආයතන වලින් නිර්දේශ ලබා ගත යුතු වේ .<br>ආ) මෙම කලාපය තුළ යෝජිත කර්මාන්තයන් හි ස්වභාවය අනුව හා අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 1000 අවශ්‍ය වන කර්මාන්ත සදහා ගොඩනැගිලි මායිමේ සිට අවමය මීටර් තුනක් සහිත වෘක්ෂලතා වලින් සමන්විත ස්වාරක්ෂක කලාපයක් ඉඩම වටා පවත්වා ගත යුතුය<br>ඇ) අවසරලත් කාර්යාල සදහා උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර් 250 විය යුතුවේ. |

### 8.1.6 මිශ්‍ර සංවර්ධන කලාපය III- අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය

වගු අංකය 8.6: මිශ්‍ර සංවර්ධන කලාපය III- අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය

| | | | |
|---|---|---|---|
| i. | **ප්‍රධාන කලාපය** | **අඩු ඝනත්ව කර්මාන්ත ප්‍රමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය** | |
| ii. | **කලාප ලක්ෂණ** | අඩු ඝනත්ව කර්මාන්ත භාවිතයන් දිරිගන්වමින් මිශ්‍ර සංවර්ධන භාවිතයන් ප්‍රවර්ධනය කරනු ලබන කලාපයකි | |
| iii. | **කලාප මායිම්** | **උතුරට:** ලෝලෙවල් මාර්ගය<br>**නැගෙනහිරට:** හෝමාගම ප්‍රදේශීය සභා සීමාව<br>**දකුණට:** කොරතොට පන්සල් කන්ද හා කුඹුරු මායිම<br>**බටහිරට:** කඩුවෙල අතුරුගිරිය මාර්ගය, වෙලේහංදිය තෙත්බිම්, | |
| iv. | **කලාප අංකය** | **MD3** | |
| v. | **කලාප සංගුණකය** | **1.18** | |
| vi. | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | **උපලේඛණය I** සහ අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය 50% | |
| vii. | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | **උපලේඛණය II** සහ **III** හි සදහන් **“**ආ**”** සහ **“**ඉ**”** ආකෘති අනුව වියයුතුය | |
| viii. | **වීථෘත අවකාශයන් සහ උපරිම උස** | **උපලේඛණය III** හි සදහන් **“**ඉ**”** ආකෘතිය අනුව වියයුතුය | |
| ix. | අනුබෙදීම් කල හැකි **අවම බිම් ප්‍රමාණය** | වර්ග මීටර් **150** හා **උපලේඛණය IV** හි සදහන් **“**උ**”** ආකෘතිය අනුව වියයුතුය | |
| | | **ප්‍රධාන භාවිතය** | **අවසරලත් භාවිතයන් ( උපලේඛණය IV** හි සදහන් **“**උ**”** ආකෘතිය අනුව**)** |
| | | නේවාසික | 1,5,8,9,10,18 |
| | | සෞඛ්‍ය | 2,3,4,5,6,9 |
| | | කාර්යාල හා ආයතනික | 1,4 |

| | | | |
|---|---|---|---|
| | | වාණිජ | 2,4,5,6,7,8,18,19,21,24,25,26,27,28,29,30,3132 |
| | | අධ්‍යාපනික | 1,8,14 |
| | | සමාජ හා ආගමික | 6,7,8 |
| | | කර්මාන්ත | 1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16,17,19 |
| | | විනෝදාත්මක | 4,6,9 |
| | | වෙනත් | 1,2,3,4,5,7,8,9,10,11,12 |
| x. | වෙනත් | අ) මෙම කලාපය තුළ අවසරලත් කර්මාන්ත සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ නිරවුල් සහතික ලබාගැනීම අනිවාර්යය වන අතර ,සැලසුම් කමිටුවෙහි නිර්දේශයට යටත්ව අදාළ අනෙකුත් ආයතන වලින් නිර්දේශ ලබා ගත යුතු වේ .<br><br>ආ) මෙම කලාපය තුළ යෝජිත කර්මාන්තයන් හි ස්වභාවය අනුව හා අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 1000 අවශ්‍ය වන කර්මාන්ත සදහා ගොඩනැගිලි මායිමේ සිට අවමය මීටර් තුනක් සහිත වෘක්ෂලතා වලින් සමන්විත ස්වාරක්ෂක කලාපයක් ඉඩම වටා පවත්වා ගත යුතුය<br><br>ඇ) මෙම කලාපය තුළ දිවා සුරැකුම් මධ්‍යස්ථාන සදහා අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 1000 ක් වන අතර ගෙබිම් ආවරණය 50%ක් විය යුතුවේ.<br><br>ඈ) අවසරලත් කාර්යාල සදහා උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර් **500** විය යුතුවේ. | |

**8.1.7. මිශ්‍ර සංවර්ධන කලාපය IV- කැළණි ගඟාභිමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය**

වගු අංකය 8.7: මිශ්‍ර සංවර්ධන කලාපය IV- කැළණි ගඟාභිමුඛ මිශ්‍ර සංවර්ධන කලාපය

| | | |
|---|---|---|
| **i.** | **ප්‍රධාන කලාපය** | **මිශ්‍ර සංවර්ධන කලාපය IV (කැලණි ගග ආශ්‍රිත ප්‍රදේශය)** |
| **ii.** | **කලාප මායිම්** | **උතුරට:** කැළණි ගග<br>**නැගෙනහිරට:** හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව<br>**දකුණට:** ලෝලෙවල් මාර්ගය<br>**බටහිරට:** කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රදේශීය සභා සීමාව |
| **iii.** | **කලාප අංකය** | **MD**4 |
| **iv.** | **කලාප සංගුණකය** | **1.05** |
| **v.** | **අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය** | **50%** |
| **vi.** | **අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය** | **උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය** |
| **vii.** | **වීථෘත අවකාශයන් සහ උපරිම උස** | **උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය** |

<table>
<tr><td>viii.</td><td>අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="2">පර්චස් 8 (වර්ග මීටර් 200) හා උපලේඛණය IV හි සදහන් "උ" ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td rowspan="9">ix.</td><td rowspan="9">අවසරලත් භාවිතාවන්</td><td>ප්‍රධාන භාවිතය</td><td>අවසරලත් භාවිතයන් (උපලේඛණය IV හි සදහන් "උ" ආකෘතිය අනුව)</td></tr>
<tr><td>නේවාසික</td><td>1,6,7,17,18,19,20</td></tr>
<tr><td>කාර්යාල හා ආයතනික</td><td>1,2,4,</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>2,3</td></tr>
<tr><td>වාණිජ</td><td>1,2,7,8,9,10,11,12,13,14,15,18,20,21,26,</td></tr>
<tr><td>විනෝදාත්මක</td><td>1,2,4,5,6,7,8,9,10</td></tr>
<tr><td>කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තය</td><td>1,2</td></tr>
<tr><td>වෙනත්</td><td>1,2,3,4</td></tr>
<tr><td colspan="2"></td></tr>
<tr><td>x.</td><td>කලාපය සඳහා වන පොදු රෙගුලාසි</td><td colspan="2">අ) කැළණි ගඟ සදහා පවතින ගඟ ඉවුරේ සිට අඩි 50 රක්ෂිතය ක් පවත්වා ගතයුතුය<br><br>ආ) රජය මගින් හඳුනා ගත් ව්‍යාපෘති හෝ සංවර්ධන සැලසුම මගින් හදුනා ගනු ලැබූ භූ දර්ශන ව්‍යාපෘති හැර ගඟ රක්ෂිතය තුළ වෙනත් කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර දෙනු නොලැබේ.<br><br>ඇ) කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි නැගෙනහිර මායිමේ සිට කඩුවෙල මංසන්ධිය දක්වා වූ ප්‍රදේශයෙහි ලෝලෙවල් මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය තුළ පමණක් පරිසර හිතකාමී නිෂ්පාදන කර්මාන්ත හා ගබඩා භාවිතයන් සදහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකයක් ලබා ගැනීමට යටත්ව සළකා බැලිය හැකිය.<br><br>ඈ) කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශයෙහි බටහිර මායිමේ සිට පිටත වටරවුම් අධිවේගී මාර්ගයෙහි අන්තර් හුවමාරු මධ්‍යස්තානය දක්වා වූ ප්‍රදේශයෙහි අධිවේගී මාර්ග ආශ්‍රිත කලාප සදහා වන සංවර්ධන රෙගුලාසි වලට යටත්ව ලෝලෙවල් මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය තුළ පමණක් පරිසර දෘෂ්‍ය කාරක නොවන සහ මහජනතාවට පීඩාකාරී නොවන ගබඩා භාවිතයන් හා නිෂ්පාදන කර්මාන්ත භාවිතයන් සදහා නාගරික සංවර්ධන අධිකාරියේ නිරවුල් සහතිකයක් ලබා ගැනීමට යටත්ව සළකා බැලිය හැකිය.<br><br>ඉ) මෙම කලාපය තුළ ගං වතුර තර්ජනයට භාජනය වන ස්ථානයන්හි ගොඩනගිලි ඉදි කිරීම් සිදු කිරීමේදී, ජල ගැලීම් මට්ටම සම්බන්ධයෙන් අදාළ ආයතනයන් ගෙන් ( වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව) නිර්දේශ ලබා ගැනීමෙන් අනතුරුව ඊට අනුකූලව සංවර්ධනය සිදුකළ යුතු වේ .<br><br>ඊ) ගොඩනැගිලි මුහුණත වර්ණ ගැන්වීමේදී දීප්තිමත් වර්ණ භාවිතා නොකළ යුතු අතර ස්වභාවික පරිසරයට උචිත වර්ණ භාවිතා කළයුතු යුතුවේ .</td></tr>
</table>

### 8.1.8 වාණිජ කලාපය

වගු අංකය 8.8: වාණිජ කලාපය

<table>
<tr><td>i.</td><td>ප්‍රධාන කලාපයේ නම</td><td colspan="2">වාණිජ කලාපය</td></tr>
<tr><td>ii.</td><td>කලාප ලක්ෂණ</td><td colspan="2">වාණිජ භාවිතයන් දිරිගන්වන කලාපයක් ලෙස මෙම කලාපය සැලකිය හැකිය.</td></tr>
<tr><td>iii.</td><td>කලාප මායිම්</td><td colspan="2">උතුරට: ලෝලෙවල් මාර්ගය<br>නැගෙනහිරට: වෙළේ හංදිය බෝධිය අසළ පුද්ගලික මාර්ගය<br>දකුණට: හෙට්ටිගේ ඔය හා ඒ ආශ්‍රිත තෙත්බිම් ප්‍රදේශය<br>බටහිරට: පිටත වටරවුම් අධිවේගී මාර්ගය</td></tr>
<tr><td>iv.</td><td>කලාප අංකය</td><td colspan="2">C1</td></tr>
<tr><td>v.</td><td>කලාප සංගුණකය</td><td colspan="2">1.65</td></tr>
<tr><td>vi.</td><td>අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය</td><td colspan="2">උපලේඛණය I සහ II හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>vii.</td><td>අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය</td><td colspan="2">උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>viii.</td><td>වීථෘත අවකාශයන් සහ උපරිම උස</td><td colspan="2">උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td>ix.</td><td>අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="2">ව.මීටර් 150 හා උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td rowspan="9">x.</td><td rowspan="9">අවසරලත් භාවිතාවන්</td><td>ප්‍රධාන භාවිතය</td><td>අවසරලත් භාවිතයන් (උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව)</td></tr>
<tr><td>නේවාසික</td><td>1,2,3,4,6,7,8,9,10,17,18,19,20</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>2,3,4,5,6,7,11,12,13</td></tr>
<tr><td>වාණිජ</td><td>1,2,3,4,5,6,7,8,9,10,11,12,13,14,15,16,17,18,19,20,21,22,23,24,25,26,27,28,29,30,31,32,33,34</td></tr>
<tr><td>කාර්යාල හා ආයතනික</td><td>1,2,3,4</td></tr>
<tr><td>අධ්‍යාපනික</td><td>2,8,9,10,11,12</td></tr>
<tr><td>කර්මාන්ත</td><td>2,10,11,</td></tr>
<tr><td>විනෝදාත්මක</td><td>1,2,3,4,5,6,7,8,9,10</td></tr>
<tr><td>වෙනත්</td><td>1,2,3,4,5,9,10,11</td></tr>
<tr><td>xi.</td><td>කලාපය සඳහා වන පොදු රෙගුලාසි</td><td colspan="2">අ) ලෝලෙවල් මාර්ගය හා කඩුවෙල ප්‍රධාන මාර්ගය එනම් නව නුවර මාර්ගය දෙපස පළමු බිම් කට්ටිය තුළ සංවර්ධන කටයුතු සිදුකිරීමට ප්‍රථම නාගරික සංවර්ධන අධිකාරියෙන් මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබා ගත යුතුය.</td></tr>
</table>

| | |
|---|---|
| | ආ) මෙම කලාපය තුළ කඩුවෙල ප්‍රධාන මාර්ගය එනම් නව නුවර මාර්ගය හා ලෝලෙවල් මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය සඳහා කලාප සංගුණකය 3.05 ක් වේ.<br><br>ඇ) කඩුවෙල මංසන්ධියේ සිට බටහිර දෙසට ලෝ ලෙවල් මාර්ගයෙහි මීටර් 100 දක්වා (රන්කඩු පත්තිනි දේවාලයෙහි පිවිසුම් මාර්ගය දක්වා) සහ කඩුවෙල මංසන්ධියේ සිට නැගෙනහිර දෙසට මීටර් 950 දක්වා (මහමෙවුනා බෞද්ධ මධ්‍යස්ථානය දක්වා) මාර්ගයට මුහුණලා පවතින ඉඩම් කොටස් සඳහා ගොඩනැගිලි සීමාව හැර මීටර් 2 ක ආකේඩයක් පවත්වා ගත යුතුවේ<br><br>ඈ) කඩුවෙල මංසන්ධියේ සිට කඩුවෙල ප්‍රධාන මාර්ගය එනම් නව නුවර මාර්ගයෙහි මීටර් 150 දක්වා (කඩුවෙල මහනගර සභාවෙහි පිවිසුම් මාර්ගය දක්වා) මාර්ගයට මුහුණලා පවතින ඉඩම් කොටස් සඳහා ගොඩනැගිලි සීමාව හැර මීටර් 2 ක ආකේඩයක් පවත්වා ගත යුතුවේ.<br><br>ඉ)වාණිජ කලාපයෙ හි කඩුවෙල ප්‍රධාන මාර්ගයට එනම් නව නුවර මාර්ගයට සහ ලෝ ලෙවෙල් මාර්ගයට මුහුණලා සිදු කරනු ලබන නේවාසික නොවන සංවර්ධනයන්හිදී ගොඩනැගිලි හා මාර්ගයට දෘෂයවන සියලුම ගොඩනැගිලි මුහුණත් හා නේවාසික ගොඩනැගිලි වල මාර්ගයට දෘශ්‍ය වන සියලුම ගොඩනැගිලි මුහුණත්, ස්වභාවික පරිසරයට ගැළපෙන අයුරින් ගොඩනැගිලි වර්ණාලේපිත කළ යුතු වේ.<br><br>ඊ) කඩුවෙල ප්‍රධාන මාර්ගයට එනම් නව නුවර මාර්ගයට සහ ලෝ ලෙවල් මාර්ගයට මුහුණලා පිහිටි ඉඩම් කොටස් සඳහා මායිම් තාප්ප ඉදි කිරීමට අවසර ලබා නොදෙන අතර, ඒ වෙනුවට උපරිම මීටර් 1ක උසකින් යුත් බැම්මක් සහිත යකඩ වැටක් හෝ හරිත වැටක් සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබේ. එකී ඉඩම දෙපස හා පසුපස මායිම තුළ මායිම් තාප්ප ඉදි කිරීමට අවසර දෙනු ලැබේ.<br><br>උ) මෙම කලාපය තුළ ස්ථිර නාම පුවරු හෝ වෙළඳ දැන්වීම් පුවරු සවි කිරීමේදී විදියට ලම්බකව හෝ ගොඩනැගිල්ලේ පෙනුමට බාධා නොවන පරිදි සවිකළ යුතු අතර ,රථ වාහන තදබදය ඇති වන ආකාරයෙන් හෝ රථ වාහන වලට අනතුරුවලට තුඩු දෙන ආකාරයෙන් මායිම් තාප්ප වල ,ඉවුරු වල වෙළඳ දැන්වීම් හෝ නාම පුවරු ඇලවීම , .හෝ සවි කිරීම නොකළ යුතුය<br><br>ඌ) කඩුවෙල ප්‍රධාන මාර්ගය එනම් නව නුවර මාර්ගයට හා ලෝ ලෙවෙල් මාර්ගයට මුහුණලා සිදු කරනු ලබන සංවර්ධනයන්හිදී සියලුම ගොඩනැගිලි මුහුණත සහ ගොඩනගිලි සිමාව මෘදු භූ දර්ශන සහිතව පවත්වා ගෙන යා යුතුවේ. |

### 8.1.9: දැනුම නගර සංවර්ධන කලාපය

වගු අංකය 8.9: දැනුම නගර සංවර්ධන කලාපය

<table>
<tr><td>i.</td><td>ප්‍රධාන කලාපය</td><td colspan="2">දැනුම නගර සංවර්ධන කලාපය</td></tr>
<tr><td>ii.</td><td>කලාප ලක්ෂණ</td><td colspan="2">තොරතුරු තාක්ෂණය මූලික කරගත් අධ්‍යාපනික ආයතන කටයුතු හා රට ආනුශාංගික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික හා ජාත්‍යාන්තර වශයෙන් අනන්‍යතාවයකින් යුත් කලාපයකි.</td></tr>
<tr><td>iii.</td><td>කලාප මායිම්</td><td colspan="2">උතුරට: ලෝලෙවල් මාර්ගය<br>නැගෙනහිර පිටත වටරවුම් අධිවේගී මාර්ගය<br>දකුණට: කඩුවෙල මාලබේ බස් මාර්ගය හා කුඹුරු යාය<br>බටහිරට:චන්ද්‍රිකා කුමාරතුංග මාර්ගය</td></tr>
<tr><td>iv.</td><td>උප කලාපය</td><td>තොරතුරු තාක්ෂණික කලාපය I</td><td>තොරතුරු තාක්ෂණික කලාපය II</td></tr>
<tr><td>v.</td><td>කලාප අංකය</td><td>KZI</td><td>KZII</td></tr>
<tr><td>vi.</td><td>කලාප සංගුණකය</td><td>1.54</td><td>1.24</td></tr>
<tr><td>vii.</td><td>අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය</td><td colspan="2">උපලේඛණය I සහ II හි සදහන් “අ” සහ “ආ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>viii.</td><td>අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය</td><td colspan="2">උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>ix.</td><td>විවෘත අවකාශයන් සහ උපරිම උස</td><td colspan="2">උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td>x.</td><td>අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="2">තොරතුරු තාක්ෂණ කලාපය I - වර්ග මීටර් 250<br>(තොරතුරු තාක්ෂණ කලාපය I හි පමණක්, “පවතින බිම් කට්ටියක්” යන්නෙන් අදහස් කරනු ලබන්නේ 2009 පෙබරවරි 27 ට පෙර පැවති බිම් කොටසක් වේ)<br>තොරතුරු තාක්ෂණ කලාපය II - වර්ග මීටර් 150</td></tr>
<tr><td rowspan="5">xi.</td><td rowspan="5">අවසරලත් භාවිතාවන්</td><td>ප්‍රධාන භාවිතය</td><td>අවසරලත් භාවිතයන් (උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව)</td></tr>
<tr><td>නේවාසික</td><td>1,2,3,4,5,6,7,8,9,10,16,17,18,19,20</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>2,4,6,12</td></tr>
<tr><td>කාර්යාල හා ආයතනික</td><td>1,2,3 (තොරතුරු තාක්ෂණික භාවිතයන්ට අදාල කාර්යාල පමණයි), 4</td></tr>
<tr><td>වාණිජ</td><td>1,2,7,8,10,11,12,15,18,19,20,21,24,28,31</td></tr>
</table>

<table>
<tr><td rowspan="6"></td><td>අධ්‍යාපන</td><td>1,5,6,7,14</td></tr>
<tr><td>සමාජ හා ආගමික</td><td>7,8</td></tr>
<tr><td>කර්මාන්ත</td><td>19</td></tr>
<tr><td>විනෝදාත්මක</td><td>1,3,4,5,6,7,8,9,10</td></tr>
<tr><td>වෙනත්</td><td>1,2,3,4,5,10,11</td></tr>
<tr><td colspan="2">*වැදගත්: උපලේඛණය IV හි සඳහන් "උ" ආකෘතිය අනුව අවසරලත් භාවිතාවන් සඳහා පවතින අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 150 ලෙස සඳහන් කර තිබුණ ද එකී භාවිතයන් සඳහා තොරතුරු තාක්ෂණ කලාපය I අදාළ අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් 250 පවත්වා ගත යුතු වේ.<br>**වැදගත්: පර්චස් 12 30-අතර පාරම්පරික ඉඩමක් පවුලේ සාමාජිකයන් අතර බෙදීමක් සිදු කරනු ලබන අවස්ථාවකදී, එම අනුබෙදුමෙහි බිම් කට්ටියක අවම බිම් ප්‍රමාණය පර්චස් 6 ක් ලෙස සලකා බැලිය හැකි වේ.<br><br>***වැදගත්: ලෝ ලෙවෙල් මාර්ගයට මුහුණලා පවතින පළමු බිම් කට්ටිය තුල මිශ්‍ර සංවර්ධන කලාපයේ සියලු භාවිතයන් සඳහා අවසර දෙනු ලැබේ.<br><br>****වැදගත්: තොරතුරු තාක්ෂණ කලාපය I තුළ ප්‍රචාරක පුවරු සඳහා අවසර දෙනු නොලැබේ.<br><br>*****වැදගත්: කඩුවෙල ප්‍රධාන මාර්ගයට (නව නුවර මාර්ගයට) මුහුණලා පවතින පළමු බිම් කට්ටිය සඳහා උපලේඛණය IV හි සඳහන් "උ" ආකෘතිය අනුකූලව පවතින සියලු වාණිජ භාවිතයන් සඳහා අවසර හිමි වන අතර එකී පළමු බිම් කට්ටිය සඳහා බලපැවැත්වෙන කලාප සංගුණකය 3.05කි.</td></tr>
<tr><td>i. කලාපය සඳහා වන පොදු රෙගුලාසි</td><td colspan="2">අ) මෙම කලාපය තුල ඇති කිසිදු තෙත්බිමක් නාගරික සංවර්ධන සැලැස්ම මගින් හදුනා ගනු ලැබූ ව්‍යපෘතින් හැර අනිකුත් කිසිදු ව්‍යාපෘතියක් සඳහා ගොඩ කර සංවර්ධන කිරීමට අවසර දෙනු නොලැබේ.<br><br>අ) අක්කරය හෝ ඊට වැඩ වැඩි ඉඩම් සංවර්ධනයට පෙර නාගරික සංවර්ධන අධිකාරිය මගින් මූලික සැලසුම් නිරාකරණයක් ලබා ගත යුතු වේ.<br><br>ආ)අක්කරයක් හෝ ඊට වැඩ වැඩි ඉඩම අනු බෙදුම් කිරීමේදී 50% ක් ප්‍රමාණයක් තාක්ෂණික හෝ අධ්‍යාපනික භාවිතයන් සඳහා වෙන් කල යුතු වේ.<br><br>ඇ) ප්‍රධාන මාර්ග වලට මුහුණලා පවතින හෝ කුඹුරු, තෙත්බිම් වලට මායිම්ව පවතින ඉඩම් සංවර්ධනය කිරීමේදී ඉඩම සඳහා මායිම් තාප්ප අනුමත නොකරන අතර උපරිම මීටර් 1ක උසකින් යුත් බැම්මක් සහිත යකඩ වැටවල් හා හරිත වැටවල් සඳහා පමණක් අවසර ලබා දෙනු ලැබේ.<br><br>ඈ) මෙම අධිකාරියේ අනුමතයකින් තොරව කිසිදු මාර්ගයක් දැනුම නගර කලාපය තුළ පවතින චන්ද්‍රිකා කුමාරතුංග මාවත සමග තෙත්බිම හෝ කුඹුරු ඉඩම් ඔස්සේ සම්බන්ධ කල නොහැක.<br><br>ඉ) ගොඩනැගිලි මුහුණත වර්ණ ගැන්වීමේදී ස්වභාවික පරිසරයට ගැළපෙන අයුරින් ගොඩනැගිලි වර්ණාලේපිත කළ යුතු වේ.<br><br>ඊ) ඕනෑම ගොඩනැගිල්ලක් සඳහා තිර බිත්ති සහ කැඩපත් වීදුරු භාවිතා කිරීම සඳහා අවසර හිමි නොවේ.</td></tr>
</table>

| | |
|---|---|
| | උ) පොදු මාර්ගයන්ට මුහුණලා පවතින ඉඩම් වල ගොඩනගිලි සීමාව මෘදු භූ දර්ශන සහිතව පවත්වා ගත යුතුවේ.<br>ඌ) එක් වෛද්‍යවරයෙකු පමණක් සිටින වෛද්‍ය මධ්‍යස්ථාන සදහා උපරිම ගෙබිම් ප්‍රමාණය වර්ග මීටර් **150**ක් විය යුතු වන අතර අවම බිම් ප්‍රමාණය වර්ග මීටර් **250** විය යුතු වේ.<br>එ) විදුලි උප පොලවල් සංවර්ධනය කිරීමේ දී ඉඩම වටා අවම වශයෙන් මීටර් 2.5ක .ස්වාරක්ෂක කලාපයක් නඩත්තු කළ යුතුය |

### 8.1.10: උස්බිම් සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 25 දක්වා ප්‍රදේශය

වගු අංකය 8.10: උස්බිම් සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 25 දක්වා ප්‍රදේශය

<table>
<tr><td>i.</td><td>ප්‍රධාන කලාපය</td><td colspan="2">උස්බිම් සංරක්ෂණ කලාපය (කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය) මුහුදු මට්ටමේ සිට මීටර් 25 දක්වා ප්‍රදේශය</td></tr>
<tr><td>ii.</td><td>කලාප ලක්ෂණ</td><td colspan="2">සංවර්ධන කටයුතු නියාමනය කරමින් ප්‍රදේශය තුල පවතින්නාවූ පුරාවිද්‍යාත්මක හා පාරසරික ලක්ෂණ ආරක්ෂා කරගැනීම අරමුණු කරගත් ප්‍රදේශයකි.</td></tr>
<tr><td>iii.</td><td>කලාප මායිම්</td><td colspan="2">උතුරට: අරඹවතුගොඩ මාර්ගය<br>නැගෙනහිරට: කොරතොට පන්සල් කන්ද ප්‍රදේශය ආශ්‍රිත සීමාව<br>දකුණට: වැක්කියවත්ත මාර්ගය<br>බටහිරට: කඩුවෙල අතුරුගිරිය මාර්ගය</td></tr>
<tr><td>iv.</td><td>කලාප සංගුණකය</td><td colspan="2">-</td></tr>
<tr><td>v.</td><td>අවසරලත් උපරිම ගෙබිම් අනුපාතය / මහල් ප්‍රමාණය</td><td colspan="2">50% හා උපරිම උස මීටර් 12 (G+2)</td></tr>
<tr><td>vi.</td><td>අවසරලත් උපරිම බිම් කට්ටි ආවරණය</td><td colspan="2">උපලේඛණය II සහ III හි සදහන් “ආ” සහ “ඉ” ආකෘති අනුව වියයුතුය</td></tr>
<tr><td>vii.</td><td>විවෘත අවකාශයන් සහ උපරිම උස</td><td colspan="2">උපලේඛණය III හි සදහන් “ඉ” ආකෘතිය අනුව වියයුතුය</td></tr>
<tr><td>viii.</td><td>අනුබෙදීම් කල හැකි අවම බිම් ප්‍රමාණය</td><td colspan="2">ව.මීටර් 150 (නේවාසික) ව.මීටර් 300 (නේවාසික නොවන)</td></tr>
<tr><td rowspan="8">ix.</td><td rowspan="8">අවසරලත් භාවිතාවන්</td><td>ප්‍රධාන භාවිතය</td><td>අවසරලත් භාවිතයන් (උපලේඛණය IV හි සදහන් “උ” ආකෘතිය අනුව)</td></tr>
<tr><td>නේවාසික</td><td>1</td></tr>
<tr><td>කාර්යාල හා ආයතන</td><td>4</td></tr>
<tr><td>වාණිජ</td><td>2,7,11,15,18,20,21</td></tr>
<tr><td>සෞඛ්‍ය</td><td>2,3</td></tr>
<tr><td>සමාජ හා ආගමික</td><td>3,4</td></tr>
